# සබරගමුව විශ්වවිද්‍යාලයීය
# ශාස්ත්‍රීය සංග්‍රහය

දහහතරවන කලාපය – 2022 දෙසැම්බර්

**ISSN 1800-1459**
**eISSN 2673-1177**

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
## දහහතරවන කලාපය - 2022 දෙසැම්බර්

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයීය ප්‍රකාශනයකි

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහහතරවන කලාපය 2022 දෙසැම්බර්
ISSN 1800-1459
eISSN 2673-1177
ප්‍රථම මුද්‍රණය: 2022 දෙසැම්බර්

**සංස්කාරක** : ආචාර්ය චම්පා එස්. ද සිල්වා

**<u>සියලු ම විමසීම්</u>**

සංස්කාරක
සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
තැ.පෙ. 02
බෙලිහුල්ඔය
දුරකථන/ෆැක්ස් - 045 22 80013
විද්‍යුත් තැපැල - sjseditor@crkd.sab.ac.lk

පරිගණක පිටු සැකසුම : යූ. ඒ. පී. කේ. රූපසිංහ
සම්බන්ධීකරණය සහ සංස්කරණ සහයක : ජී. පී. එම්. එස්. නන්දසේන

ප්‍රකාශනය : ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
බෙලිහුල්ඔය

## සංස්කරණ ප්‍රතිපත්තිය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය වූ කලී අඛණ්ඩ ව වාර්ෂික ව පළ වන විමර්ශිත සඟරාවකි. ඕනෑ ම විෂය ක්ෂේත්‍රයකට අදාළ ව සිංහල භාෂාවෙන් රචිත, පුරෝගාමී ඥානයක් සම්පාදනය කෙරෙන, උසස් ප්‍රමිතියෙන් යුතු ලිපි මෙහි පළ කෙරේ. සියලු ම ලිපි ප්‍රවීණ විමර්ශන මඬුල්ලකට යොමු කෙරෙන අතර ආරාධිත ජ්‍යෙෂ්ඨ පර්යේෂකයන්ගේ ලිපි සංස්කාරක මණ්ඩලයේ විමර්ශනයට පමණක් යොමු කෙරේ. සඟරාවේ පළ කෙරෙන ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය.

## සංස්කාරක මණ්ඩලය


මහාචාර්ය ආර්. එම්. ඩබ්ලිව්. රාජපක්ෂ

මහාචාර්ය මනෝජ් ආරියරත්න

මහාචාර්ය කේ. වී. දීපානි එදිරිසූරිය මැණිකේ

මහාචාර්ය ඒ. සරත් ආනන්ද

මහාචාර්ය ආර්. ඒ. ඩී. ප්‍රියංකා වීරසේකර

ආචාර්ය ජී. කේ. චම්පා එස්. ද සිල්වා

සම්බන්ධීකරණ සංස්කාරක : ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. සී. පල්ලියගුරුගේ

ඉංග්‍රීසි භාෂා සංස්කාරක : ආචාර්ය මහේෂ් හපුගොඩ

# සංස්කාරක සටහන

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහයෙහි 14 වන කලාපය මෙසේ විද්වත් ඔබ සැම වෙත සමර්පණය කිරීමට ලැබීම අපගේ නොවක් සොම්නසට හේතුවකි. අධික කාර්ය බහුලත්වය සහ නොයෙකුත් ගැටලු හමුවේ මෙම කලාපය එළිදැක්වීමට තරමක් ප්‍රමාද වුව ද හැකි ඉක්මනින් මෙය පළ කිරීමට හැකි සැම ප්‍රයත්නයක් ම දැරුවෙමු. මෙම කලාපය විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය වන පර්යේෂණ පත්‍රිකා 06කින් සමන්විත වන අතර එය විද්‍යාර්ථීන්ගේ ඥාන ගවේෂණය උදෙසා ද අනාගත අභිවෘද්ධිය සඳහා ද මහගු පිටිවහලක් වනු ඇත. පර්යේෂණ හිතකාමීන් විසින් යොමු කරන ලද මෙම පර්යේෂණ පත්‍රිකා ප්‍රාමාණික විද්වත් මණ්ඩලයක් වෙත යොමු කර ඇති බැවින් ගුණාත්මක බවින් පරිපූර්ණ විමර්ශිත සඟරාවක් වශයෙන් මෙම ශාස්ත්‍රීය සඟරාව ඇගයිය හැකි ය. ස්වකීය පර්යේෂණ අප වෙත යොමු කළ එම ශාස්ත්‍ර ගවේෂී විද්‍යාර්ථීන්ට ප්‍රථමයෙන් ම අපගේ ප්‍රණාමය හිමි විය යුතු ය.

ජාතික මට්ටමෙන් ක්‍රමක්‍රමයෙන් අභිවෘද්ධිය වෙත පියමන් කරමින් සිටින ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය දැනුම සම්පාදනය කිරීමේ අංශයෙන් පමණක් නොව දැනුම බෙදා හැරීමේ අංශයෙන් ද ප්‍රමුඛ ව සිටින විද්‍යාස්ථානයකි. එය සබරගමුව ප්‍රදේශයට පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකේය විද්‍යාර්ථීන්ට ද මහත් ආලෝකයක් සපයන ප්‍රදීපස්ථානයකි.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහය කිසිදු ප්‍රමාදයකින් තොර ව පළ කිරීම සඳහා සදුපදේශ සපයන ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරන්දර මහාචාර්ය එම්. සුනිල් ශාන්ත මැතිඳුන්ට සැබවින් ම ස්තුතිය පළ කළ යුතු ය. එසේ ම පර්යේෂණ හා දැනුම බෙදා හැරීමේ මධ්‍යස්ථානයේ වත්මන් අධ්‍යක්ෂ මහාචාර්ය බී. ටී. ජී. එස්. කුමාර මහතාගේ මනා කැපවීම සහ නිහතමානී ගුණය මෙහි උද්දීප්තිය තවත් වර්ධනය කරනු ඇත. තව ද මෙම ශාස්ත්‍රීය සඟරාවෙහි සම්බන්ධීකරණ කටයුතු අනලස් ව ඉටු කරමින් මහගු සේවයක් සපයන ජී. පී. එම්. එස්. නන්දසේන මෙනවිය ද සමස්ත සඟරාවෙහි ම බර තම උර මත දරමින් පරිගණක පිටු සැකසුම සහ මුල් කවරය නිර්මාණය කරමින් විශාල වගකීම් සම්භාරයක් උසුලන යූ. ඒ. පී. කේ. රූපසිංහ මහත්මිය ද විශේෂයෙන් ම ඇගයිය යුතු ය.

එසේ ම මෙහි අන්තර්ගත ඉංග්‍රීසි බසින් රචිත සාරසංක්ෂේප සංස්කරණය කර දෙමින් අප වෙත සහයෝගය ලබා දීම සම්බන්ධයෙන් භාෂා අධ්‍යයනාංශයෙහි ආචාර්ය මහේෂ් හපුගොඩ මහතාට ද කෘතවේදීත්වය පුද කර සිටිය යුතු ම ය. තව ද ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආර්. සී. පල්ලියගුරුගේ මහතා සම්බන්ධීකරණ කටයුතුවල දී නොමසුරු ව දැක් වූ සහයෝගය අගයන අතර ම තත්ත්ව සුනිශ්චිතකරණ කේන්ද්‍රයේ අධ්‍යක්ෂ මහාචාර්ය එච්. ඒ. ඩී. රුවන්දීපිකා මැතිනිය දක්වන සහයෝගය ද මෙම අවස්ථාවේ දී සිහිපත් කරන්නේ ඉමහත් ගෞරවයෙනි.

**ආචාර්ය චම්පා එස්. ද සිල්වා**
**ප්‍රධාන සංස්කාරක**
**සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය.**

# ලිපි සම්පාදකයෝ

**යූ. ඩී. ආර්. ෂෙහාන් තිලකරත්න**
පර්යේෂණ සහකාර, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

**හෂාන් විජේසිංහ[1] සහ කළිඳු රත්නායක[2]**
කථිකාචාර්ය, ජාත්‍යන්තර අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය[1]
පශ්චාත් උපාධි අපේක්ෂක, භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය[2]

**රශ්මි හෙට්ටිආරච්චි[1] සහ චම්පා එස්. ද සිල්වා[2]**
ශාස්ත්‍රවේදී (විශේෂ) සිංහල, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය[1]
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය[2]

**කළුබෝවිටියන සෝරත හිමි**
සහාය කථිකාචාර්ය, සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

**ඩබ්ලිව්. ටී. ඩී. විජේතුංග[1], එස්. ඩී. වයි. ජයරත්න[2] සහ රිශිනි ෆර්නැන්ඩෝ[3]**
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, මානව විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය[12]
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය[3]

**ඩබ්. ඩී. එන්. ඩබ්. කුමාරි[1], සහ චම්පා එස්. ද සිල්වා[2] සහ ඩබ්. එම්. ආරියරත්න[3]**
ශාස්ත්‍රවේදී (විශේෂ) සිංහල, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය[1]
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය[2]
මහාචාර්ය, භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය[3]

# පටුන

පරිච්ඡේදය පිටු අංකය

1. ‘පන්නම් කතුර’ පැදි පෙළින් හෙළි වන සාම්ප්‍රදායික පන් කර්මාන්තය 1-09
**යූ. ඩී. ආර්. ෂෙහාන් තිලකරත්න**

2. 21 වන සියවසේ ලෝක හදබිම :චීනයේ පිබිදීම ඇසුරෙන් 10-23
**හෂාන් විජේසිංහ සහ කළිඳු රත්නායක**

3. තත්කාලින සමාජ පරිස්ථිතිය නිරූපණය කිරීම උදෙසා මායා යථාර්ථවාදී ලක්ෂණ භාවිතයː පියල් කාරියවසම්ගේ වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාව ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි 24-32
**රෂ්මි හෙට්ටිආරච්චි සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චම්පා එස්. ද සිල්වා**

4. ගැටවරවියේ පසුවන පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමට බලපාන මනෝ සමාජීය සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් 33-41
**කළුබෝවිටියන සෝරත හිමි**

5. සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්) 42-70
**ඩබ්ලිව්. ටී. ඩී. විජේතුංග, එස්. ඩී. වයි. ජයරත්න සහ රිශිනි ෆර්නැන්ඩෝ**

6. සිංහල නවකතාවෙන් නිරූපිත යටත්විජිත යුගයෙහි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදු වූ සමාජ විපර්යාස ː තෝරාගත් සිංහල නවකතා කිහිපයක් ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් 71-82
**ඩබ්. ඩී. එන්. ඩබ්. කුමාරි, සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චම්පා එස්. ද සිල්වා සහ මහාචාර්ය ඩබ්. එම්. ආරියරත්න**

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහහතරවන කලාපය 2022 දෙසැම්බර්
පිටු 1-9
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ‘පන්නම් කතුර’ පැදි පෙළින් හෙළි වන සාම්ප්‍රදායික පන් කර්මාන්තය

# (The Traditional *Pan* Industry as revealed by the “*Pannam Katura*” Poems)

යූ. ඩී. ආර්. ෂෙහාන් තිලකරත්න

පර්යේෂණ සහකාර, පුරාවිද්‍යා අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
**shehanthilakarathna1205@gmail.com**

## Abstract

Household enterprises which are coming from ancient time to present can be identified as traditional industries. *Pan* or grass industry is one of the traditional industries in Sri Lanka. At present this industry is seemed to be limited to several areas in the country. Rather than using ancient techniques, modern techniques are being used for the grass industry at this moment in time. According to the researchers who have studied the folk poetry of Sri Lanka, a number of folk poems have emerged through *pan* industry. “*Samayan Pedura*”, "*Sath Korale Kavi*", “*Peduru Gebe Kavi*” etc. are the most popular among those. The current research is based on '*Pannam katura*'. '*Pannam katura*' poems have been published by Ananda Kumaraswamy's 'Medieval Sinhala Art'. There are 55 poems. The aim of this study was to identify the traditionality of *pan* industry through *'Pannam katura'*. The research problem was whether the poem *'Pannam katura'* can identify information about the traditional pan industry? Library survey was the research method here. '*Pannam katura*' poetry is presented in the form of a dialogue. This conversation takes place between a mother-in-law and a daughter-in-law. This poetry initiates a historical for the animosity which is believed by the villagers to be there between the mother-in-law and daughter-in-law. The '*Pannam katura*' poetry is a Knowledge store of the traditional *pan* industry. *Pannam Katura* presents all the activities from cutting the bulrush until making mats very creatively. It gives a clear understanding of *pan* industry as how it was welcomed in social terms in the past. *Pan* industry is not an isolated industry. It is an industry in which women were participated in groups. It can be identified very well by '*Pannam Katura*' poems. Thus, it can be concluded that the "*Pannam katura*" poems are an important source to identify the traditionality of the *pan i*ndustry.

**Key Words**: Ancient Techniques, Folk poetry, *Pan* Industry, *Pannam Katura*, Traditionality

## සාරසංක්ෂේපය

ඈත අතීතයේ සිට වර්තමානය දක්වා පවතින හස්ත කර්මාන්ත සාම්ප්‍රදායික කර්මාන්ත ලෙස හඳුනාගත හැකි ය. පන් කර්මාන්තය ශ්‍රී ලංකාවේ එවැනි සාම්ප්‍රදායික කර්මාන්තවලින් එකකි. වර්තමානයේ මෙම කර්මාන්තය රටේ ප්‍රදේශ කිහිපයකට සීමා වී ඇත. පැරණි ශිල්පීය ක්‍රම භාවිත කරනවාට වඩා නවීන තාක්ෂණික ක්‍රම වර්තමානයේ දී මෙම කර්මාන්තයේ දී යොදා ගැනේ. ශ්‍රී ලංකාවේ ජන කවි සම්බන්ධ ව අධ්‍යයනය කළ පර්යේෂකයන්ට අනුව පන් කර්මාන්තය පදනම් කොට ගෙන ජන කවි රැසක් බිහිවී ඇත. "සමයන් පැදුර", " සත් කෝරළේ කවි", "පැදුරු ගැබේ කවි" යනාදිය ඒ අතරින් ජනප්‍රිය ය. එවැනි පැදි පෙළක් වන "පන්නම් කතුර" පදනම් කර ගෙන මෙම පර්යේෂණය සිදු කෙරිණි. ආනන්ද කුමාරස්වාමිගේ 'මධ්‍යකාලීන සිංහල කලාව' නමැති කෘතියෙහි මෙම කවි පළ කර තිබේ. මෙය කවි 55කින් සමන්විත පැදි පෙළකි. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ 'පන්නම් කතුර' පැදි පෙළ හරහා පන් කර්මාන්තයේ සාම්ප්‍රදායිකත්වය පිළිබඳ ව හඳුනා ගැනීමයි. පර්යේෂණ ගැටලුව වූයේ 'පන්නම් කතුර' පැදි පෙළෙන් පන් කර්මාන්තයේ සාම්ප්‍රදායිකත්වය පිළිබඳ තොරතුරු හඳුනා ගත හැකි ද? යන්නයි. පුස්තකාල අධ්‍යයනය මෙහි පර්යේෂණ ක්‍රමවේදය විය. පන්නම් කතුර කවි පෙළ ඉදිරිපත් කෙරෙන්නේ සංවාදයක ස්වරූපයෙනි. එම සංවාදය සිදුවන්නේ නැන්දම්මා සහ ලේලි අතර ය. නැන්දම්මා සහ ලේලිය අතර ඇතැයි ගැමියන් විශ්වාස කරන විරසකය මෙම කවි පෙළට ද ප්‍රස්තුත වී තිබේ. පන්නම් කතුර කවි පෙළ සාම්ප්‍රදායික පන් කර්මාන්තය පිළිබඳ දැනුම් සංචිතයකි. එමගින් පන් කැපීමේ සිට පැදුරු සෑදීම දක්වා සියලු කටයුතු ඉතා නිර්මාණශීලී ව ඉදිරිපත් කරයි. එසේ ම මෙම කවි පෙළ පන් කර්මාන්තය අතීතයේ සමාජීය වශයෙන් පිළිගත් ආකාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා දෙයි. පන් කර්මාන්තය හුදකලාව නියැලෙන කර්මාන්තයක් නොවේ. කාන්තාවන් කණ්ඩායම් වශයෙන් සහභාගී වූ කර්මාන්තයකි. එය 'පන්නම් කතුර' කවිවලින් ඉතා හොඳින් හඳුනාගත හැකි ය. මේ අනුව පන් කර්මාන්තයේ සාම්ප්‍රදායික ස්වරූපය හඳුනා ගැනීමට "පන්නම් කතුර" පැදි පෙළ වැදගත් මූලාශ්‍රයක් වන බවට නිගමනය කළ හැකි ය.

**කේන්ද්‍රීය වචනඃ** ජන කවි, පුරාණ ශිල්පීය ක්‍රම, පන් කර්මාන්තය, පන්නම් කතුර, සාම්ප්‍රදායිකත්වය

## හැඳින්වීම

'ජනකවිය' අයත් වන්නේ 'ජනශ්‍රැතිය' හෝ 'ජනශ්‍රැති විද්‍යාව' **(Folklore)** නම් පුළුල් විෂය ක්ෂේත්‍රයට ය. ජනශ්‍රැතිය **(Folklore)** වනාහි ජනකථා, ජන ආගම්, යාතු කර්ම, අධිවිශ්වාස, අභිචාර, ජන උත්සව, කෙළි සෙල්ලම්, ජන බස, ජන වෙදකම ආදී විශාල ප්‍රදේශයක ව්‍යාප්ත වූ විෂය ධාරාවකි. මානවයා සතු ප්‍රාථමික දැනුම් සම්භාරය නිරායාසයෙන් ම ජනශ්‍රැතියෙහි ගැබ්වන හෙයින් ලොව බොහෝ ශාස්ත්‍රඥයින් මෙම විෂය කෙරෙහි අවධානය යොමු කොට තිබේ. ජනශ්‍රැතියෙහි එන ඥාන ධාරාවන් මානව සංහතියෙහි අතීත ම අවස්ථාවල සිට ගලා එන්නකි. එම ඥානය හුදෙක් පැරණි යයි ඉවත දැමිය නොහැකි අතර නූතන තාක්ෂණික ලෝකයේ ඇතැම් කටයුතු සඳහා නිර්මාණශීලී ව යොදාගත හැකි විභවතාවක් එම දැනුම් පද්ධතීන්හි ගැබ් වී ඇත. ජනශ්‍රැතිය ඔස්සේ පුරාවිද්‍යාවේ උප විෂය ධාරාවක් ද දියුණු වී තිබේ. ජනශ්‍රැතික පුරාවිද්‍යාව ***(Folklore Archeology)*** ලෙස හඳුනා ගැනෙන්නේ එය යි.

ජනශ්‍රැතියට අයත් විවිධ අංගෝපාංග අතරින් බොහෝ දෙනාගේ අවධානය පැහැරගත් ක්ෂේත්‍රයක් වී ඇත්තේ ජන කවිය යි. ඉංග්‍රීසියෙන් ***Folk Poetry*** හෝ ***Folk Songs*** ලෙස හඳුන්වන ජනකවි මහාචාර්ය ඒ. වී. සුරවීර සිය ''සාහිත්‍ය විචාර ප්‍රදීපිකා'' කෘතියේ පැහැදිලි කර ඇත්තේ මෙසේ ය.

> ''ජනකවි/ ජනගී- පොදු ජනයා අතර පෙර පටන් වාචෝද්ගතව පැවත එන කවි සහ ගී. ජනකවි සහ ජන ගී අතර පැහැදිලි වෙනසක් හඳුනා ගත හැකි නොවේ. මේවා මෑත භාගය වනතුරු පැවතියේ අලිඛිතව ය. මිනිසාගේ එදිනෙදා ජීවිතය ආශ්‍රිත සියලු අවස්ථා ජනකවියට හා ජනගීයට විෂය වී ඇත්තේ ය'' (සුරවීර, 2005: 94).

ජනකවිය පිළිබඳ මෙම පැහැදිලි කිරීමෙන් එහි ස්වභාවය පිළිබඳ මූලික කරුණු දෙකක් ඉස්මතු කර තිබේ. ඉන් පළමු වැන්න නම් ජනකවිය ඉතා ඈත අතීතයේ සිට පොදු ජනයා අතර මුඛ පරම්පරාවෙන් පැවත එන සාහිත්‍යයක් වීම යි. පරපුරෙන් පරපුරට ජනකවිය ගමන් කරන්නේ ශ්‍රැතිය හෙවත් ඇසීම පදනම් කරගෙනයි. මෙම ශ්‍රැතියමාන සාහිත්‍යය පරම්පරා මාර්ගයෙන් විකාසනය වන විට එහි යම් ආකාරයක වෙනස්කම් සිදුවීම වැළැක්විය නොහැක්කකි. නිදහසේ වැඩුණ ජනකවි සාහිත්‍යාංගය ලේඛනාරූඪ වීමත් සමග තවදුරටත් වෙනස් නොවන තත්ත්වයකට පත්විය. එසේ ලේඛනාරූඪ වූ දහස් සංඛ්‍යාත ජනකවි සංචිතයක් අප හමුවේ ඇත. කෙසේ වුවත් ජනකවි සජීවී ව භාවිත වන සමාජ අවස්ථා අද දින ද විරල නොවන බව සඳහන් කළ යුතු ය. උදාහරණයක් ලෙස ශ්‍රීපාද වන්දනා ගමන්වල දී 'හිමගත වර්ණනා කවි' ලයාන්විත ව ගයමින් යන බැතිමත් පිරිස් අද දින ද දැකිය හැකියි.

ජනකවියේ හඳුනාගත හැකි අනෙක් සුවිශේෂ කරුණ නම් එදිනෙදා ජීවිතය ආශ්‍රිත සියලු අවස්ථා එම පද්‍යවල නිධන්ගත ව පැවතීම යි. අතීතයේ පටන් මානවයා මුහුණ පෑ දුක්ඛ දෝමනස්ස, සුඛ ප්‍රහර්ෂ සියල්ල ජනකවි අතරට එකතු වී ඇත. මේවායේ දක්නට ලැබෙන ඉතා වැදගත් තවත් කරුණක් වන්නේ අව්‍යාජ බවයි. පුහු සාටෝපී බවින් තොර ව තමාට පැවසීමට ඇති දෑ අව්‍යාජ ලෙස ප්‍රකාශ කර සිටීම ජනකවියාගේ සිරිතයි. මේ අනුව ජනකවි මගින් අප වෙත දායාද වන්නේ කාල්පනික සුන්දරත්වයක් නොව ජීවිතයෙහි කටුක යථාර්ථය යි.

ජනකවි වනාහි මානවයාගේ සාම්ප්‍රදායික ඥානය එක් රැස් කළ ඥාන සංචිතයක් ද වෙයි. මෙරට සාම්ප්‍රදායික ඥානය ප්‍රවාහනය කිරීමේ ප්‍රධාන වාහකයක් ලෙස කවිය ක්‍රියාත්මක වී ඇති බව නොරහසකි. වෛද්‍ය ශාස්ත්‍රය, නක්ෂත්‍රය ආදියට අදාළ දැනුම රැගත් පද්‍ය දහස් සංඛ්‍යාත ප්‍රමාණයක් අදත් අප අතර පවතී. ඒ හැර වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ සාම්ප්‍රදායික දැනුම ජන කවි ඔස්සේ ද හඳුනා ගත හැකි ය. ප්‍රධාන වශයෙන් මෙරට කෘෂිකර්මාන්තයට පසුබිම් වන සාම්ප්‍රදායික දැනුමක් බොහෝ ජනකවිවල නිරූපණය වෙයි. මේ හැරෙන්නට අනෙකුත් වෘත්තීන් පිළිබඳ සාම්ප්‍රදායික ඥානය එම වෘත්තීන් අනුව නම් කර ඇති ජනකවිවලින් හඳුනා ගත හැකි ය. කරත්ත කවි, පතල් කවි, බඹර කවි, ඔරු පාරු කවි මීට නිදසුන් ය. ජනකවිවල කෘෂිකර්මාන්තය හා සම්බන්ධ සාම්ප්‍රදායික ඥානය ගැබ් වී ඇත්තේ කෙසේ ද යන්නට පහත කවිය කදිම නිදසුනකි.

> "වෙසක් පොසොන් මස බිං තෝරා ගන්ට
> ඇසළ නිකිණි මස වල් පීරා ගන්ට
> බිනර මහේ වැට කටු සවිකර ගන්ට
> වප් මස පුරා වපුරන් අටු පුර වන්ට"
> (පඤ්ඤාරතන හිමි, 1967: 2)

පුරාණ හේන් ගොවිතැනේ දී කෘෂි ක්ෂේත්‍රය සකස් කර ගත යුතු එක් එක් අවස්ථා මාස පිළිවෙළින් මේ කවියෙහි දක්වා ඇත. අටුකොටු පිරී අස්වනු සරුවීමට නම් මෙහි එන අන්දමට කටයුතු කළ යුතු බව අඟවා තිබේ. මෙබඳු පැදිවල අඩංගු වන්නේ මිනිසා පරිසරයේ ජීවත් වීමෙන් ස්වයංබෝධ කළ ඥානයකි. එබඳු දැනුමක් කවියකට නැංවීමෙන් එයට සාහිත්‍ය මුහුණුවරක් ලැබෙනවා පමණක් නොව එය කටපාඩමින් පරපුරින් පරපුරට පවත්වාගෙන යැමට ද හැකියාව ලැබී ඇත.

සෙසු කර්මාන්ත සේ ම 'පන් කර්මාන්තය' ද පිටිසර බද ජන ජීවිතයට ඉතා වැදගත් දෙයක් වූයේ ය. ගෘහාශ්‍රිත කර්මාන්තයක් වූ මෙය බොහෝ විට කාන්තාවන් ඇසුරේ පැවතියකි. පැදුරු පමණක් නොව මලු, වට්ටි, පෙට්ටි ආදිය ද පන් ගසින් නිම විණ. මෙය අධික ලෙස කායික ශ්‍රමය වැය කළ යුතු කර්මාන්තයක් නොවූ අතර ගැමි කාන්තාවන්ට සිය නිර්මාණශීලීත්වය උපරිම අන්දමින් ප්‍රදර්ශනය කළ හැකි කර්මාන්තයක් විය. පන්වලින් නිර්මාණ කිරීම එක්තරා ආකාරයකට විනෝදජනක කටයුත්තක් විය. අපේක්ෂා කළ යුතු පරිද්දෙන් ම පන් කර්මාන්තය ඔස්සේ ද වෙන ම ජන කවි සාහිත්‍යයක් බිහි වී තිබේ.

මෙරට ජනකවි පිළිබඳ අධ්‍යයනය කළ පර්යේෂකයන් පෙන්වා දෙන අන්දමට පන් කර්මාන්තය ඔස්සේ ජන කාව්‍ය නිර්මාණ කිහිපයක් ම බිහි වී තිබේ. ''සමයන් පැදුර'', ''සත් කොරලේ පන් කවි'', ''පන්නන් කතුර'',


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

''සමයන් පැදුරේ කවි'', ''පැදුරු ගැබේ කවි'' ''පැදුරු මාලය''ඒ අතර ප්‍රධාන වේ. පැරණි කෘෂිකාර්මික සමාජයේ පන් කපා පැදුරු විවීම කාන්තාවන් විසින් සිදුකරන ලද වැදගත් කාර්යයක් විය. එය සැම කුලයකට ම අයත් ස්ත්‍රීන් විසින් සිදුකරන ලදී (කුමරස්වාමි, 1962: 242). අතීත සමාජය තුළ "පන් යක්කම" නමින් යාතුකර්මයක් (පූජා ක්‍රමයක්) පැවැත් වූ බව ද පෙනේ. පන් යක්කම හා බැඳෙන පට්ටිය ගිරි, ඔකඳ ගිරි, කොටපල බිසව්, වෙළඹ ගිරි, දොළොස් ගිරි වැනි මනුෂ්‍යාත්මවය ඉක්මවා ගිය දෙවියන් හෝ යක්ෂයන් ගැන තොරතුරු පන් යක්කම ආශ්‍රිත කවිවලින් අනාවරණය වේ. පහතරට ශාන්ති කර්ම අතර ඇති රට යකුම හෙවත් රිද්දි යාගයේ දී ද පන් යක්කම ආශ්‍රිත කවි ගායනා කරනු ලබයි. මෙම කවිවලින් පන් කර්මාන්තය ආශ්‍රිත ව වැදගත් තොරතුරු අනාවරණය කර ගත හැකි ය.

## පර්යේෂණ අරමුණ

වත්මන් අධ්‍යයනයේ දී පන් කර්මාන්තයට අදාළ ව බිහි වූ ජනකවි සාහිත්‍යයෙහි එන 'පන්නම් කවි' හෙවත් 'පන්නම් කතුර' නම් ජන කවි සමුදාය පිළිබඳ විමර්ශනය කිරීමට අපේක්ෂිත ය. මේ පන්නම් කවි පළ වී ඇත්තේ ආනන්ද කේ. කුමාරස්වාමි මහතාගේ 'මධ්‍යකාලීන සිංහල කලා කෘතියෙහි' ය. එහි පද්‍ය 55කි. මේ 'පන්නම් කවිවලින්' බොහෝ ප්‍රමාණයක් තෙරිපැහැ සෝමානන්ද හිමියන් විසින් සංස්කරණය කරන්නට යෙදුණ සිංහල මාල කවි සංග්‍රහයෙහි එන 'පැදුරු මාලය' නම් කෘතියෙහි ද දැක ගත හැකියි. කෙසේ වතුදු මෙහි දී අපගේ අරමුණ ආනන්ද කේ. කුමාරස්වාමි මහතාගේ 'මධ්‍යකාලීන සිංහල කලා කෘතියෙහි' එන 'පන්නම් කවි' (කුමරස්වාමි, 1962: 254-251) පමණක් විමර්ශනය කොට එයින් හෙළිවෙන සාම්ප්‍රදායික පන් කර්මාන්තයේ ස්වරූපය පිළිබඳ ව හඳුනා ගැනීම යි.

## පර්යේෂණ ගැටලුව සහ ක්‍රමවේදය

'පන්නම් කතුර' පැදි පෙළින් සාම්ප්‍රදායික පන් කර්මාන්තය පිළිබඳ තොරතුරු හඳුනාගත හැකි ද? යන්න මෙහි පර්යේෂණ ගැටලුව විය. මෙහි දී පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් පුස්තකාල ගවේෂණය භාවිත කෙරිණි. ඒ අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය පරිහරණය කොට 'පන්නම් කතුර' පැදි පෙළ අතුළුව සාම්ප්‍රදායික පන් කර්මාන්තය සහ පැදුරු නිර්මාණකරණය සම්බන්ධයෙන් සිදුකර ඇති ස්වර්ණා ඉහළගමගෙගේ **පැදුර හා සිංහල ජන ජීවිතය** (1997), රත්නපාල නාගොඩවිතානගේ **ලක්දිව අත්කම් ශිල්ප කලා** (2010) වැනි පූර්ව පර්යේෂණ ද ඉවන්තා සඳුනි ජයසේන විසින් 2022 පෙබරවාරි 23 දිවයින බදාදා අතිරේකයට ලියන ලද "පැදුර හා බැඳි සිංහල ජන ජීවිතය", 2019 සැප්තැම්බර් 21 දින දේශය පුවත්පතෙහි පළව ඇති චමිඳු නිසල් ද සිල්වාගේ "එදා වගේ ම අදත් වැදගත් පැදුරේ පුරාණය" වැනි පුවත්පත් ලිපි පිළිබඳ ව ද විමර්ශනය කරන ලදී. පන් කර්මාන්තයේ ඉතිහාසය හා එම කර්මාන්තය සිදුකරන ප්‍රදේශ පිළිබඳ පූර්ව අවබෝධයක් ලබා ගැනීමට පුස්තකාල ගවේෂණය වැදගත් වේ. මෙහි දී වත්මන් අධ්‍යයන ප්‍රස්තුතයට අදාළ බහුතරයක් මූලාශ්‍රය අධ්‍යයනය කරන ලද අතර 'පන්නම් කතුර' පැදි පෙළ ඇතුළත් ආනන්ද කේ. කුමාරස්වාමිගේ 'මධ්‍යකාලීන සිංහල කලා' කෘතිය ප්‍රාථමික මූලාශ්‍රය ලෙස යොදා ගන්නා ලදී. පන් කර්මාන්තය පිළිබඳ සඳහන් පූර්ව පර්යේෂණ කෘති රැසක් ම මෙහි දී ද්විතියික මූලාශ්‍රය ලෙස ඉතා වැදගත් විය.

## සාහිත්‍ය විමර්ශනය

### පන්නම් කවි ආකෘතිය හා අන්තර්ගතය

සිංහල ජන කවි සැලකීමේ දී ඒවායෙහි කාව්‍යාකෘති කිහිපයක් දැකගත හැකියි. කවියේ සැකස්ම පිළිබඳ පොදු ආකෘතිය නම් ඒවා බොහෝ විට සිවුපද වීම යි. කෙසේ වුවත් සිවුපද නොවන සැහැලි කවි ද සිංහල ජන සමාජයේ පවතියි. ඊකා කවිවල ද පද සතරට වඩා තිබේ. ජන කවිය ප්‍රකාශ කරන විලාස අනුව ද විවිධ ආකෘති හඳුනා ගත හැකියි. බොහෝ කවි තනි කථකයෙකුගේ සිතුම් පැතුම් ලෙස ඉදිරිපත් කෙරී ඇත. මේවා සාහිත්‍යයේ දී හැඳින්වෙන්නේ 'මුක්තක' කවි එසේත් නැතිනම් 'නිරපේක්ෂ කාව්‍ය' ලෙස යි. සීගිරි කැටපත් පවුරේ දක්නට ඇති බොහෝ කුරුටු ද මුක්තක ගණයට අයත් වේ. මේ හැර තවත් ජන කවි ප්‍රශ්නෝත්තර ලෙස නිර්මාණය වී තිබේ. තේරවිලි කවි බොහෝ විට මෙම ස්වරූපයෙන් යුක්ත ඒවා ය. සිංහල ජන කවිවලින් තවත් ප්‍රමාණයක් සංවාදශීලී ඒවා බව හඳුනා ගත හැකියි. මහාචාර්ය නන්දසේන රත්නපාල එබඳු කවි ගැන මෙසේ කියයි.

> "අපේ ජනකවි සාමූහික ජීවන රටාවේ වැදගත්ම දායාදයක් වැන්න. තනිවම කියන ජනකවියක් අපට නැත. දරු නැළවිල්ල පවා කියන්නේ ඉතා අඩු වශයෙන් දෙදෙනෙකුවත් ඉන්නා තැනක ය. පැල් කවිය වුවත් පැලේ ඉඳ කියන විට රාත්‍රී පාළුව හා නිසංසලකම මකා ගෙන පැල් රකින අවශේෂ උදවියගේ දෙසවන පතිත වන්නේ ය. ඒ අයගෙන් කෙනෙක් නිසැක ව ම තවත් පැල් කවියකින් ඊට උත්තර සපයන්නේ ය. ඔරු පාරු කවි ගැන කිව යුත්තේ ද ඒ ටිකම ය. සාමූහික ජනජීවන රටාවෙන් විනිර්මුක්ත ජන කවියක් සිංහලයා අතර නොවී ය" (රත්නපාල, 2007: 97).

නන්දසේන රත්නපාල පෙන්වා දෙන පරිදි ම මෙම සංවාද දෙදෙනෙකු හෝ ඊට වැඩි පිරිසක් අතර සිදු විය හැකියි (රත්නපාල, 2007: 97). බොහෝ විට පද්‍ය සංවාදය සිදු වන්නේ දෙදෙනෙකු අතර ය. 'පුරාණ ජෝඩු කවිපොත' එබඳු සංවාද කවි සරණියකට හොඳ නිදසුනකි. පද්‍ය සංවාද බොහෝ විට සිදුව ඇත්තේ තරුණ පෙම්වතුන් අතර, අඹු සැමියන් අතර, ගිහියන් හා පැවිද්දන් අතර, දෙමාපියන් හා දරුවන් අතර, රජවරුන් මැති ඇමැතියන් අතර ආදී විවිධ පිරිස් අතරේ ය. දයාපාල ජයනෙත්තිගේ 'සංවාද කාව්‍ය සංග්‍රහය' (2000) කෘතියේ මෙබඳු ජනකවි සංවාද විශාල ප්‍රමාණයක් අන්තර්ගත වේ.

අපගේ ප්‍රස්තුතය වන 'පන්නම් කවි' ද සංවාදයක් ස්වරූපයෙන් ඉදිරිපත් වන්නකි. මෙම සංවාදය සිදු වන්නේ නැන්දා කෙනෙකු සහ ලේලී කෙනෙකු අතර ය. නැන්දා හා ලේලිය අතර පවත්නේ යැයි ගැමියන්


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සිතන විරසයකයට ඓතිහාසික ආරම්භයක් දීම ද මෙම පැදි පෙළින් සිදු කෙරේ. කෙසේ වුව ද එම විරසකය සාමදාන වූ ආකාරය පද්‍ය පන්තිය අවසානයේ දැක් වේ.

'පන්නම් කවි' නම් වූ මෙම සංවාද පද්‍ය පන්තිය නාට්‍යයක් ස්වරූපයෙන් ඉදිරිපත් වන්නක් යැයි ද කිව හැකි ය. මීට අදාළ කාල අවකාශය ලොව මුල් ම රජු යැයි ගැමියන් පිළිගන්නා මහා සම්මත රජ දවස දක්වා දිවේ. සිංහල ජන සමාජයේ බොහෝ අජීවී වස්තූන්ට නිර්මාණය කර ඇති 'උප්පත්ති කථාවල' මහා සම්මත රජ සමය නිරන්තරයෙන් ප්‍රකාශ වේ. මෙරට ජන විශ්වාසවලට අනුව බොහෝ අජීවී වස්තූන්ට ද නිශ්චිත උපතක් ඇත. ඒ අනුව දෙහි උපත, ගිරා උපත, සළු උපත ආදී උප්පත්තීන් ගණනාවකි. ශාන්ති කර්මවල දී ප්‍රමුඛ වශයෙන් මෙම උපත් පිළිබඳ කවි ගායනා කරනු ලබන අතර එම කවිවලට අනුව මෙලොව බොහෝ අජීවී දේ මහා සම්මත රජ දවස සිදු වූ සිදුවීමකින් අනතුරු ව ඉපදී ඇත. පන්නම් කවිවලින් පැවසෙන්නේ 'පැදුරේ උපත' සිදු වූ ආකාරය පිළිබඳව යි. අපේක්ෂා කළ යුතු පරිද්දෙන් ම පැදුරේ පහළ වීම ද මහාසම්මත රජ දවස දක්වා ගෙන යෑමට ගැමියා සමත් වෙයි.

පන්නම් කවිවලින් මුල් කොටස වෙන් වන්නේ මහා සම්මත රජ දවස පැදුරේ උපතට අදාළ ව සිදු වූ දෑ ප්‍රකාශ කිරීමට යි. ඒ අනුව මහා සම්මත රජුගේ යහනට පැදුරක් නොවී ය. එය දුක් ගන්නා මැතිගේ අවධානයට ලක් කරන ලදී. එම අමාත්‍යවරයා ද පැදුරු වියන්නට දන්නා ගැහැනුන් සිටින ගම්වලට ගොස් මහා සම්මත රජුට ගැළපෙන පැදුරක් වියාගෙන එන ලෙස එම ගැහැනුන්ට දන්වයි.

එතැන් පටන් ඇරඹෙන්නේ ගැහැනුන් පැදුරු විවීමට යුහුසුලු වූ ආකාරය යි. පැදුරු කර්මාන්තයේ මුල් ම අංගය වන පන් කැපීම මෙහි මුලින් ම නිරූපණය වේ. දරුවන් සිටින ගැහැනුන් පන් කැපීමට යෑමේ දී ඇති විය හැකි ගැටලු ද පැවසේ. පන් කපන කාන්තාවන්ගේ රූප ස්වභාවය හෙවත් නාරි ලාවණ්‍යය වර්ණනා කිරීමට ද කතුවරයා මෙය අවස්ථාවක් කර ගනී යි. සිංහලයන් අතර බොහෝ සෙයින් ජනප්‍රිය ''ගාන තෙල් සඳුන් වරලස ඔමරි කොට- මූන පුරා තෙල් ගාගෙන යන කලට'' (15 කවිය) යන කවිය ද ඇත්තේ කාන්තාවනගේ පන් නෙළීමට අදාළ ව මෙම පද්‍ය පන්තියේ ය. පන් නෙළා ගෙදරට ගෙන ඒමෙන් පසු ඉරූ පන් වියළා පැදුරු විවීම ආරම්භ කෙරේ. සායම් කරන ලද පන් සහිත ව විවිධ විසිතුරු රටාවලට පැදුරු විවීම සිදු වේ. මහා සම්මත රජුගේ අවශ්‍යතාවට පැදුරු ලබාදීම සිදු වන්නේ ඉන් අනතුරුව ය. එහි දී නැන්දාගේ හා ලේලියගේ පැදුරු විවීමේ හැකියාවට ඇතෙක් බරට වස්තුව හිමි වේ. දවස් පතා පැදුරු වියමින් මහා සම්මත රජුට පිළිගන්වන ලෙසට ඉල්ලීමක් ද සිදු කෙරේ. කෙසේ වතුදු නැන්දා හා ලේලිය අතර විරසකය ඇති වන්නේ ඇතෙක් බරට ලද වස්තුව බෙදා ගැනීමට යෑමේ දී ය. එම වස්තුවෙන් අඩක් ලේලිය සිය නැන්දණියගෙන් ඉල්ලා සිටිය ද නැන්දණිය එය දීම ප්‍රතික්ෂේප කිරීම මෙම විරසකයේ ඇරඹුම වේ.

"පිනක් පෙර නිසා මෙය ලැබුණි අප හට
අඩක් දෙන්න නැද්දේ ඉන් මෙමා හට
මෙකක් කියනවද මොන තැගි ද නුඹට
එවක් පටන් දෙදෙනගෙ සිත විය කහට"
(35 කවිය)

එම විරසකය හේතුවෙන් නැන්දා හා ලේලිය තරගයට පැදුරු වියන්නට පටන් ගනිති. පැදුරුවල දක්නට ලැබෙන රටා පිළිබඳ හොඳ අවබෝධයක් එම කවිවලින් ලැබේ. නැන්දා සිය පැදුරේ සාවෙකුගේ රටාවක් වියන විට සාවාට අභියෝගයක් ලෙස සිවලෙකුගේ රුවක් වියන්නට ලේලිය උත්සුක වෙයි.

"චන්ද්‍රමඩල උඩ ගුවනේ තියෙ න්නේ
මන්ත්‍රිකාමි මද යුදයට ලොබි න්නේ
සුන්ද වඩන සිව්පාවෝ බොල න්නේ
ඒවා බලන්නට ලේලිට විය දු න්නේ"
(44 කවිය)

"පණ්ඩිත කෙනෙකි සිව්පාවෙකි මම විය නා
මිතුරු කෙනෙකි කුර සතරකි ඉඳ පුර නා
සතුරුකමකි නැත උඹ වෙත මම උර නා
සාවා කන්ට සිවලෙක් නැන්දට විය නා"
(45 කවිය)

මෙසේ මුවෙකු වියන විට ඊට එරෙහිව දිවියෙකු ද, ඇතෙකු වියන විට එයට එරෙහි ව සිහ රජෙකු ද කුකුලෙකු වියන විට කොළ දිවියෙකු ද ආදී ලෙස විවිධ සිවුපා රූප පැදුරු රටාවන් ලෙස නිර්මාණය කරනු ලැබේ.

"මුවා රුවැති ලේලිට පෙනුමට විය නා"
(46 කවිය)
"මුවා කන්ට දිවියෙකු නැන්දට විය නා"
(47 කවිය)
"ඇතා බලන්නට ලේලිට විය දු න්නේ"
(48 කවිය)
"ඇතා කන්ට සිහ රජ නැන්දට විය නා"
(49 කවිය)

මේ තරගය බෝ මැඩ විදුරසුනේ මරසෙන් පරාජය විවීම දක්වා ගොස් අවසන් වන්නේ නැන්දා හා ලේලිය සමගි වීමෙනි. මෙසේ පැදුරු කර්මාන්තය ගැන පැවසෙන මෙම පැදි පෙළ කෙළවරට පැමිණෙන්නේ ආගමික කූට ප්‍රාප්තියකිනි. බෝමැඩ මාර පරාජයෙන් පසු ව බෝසතාණන් බුද්ධත්වය සාක්ෂාත් කළ අතර ඉන් අනතුරුව ධර්මය ලොවෙහි පැතිරිණ. ධර්මය ලොවෙහි පැතිරී ඇති කල විරසකයෙන් පළක් නැත. සැරවැර නොවී මිතුරුකමින් සදා පවතින්නට කතා කරගන්නා මේ නැන්දා හා ලේලිය මතු භවයක එක ම මව් කුසක උපදිමු යැයි ද ප්‍රාර්ථනා කරති.

## දත්ත විශ්ලේෂණය

### පන්නම් කවිවලින් පැවසෙන පන් කර්මාන්තයේ ස්වරූපය හා සාම්ප්‍රදායික ඥානය

පන්නම් කවි එකතුව වනාහි සාම්ප්‍රදායික පන් කර්මාන්තය පිළිබඳ ඥාන සංචිතයකි. පන් නෙළීමේ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පටන් පැදුරු වියා අවසන් වන තෙක් සිදුවන ක්‍රියාකාරකම් සියල්ල මෙහි නිර්මාණාත්මක ව ඉදිරිපත් කර තිබේ. කවිවල සඳහන් පන් කර්මාන්තයට අයත් බොහෝ පාරිභාෂික පද අද දිනයේ අභාවිත ය. ඇතැම් ඒවායෙහි තේරුම් ශබ්දකෝෂවල ද හමු නොවේ. කෙසේ වෙතත් මෙරට ගැමි ගැහැනුන් අත වැඩුණු නිර්මාණශීලී කර්මාන්තයක් වූ පන් කර්මාන්තය පිළිබඳ සාර පූර්ණ චිත්‍රයක් මවා ගැනීමට මෙම පැදි පෙළ අපට උපකාරී වෙයි. පන්නම් කවිවලින් හෙළිවන අතීත පන් කර්මාන්තයේ ස්වරූපය පිළිබඳ පහත සඳහන් අනුමාතෘකා ඔස්සේ සාකච්ඡා කළ හැකි ය.

### * සාමූහික කාන්තා නියෝජනය

පන්නම් කවිවලින් පැවසෙන පරිදි පන් කර්මාන්තය හුදෙකලා එකක් නොව කාන්තාවන් සාමූහික වශයෙන් සහභාගී වූ කර්මාන්තයකි. එහි දී ඔවුන් සූදානම් වී ඇත්තේ චමත්කාරජනක අන්දමට ය. පන් නෙළීමට පෙර ඇතැම්හු වරළ මුදා ඉස ඔපකර බැඳ ගත්තෝ ය (8 කවිය). තවත් අය සුදු සේල ඇඳ ගත්තෝ ය (13 කවිය). වෙනත් පිරිස් වරලස තෙල් සඳුන් ද මුහුණෙහි තෙල් ද ආලේප කර ගත්තෝ ය (15 කවිය). පන් නෙළීම දැඩි අව්රශ්මියේ ද සිදු විය හැක්කක් බැවින් මෙසේ තෙල් ආලේප කරගෙන යෑම ශරීර අලංකරණය පිණිස පමණක් නොව අව්වෙන් විය හැකි පිළිස්සීම් අවම කර ගැනීමට යෙදූ උපක්‍රමයක් වන්නට ද ඇත. කෙසේ වතුදු පන් නෙළීමට කාන්තාවන් පිවිසියේ සාමූහික ලෙස යි. ''පෙමා වඩන සොඳ පද අහපන් නැනේ- උමා වඩන සත් දෙන සමගින් යන්නේ'' (14 කවිය) නම් අවස්ථාවේ පන් නෙළීමට යන කාන්තාවන් සත් දෙනෙකු පිළිබඳ කියැවේ. උනුන් කථා බස් කරමින්, එකිනෙකාට උදව් කර ගනිමින් සැහැල්ලුවෙන් පන් නෙළීමෙහි නිරත වූ බව මේ කවිවලින් හෙළිදරවු වේ.

### * පන් නෙළීමට ඇති බාධා

පන් නෙළීමට ඇති ප්‍රධාන බාධාවක් ලෙස මෙම කවිවලින් පැවසෙන්නේ බිළිඳුන් සිටින මව්වරුන්ට එම කර්මාන්තය සඳහා සහභාගී වීමට ඇති දුෂ්කරතාව යි. බොහෝ විට ස්වාමියා වෙනත් රැකියාවක් සඳහා වෙනතක ගොස් සිටින විටක තමා ඇසුරේ සිටින බිළිඳුන් තනිකර යෑමට මෙම මව්වරු අකමැති වෙති. ''මන්ද නගේ ඇයි කල් පසු කරන්නේ-යන්ඩ මෙලහකට දරුවා අඬන්නේ'' (17 කවිය) යන අවස්ථාව දරුවා නිවසෙහි දමා පන් කැපීමට ගිය මවකගේ සිතුවිල්ලකි. දරුවන් ඇති ඇතැම් මව්වරු සිය යෙහෙළියන් හා පන් නෙළීමට යෑම ප්‍රතික්ෂේප කර ඇති බව ''ගොසින් පන් කපා එන්නේ සවසකට- කවුද නගේ දරුවට කිරි පොවන්නට'' (12 කවිය), ''වඩලා තියන්නට බැරි කිරි බොන දරුවා- ඇරලා යන්ට බැරි මගෙ සුරතල් දරුවා'' (13 කවිය) යන අවස්ථාවලින් හෙළි වේ. මේ අන්දමට සිය දරුවන්ගේ ආරක්ෂාව සියල්ලට වඩා ප්‍රමුඛ බව සිතන උත්තරීතර මව්වරුන් පිරිසක් ද පන්නම් කවිවලින් හමුවෙයි. දරුවන් සිටින මව්වරුන්ට පමණක් නොව ගර්භිණී මව්වරුන්ට ද පන් නෙළීමට යෑම දුෂ්කර වූ බව තවත් කවියකින් ප්‍රකාශ කෙරේ ඇත.

"සත් මසකට ඇති දරුවා පිළිසිඳලා
චිත්‍ර රුවින් ළමැදේ ගෝමර ඉසිලා
ගස්සා වෙයි කැපුවොත් පන්විල බැසලා
එපා යන්ඩ කී මගෙ හිමි මට බැනලා"
(10 කවිය)

මෙහි එන මව මාස හතක ගැබිණියකි. ඇය ද සිය යෙහෙළියන් හා පන් නෙළීමට යෑමට සූදානම් වුව ද එහි දී සැමියාගේ විරෝධය එල්ල විය. සැමියාගේ භීතිය වූයේ සිය සත් මස් ගැබිණි බිරිඳ පන් විලට බැස පන් නෙළීම අනතුරු දායක බවයි. එමගින් දරු ගැබ 'ගබ්සා විය හැකි බවට' (ගස්සා වෙයි) හෙතෙම අනතුරු අඟවයි. එසේ හෙයින් ඇයට නිවසේ නතර වීමට සිදු වේ. මේ අනුව ස්වකීය බිරින්දෑවරුනට සේ ම අනාගතයේ උපදින දරුවනට ද මහත් සෙනෙහෙ ඇති පියවරුන් ද පන්නම් කවිවලින් හමු වේ. මෙය මෙරට ජන විඥානයේ පොදු ස්වභාවයක් ලෙස ද ගත හැකියි. දෙමාපියන් අවදානම් ක්‍රියාවලින් වැළකී සිටින්නේ හුදෙක් තමාගේ ජීවිත ආරක්ෂාව සලකමින් පමණක් නොව තමාගේ දරුවන් ගැන ද කල්පනා කරමිනි. පන් කර්මාන්තයට දී ද එය නොවෙනස් ව පවතී යි.

### * පන් නෙළීම සඳහා භාවිත කරන සුවිශේෂ ආයුධය: පන් කැත්ත

ගොයම් කැපීමට මෙරට වැසියා යොදා ගන්නා ආයුධය 'දෑ කැත්ත' වන විට කුරක්කන් කැපීමට 'කුරක්කන් කැත්ත' යොදා ගැනීම දක ගත හැකියි. පන් නෙළීම ආශ්‍රිත මේ කවිවල පැවසෙන විශේෂිත ආයුධය 'පන් කැත්ත' නම් වේ (ඡායාරූප අංක 01 බලන්න).

"පෙමා වඩන **පන් කැති** සුරතට ගන්නේ"
(08 කවිය)
"සුබා රුවින් අඟනෝ **පන් කැති** රැගෙන"
(16 කවිය)

පන් කර්මාන්තය අභාවයට යෑමත් සමඟ පන් කැත්තේ උපයෝගිතාව ද සමාජයෙන් තුරන් වෙමින් පවතියි. බොහෝ විට අනාගතයේ දී මේ ආකාරයේ ජනකවිවල පමණක් එම ආයුධය පිළිබඳ තොරතුරු ශේෂ වී පවතිනවා වන්නට පුළුවන.

### * පන් නෙළීමෙන් පසු සිදු වන ක්‍රියාකාරකම්

ගැමි කාන්තාවන් විසින් පන් නෙළා ගත් පසු සිදු කරන සෙසු ක්‍රියාකාරකම් ද පන්නම් කවිවල විස්තර කර ඇත. පන් කැපූ පසු එම පන් මිටි බැඳීම සිදු වේ. එම මිටි නිවාසවලට ගෙන ඒම සිදු වන්නේ ද ගැමි කාන්තාවන්ගේ හිස මතිනි. එසේ සිදුවන ක්‍රියාකාරකම් පියවරින් පියවර කවිවලින් විස්තර වන්නේ මෙපරිද්දෙනි.

"පන් බැඳලා මිටි අරගත්තුය ඉසට
යන් කියලා අඟනෝ සැදුණේ රුවට
මන් බැසලා අඟනෝ සැදුණේ රුවට
පන් ඉරලා වියමුව පැදුරක් එවිට"
(18 කවිය)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

"ගෙනත් එපත් අව්වේ ලා වේලමින
නොබා පන් ඉරති අඟනෝ වෙනින් වෙන"
(19 කවිය)

"පුරා කොනින් ලද පැදුරක් පුරන්නේ
ඉරා එපත් ගෙන සායම් පොවන්නේ"
(21 කවිය)

මිටි බඳින ලද පන් නිවසට ගෙන ඒමෙන් පසු ව ඒවා අව්වේ වියළා ඉරා ගෙන සායම් පෙවීම සිදු කරනු ලැබේ. සාමාන්‍ය පැදුරක් විවීම ඕනෑම ගැමි කාන්තාවකට හැකි දෙයක් වුවත් සායම් කරන ලද කොළවලින් විවිධ රටා සහිත ව විවීමට නම් විශේෂ ප්‍රාගුණ්‍යයක් අවශ්‍ය කෙරේ. එකිනෙක පරයන විවිධ ආකර්ෂණීය රූප පැදුර මත මැවීම සැබැවින් ම දක්ෂතාවකි. පැදුරු කර්මාන්තයේ දී දක්නට ලැබෙන රටා ගණනාවක් ස්වර්ණා ඉහළගම සිය **'පැදුර හා සිංහල ජන ජීවිතය'** කෘතියේ දී පෙන්වා දෙයි. අඩි රටාව, ඉරි රටාව, දිය රැල්ල රටාව පහන් කූඩු රටාව ආදී රටා හතළිස් හයක් එහි සඳහන් ය (ඉහළගම, 1997: 66-67). කෙසේ නමුත් මෙම පර්යේෂිකාව ඡායාරූප මගින් පෙන්වා දීමට සමත් වන්නේ එම අතුරින් කිහිපයක් පමණි. ''අවුල් හැරේ රටාව, වංකගිරිය රටාව, නයි පොරේ, ලේන්සු රටාව, මකුළුවා රටාව, පිච්ච මල් රටාව, මුවා රටාව, සමදරා මල් රටාව, මාස දොළහේ රටාව, 'ර' රටාව'' ආදිය එසේ ඡායාරූප සහිත ව දක්වා ඇත (ඉහළගම, 1997: 104-108). පන්නම් කව්වලින් හෙළි වන පුරාණ පැදුරු රටාවන් පහත පරිදි ය.

- දෙපත් රටාව (19 කවිය)
- හරස් රටාව (40 කවිය)
- පියුම් රටාව (41 කවිය)
- හුනුවැල් දගේ (42 කවිය)
- ලනුගැට පොහොට්ටුව (42 කවිය)
- රත්මල් පොහොට්ටුව (43 කවිය)

මෙම රටාවලට අදාළ කිසිදු ඡායාරූපයක් ස්වර්ණා ඉහළගමගේ පර්යේෂණයේ දක්නට නොවීමෙන් පෙනී යන්නේ ඇය සිය පර්යේෂණය කරන විටත් පැදුරු වියන මෙම ක්‍රම අභාවයට ගොස් තිබූ බවයි. පැදුරු රටා හැරුණු කල සුවිශේෂ පැදුරු වර්ග කිහිපයක නම් ද පන්නම් කව්වල හමු වේ.

- සමයන් පැදුර (19 කවිය)
- හවඩි දඟ පැදුර (43 කවිය)
- මරසෙන් පැදුර (52 කවිය)

මෙම පැදුරු වර්ග අතුරින් දෙවන සහ තෙවන වර්ගය අද දින අප්‍රකට නමුත් සමයන් පැදුර පිළිබඳ විස්තරයක් **'පැදුර හා සිංහල ජන ජීවිතය'** කෘතියේ හමු වේ.

> ''ශාන්ති කර්මවල දී පැදුර භාවිතවීමේ දී ඒ සඳහා වෙන ම පැදුරක් විවීම සාමාන්‍ය ස්වභාවය යි. එය **සමයන් පැදුර** යන විශේෂ නාමයකින් හැඳින් වේ. එය විවීමේ දී ද යම් යම් චාරිත්‍ර අනුගමනිත ආකාරය විවිධ ශාන්ති කර්මවල දී කියවෙන පැදුර පිළිබඳ කව්වලින් හෙළි වේ'' (ඉහළගම, 1997: 87).

මෙරට ශාන්ති කර්මවල දී ශුද්ධ පවිත්‍රභාවය විශේෂයෙන් 'කිලි' ආදී සංකල්ප ගැන විශාල අවධානයක් යොමු කෙරේ. මෙහි එන සමයන් පැදුර ඉතා පවිත්‍ර ලෙස, කිලි ආදියට හසු නොවී පිළියෙල කර ගන්නා ලද්දක් විය හැකි ය.

*** පැදුර මත ඇඳෙන විවිධ රූ සොබා**

පැදුර මත ඇඳෙන විවිධ රූප පැදුරට අමුතු අලංකාරයක් එක් කරන්නක් වන අතර ම එය වියන්නියගේ නිර්මාණශීලීත්වය ද පිළිබිඹු කරන්නකි (ඡායාරූප අංක 02 බලන්න). එවැනි අලංකාර රටාවන් පහත පරිදි හඳුනාගත හැකිය.

| මල් රටා | සත්ත්ව රූප | ජ්‍යාමිතික මෝස්තර |
|---|---|---|
| සමදරා මල් රටාව<br>අටපෙතියමල් රටාව<br>නෙළුම්මල් රටාව<br>මිරිස්මල් රටාව<br>නවම්මල් රටාව | හංස පූට්ටුව<br>මකුළුවා රටාව<br>නයිපෙන රටාව<br>මුව රටාව | වංගගිරිය<br>මහකෙළි රටාව<br>ලේන්සු රටාව<br>වෙල්ලවැහුම් රටාව<br>බඳුලු රටාව<br>දියරැල්ල රටාව<br>පන්නම් කුර රටාව<br>මහලණු දගේ රටාව<br>පනාලැලි රටාව<br>කතිර රටාව |

හණ කෙඳි ආශ්‍රිත දුම්බර කළාල නිර්මාණයන් හා බැඳුණු රටා මෝස්තර සිරිත් විරිත් සම්ප්‍රදායක් වෙන ම ම පවතියි. දුම්බර කළාල සඳහා යොදන මෝස්තර ලෙසට,

- කොරොස් පෙත්ත
- රත්වත්තේ අලංකාරය
- තාරාවා
- දෙපට ලණුව
- තාරකා පෙත්ත
- තුන්පට ලණුව
- මල් ගහ
- කුරුළු ගහ
- නයි මෝසතරය (නාගොඩවිතාන, 2010: 262)

පන්නම් කව්වල දී ද පැදුර මත ඇඳෙන එබඳු රූ සටහන් ගණනාවක් පිළිබඳ විස්තර හමු වේ.

බොහෝ විට පැදුරක අලංකරණය පිණිස යොදා ගෙන ඇත්තේ සත්ත්ව රූප බව පන්නම් කව්වලින් පැහැදිලි වෙයි. ඒ සතුන් අතර සිවුපාවුන් සේ ම පක්ෂි විශේෂ ද හඳුනා ගත හැකියි. සර්පයන් ආදී සතුන්ගේ රූප ගැන ද ඇතැම් තැනක සඳහන් වේ. ගෝමර ඇත්තු, ඇතුන් අසුන්, නයි පොළඟුන්, වලිග ඇති ලේනුන්, සාවුන් මුවන්, කුකුළන් කොළ දිවියන් ආදී සත්තු මෙම කව්වල ප්‍රමුඛ ව සිටිති. ගිරා, මලිති, කොබෙයි ආදී පක්ෂීහු ද වෙති. මේ හැරුණු කල මල් පෙති මෝස්තර ද දක්නට ලැබේ.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

"වියලා මල් පෙති සහ ගෝමර ඇත්තු
දඟලා පෙළින් පෙළ නයි පොළඟුන් සත්තු"
(22 කවිය)

"හරස් රටාවෙන් පැදුරක් මම වියනා
ගිරා කොබෙයියෝ පැදුරේ මැද වියනා"
(40 කවිය)

"පියුම් රටාවෙන් පැදුරක් මම වියනා
ලඳු වැසි වලඟ ඇති ලේනුන් මැද වියනා"
(41 කවිය)

මේ ආකාරයට පැදුරේ අලංකාරයට සොබා දහමේ විවිධ විසිතුරු මල් වර්ගවල රූප මෙන් ම සත්ත්ව රූපාදිය ද යොදා ගැනීමට ද මෙරට ජනයා කටයුතු කළ බව පැහැදිලි වෙයි. අද මෙන් යන්ත්‍ර සූත්‍ර ඇතුළු තාක්ෂණික මෙවලම් නොවූ අවධියක ඉවසීමෙන් යුතු නිර්මාණශීලී ගැමි ගැහැනුන් සිය දෑතේ මහන්සියෙන් කරගෙන ආ මේ කර්මාන්තය වර්තමානයෙහි බොහෝ සෙයින් අභාවයට ගොස් ඇතත් මෙබඳු ජන කවි පන්ති තුළ එම අතීත ඥානය වැළලී නොගොස් තවදුරටත් ආරක්ෂාව පවතී. පන් ආශ්‍රිත ව නිර්මාණය කරන පැදුර වනාහි සම්පූර්ණයෙන් ම පරිසර හිතකාමී වූවකි. වත්මනෙහි පැදුර වෙනුවට පැමිණ ඇති බොහෝ ආදේශක කෘත්‍රිම ඒවා වන අතර බොහෝ විට පරිසරයට ද එමගින් හානි විය හැකි ය. තව ද පන් කර්මාන්තය ආශ්‍රිත ව පැවැති සාමූහික ක්‍රියාකාරකම් සමාජ සහජීවනයට හා ඒකාබද්ධතාවට අතිශයින් අදාළ ය. එම කර්මාන්තය බිඳ වැටීමත් සමග සිදු වූයේ තවත් සාම්ප්‍රදායික කර්මාන්තයක් අහිමි වීම පමණක් නොව නිර්මාණශීලී ගැමි ගැහැනුන්ට සිය හැකියාවන් පෙන්වීමට තිබූ අවකාශයක් ද ඇහිරී යෑම ය.

## නිගමනය

පුරා විද්‍යාත්මක පර්යේෂණවල දී බොහෝ විට නිගමනවලට පැමිණෙනුයේ අතට දැනෙන හෙවත් ස්පර්ශනීය (Tangible) සාධක පදනම් කර ගනිමිනි. ඒ අනුව යම් පුරාවස්තුවක් කාල නිර්ණය කර නිගමනවලට එළඹීම සිදු වේ. තවත් විටෙක සෙල් ලිපියක් බඳු දෙයක් නම් එහි සඳහන් කරුණු නිශ්චය කර ගත් පසු නිගමනවලට එළඹීම සිදු කෙරේ. එහෙත් මෙම ක්‍රමවලට අමතර ව නිගමනවලට එළඹිය හැකි තවත් ව්‍යතිරේක ක්‍රමයක් ද ඇති බව පෙනී යයි. එනම් ජන සමාජයේ පවත්නා සාම්ප්‍රදායික දැනුම හා විශ්වාස මත පදනම් ව නිගමනයන් කිරීම යි. විද්‍යාත්මකව තහවුරු කිරීමට අපොහොසත් වූ පමණින් සාම්ප්‍රදායික ඥානය බැහැර කිරීම සුදුසු නොවේ. ඒවායෙහි ද පුරාණ තාක්ෂණයක් ගැබ් වී ඇති බැවිනි. ඒ සඳහා හොඳ ම නිදසුන නම් මේ නිබන්ධයෙහි සාකච්ඡා කරන්නට යෙදුණ 'පන්නම් කවි' සමූහය යි.

මෙරට ගැමි කාන්තාවන් අත වැඩුණ නිර්මාණශීලී, පරිසර හිතකාමී කර්මාන්තයක් ලෙස පන් කර්මාන්තය හැඳින්වීමේ වැරද්දක් නැත. පන් කර්මාන්තය ගැමි ලියන් අනිවාර්යයෙන් ම දැන ගෙන සිටිය යුත්තක් බව ''පන්නන් බැරි ගෑනු කොහොම ද රැකෙන්නේ'' යන කවි පදයෙන් හෙළි වේ. එම කර්මාන්තය ආශ්‍රිත ව කිසියම් ආකාරයක අභිචාරමය දේවල් පැවැති අතර එය අස්පර්ශණීය උරුමයක් ද වෙයි.

සාම්ප්‍රදායික පන් කර්මාන්තය ආශ්‍රිත ව බිහි වී ඇති පද්‍ය පන්ති ගණනාවකි. ඒ අතර පන්නම් කවි සුවිශේෂ වන්නේ පන් කර්මාන්තයේ ක්‍රියාකාරකම් පියවරින් පියවර ඒ තුළ නිරූපණය වීම මගිනි. පන් කර්මාන්තයට අදාළ පාරිභාෂික පද රැසක් ද මෙම කවි තුළ සංරක්ෂණය වී පවතී. ඒ ඇතැම් පාරිභාෂිකයක අදහස කුමක් දැයි අද දින හඳුනා ගත නොහැක්කේ එම දැනුම අපගෙන් සපුරා වියෝ ව ඇති බැවිනි.

අතීතයේ මෙරට පැවැති සියලු ම කර්මාන්තවලට පාහේ මෙබඳු ජන කවි, ජනශ්‍රැති නිර්මාණය වී තිබීම දැක ගත හැකි දෙයකි. අතීත ජනයා තමා කරන කටයුත්ත කුමක් වුවත් වඩාත් ආස්වාදනීය අන්දමින් පීඩනයකින් තොර ව එය සිදු කළ බවට මෙබඳු කවි ජීවමාන සාක්ෂ්‍ය වෙයි. අදාළ කර්මාන්තය කුමක් වුවත් ඒ සතුව පවත්නා සාම්ප්‍රදායික ඥානය පහසුවෙන් අනාගතය වෙත ගෙන යෑමට මෙබඳු පද්‍ය පන්ති උපකාරී වෙයි. අවසාන වශයෙන් කිව යුත්තේ සාම්ප්‍රදායික ඥානය රැගත් මෙම ජන ගායනා අපගේ පොදු උරුමයක් බවයි. එම උරුමය අතීතයට පමණක් සීමා වූවක් නොව නිර්මාණශීලී ව අද දිනයේ ද ප්‍රයෝජනයට ගත හැකි ජීවමාන උරුමයක් බව මෙහි ලා සඳහන් කළ යුතු ය.

## පරිශීලිත මූලාශ්‍රය

ඉහළගම, ස්වර්ණා. (1997). **පැදුර හා සිංහල ජන ජීවිතය,** කොළඹ, එස් ගොඩගේ සහ සහොදරයෝ.

කුමාරස්වාමි, ආනන්ද කේ. (1962). **මධ්‍යකාලීන සිංහල කලා** එච්. ඇම්. සෝමරත්න (පරි.), කොළඹ, සංස්කෘතික දෙපාර්තමේන්තුව.

පඤ්ඤාරතන හිමි, බටුගම්මන. (1967). **මඩුලුරට සිවුපද හෙවත් රසික ජන කවි**, විජයසුන්දර රත්නායක ප්‍රකාශනයකි.

නාගොඩවිතාන, රත්නපාල. (2010). **ලක්දිව අත්කම් ශිල්ප කලා,** නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.

රත්නපාල, නන්දසේන. (2007). **ජනශ්‍රැති විද්‍යාව**, කොළඹ, එස් ගොඩගේ සහ සහොදරයෝ.

සුරවීර, ඒ. වී. (2005). **සාහිත්‍ය විචාර ප්‍රදීපිකා**, කොළඹ, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සෙනෙවිරත්න, නි.බ.මා. (1989). **සිංහල කාව්‍ය සංග්‍රහය**, කොළඹ, ජාතික කෞතුකාර ප්‍රකාශන.


සෝමානන්ද හිමි, තෙරිපැහැ. (1997). **සිංහල මාල කවි සංග්‍රහය,** බත්තරමුල්ල, යුනෙස්කෝ ජාතික මණ්ඩලය.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය





ඡායාරූප අංක 01 - පන් කැත්ත
ඡායාරූපකරණය: ෂෙහාන් තිලකරත්න, 01-08-2022


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය



ලේන් ඉර රටාව



කදුරු මල් රටාව



දහයෙන් පෙත්ත රටාව



නෙළුම් මල් රටාව



වංගගිරි රටාව

ඡායාරූප අංක 02 - සාම්ප්‍රදායික පන් කර්මාන්තයේ පැදුරු විවීමේ දී නිර්මාණය කරනු ලබන රටා කිහිපයක්

ඡායාරූපකරණය: ෂෙහාන් තිලකරත්න, 21-09-2018



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහහතරවන කලාපය 2022 දෙසැම්බර්
පිටු 10-23
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# 21 වන සියවසේ ලෝක හදබිම: චීනයේ පිබිදීම ඇසුරෙන්

# (Heartland of the 21st Century: Special Reference to China)

හෂාන් විජේසිංහ[1] සහ කළිඳු රත්නායක[2]

කථිකාචාර්ය, ජාත්‍යන්තර අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය[1]
පශ්චාත් උපාධි අපේක්ෂක, භූගෝලවිද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය[2]
**sandeeprathnayaka@gmail.com**

## Abstract

British geographer Halford Mackinder proposed the concept of the Heartland in 1904 and gained more attention in international politics by the mid of the 20th century. This concept highlights the importance of Eastern Europe region and according to him, the person who controls the Eastern Europe has the ability to have more influence in international politics. However, in today's context of international relations, the factors necessary to create a Heartland are more complex compared to the factors outlined by Mackinder in the twentieth century. In such a background, the main purpose of this article is to study the current applicability of the Heartland concept presented by Mackinder and to investigate whether the Heartland presented by Mackinder has been displaced to another region with the development of the current political, economic and social aspects. Both quantitative and qualitative data were used for this research and the data were collected through secondary sources. The data collected were analyzed using thematic analysis. Due to the changes that have occurred in the international system in the 21st century, it is difficult to use the heartland concept presented by Mackinder in the 20th century in the same way. This academic article has presented some factors necessary for the creation of a Heartland in the 21st century. These are geographical factors, rapid economic growth, political stability, abundance of natural resources and population. As China has all these factors in comparison to other states, China can be identified as the heartland in today's international geopolitics. China's expansionism can be observed in Sri Lanka.

**Key Words**: Heartland Concept, Modern World Heartland, China, Geopolitics, Halford Mackinder

## සාරසංක්ෂේපය

බ්‍රිතාන්‍යය ජාතික භූගෝල විද්‍යාඥයකු වන හැල්ෆෝඩ් මැකින්ඩර් විසින් 1904 වසරේ දී ඉදිරිපත් කරනු ලැබූ හදබිම් සංකල්පය (Heatland Theory) 20 වන ශත වර්ෂයේ මැද භාගය වන විට ජාත්‍යන්තර දේශපාලනය තුළ වැඩි අවධානයක් දිනා ගැනීමට සමත් විය. එම සංකල්පයෙන් නැගෙනහිර යුරෝපානු කලාපයේ වැදගත්කම පෙන්වා දෙනු ලබන අතර ඔහුට අනුව නැගෙනහිර යුරෝපානු කලාපය පාලනය කරනු ලබන රාජ්‍යයට ජාත්‍යන්තර දේශපාලනයෙහි වැඩි බලපෑමක් කිරීමේ හැකියාවක් සතු බව පෙන්වා දෙන ලදී. කෙසේ වෙතත් වර්තමාන ජාත්‍යන්තර සබඳතා පිළිබඳ සැලකීමේ දී හදබිමක් නිර්මාණය වීමට අවශ්‍ය වන සාධක විසිවන සියවසේ දී මැකින්ඩර් විසින් ඉරිදිපත් කරන ලද සාධකවලට සාපේක්ෂ ව වඩා සංකීර්ණ වී ඇත. එවැනි පසුබිමක මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රධාන අරමුණ වන්නේ මැකින්ඩර් විසින් ඉදිරිපත් කරන ලද හදබිම් සංකල්පයේ වර්තමාන ප්‍රායෝගිකත්වය අධ්‍යයනය කිරීම හා වර්තමාන දේශපාලන, ආර්ථික හා සමාජීය අංශයන්හි දියුණුවත් සමඟ මැකින්ඩර් විසින් ඉදිරිපත් කරන ලද හදබිම වෙනත් ප්‍රදේශයකට විතැන් වී තිබේ ද යන්න පිළිබඳ ව චීනය ඇසුරින් විමර්ශනය කිරීමයි. මෙම ශාස්ත්‍රීය ලිපිය සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත භාවිත කර ඇති අතර එම දත්ත ද්විතීයික මූලාශ්‍රය මඟින් රැස් කර ගන්නා ලදී. රැස්කර ගන්නා ලද දත්ත තේමා විශ්ලේෂණය ඇසුරින් විශ්ලේෂණය කරන ලදී. 21 වන සියවසේ ජාත්‍යන්තර පද්ධතිය තුළ සිදු වී ඇති වෙනස්කම් හේතුවෙන් මැකින්ඩර් විසින් 20 වන ශතවර්ෂයේ දී ඉදිරිපත් කරන ලද හදබිම් සංකල්පය තව දුරටත් ඒ අකාරයෙන් ම භාවිත කිරීම අපහසු වන අතර අද වන විට හදබිමක් නිර්මාණය වීමට අවශ්‍ය සාධක කිහිපයක් මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ඉදිරිපත් කර ඇත. ඒවා නම්, භූගෝලීය සාධක, ශීඝ්‍ර ආර්ථික වර්ධනය, දේශපාලන ස්ථාවරත්වය, ස්වාභාවික සම්පත් බහුලතාව හා ජනගහනයයි. අනෙකුත් රාජ්‍යයන් හා සැසඳීමේ දී චීනය සතු ව මෙම සියලු සාධක ඇති හෙයින් චීනය පිහිටි භූමිය වර්තමාන ජාත්‍යන්තර භූ දේශපාලනය තුළ හදබිම ලෙස හඳුනා ගත හැකි වේ. චීනය බලවත් වීම හරහා ශ්‍රී ලංකාව තුළ ද චීනයේ ව්‍යාප්තවාදයක් හඳුනා ගත හැකි වේ.

**කේන්ද්‍රීය වචන:** හදබිම් සංකල්පය, නූතන ලෝක හදබිම, චීනය, භූ දේශපාලනය, හැල්ෆෝඩ් මැකින්ඩර්

## හැඳින්වීම

ඇමරිකානු ජාතික දේශපාලන විද්‍යාඥයෙක් වන හැන්ස් ජේ මෝගන්තෝ (Hans J. Morgenthau) විසින් වරක් සඳහන් කර ඇති පරිදි අනෙකුත් සියලු ම දේශපාලන තත්ත්වයන් සේ ජාත්‍යන්තර දේශපාලනය ද, බලය සඳහා වූ අරගලයකි. ජාත්‍යන්තර දේශපාලනය තුළ අවසාන ඉලක්ක, අරමුණු කුමක් වුව ද, සෑමවිට ම එහි ආසන්නතම අරමුණ වන්නේ බලයයි (Morgenthau, 1948). යථාර්ථවාදීන්ට අනුව ජාතීන් අතර සම්බන්ධතාවන්හි ස්වභාවය තීරණය කරන්නා වූ ප්‍රධානතම සාධකය වන්නේ බලයයි.

නිකලස් ස්පයික්මන්ට (Nicholas J. Spykman) අනුව අරාජික ජාත්‍යන්තර පද්ධතියක් තුළ විදේශ ප්‍රතිපත්තියක ප්‍රධානතම අරමුණ විය යුත්තේ, රාජ්‍යයක් සතු බලය ඒ ආකාරයෙන් පවත්වා ගෙන යාම හෝ එම බලය වැඩි කර ගැනීමයි (Spykman, 1942). මෙහි දී බලය යනු කිසියම් ස්වාධිපත්‍යය රාජ්‍යයක් සතු ස්වකීය ජාතික අභිලාශයන් දිනා ගැනීමට ඇති හැකියාවයි. ඕනෑ ම රාජ්‍යයක් සතු බලය තීරණය කරන්නාවූ ප්‍රධාන සාධකය ජාතික බලයේ මූලාංග (Elements of National Power) ලෙස හඳුන්වනු ලබන අතර සෑම රාජ්‍යයක් ම සෑම විට ම උත්සාහ කරනු ලබන්නේ තම රාජ්‍යය සතු ජාතික බලයේ මූලාංග වර්ධනය කර ගැනීමයි.

රාජ්‍යයක් සතු ස්වාභාවික සම්පත්, ජනහගනය, යුධමය ශක්තිය, ඉතිහාසය හා නායකත්වය වැනි කරුණු රාශියක් ජාතික බලයේ මූලාංග ලෙස හඳුනා ගෙන ඇති අතර මෙම සාධක අතුරින් භූගෝලීය සාධකයට සුවිශේෂ ස්ථානයක් හිමිවේ. භූගෝලීය සාධකය පිළිබඳ ව සාකච්ඡා කිරීමේ දී වරක් ස්පයික්මන් පවසා සිටියේ ඇමතිවරුන් පැමිණේවි, යාවි, ඒකාධිපති පාලනකයන් මිය යාවී, නමුත් කඳු වැටි නොසෙල්වී පවතින බවයි.


රටක භූගෝලීය සාධකය බලයේ මූලිකාංගයක් ලෙස බොහෝ විද්වතුන් විසින් පිළිගෙන ඇති අතර ස්වීඩන් ජාතික රුඩොල්ෆ් කේලන් (Rudolf Kjellen), ජර්මානු ජාතික භූ දේශපාලනය හා සම්බන්ධ විද්වතුන් වන ෆෙඩ්රිච් රැට්සල් (Friedrich Ratzel) හා කාල් හව්ස්හෝෆර් (Karl Haushofer) පවසා සිටියේ රාජ්‍යයක් සතු බලය තීරණය වන්නේ ඒ රාජ්‍යය කොතරම් දුරට භූමිය තුළ ව්‍යාප්ත වන්නේ ද යන්න මතයි. ජාත්‍යන්තර දේශපාලනය තුළ භූ දේශපාලනය වැඩි වශයෙන් කතාබහට ලක්වන්නේ, භූගෝලීය සාධකයෙහි පවතින්නා වූ ඉහත සඳහන් කළ වැදගත්කම හේතු කොට ගෙන ය (Cohen, 2015). සරල ව සඳහන් කළහොත් භූ දේශපාලනය යනු කිසියම් රටක භූමි ප්‍රමාණය, පිහිටීම, වැනි සාධක එක් එක් රාජ්‍යයන්හි බලයට බලපෑම් කරන ආකාරය අධ්‍යයනය කිරීමයි.

## සාහිත්‍යය විමර්ශනය

19 වන සියවස පමණ වන විට විශේෂයෙන් ම අධිරාජ්‍යවාදී රාජ්‍යයන් යටත් විජිත සඳහා යෙදී සිටි අරගලය හේතුකොට ගෙන භූ දේශපාලනය හා එහි වෙනස්වීම් පිළිබඳව විවිධ විද්වතුන් විසින් විවිධ අදහස් ප්‍රකාශ කරන්නට විය. ෆෙඩ්රිච් රැට්සල් විසින් 19 වන සියවසේ දී ඉදිරිපත් කරන ලද රාජ්‍යයන් පිළිබඳ ව ඓන්ද්‍රීය න්‍යායට අනුව (Organic theory of states) රාජ්‍යය ද, සාමාන්‍යය ජීවියකු මෙන් උපත, වර්ධනය, හා විනාශ වීම යන අවධීන් පසු කරනු ලබයි. මෙහි දී රාජ්‍යයක වර්ධනය යන්නෙන් ඔහු සඳහන් කරන්නේ යම් රාජ්‍යයක් තම දේශසීමා පුළුල් කරගනිමින් එම රාජ්‍යය ශක්තිමත් කර ගැනීමයි. ඇමරිකානු නාවික හමුදාවේ උසස් නිලධාරියකු වූ ඇල්ෆඩ් මහන් (Alfred Mahan) විසින් 1890 වසරේදී රචනා කරන ලද "ඉතිහාසය කෙරෙහි සාගරයේ බලපෑම"-1660-1783 (The Influence of Sea Power Upon History 1660-1783) කෘතියට අනුව භූ උපායමාර්ගයන්හි ප්‍රබලතම සාධකය වන්නේ සාගරික බලයයි. එහි දී ඔහු විසින් ඉදිරිපත් කරන ප්‍රධානතම නිදසුන වන්නේ මහා බ්‍රිතාන්‍යයි. කෙසේ වෙතත් 1904 වසරේ දී ලන්ඩනයේ රාජකීය භූගෝලවිද්‍යා සංගමයට ඉදිරිපත් කරනු ලැබූ "ඉතිහාසයේ භූගෝලීය කේන්ද්‍රය" (The Geographical Pivot of History) නැමති ලිපිය මගින් බ්‍රිතාන්‍ය ජාතික හැල්ෆෝඩ් මැකින්ඩර් (Halford Mackinder) විසින් භූ දේශපාලනය පිළිබඳ ව නව සංකල්පයක් ලොවට ඉදිරිපත් කරන ලදි. මෙම සමයෙහි ජාත්‍යන්තර දේශපාලනය තුළ පිළිගත් මතය වූයේ සාගරය පාලනය කරන්නේ යම් රාජ්‍යයක් ද, එම රාජ්‍යයට ලෝකය පාලනය කළ හැකි බවයි. කෙසේ වෙතත් මෙම අදහසට අභියෝග කරමින් මැකින්ඩර් පවසා සිටියේ සාගරික කලාපවලට වඩා ගොඩබිම් කලාප තුළ තම බලය වර්ධනය කර ගැනීමට රාජ්‍යයන් කටයුතු කළ යුතු බවයි. මෙහි දී ඔහු විසින් නැගෙනහිර යුරෝපානු කලාපයට සුවිශේෂ වැදගත්කමක් ලබා දී තිබේ (රූප සටහන් අංක 01).


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

රූප සටහන් 01 : 1904 දී මැකින්ඩර් විසින් දක්වන ලද ලෝක හදබිම




මූලාශ්‍රය - Wilkinson et al.1904

ඔහුට අනුව මෙම නැගෙනහිර යුරෝපානු කලාපය භූ දේශපාලනික හා භූ උපායමාර්ගික වශයෙන් වැදගත් වීමට කරුණු රාශියක් බලපා ඇත. එම කරුණුවලින් ආරක්ෂාව යන සාධයකට සුවිශේෂ ස්ථානයක් හිමිවේ. මෙම කලාපය වඩා ආරක්ෂිත කලාපයක් බවට පත් වීමට පහත කරුණු ඉවහල් වී ඇත.

- ආක්ටික් සාගරය මතින් යුද හමුදාවකට නාවික මග ඔස්සේ ප්‍රවේශ වීමට ග්ලැසියර්වලින් ගහන ආක්ටික් සාගරය අවකාශයක් ලබා නොදීම,
- යුරෝපය වැනි ස්වාභාවික රාජ්‍ය බහුල බිමක් මතුපිටින් පාබල හමුදාවක් යැවීම දුෂ්කර වීම,
- ඉන්දියානු සාගරය හරහා ආසියාවට ප්‍රවේශ වන්නේ නම් එය ද යුරෝපය මෙන් ම බෙදී ගොස් නැතත් ජාතිවාදී දේශප්‍රේමී බහු ජාතික රාජ්‍යයන් ගොන්නක් මතින් යාම දුෂ්කර වීම,
- පැසිපික් සාගරය හෝ බීජිං සමුද්‍ර සන්ධිය උපයෝගී කරගත් විට මහා සයිබිරියානු තැන්න මතින් ගමන් කිරීම ඔවුන් අතරමං වීමට හා පාබල හමුදා අනවශ්‍ය වෙහෙසකට පත් වීමට ඇති හැකියාව ,
- උතුරු අක්ෂාංශීය ග්ලැසියර් ගහන සාගරය, යුරල (Ural), කාර්පේතියන් කඳු (Carpathian Mountains), පාමීර් සානුව (Pamir Plateau), හා හිමාලය කඳු පද්ධත (Himalayan Mountain Range), ගෝබි කාන්තාරය (Gobi Desert) සයිබීරියන් තැන්න (Siberian Plain) ආදියෙන් හදබිම ස්වාභාවික ව ආරක්ෂා වීම, යම්කිසි අවස්ථාවක ආක්‍රමණයක් සිදු වුවත් එම කලාපයේ ඇති අන්තගාමී දේශගුණික තත්ත්වයන් හේතුවෙන් ආක්‍රමණික රාජ්‍යයට ඉතා පහසුවෙන් එම කලාපය ආක්‍රමණය කිරීමට අපහසු වීම
- හදබිමට ප්‍රවේශ විය හැකි මාර්ග අතලොස්සක් අතුරින් බෝල්ටික් මුහුද) Baltic Sea( හා කාපේතියන් කඳු ආශ්‍රිත ප්‍රදේශයන් වැදගත් වුව ද ඒවා ද පිහිටා තිබෙන්නේ හදබිමට වාසි වන අයුරිනි.

මේ කරුණු සියල්ල සැලකිල්ලට ගනිමින් මැකින්ඩර්(1919) ***"නැගෙනහිර යුරෝපය පාලනය කරන්නා හදබිම මෙහෙයවන බවත්, හදබිම පාලනය කරන්නා ලෝක දිවයින මෙහෙයවන බවත්, ලෝක දිවයින පාලනය කරන්නා ලෝකය ම මෙහෙයවන බවත්"*** උපකල්පනය කරන ලදි.

ඔහු විසිවන සියවසේ මුල් කාලයේ දී පුරෝකථනය කළ මෙම සංකල්පය පශ්චාත් දෙවන ලෝක යුද්ධ සමයෙහි යථාර්ථයක් බවට පත් විය . ඒ සෝවියට් දේශයේ නැගී සිටීමත් සමග ය. බොහෝ විද්වතුන්ට අනුව හැල්ෆෝඩ් මැකින්ඩර්ට විසින් පශ්චාත් දෙවන ලෝක යුද්ධ සමයෙහි සෝවියට් දේශයෙහි පිබිදීම පුරෝකථනය කර ඇත.

කෙසේ වෙතත් වර්තමාන ජාත්‍යන්තර පද්ධතිය දෙස අවධානය යොමු කරන විට චීනයේ පිබිදීම ඉතා සුවිශේෂ වේ. අද වන විට චීනය ලෝක දේශපාලනය තුළ ඉතා බලවත් ස්ථානයකට පැමිණ ඇති අතර චීනයේ බලයට අභියෝග කිරීමට අන් කිසි ම රාජ්‍යයකට හැකියාවක් ලැබී නැත. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් අවධානය යොමු කරනු ලබන්නේ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

චීනයේ මෙම පිබිදීම භූ දේශපාලනික ප්‍රවේශයකින් පැහැදිලි කිරීමයි. මෙහි දී ප්‍රධාන තර්කය වන්නේ මැකින්ඩර් විසින් ඉදිරිපත් කරන ලද හදබිම අදවන විට නැගෙනහිර ආසියාව දෙසට නැතහොත් වර්තමාන චීනය පිහිටා ඇති භූමි ප්‍රදේශයට විතැන් වී ඇති බවයි.

වර්තමාන ජාත්‍යන්තර දේශපාලනය තුළ ආසියානු කලාපයට ඉතා සුවිශේෂ ස්ථානයක් හිමිවේ. ආසියානු සංවර්ධන බැංකුව (Asian Development Bank) විසින් නිකුත් කරන ලද වාර්තාවකට අනුව 21 වන ශත වර්ෂය යනු ආසියානු ශත වර්ෂයයි. එම වාර්තාවට අනුව 2050 වන විට ලෝක නිෂ්පාදනයෙන්, වෙළඳාමෙන් හා ආයෝජනවලින් අඩකට වැඩි ප්‍රමාණයකට වඩා හිමිකම් කියනු ලබන්නේ ආසියානු කලාපයයි (ADB, 2021). මෙවැනි පසුබිමක් තුළ අද වන විට ජාත්‍යන්තර බල අරගලයේ ප්‍රධාන සටන් භූමිය බවට පත් ව ඇත්තේ ආසියානු කලාපයයි. එමනිසා ආසියානු කලාපය පාලනය කරනු ලබන රාජ්‍යයට ලෝකය තුළ තම අණසක පැතිරවීමේ වැඩි ඉඩ ප්‍රස්ථාවක් හිමිවේ (Abeysinghe & Wijesinghe, 2011). ආසියානු කලාපය මෙසේ ජාත්‍යන්තර දේශපාලනයේ කේන්ද්‍රස්ථානය බවට පත්වන පසුබිමක ලෝක බලවතුන්ගේ වැඩි අවධානයක් දිනා ගැනීමට ආසියානු කලාපය සමත් ව ඇත. කෙසේ වෙතත් චීනය ආසියානු කලාපය තුළ පිහිටීම, චීනයට ආසියානු කලාපය තුළ තම අණසක පැතිරවීමට වැඩි අවස්ථාවක් සලසා දී තිබේ. චීනයේ වර්තමාන භූ දේශපාලනික ක්‍රියාකාරකම් පිළිබඳ විමර්ශනය කිරීමේ දී, එම රාජ්‍යයේ විදේශ ප්‍රතිපත්තියෙහි සුවිශේෂ වටිනාකමක් ආසියානු කලාපයට ලබා දී තිබේ. ආසියානු කලාපයට ජාත්‍යන්තර දේශපාලනය තුළ සුවිශේෂ ස්ථානයක් හිමි වීමට බලපෑ ප්‍රධාන කාරණා හතරක් හඳුනාගත හැකි ය. ඒවා නම්,

1. ආසියානු කලාපය අත් කරගෙන ඇති ශීඝ්‍ර ආර්ථික වර්ධනය
2. ස්වාභාවික සම්පත්වල බහුලතාව
3. ඉතා කාර්ය බහුල මුහුදු වෙළඳ මාර්ග සතුවීම
4. ජනගහනය යි. ( ADB, 2011, Davidovich & Olegovna, 2018 )

මැකින්ඩර් විසින් හදබිම් සංකල්පය ලොවට ඉදිරිපත් කරන වකවානුවෙහි ජාත්‍යන්තර දේශපාලනය තුළ පැවති තත්ත්වයන් සැලකීමේ දී භූමියෙහි බලය, ස්වාභාවික සම්පත්වල බහුලතාව වැනි සාධක හදබිමක් නිර්මාණය කිරීමට ප්‍රමාණවත් වුව ද එම සාධක පමණක් නූතන හදබිමක් නිර්මාණය කිරීමට ප්‍රමාණවත් නොවේ. මන්ද අතීතයට සාපේක්ෂ ව වර්තමානය වන විට ඉතා ශීඝ්‍ර ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික දියුණුවක් සිදු වී ඇති බැවිනි.

## චිනයේ පිබිදීම


අද වන විට චීනය ලෝකයේ ඉතා බලවත් රාජ්‍යක් බවට පත් ව ඇත. එම පිබිදීම එක් දශකයකින් හෝ එක් රාජ්‍ය නායකයෙකු යටතේ සිදු වූවක් නොවේ. මීට ශතවර්ෂ කිහිපයකට පෙර ද චීනය කලාපීය බලවතෙකු ලෙස කටයුතු කර ඇති බවට ඉතිහාසය සාක්ෂි දරයි. උදාහරණයකට පස්වන හන් අධිරාජයා (Han) වන හන් වූඩි (Han Wudi) යටතේ චීනයේ ආධිපත්‍යය එවකට රෝම අධිරාජයටත් වඩා විශාල අධිරාජ්‍යයක් ස්ථාපිත කිරීමට චීනය සමත් වන අතර වර්තමානයේ කොරියාව, මොංගෝලියාව, වියට්නාමය සහ මධ්‍යම ආසියානු කලාපයේ වැඩි භූමි ප්‍රදේශයක තම බලය ව්‍යාප්ත කිරීමට චීනය සමත් විය. තව ද මේ සමයෙහි ඉතා බලවත් හමුදා ශක්තියක් මෙන් ම අනෙකුත් රටවල් සමඟ ස්ථාවර වෙළෙඳ සම්බන්ධතා ද පවත්වා ගැනීමට චීනය සමත් විය. කෙසේ වෙතත් දහනව වන සියවසේ දී මෙන් ම විසිවන සියවසේ මුල් භාගයේ දී චීනයට බාහිර පාර්ශවයන්ගෙන් විශේෂයෙන් යුරෝපීය අධිරාජ්‍යවාදී රාජ්‍යයන්ගෙන් හා ජපානයේ විවිධ බලපෑම් එල්ල වූ අතර මේ හේතුවෙන් චීනයට තමන් මෙතෙක් පවත්වාගෙන ගිය බලපෑම් කිරීමේ හැකියාව හීන විය. පළමු සහ දෙවන අබිං (First and Second Opium Wars) යුද්ධ පළමු සහ දෙවන චීන ජපාන යුද්ධය (First and Second Sino - Japanese Wars) මීට උදාහරණ වශයෙන් සඳහන් කළ හැකි ය. චීනය සහ බටහිර බලවතුන් අතර ඇති වූ පළමු අබිං යුද්ධයෙන් පසු ඇතිකරගත් නැන්ජින් ගිවිසුම (Treaty of Nanjing - 1842) හරහා චීනයට තමන් සතු හොංකොං භූමි ප්‍රදේශය අහිමි වූ අතර යුරෝපීය රාජ්‍යයන් සමඟ වෙළඳාම සඳහා තම වරායන් කිහිපයක් ද විවෘත කිරීමට සිදුවිය (එතෙක් චීනය තම ජාත්‍යන්තර වෙළඳාම සිදු කරනු ලැබුවේ එක් වරායක් භාවිත කරමිනි). මෙසේ විවිධ බාහිර බලපෑම් හේතු කොට ගෙන චීනයට ජාත්‍යන්තර දේශපාලනය තුළ තිබූ පිළිගැනීම පලුදු වූ අතර මෙම පළමු අබිං යුද්ධය සිදු වූ කාලය සහ දෙවන චීන ජපාන යුද්ධය දක්වා වූ කාල සීමාව හැඳින් වූයේ චීනය ජාත්‍යන්තර හමුවේ අපකීර්තියට පත්වූ සියවස ලෙසයි. දේශපාලනයේ නව පිබිදීමක් ඇති වූ සිදුවීමක් ලෙස 1946 -1949 කාලයේ සිදු වූ චීන කොමියුනිට්ස් විප්ලවය සහ 1949 වසරේ මහජන චීනය නිර්මාණය වීම සඳහන් කළ හැකි ය. මාවෝ සේතුං නායකත්වය යටතේ ස්ථාපිත වූ මහජන චීනය නැවත වරක් ජාත්‍යන්තර දේශපාලනය තුළ වැදගත් මෙන් ම බලවත් ක්‍රියාධරයෙකු ලෙස කටයුතු කරන්නට විය. මේ සමයෙහි චීනයේ කෘෂිකර්මාන්තය සහ කර්මාන්ත අංශය ශීඝ්‍ර වර්ධනයක් අත්පත් කර ගැනීමට සමත් වූ අතර ඒ හරහා සැලකිය යුතු ස්ථාවර ආර්ථික වර්ධනයක් ද අත්පත් කර ගැනීමට චීනය සමත් විය. කෙසේ වෙතත් චීනයේ වර්තමාන ආර්ථික ආකෘතියට අඩිතාලම දමනු ලැබුවේ 1970 දශකයේ අග භාගයේ බලයට පත්වූ ඩෙන් ෂියාඕපිං (Deng Xiaoping) යටතේ ය. මෙතෙක් චීනය සංවෘත ආර්ථික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට උනන්දු විය. නිෂ්පාදන කටයුතුවල දී විශේෂයෙන් කෘෂිකාර්මික අංශය සැලකීමේ දී එම අංශයේ රැකියාවල නියුතු පුද්ගලයන්ට තම නිෂ්පාදනයන් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ යම් නිදහසක් හිමිවිය. තව ද මේ සමයෙහි චීනයේ විවිධ ප්‍රදේශවල වෙළඳ කලාප ස්ථාපිත කළ අතර එම කර්මාන්තවල ආයෝජනය කිරීම සඳහා විදේශීය ආයෝජනයන් දිරිගන්වන ලදී. මේ මගින් චීනයට සෘජු විදේශ ආයෝජන ගලා ඒමට පටන් ගත් අතර එය රටේ ආර්ථික වර්ධනයට විශාල රුකුලක් විය. රටේ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ජනගහණයෙන් විශාල පිරිසකට රැකියා අවස්ථා හිමි වූ අතර එරට දුප්පත්කම ශීඝ්‍රයෙන් අඩු විය. එම ආර්ථික ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස ඉදිරි වසර ගණනාවක් සඳහා 10% වැඩි දළ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට චීනය සමත් විය (ප්‍රස්තාර අංක 01).

ප්‍රස්තාර අංක 01

**චීනයේ ආර්ථික වර්ධන වේගය (දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස)**




මූලාශ්‍රය - ලෝක බැංකුව, 2013

වර්තමානය වන විට ලෝකයේ දෙවනුවට බලවත් රාජ්‍ය බවට චීනය පත් ව ඇති අතර අද වන විට එක් තීරයක් එක් මාවතක් වැඩසටහන හරහා තම බලය ආසියානු කලාපයේ මෙන් ම සමස්ත ලෝකය පුරා ම ව්‍යාප්ත කිරීමට චීනය සමත් ව ඇත. අද වන විට ලෝකයේ විශාලතම අපනයනකරු මෙන් ම වැඩි ම විදේශ සංචිත හිමි රාජ්‍ය වන්නේ ද චීනයයි.

## පර්යේෂණ ගැටලුව

මෙම ශාස්ත්‍රීය ලිපියෙහි පර්යේෂණ ගැටලුව වන්නේ 20 වන සියවසේ පළමු දශකයේ දී හැල්ෆෝඩ් ජෝන් මැකින්ඩර් විසින් නිර්ණායක කිහිපයක් පදනම් කර ගනිමින් ඉදිරිපත් කරන ලද හදබිම් සංකල්පය (Heartland Theory) වර්තමාන ජාත්‍යන්තර හු දේශපාලනය තුළ කෙතරම් දුරට ප්‍රයෝගික ද යන්න හා වර්තමාන දේශපාලන, ආර්ථික, සමාජීය අංශයන්හි සිදුවූ දියුණුවත් සමඟ එම හදබිම් ප්‍රදේශය වෙනත් ප්‍රදේශයකට විතැන් වී තිබේ ද යන්න චීනයේ පිබිදීම ඇසුරෙන් අධ්‍යයනය කිරීමයි.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණය ප්‍රධාන අරමුණු ද්විත්වයක් ඔස්සේ සිදු කොට ඇත. එනම්, හැල්ෆෝඩ් මැකින්ඩර් ඉදිරිපත් කරන ලද හදබිම් සංකල්පය වර්තමාන ජාත්‍යන්තර හු දේශපාලනය තුළ කෙතරම් දුරට ප්‍රායෝගික ද යන්න අධ්‍යයනය කිරීම, වර්තමාන දේශපාලන, ආර්ථික හා සමාජීය අංශයන්හි දියුණුවත් සමඟ එම හදබිම් ප්‍රදේශය වෙනත් ප්‍රදේශයකට විතැන් වී තිබේ ද යන්න චීනයේ පිබිදීම ඇසුරෙන් අධ්‍යයනය කිරීම යි.

## ක්‍රමවේදය

මෙම ශාස්ත්‍රීය ලිපිය ලිවීම සඳහා ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත භාවිත කළ අතර එම දත්ත පොත්පත්, සඟරා හා පරිගණක මූලාශ්‍රය ඔස්සේ රැස්කර ගන්නා ලදී. රැස් කරගන්නා ලද දත්ත තේමා විශ්ලේෂණය ඇසුරින් විශ්ලේෂණය කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

වර්තමාන ජාත්‍යන්තර සබඳතාවල ස්වභාවය සලකා බලන කල්හි එය වඩාත් සංකීර්ණ ස්වභාවයකින් යුක්ත වේ. ජාත්‍යන්තර දේශපාලනය තුළ අතීතයේ මෙන් නොව අදවන විට ජාතික රාජ්‍යයන්ට අමතර ව වෙනත් විවිධ ක්‍රියාධරයින් බිහිවී ඇති අතර ඔවුන් අන්තර්ජාතික සම්බන්ධතාවන්හි සුවිශේෂ භූමිකාවක් නිරූපණය කරයි. තව ද අතීතයේ මෙන් නොව වර්තමානයේ දී ජාතික රාජ්‍යයන්ගේ අභිලාෂයන් විවිධාකාර වූ ස්වරූපයන් ගෙන ඇත. උදාහරණයකට අතීතයේ දී ජාතික රාජ්‍යන්ගේ ප්‍රධාන ජාතික අභිලාශය වූයේ තම රාජ්‍යයට බාහිර පාර්ශවයන් ගෙන් එල්ල විය හැකි තර්ජන හා අභියෝගවලින් රාජ්‍ය ආරක්ෂා කර ගැනීමයි. එවැනි පසුබිමක් තුළ එකල පැවති රාජ්‍යයන් සැමවිට ම උත්සාහ කරනු ලැබුවේ තම හමුදා ශක්තිය වර්ධනය කර ගනිමින් තම දේශ සීමා ආරක්ෂා කර ගැනීමයි. මැකින්ඩර් විසින් ඔහුගේ හදබිම සංකල්පයේ ද මෙම ජාතික ආරක්ෂාවට



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සුවිශේෂ ස්ථානයක් ලබා දී ඇත. උදාහරණයකට නැගෙනහිර හා මධ්‍යයම යුරෝපානු කලාපය හදබිම ලෙස තෝරා ගැනීමට බලපෑම් කළ එක් ප්‍රධානතම කාරණයක් වන්නේ එම කලාපයට බාහිර පාර්ශවයන්ගෙන් එල්ල විය හැකි බලපෑම්වලට සාර්ථක ලෙස මුහුණ දීමේ හැකියාවයි.

කෙසේ වෙතත් වර්තමාන දේශපාලන තත්ත්වය තුළ තව දුරටත් සාම්ප්‍රදායික ව නිර්වචනය කරන්නා වූ ජාතික ආරක්ෂාව අභියෝගයට ලක් වී ඇත. උදාහරණයකට වර්තමානයේ දී ජාත්‍යන්තර දේශපාලනය තුළ ආර්ථික ආරක්ෂාව, මානව ආරක්ෂාව වැනි සාම්ප්‍රදායික නොවන ආරක්ෂාව පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කරනු ලබයි. තව ද ගෝලීයකරණය හේතුවෙන් රාජ්‍යන්ගේ අන්තර් රඳාපැවැත්ම පෙර නොවූ විරූ ආකාරයෙන් වර්ධනය වී ඇති හෙයින් රාජ්‍යයක් තවත් රාජ්‍යයක් හමුදා බලය යොදා ගෙන ආක්‍රමණය කිරීමට නොපෙළඹේ. තව ද මැකින්ඩර් පවසා ඇති ආකාරයට ඔහු වැඩි අවධායනයක් යොමු කර සිටින්නේ දුම්රිය ප්‍රවාහනය පිළිබඳවයි. කෙසේ වෙතත් වර්තමානයේ දී මගී ප්‍රවාහනය සඳහා ගුවන් මාර්ග ද භාණ්ඩ ප්‍රවාහනය සඳහා මුහුදු මාර්ග ද බහුල ව යොදා ගැනෙන අතර ඒවා වඩා ඵලදායී බව හඳුනාගෙන ඇත.

නූතන ජාත්‍යන්තර දේශපාලනයේ පසුගිය දශක කිහිපය තුළ දැකගත හැකි වූ එක් සුවිශේෂ සිදුවීමක් ලෙස චීනයේ ආර්ථික පිබිදීම හඳුන්වා දිය හැකි ය. 1978 වසරේ දී එවකට චීනයේ පාලකයා වූ ඩෙන් ෂියාඕපින් විසින් හඳුන්වා දුන් ආර්ථික ප්‍රතිසංස්කරණයන් හේතුවෙන් අද වන විට ජාත්‍යන්තර දේශපාලනය තුළ චීනයට ප්‍රබල ස්ථානයක් හිමි වී තිබේ. උදාහරණයක් ලෙස අද වන විට ලෝකයේ දෙවන ප්‍රබලතම ආර්ථිකයට චීනය හිමිකම් කියන අතර ලෝකයේ ප්‍රධානතම අපනයනකරු වන්නේ ද චීනයයි. මෙම පර්යේෂණ පත්‍රිකාව මඟින් 21 වන ශත වර්ෂයේ හදබිම චීනයට විතැන් වී බව හඳුනාගෙන ඇති අතර ඒ සඳහා බලපෑම් සිදුකර ඇති සාධක පහත පරිදි සඳහන් කළ හැකි ය (රූප සටහන් අංක 02).

රූප සටහන් අංක 02 : **හදබිම නිර්මාණයට බලපාන සාදක**




මූලාශ්‍රය - කර්තෘ විසින් නිර්මාණය කරන ලදී.


**01. භූගෝලීය සාධක**

ජාතික බලයේ ප්‍රධාන මූලාංගයක් ලෙස භූගෝලීය සාධක හඳුනාගත හැකි ය. එදා මෙදා තුර ඉතිහාසයේ ජාත්‍යන්තර දේශපාලනය තුළ බිහිවූ බලවත් රාජ්‍යයන් එම තත්වයට පැමිණීම සහ ජාත්‍යන්තර පද්ධතිය තුළ තම බලය ව්‍යාප්ත කිරීම සඳහා එම රාජ්‍යයේ පිහිටීම, විශාලත්වය වැනි භූගෝලීය සාධක හා සම්බන්ධ කරුණු විශේෂ බලපෑමක් සිදු කොට ඇත. රාජ්‍යයක පිහිටීම සලකා බලන කල්හි යම් රටක් විදේශ රාජ්‍යයන්ගේ ආක්‍රමණවලට ගොදුරු වීමට පහසු ස්ථානයක පිහිටා තිබීම එම රාජ්‍යයට අහිතකර බලපෑමක් එල්ල කරනු ලබයි. අනෙක් අතට කිසියම් රාජ්‍යයක් බාහිර බලපෑම්වලට පහසුවෙන් ලක් නොවන ස්ථානයක පිහිටා තිබීම එම රටට විශේෂයෙන් එම රාජ්‍යයේ දේශපාලන ස්ථාවරත්වයට හිතකර තත්ත්වයකි. අනෙක් සාධකය වන්නේ රාජ්‍යයේ විශාලත්වයයි. කිසියම් රාජ්‍යයක් භූමි ප්‍රමාණයෙන් විශාල වූ පමණින් එකී රාජ්‍යයක් බලවත් නොවුව ද, රාජ්‍යයක් බලවත් වීම සඳහා ඍජු බලපෑමක් කරන සාධකයක් ලෙස රාජ්‍යයේ විශාලත්වය හඳුනා ගත හැකි ය. මෙය ද උදාහරණ ලෙස සීතල යුධ සමයේ සුපිරි බලවතුන් ලෙස ජාත්‍යන්තර පද්ධතියයෙහි ක්‍රියා කළ ඇමෙරිකානු එක්සත් ජනපදය හා සෝවියට් දේශය හඳුන්වා දිය හැකි ය.

වර්තමාන චීනය සැලකීමේ දී එය ලෝක දේශපාලනයෙහි බලවත් රාජ්‍යයක් බවට පත්වීම සඳහා එම රාජ්‍යයේ භූගෝලීය සැකැස්ම ඍජු බලපෑම් සිදු කර ඇති බව අවිවාදයෙන් පිළිගත යුතු ය. චීනය ලෝක දේශපාලනය තුළ බලවත් රාජ්‍යයක් බවට පත් වීමට භූගෝලීය සාධක ඉවහල් වී ඇති ආකාරය ප්‍රධාන කරුණු කිහිපයක් ඔස්සේ පැහැදිලි කළ හැකි ය (රූප සටහන් අංක 03).


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

රූප සටහන් අංක 03 : **භූගෝලීය සාධක**




මූලාශ්‍රය - කර්තෘ විසින් නිර්මාණය කරන ලදී.

**භූගෝලීය පිහිටීම**

- **ආසියානු කලාපයේ පිහිටීම**

ඉහත සඳහන් කළ පරිදි 21 වන සියවස යනු නැගී එන ආසියානුවන්ගේ ශතවර්ෂයයි. ඉතිහාසයේ ප්‍රථම වතාවට ජාත්‍යන්තර දේශපාලනයේ බල කේන්ද්‍රය බවට ආසියානු කලාපය පත් වෙමින් පවතින අතර ආසියාතික රාජ්‍යයන් විශාල සංඛ්‍යාවක් ආර්ථික වශයෙන් ජාත්‍යන්තර පද්ධතිය තුළ සැලකිය යුතු බලපෑමක් කිරීමට සමත් වී ඇත. තව ද, ලෝකයේ විශාලතම ජනගහනය හිමි රාජ්‍යයන්ගෙන් 10න් 05ක් පිහිටා තිබෙන්නේ ද මෙම කලාපයේ ය. චීනය ආසියානු කලාපයේ පිහිටා තිබීම හේතුවෙන් ඉතා පහසුවෙන් මෙම කලාපයේ ඇති අන්තර්ජාතික වෙළඳපොළවල් අත්පත් කර ගැනීමේ අවකාශය චීනය සතු වේ. අද වන විටත් ආසියානු කලාපීය රාජ්‍යයන්ගෙන් බොහෝ රාජ්‍යයන්හි ප්‍රධාන වෙළඳ සගයකු බවට චීනය පත් ව ඇත. ඉතා විශාල වෙළෙඳපොලකට ඉතා පහසුවෙන් ඇතුළත් වීමට හැකි වීම චීනයට ඉතා වාසිදායක වේ.

- **කෘෂිකර්මාන්තය සඳහා සුදුසු භූගෝලීය පිහිටීම**

ලෝකයේ විශාලතම කෘෂිකාර්මික රාජ්‍යයක් වන චීනය අතීතයේ සිට ම කෘෂිකර්මාන්තය සඳහා විශාල වැදගත්කමක් ලබා දී ඇත. අදවන විට ලෝකයේ ධාන්‍ය නිෂ්පාදනය, කපු, පලතුරු, එළවලු, බිත්තර නිෂ්පාදනය සම්බන්ධයෙන් ඉදිරියෙන් සිටින රාජ්‍යයක් ලෙස චීනය හඳුන්වා දිය හැකි ය. මත්ස්‍යය නිෂ්පාදනය සැලකීමේ දී ලෝකයේ විශාලතම මත්ස්‍ය නිෂ්පාදකයා වන්නේ ද චීනයයි.

**වගු අංක 02 : චීනයේ කෘෂිකාර්මික නිෂ්පාදනවල මුළු වටිනාකම, 2009 - 2019 (චීන යුආන් බිලියන)**

| වර්ෂය | ප්‍රමාණය |
|---|---|
| 2009 | 5,931.13 |
| 2010 | 6,776.31 |
| 2011 | 7,883.70 |
| 2012 | 8,634.22 |
| 2013 | 9,317.37 |
| 2014 | 9,782.25 |
| 2015 | 10,189.35 |
| 2016 | 10,647.87 |
| 2017 | 10,938.17 |
| 2018 | 11,357.95 |
| 2019 | 12,396.79 |

මූලාශ්‍රය - Statista.com

වගු අංක 01 හි නිරූපණය වන පරිදි පසුගිය දස වර්ෂය තුළ චීනයේ කෘෂිකාර්මික අංශය ඉතා ශීඝ්‍ර වර්ධනයක් අත් පත් කොට ගෙන ඇති බව පැහැදිලි වේ. තව ද, ලොව සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් 15% චීනය විසින් නිපදවයි (Statica.com, 2019). ඕනෑ ම රටක කෘෂි නිෂ්පාදනය එම රටේ පැවැත්ම කෙරෙහි සෘජු බලපෑමක් සිදු කරනු ලබයි. රාජ්‍යයකට තම ජනගහනයට සරිලන පරිදි ආහාර නිෂ්පාදනය කිරීමේ හැකියාවක් සතු වීම ඉතා වැදගත් වේ. ඒ මන්ද යත්, කිසියම් රටක් තම රටට අවශ්‍ය කරන ආහාර සඳහා විදේශීය රාජ්‍යයන් මත රඳා පැවතීම එම රටේ අනාගතයට අවදානමකි. අදවන විට ලෝකයේ සෑම රාජ්‍යයක් ම ආහාර සුරක්ෂිතාව කෙරෙහි විශේෂ අවධානයක් ලබා දී ඇත. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අනුව ආහාර සුරක්ෂිතාව යනු ක්‍රියාශීලී හා නිරෝගී ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ආහාර අවශ්‍යතා සහ ආහාර රුචිකත්ව සපුරාලිය හැකි පරිදි, ප්‍රමාණවත් සුරක්ෂිත හා පෝෂ්‍යදායී ආහාර සඳහා සියලු ම පුද්ගලයන්ට සෑම කල්හි ම භෞතික, සමාජීය හා ආර්ථික වශයෙන් ප්‍රවේශ වීමේ හැකියාවක් පැවතීමයි. රටක ජනතාවගේ ජීවිතවල ගුණාත්මකභාවය පිළිබඳ සැලකීමේ දී ආහාර සුරක්ෂිතභාවට වැඩි අවධානයක් ලබා දෙයි. කිසියම් රටක ජනතාවට තම අහාර අවශ්‍යතා සපුරා ගැනීමට නොහැකි වන්නේ නම් එය රටේ ස්ථාවරත්වයට විශාල බලපෑමක් එල්ල කරනු ලබයි. එබැවින් සෑම රාජ්‍යයක් ම සෑම විට ම උත්සාහ කරනු ලබන්නේ තම ජනතාවගේ ආහාර අවශ්‍යතාව හැකි උපරිමයෙන් සපුරාලීමයි. මෙහි දී, කිසියම් රටකට තම ජනතාවගේ ආහාර අවශ්‍යතාව සපුරාලීමට ප්‍රධාන ක්‍රම දෙකක්


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඇත. ඉන් එකක්, තම රටෙහි ආහාර අවශ්‍යතාවයෙන් වැඩි ප්‍රමාණයක් තම රට තුළ නිෂ්පාදනය කිරීම හා අනෙක් ක්‍රමය වන්නේ එම අවශ්‍යතාව ආනයනය කිරීම යි. මෙහි දී වැදගත් කරුණ වන්නේ කිසියම් රටක් තම ජනතාවගේ ආහාර අවශ්‍යතාවන් සඳහා විදේශීය රාජ්‍යයන් මත යැපීමට සිදුවීම එම රාජ්‍යයට, විශේෂයෙන් එහි ස්වාධීනත්වයට දැඩි බලපෑමක් එල්ල කිරීමයි. එවැනි රාජ්‍යයකට ජාත්‍යන්තරය තුළ තම බලය පැතිරීමේ හැකියාව සීමා සහිත වේ. එහෙයින් චීනයට මෙහි දී යම් වාසිසහගත තත්ත්වයක් පවතී.

- **ප්‍රධාන මුහුදු මාර්ගවලට ආසන්නයේ පිහිටීම**

වර්තමාන ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ සැලකීමේ දී කෙතරම් තාක්ෂණය දියුණු මට්ටමක පැවතිය ද අදටත් ජාත්‍යන්තර වෙළඳාමෙන් 80% කට අධික ප්‍රමාණයක් සිදු වන්නේ මුහුදු මාර්ග ඔස්සේ ය (UNCTAD, 2021). එම නිසා සාගරය ආසන්නයේ පිහිටා තිබීම ඕනෑම රාජ්‍යයකට වෙළඳාම සම්බන්ධයෙන් හිතකර තත්ත්වයකි. එවැනි තත්වයක භාණ්ඩ ප්‍රවාහනයේ දී වැය වන වියදම සාපේක්ෂ ව අඩු අතර එම භාණ්ඩ ඉතා ඉක්මනින් හා පහසුවෙන් නැව්ගත කළ හැකි ය. කිසියම් රටක් මුහුදු මාර්ගයන්ට දුරස්ථ ව පිහිටා ඇත්නම් එය එම රටට ජාත්‍යන්තර වෙළඳ කටයුතුවල නිරත වීමේ දී අවාසි සහගත තත්වයක් උදාකරයි. උදාහරණයකට ගත් විට කිසියම් රටක් සෑම ස්ථානයකින් ම ගොඩ බිම් රාජ්‍යයන්ගෙන් වටවී (Landlocked Countries) ඇත්නම් එම රාජ්‍යයට තම වෙළඳ කටයුතු සඳහා තවත් රාජ්‍යයක් මත රඳා පැවතීමට සිදු වේ. චීනය පිළිබඳ සැලකීමේ දී චීනය දිවයිනක් නොවුන ද එම රාජ්‍යය ප්‍රධාන මුහුදු වෙළඳ මාර්ග ආසන්නයේ පිහිටා ඇත. කෙසේ වුවත් රටක් සාගරයට සමීප ව පිහිටා තිබූ පමණින් අන්තර්ජාතික වශයෙන් එම රටට වෙළඳාම තුළ සැලකිය යුතු කාර්යභාරයක් සිදු කිරීමට නොහැක. ඇල්ෆ්‍රඩ් මහන් විසින් වරක් ප්‍රකාශ කර ඇති පරිදි දීර්ඝ වෙරළ තීරයක් හා වරායන් සතු වීම රාජ්‍යයකට ඉතා වැදගත් කරුණකි. මෙහි දී චීනය සම්බන්ධයෙන් සැලකීමේ දී චීනය සතු ව දීර්ඝ වෙරළ තීරයක් ඇති අතර ඉතා විශාල වරායන් සංඛ්‍යාවක් ද පවතී. මෙය ජාත්‍යන්තර වෙළඳාමට ඉතා හිතකර තත්ත්වයකි.

- **විශාල වෙරළ තීරය හා වරායන් විශාල සංඛ්‍යාවක් සතු වීම**

ඉහත සඳහන් කර ඇති පරිදි කිසියම් රාජ්‍යයක් සතු ව විශාල වරායන් සංඛ්‍යාවක් සතු වීම, ජාත්‍යන්තර වෙළඳාමේ නියැලීමේ දී එම රටට විශාල වාසියක් වේ. චීනය සැලකීමේ දී අද වන විට එම රට සතු ව විශාල වරායන් සංඛ්‍යාවක් සතුවන අතර ආනයනය, අපනයනය මත රඳා පවතින රාජ්‍යයක් ලෙස මෙවැනි වරායන් විශාල සංඛ්‍යාවක් සතු වීම චීනයට තම ජාත්‍යන්තර වෙළඳ කටයුතු පහසු කිරීමට විශාල වශයෙන් උපකාරී වේ. World Port Source (https://www.worldshipping.org/top-50-ports) වෙබ් අඩවියට අනුව චීනය සතුව වරායන් 172ක් ඇත. තව ද, ලෝකයේ කාර්යබහුල ම වරායන් 10න් හතක් සතු වන්නේ ද චීනයටයි (වගු අංක 03)

වගු අංක 03: ලොව කාර්ය බහුල වරායන් 10

| | වරාය | රට |
|---|---|---|
| 1 | ෂැංහයි (Shanghai) | චීනය |
| 2 | සිංගප්පූරුව (Singapore) | සිංගප්පූරුව |
| 3 | ෂෙන්සෙන් (Shenzhen) | චීනය |
| 4 | නිංබෝ-චෞෂාන් (Ningbo-Zhoushan) | චීනය |
| 5 | බුසාන් (Busan) | දකුණු කොරියාව |
| 6 | හොංකොං (Hong Kong) | චීනය |
| 7 | ගුවාන්ෂු (Guangzhou) | චීනය |
| 8 | කිංඩාඕ (Kingdao) | |
| 9 | ජෙබෙල් අලි (Jebel Ali) | එක්සත් අරාබි එමීර් රාජ්‍යය |
| 10 | ටියැන්ජින් (Tianjin) | චීනය |

මූලාශ්‍රය- www.weforum.org

මේ අනුව පෙනී යන්නේ වර්තමාන ජාත්‍යන්තර දේශපාලනය තුළ චීනය බලවත් රාජ්‍යයක් බවට පත්වීම සඳහා භූගෝලීය සාධකය ඉතා සුවිශේෂ වැදගත්කමක් උසුලන බවයි.

**02. ස්වාභාවික සම්පත්වල බහුලතාව**

චීනය සතු ව ඉතා වැදගත් ස්වාභාවික සම්පත් රාශියක් උරුම ව පවතී. උදාහරණ ලෙස, ගල් අඟුරු, ඛනිජ තෙල්, ස්වාභාවික වායු, වනාන්තර, සූර්ය ශක්තිය, ඇලුමිනියම්, මැග්නීසියම්, යපස්, තඹ හා පොස්පේට් ආදිය පෙන්වා දිය හැකි ය. චීනයේ පවතින උස කඳු මුදුන්වලින් ගලා යන ගංගා මගින් රටට අවශ්‍ය ජල විදුලිය නිපදවා ගනු ලබයි. 2020 ජාත්‍යන්තර ජලවිදුලිබල සංගමයේ ජල විදුලිබල තත්ත්ව වාර්තාවට (IHA's 2020 Hydropower Status Report) අනුව චීනය 2019 වසරේ දී 356GW ප්‍රමාණයක් නිෂ්පාදනය කොට ඇති අතර ඉදිරියේ දී තවත් 4.2GW ප්‍රමාණයක් එකතු කර ගැනීමට සූදානම් වෙමින් සිටී (Hydropower.org. 2020). එමෙන් ම චීනය ලොව ආකර කර්මාන්ත පවත්වාගෙන යනු ලබන රටවල් අතර ප්‍රමුඛ තැනක් හිමිකර ගෙන ඇත. පහත රූප සටහන් අංක 04 හා 05 මගින් දැක්වෙන්නේ ලෝකයේ ස්වාභාවික සම්පත් හිමිකම හා චීනය එහි සිටින ස්ථානයයි. ලෝකයේ රටවල් සතු ස්වාභාවික සම්පත් (ආකාර කර්මාන්තයට අදාළ) mining.com මගින් ලකුණු දීමේ ක්‍රමයක් සකස් කොට ඇති අතර එම ලකුණු දීමේ පටිපාටියට අනුව ආකර කර්මාන්තයන්ගෙන් ලෝකයේ ඉදිරියෙන් ම සිටින්නේ චීනයයි.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

රූප සටහන් අංක 04 : **ලෝකයේ විවිධ රටවල් ස්වාභාවික සම්පත් නිෂ්පාදනය¹ 2014**

| | රන් | රිදී | ප්ලැටිනම් | තඹ | සින්ක් | ඊයම් | නිකල් | කොබෝල්ට් | මලිබ්ඩිනම් | යකඩ | බොක්සයිට්/ ඇලුමිනියම් | ගල් අඟුරු | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| චීනය | 10 | 9 | 5 | 9 | 10 | 10 | 3 | 9 | 10 | 10 | 9 | 10 | 112 | 216 |
| ඕස්ට්‍රේලියාව | 9 | 7 | 1 | 5 | 9 | 9 | 6 | 7 | 0 | 9 | 10 | 8 | 64 | 144 |
| රුසියාව | 8 | 6 | 9 | 4 | 0 | 5 | 9 | 6 | 0 | 6 | 3 | 5 | 73 | 134 |
| ඇ.එ.ජ. | 7 | 2 | 6 | 7 | 7 | 8 | 0 | 0 | 9 | 3 | 0 | 9 | 34 | 92 |
| කැනඩාව | 6 | 1 | 8 | 2 | 4 | 0 | 7 | 8 | 5 | 1 | 0 | 0 | 49 | 91 |
| දකුණු අප්‍රිකාව | 5 | 0 | 10 | 0 | 0 | 0 | 0 | 2 | 0 | 4 | 0 | 4 | 58 | 83 |
| ඉන්දියාව | 0 | 0 | 0 | 0 | 6 | 4 | 0 | 0 | 0 | 7 | 6 | 6 | 39 | 68 |
| බ්‍රසීලය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 4 | 2 | 0 | 8 | 8 | 0 | 34 | 56 |
| පේරු | 4 | 8 | 0 | 8 | 8 | 7 | 0 | 0 | 7 | 0 | 0 | 0 | 9 | 51 |
| මෙක්සිකෝව | 2 | 10 | 0 | 1 | 6 | 6 | 0 | 0 | 6 | 0 | 0 | 0 | 6 | 37 |

මූලාශ්‍රය- www.mining.com, 2015

රූප සටහන් අංක 05 : **ලෝකයේ ස්වාභාවික සම්පත් කිහිපයක වාර්ෂික නිෂ්පාදන ධාරිතාව හා චීනයේ නිෂ්පාදන ධාරිතාව**




මූලාශ්‍රය- www.mining.com, 2021

ඉහත රූප සටහන් මගින් දක්වා ඇති ආකාරයට ලෝකයේ මූල්‍ය වටිනාකමකින් යුත් ස්වාභාවික සම්පත්වලින් වැඩි ප්‍රමාණයක් චීනය සතු වේ. මෙසේ එවැනි ස්වාභාවික සම්පත් චීනය සතු වීම තුළ චීනයට අන්තර්ජාතික වශයෙන් සුවිශේෂ බලයක් සතුවේ. ලෝක බලය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය සාධක අතර ස්වාභාවික සම්පත් ප්‍රමුඛ තැනක් ගන්නා අතර චීනය සතු ව එම හැකියාව තිබීම මගින් පැහැදිලි වන්නේ චීනය ලෝක හදබිම ගොඩනගා ගැනීමට සමත් වී ඇති බවයි.

### 03. දේශපාලන ස්ථාවරත්වය

පොදු වචනයෙන් හැඳින්වෙන චීන මහජන සමූහාණ්ඩුව යනු ලොව ජනාධික රාජ්‍යයක් වන අතර


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය


චීන කොමියුනිස්ට් පක්ෂය විසින් පාලනය කරන ප්‍රධාන තනි පක්ෂ රාජ්‍යකි. 1921 චීනයේ කොමියුනිස්ට් පක්ෂය පිහිටු වූ අතර 1949 ඔක්තෝබර් 1 වනදා මාඕ සේතුං (Mao Zedong) විසින් බීජිං නගරයේ දී මහජන චීන සමූහාණ්ඩුව ප්‍රකාශයට පත් කෙරිණි. චීන කොමියුනිස්ට් පක්ෂය විසින් පළාත් 22 ක්, ස්වතන්ත්‍ර ප්‍රදේශයන් පහක්, සෘජු ලෙසින් පරිපාලිත මහ නගර සහා ප්‍රදේශයන් සතරක් (බෙයිජිං, ටියාංජිං, ෂැංහයි, සහ චොංකිං) හා අතිශයින් ස්වතන්ත්‍ර විශේෂ පරිපාලන ප්‍රදේශයන් දෙකක් (හොංකොං, මැකාවු) මත ද සිය ආධිපත්‍යය පතුරවයි.

වර්තමාන චීන ජනාධිපති ෂි ජින්ග්පින් (Xi Jinping) වන අතර අගමැති ලී කචියාං (Li Keqiang) ය. ෂි ජින්ග්පින් චීනයේ හත්වන ජනාධිපතිවරයා වන අතර මොහු 2013 දී බලයට පත්ව ඇත. චීන මහජන සමුහාණ්ඩුවේ ප්‍රථම පාලකයා වූ මාඕ සේතුන් (Mao Zedong) 1949 සිට 1976 කාලය පරාසයෙහි චීනය පාලනය කොට ඇත. ඔහු චීනය වර්තමාන තත්ත්වය දක්වා ඔසවා තැබීමට විශාල උත්සාහයක් ගන්නා ලදී. ඔහු විසින් සකස් කරනු ලැබූ පස් අවුරුදු සැලසුම් මඟින් ඉතා ඉහළ මට්ටමකට චීනය රැගෙන යාමට හැකිවිය. චීනය වර්තමානය වන විට නිවැරැදි නායකත්වයක් යටතේ පාලනය වන්නේ සමාජවාදී දේශපාලන නායකත්වය යටතේ ය. වර්තමානයේ දී චීනය ලොව අනෙකුත් ප්‍රබල රටවල දේශපාලනයට දැඩි සේ අභියෝගයක් එල්ල කරමින් සිටී. උදාහරණයකට ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් චීනයෙන් ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා පනවනු ලබන තීරුබදු ඉහළ දැමූ අවස්ථාවේ දී චීනය ද පෙරළා ඇමරිකාවෙන් ආනයනය කරන භාණ්ඩවලට ද තීරුබදු පනවන ලදී. තව ද චීනය ඇමරිකාව විසින් ලෝකයේ අනෙකුත් රාජ්‍යන්ගේ අභ්‍යන්තර කටයුතුවලට බලපෑම් කරන අවස්ථාවන්වල දී ඊට විරුද්ධ ව කටයුතු කිරීමට චීනය ඉදිරිපත් වී ඇත. මෙයට උදාහරණ ලෙස ශ්‍රී ලංකාව හා මියන්මාරය පෙන්වා දිය හැකි වේ. මෙසේ ජාත්‍යන්තර තුළ මෙවැනි භූමිකාවක් නිරූපණය කිරීමට චීනයට හැකියාව ලැබී ඇත්තේ එම රාජ්‍ය තුළ වූ දේශපාලන ස්ථාවරත්වය හේතුවෙනි. යම් රටක් දේශපාලනික ව ස්ථාවර වන්නේ ද එම රටෙහි ප්‍රතිපත්තීන් ද නොවෙනස් ව පැවතීමට වැඩි ඉඩකඩක් පවතී.

### 04. ශීඝ්‍ර ආර්ථික වර්ධනය


චීනය මුළු ලෝකයේ ම වැඩපොළ බවට පත් වී ඇති බව ආර්ථික විද්‍යාඥ ඩේවිඩ් මාන් (David Mann) ප්‍රකාශ කොට ඇත. එයින් පැහැදිලි වන්නේ චීනය ලොව සියලු ම රටවල් සඳහා අවශ්‍ය නිෂ්පාදනයන් සිදු කරන බවයි. උදාහරණයක් ලෙස අද වන විට ලෝක සැපයුම් දාමයේ එක් ප්‍රධාන පුරුකක් බවට චීනය පත් ව ඇත. පහත රූප සටහන් අංක 06 හා 07 මඟින් දැක්වෙන්නේ චීනයේ වාර්ෂික අපනයන ප්‍රමාණය හා චීනය සිය අසල්වාසි රටවල්හි සිදු කරනු ලැබූ ආයෝජනය ප්‍රමාණයයි.

රූප සටහන් අංක 06 : චීනයේ වාර්ෂික අපනයන ප්‍රමාණය




මූලාශ්‍රය - (*චීනය බලවත් වූයේ කෙසේ ද ? ලොව මවිත කළ "ආර්ථික හාස්කම" - BBC News සිංහල*, 2019.)

රූප සටහන් අංක 07 : චීනයේ වාර්ෂික ආයෝජනය ප්‍රමාණය (අසල්වාසි රටවල් සඳහා)




මූලාශ්‍රය - (*චීනය බලවත් වූයේ කෙසේ ද ? ලොව මවිත කළ "ආර්ථික හාස්කම" - BBC News සිංහල*, 2019.)

ඉහත රූප සටහන අංක 06 ට අනුව චීනය ඇ. ඩො. ට්‍රිලියන 01 කට වඩා පාරිභෝගික භාණ්ඩ හා උපාංග අපනයනය කරන බව පැහැදිලි වේ. මෙය ගෝලීය ප්‍රමාණය හා සසඳන විට ඉතා විශාල ප්‍රමාණයකි. එමෙන් ම ඔවුන් සිය අපනයන ප්‍රමාණය වාර්ෂික ව ඉහළ නංවා ගනිමින් සිටියි. රූප සටහන් අංක 07 මඟින් දැක්වෙන්නේ චීනය සිය අසල්වැසි රටවල් සමඟ සිදු කොට ඇති ආයෝජන ප්‍රමාණයයි. ඒ අනුව



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

චීනය තම කලාපය තුළ සිය බලය තහවුරු කරගෙන ඇති අකාරය පැහැදිලි වේ. විශේෂයෙන් ම 2013 වසරේ දී ෂි ජින් පින් ජනාධිපතිවරයා විසින් හඳුන්වා දෙනු ලැබූ එක් තීරයක් එක් මාවතක් (Belt and Road Initiative) වැඩ සටහන හරහා ආසියානු, අප්‍රිකානු හා යුරෝපානු රාජ්‍යන්හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා දීම සිදු කරන අතර ඇතැම් විද්වතුන් පවසන ආකාරයට චීනය විසින් සිදු කරනු ලබන්නේ ලෝකයේ අනෙකුත් රටවල් තම ආධිපත්‍යට නතු කර ගැනීමයි. මෙම වැඩසටහන ජාත්‍යන්තර පද්ධතිය තුළ කෙතරම් අවධානයට පාත්‍ර වී තිබේ දැයි දැක්වුවහොත් අද වන විට ලෝකයේ රාජ්‍ය 140 කට ආසන්න සංඛ්‍යාවක් මෙම වැඩසටහන සමඟ සම්බන්ධ වී ඇත.

ආර්ථික විද්‍යාඥයන් ප්‍රකාශ කරන්නේ මේ සියවස ඇමරිකානුවන්ගේ සියවස අවසන් වී චීන ජාතිකයන්ගේ සියවස ආරම්භ වන සියවසක් යනුවෙනි. පසුගිය දශක තුන තුළ චීන ආර්ථිකය ඉතා ඉහළ වේගයෙන් දියුණු වූ අතර 1978 දී හිටපු ජනාධිපති ඩෙන් ෂියාඕපිං (Deng Xiaoping) මැතිතුමා විසින් ඇති කරන ලද ආර්ථික ප්‍රතිසංස්කරණ හා විවෘත ආර්ථික පිළිවෙත හේතු කොට ගෙන එරට ශීඝ්‍ර ආර්ථික දියුණුවක් අත්කර ගන්නා ලදී. චීනයේ ආර්ථික නගරය ෂැන්හයි (Shanghai) වන අතර මීට අමතර ව බීජිං (Beijing), ග්වාන්ෂු (Guangzhou), ටියැංජිං (Tianjin) හා ෂැන්හෙන් (Shenzhen) යන නගර ද ආර්ථික නගර වේ. චීනය විසින් අත්පත් කරගෙන ඇති ආර්ථික දියුණුව පහත පරිදි විස්තර කළ හැකි ය.

2001 සිට 2010 දක්වා දල දේශීය නිෂ්පාදනයේ දල වාර්ෂික වර්ධනය 9.9% කි. චීන දල දේශීය නිෂ්පාදනයේ වර්ධනය අනෙකුත් රටවල් හා සංසන්දනය කර බැලීමේ දී චීනයේ ආර්ථික වර්ධනය ඉතා ඉහළ මට්ටමක පවතින බව හඳුනා ගත හැකිවේ. චීනයේ මෙලෙස ඉහළ ආර්ථිකයක් පැවතීමට ප්‍රධාන හේතුවක් වන්නේ චීනයේ නැගෙනහිර කලාපයේ ගුවාංග්ඩොංග, ෂැන්හයි හා බීජිං ආශ්‍රිත මුහුදු ප්‍රදේශ තුළ නිදහස් වෙළඳ කලාප රාශියක් විදේශ ආයෝජකයින් සඳහා විවෘත කර තිබීමයි. දැනට ලොව ඇති විශාලම ව්‍යාපාර අතුරෙන් විශාල සංඛ්‍යාවක් චීනය සතු වීමත්, චීන ආර්ථික ශක්තිය ගම්‍ය කරයි. දැනට ලෝකයේ වැඩි ම විදේශ විනිමය සංචිතයක් ඇත්තේ ද චීනයටයි. මේ වන විට චීන සමාගම් විශාල ලෙස ඇමරිකානු හා යුරෝපයේ ප්‍රසිද්ධ වෙළඳ සමාගම් මිලදී ගැනීමට පෙළඹී ඇති අතර චීනය ලෝක අපනයනවලින් ප්‍රථම ස්ථානය හිමි කරගෙන ඇත. එමෙන් ම 2018 වසරේ චීනයේ දල දේශීය නිෂ්පාදනයේ වටිනාකම (Gross domestic product) ඇ.ඩො. ට්‍රිලියන 13.61 කි (The Economic Times. 2019). පහත රූප සටහන් අංක 08 මගින් දැක්වෙන්නේ චීනයේ වාර්ෂික දල දේශීය නිෂ්පාදනයයි.

රූප සටහන් අංක 08 : චීනයේ වාර්ෂික දළ දේශීය නිෂ්පාදනය




මූලාශ්‍රය - mgmresearch.com

ඉහත රූප සටහන් අංක 08 ට අනුව චීනයේ වාර්ෂික දල දේශීය නිෂ්පාදන ප්‍රමාණය ඉහළ යමින් පවතින බව මනාව පැහැදිලි වේ.

**05. ජනගහනය**

වර්තමාන ලෝක ජන සංඛ්‍යාව බිලියන 7.8 ක් පමණ වන අතර එයින් බිලියන 1.441 ජන සංඛ්‍යාවක් චීනය සතු වේ. ඒ අනුව චීනය ලොව වැඩි ම ජන සංඛ්‍යාවක් වෙසෙන රට ලෙස වාර්තා වේ (Worldometers.info.2020). චීනය තුළ ඉතා ඉහළ ශ්‍රම බලකායක් සිටින අතර එය ලොව අන් රටවලට


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වඩා ඉතා ඉහළ අගයක් ගනී. ලොව ප්‍රබල රටවල් වන ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, ජර්මනිය, ප්‍රංශය, බ්‍රිතාන්‍ය ආදී රටවල්වලට වඩා වැඩි ජන සංඛ්‍යාවක් හා ශ්‍රම බලකායක් චීනය සතු වේ. 2018 වර්ෂය වන විට චීනයේ මිලියන 805.67 ක ශ්‍රමබලකායක් වාර්තා වී ඇත (Statista.2020). මෙය ඇ.එ.ජ යේ මුළු ජන සංඛ්‍යාවට දෙගුණයකටත් වඩා වැඩි අගයකි. විශාල ජනගහනයක් යනු විශාල වෙළඳපොළකි. ලෝක ජන සංඛ්‍යාවෙන් 20% පමණ සිටින චීනයෙහි ඉතා විශාල වෙළඳපොළක් ඇති බව පැහැදිලි වේ. මෙම විශාල වෙළඳපොල හේතු කොට ගෙන ඕනෑ ම රටක් චීනය තුළ ආයෝජනය කිරීමට පෙළඹේ. ඒ අනුව විශාල ජන සංඛ්‍යාවක් පැවතීම ද චීනයේ නූතන හදබිම නිර්මාණය කිරීම සඳහා දායක වී ඇති බව පැහැදිලි වේ.

**නූතන හදබිම බවට පත් වීමත් සමඟ ශ්‍රී ලංකාවට ඇතිවන බලපෑම**

වර්තමාන ජාත්‍යන්තර භූ දේශපාලනය සැලකීමේ දී චීන බලපෑමට හසු නොවුණු රාජ්‍යයක් සොයා ගැනීම ඉතා අපහසු වේ. විශේෂයෙන් ම ආසියානු කලාපය සැලකීමේ දී, සමස්ත ආසියානු කලාපය පුරා ම පෙර නොවූ විරූ ලෙස චීන බලපෑම දැකගත හැකි ය. උදාහරණයකට ගතහොත් අද වන විට සෑම ආසියාතික රාජ්‍යයක ම ප්‍රධාන වෙළඳ සගයෙකු බවට චීනය පත් ව ඇත. චීන ශ්‍රී ලංකා සම්බන්ධතා සැලකීමේ දී පසුගිය වසර කිහිපයෙහි එහි පැහැදිලි වර්ධනයක් දැකගත හැකි විය. ඈත අතීතයේ සිට ම චීනය හා ශ්‍රී ලංකාව අතර සමාජීය හා සංස්කෘතික සම්බන්ධතා පැවති අතර 1957 වසරේ දී දෙරට අතර නිල රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ආරම්භ වීමත් සමඟ චීන ශ්‍රී ලංකා සම්බන්ධතාවන් නව දිශානතියකට යොමු විය. එදා මෙදා තුර චීන ශ්‍රී ලංකා සම්බන්ධතාවන්හි වර්තමාන තත්ත්වය සැලකීමේ දී දෙරටෙහි සම්බන්ධතාවන්හි පෙර නොවූ විරූ ආකාරයේ වර්ධනයක් හඳුනා ගත හැකි වේ. සැබවින් ම පැවසුවහොත් චීන ව්‍යාප්තවාදයේ පැහැදිලි ප්‍රතිමූර්තියක් ලෙස ශ්‍රී ලංකාව සඳහන් කළ හැකි ය. අද වන විට ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික සගයෙකු බවට පත් ව ඇති චීනය ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ වැදගත් ක්‍රියාධරයෙකු බවට පත් ව ඇත. උදාහරණයකට අද වන විට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන් අතුරින් බහුතරයකට මූල්‍ය දායකත්වය ලබා දෙනු ලබන්නේ චීනයයි. එම යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති අතුරින් කිහිපයක් ලෙස දක්ෂිණ අධිවේගී මාර්ගය, කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, හම්බන්තොට ජාත්‍යන්තර ගුවන් තොටුපල, හම්බන්තොට වරාය සඳහන් කළ හැකි ය. තව ද චීන මූල්‍ය ආධාර මත සංවර්ධනය කෙරුණු හම්බන්තොට වරායෙහි පරිපාලන තීරණ ගැනීමේ වැඩි හැකියාවක් චීනය සතු වේ. මීට අමතර ව එදා මෙදා තුර ශ්‍රී ලංකා ඉතිහාසයේ විශාලතම ආයෝජන ව්‍යාපෘතිය වන කොළඹ වරාය නගරය ද මහජන චීනයේ ව්‍යාපෘතියකි. ඇතැම් විද්වතුන් පවසන ආකාරයට ශ්‍රී ලංකාව අද වන විට චීනයේ ණය උගුලට හසුවී ඇත. දත්ත සැලකීමේ දී 2008 වසරේ ශ්‍රී ලංකාව චීනයෙන් ලබාගෙන තිබූ ණය ප්‍රමාණය රටේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 1.9% පමණක් වූ අතර 2017 වන විට එය 9.5% දක්වා වර්ධනය වී ඇත (CFR Belt and Road Tracker, 2021). චීනය බලවත් රාජ්‍යයක් බවට පත්වීම සමඟ තම බලය ජාත්‍යන්තරය තුළ ක්‍රියාත්මක කරන අකාරයක් දකගත හැකි අතර ශ්‍රී ලංකාවෙහි චීනයේ ක්‍රියා කලාපය මෙයට කදිම උදාහරණයකි. සැබවින් ම නූතන ජාත්‍යන්තර භූ දේශපාලනය තුළ හදබිම බවට චීනය පත්වීම තුළ එහි ඍජු බලපෑමක් ශ්‍රී ලංකාවට එල්ල වී ඇත.

**නිගමනය**

21 වන සියවස සැලකීමේ දී තවදුරටත් හදබිමක් නිර්මාණය වීමට මැකින්ඩර් විසින් මීට සියවසකට පෙර ඉදිරිපත් කරන ලද සාධක ප්‍රමාණවත් නොවේ. අතීතයේ මෙන් නොව වර්තමාන අන්තර් රාජ්‍ය සම්බන්ධතා වඩාත් සංකීර්ණ වී ඇති හෙයින් රාජ්‍යයක ප්‍රමුඛතම අභිලාෂය තව දුරටත් තම රාජ්‍යයන්ගේ දේශ සීමා බාහිර පාර්ශවයන්ගෙන් ආරක්ෂා කර ගැනීම පමණක් නොවේ. අදවන විට රාජ්‍යයන් අතර අන්තර් රඳා පැවැත්ම වර්ධනය වී ඇති අතර ආර්ථික අභිලාෂයන් ප්‍රමුඛස්ථානයක් ලබා ගෙන ඇත. එහෙයින් වර්තමාන ජාත්‍යන්තර භූ දේශපාලනික තත්ත්වයන් මත හදබිමක් නිර්මාණය වීමේ දී සාම්ප්‍රදායික ආරක්ෂාවට වඩා වැදගත් කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. මෙහි දී භූගෝලීය සාධකය, ජනගහනය, ශීඝ්‍ර ආර්ථික වර්ධනය, සම්පත් බහුලතාව හා දේශපාලනික ස්ථාවරත්වය වැදගත් වේ. එනම්, මේ සියලු සාධක ඔස්සේ වැඩි අවධානයක් ලබා දී ඇත්තේ රටක ආර්ථික ප්‍රගමනයට මෙම සාධක කෙතරම් දුරට උචිත ද යන්න සඳහායි. මෙම සාධක චීනය සම්බන්ධයෙන් සැලකීමේ දී අනෙක් රාජ්‍යයන් හා සැසඳීමේ දී චීනය පිහිටි භූමිය 21 වන සියවසේ හදබිම බවට පත් වී ඇති බව පැහැදිලි වේ.

පෙර සඳහන් කළ පරිදි වර්තමාන ජාත්‍යන්තර භූ දේශපාලනයෙහි චීනය බලවත් රාජ්‍යයක් බවට පත් වීම තුළ එහි ඍජු බලපෑමක් ශ්‍රී ලංකාවට එල්ල වී ඇත. විශේෂයෙන් ම කුඩා රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවට මෙම බලපෑමෙන් මිදිය නොහැකි ය. සිදු කළ යුත්තේ චීනයේ මෙම පිබිදීම ශ්‍රී ලංකාවට වාසි සහගත අයුරින් භාවිත කිරීමයි. ඒ සඳහා නිවැරදි දැක්මක් සහිත විදේශ ප්‍රතිපත්තියක් සතුවීම අනිවාර්ය වේ. මෙහි දී ශ්‍රී ලංකාව සතු ව විකල්ප කිහිපයක් ඇත. පළමු වැන්න නම් චීනය සමඟ සන්ධානගත වීමයි. බොහෝ අවස්ථාවන්හි ජාත්‍යන්තර දේශපාලනය තුළ සිදුවන්නේ දුර්වල රාජ්‍යයන් බලවත් රාජ්‍යයන් සමඟ සන්ධානගත වීම මගින් තම ආරක්ෂාව සපුරා ගැනීමයි. කෙසේ වෙතත් වර්තමාන ජාත්‍යන්තර භූ දේශපාලනික හා ආර්ථික තත්ත්වයන් මත ශ්‍රී ලංකාවට එය සිදු කළ නොහැකි ය. ඒ සඳහා හේතු සාධක කිහිපයක් ඇත. ඉන් පළමුවැන්න නම් වර්තමානයේ අප ජීවත් වන්නේ ගෝලීයකරණය වූ ලෝකයක වීමයි. එහි දී ලොව කිසි ම රාජ්‍යයකට ස්වාධීනව තමන්ට අවැසි දේ ජාත්‍යන්තරය තුළ සිදු කළ නොහැක. තව ද ශ්‍රී ලංකාවේ භූ දේශපාලනික තත්ත්වයන් සාකච්ඡා කිරීමේ දී කිසිවිටක ඉන්දියාව නම් සාධකය අමතක නොකළ යුතු ය. ශ්‍රී ලංකාව චීනය සමඟ සන්ධානගත වීම ඉන්දියාව කිසි විටෙක අනුමත නොකරන අතර එසේ සන්ධාන ගත වීම භූ දේශපාලනික වශයෙන් ශ්‍රී ලංකාවට අවාසි සහගත වේ. ශ්‍රී ලංකාවට ඇති


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රයෝගික ම විකල්පය වන්නේ මැද මාවතකින් යුතු විදෙස් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමයි. එසේ කිරීම මඟින් ශ්‍රී ලංකාවට චීනයේ පිබිදීමෙන් උපරිම ප්‍රතිඵල ලබා ගත හැකි අතර චීනය මත අනිසි ආකාරයෙන් රඳා නොපැවතීම තුළ ජාත්‍යන්තරයේ සෑම රාජ්‍යයක් සමඟ ම සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට හැකි වේ.

## පරිශීලිත මූලාශ්‍රය


*China: Labor force | Statista*. (n.d.). Retrieved May 4, 2021, from https://www.statista.com/statistics/282134/china-labor-force/

*20131016_MackinderTheGeographicalJournal.pdf*. (n.d.). Retrieved May 3, 2021, from https://www.iwp.edu/wp-content/uploads/2019/05/20131016_MackinderTheGeographicalJournal.pdf

*Analysis of China's coastal zone management reform based on land-sea integration | Emerald Insight*. (n.d.). Retrieved May 4, 2021, from https://www.emerald.com/insight/content/doi/10.1108/MAEM-03-2019-0001/full/html

*China GDP Data and Charts 1980-2020*. (2019, April 18). MGM Research. https://mgmresearch.com/china-gdp-data-and-charts-1980-2020/

China is burning through its natural resources. (2015, April 26). *MINING.COM*. https://www.mining.com/china-burning-natural-resources/

*China Maps & Facts—World Atlas*. (n.d.). Retrieved May 3, 2021, from https://www.worldatlas.com/maps/china

China wins world mining competition graph. (n.d.). *MINING.COM*. Retrieved May 4, 2021, from https://www.mining.com/china-burning-natural-resources/china-wins-world-mining-competition-graph/

*china-location-map—Synergy180*. (n.d.). Retrieved May 3, 2021, from https://synergy180.com/china-location-map/

*How many countries are there in the world? (2021)—Total & List | Worldometer*. (n.d.). Retrieved May 4, 2021, from https://www.worldometers.info/geography/how-many-countries-are-there-in-the-world/

*Here are the 20 busiest ports on the planet*. (n.d.). World Economic Forum. Retrieved August 19, 2021, from https://www.weforum.org/agenda/2019/02/visualizing-the-world-s-busiest-ports/

*Top 10 Busiest Ports in The World*. (n.d.). Retrieved May 4, 2021, from https://www.lotus-containers.com/en/blog/news/top-10-busiest-ports-in-the-world/

*චීනය බලවත් වුයේ කෙසේ ද? ලොව මවිත කළ 'ආර්ථික හාස්කම'—BBC News සිංහල*. (n.d.). Retrieved May 4, 2021, from https://www.bbc.com/sinhala/world-49895989

මහජන චීන සමූහාණ්ඩුව පිහිටුවීම. (n.d.). Retrieved May 4, 2021, from https://roar.media/sinhala/main/history/founding-of-the-peoples-republic

Morgenthau, H. J. (1948). *Politics among Nations*. Alfred A Knopf.

Abeysinghe, C., & Wijesinghe, H. (2021). Political-Economic impact of growing rivalry between china and the Quad Alliance on Small states in Asia: Special Reference to Sri Lanka. *Technium Social Sciences Journal*, *19*, 545-562. Retrieved May 27, 2021, from

https://www.researchgate.net/publication/351441213_Political-Economic_impact_of_growing_rivalry_between_china_and_the_Quad_Alliance_on_Small_states_in_Asia_Special_Reference_to_Sri_Lanka.

ADB. (2011). Asia 2050: Realizing the Asian Century. Asian Development Bank. Retrieved February 14, 2021, from

http://www.iopsweb.org/researchandworkingpapers/48263622.pdf

https://www.worldshipping.org/top-50-ports

Spykman, N. (1942). *America's strategy in World Politics*. Harcourt, Brace and Company.




© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

UNCTAD. (2021). *Review Of Maritime Transport 2021*. United Nations Publications.

Cohen, S. (2015). *Geopolitics: The Geography of International Relations* (3rd ed.). Rowman & Littlefield.

Rathnayaka, K., 2020. අනාගත ලෝක භූ දේශපාලන අර්බුද. දේශපාලන විද්‍යා ලිපි , 01(01), pp. 01 -12.

https://www.researchgate.net/publication/354544379_3461_3505_3535_3484_3501_95_3517_3549_3482_95_3511_3542_95_3503_3546_3521_3508_3535_3517_3505_95_3461_3515_3530_3510_3540_3504

Mackinder, H. (1919). *Democratic Ideals and Reality*. Henry Holt and Company, Inc.

Davidovich, T. G., & Olegovna, G. V. (2018). Geopolitical Configurations in ASIA . *Communication and Public Diplomacy*, *01*(01), 89–97. Retrieved January 30, 2023, from https://www.davidpublisher.com/Public/uploads/Contribute/5fa39fb5a5f07.pdf.

 © 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහහතරවන කලාපය 2022 දෙසැම්බර්
පිටු 24-32
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# තත්කාලින සමාජ පරිස්ථිතිය නිරූපණය කිරීම උදෙසා මායා යථාර්ථවාදී ලක්ෂණ භාවිතයඃ පියල් කාරියවසම්ගේ වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාව ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි

## (Use of surrealistic features to depict real-time social situations, An investigative study based on Piyal Kariyawasam's novel වීදුරු කුඩු කැවුණු කලෙක)

රශ්මි හෙට්ටිආරච්චි[1] සහ චම්පා එස්. ද සිල්වා[2]

භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
**rashminimeshika1819@gmail.com**

### Abstract

Magical realism, a concept that goes beyond deadly realism to reflect reality and intricacy, is a popular literary notion in today's third world countries. The main objective of magical realism was to present the society in which we live and human life in an unconventional way that transcends the standard, both qualitatively and logically. Originally used in German art criticism, the concept became popular in the field of literature, primarily based on the works of Latin American writers. Magical realism is characterized in literature as well as in short stories and novels. In this study, Piyal Kariyawasam's novel, "Weeduru Kudu Kawnu Kaleka", explores how Magical realism features that depicated at represent the prevailing social sitation. The primary sources are based on the Piyal Kariyawasam's Novel, "Weeduru Kudu Kawnu Kaleka" and the secondary sources are theoretical books, journals, articles on magic realism and novels, and the internet. For this study, the researcher has used the theories by Wendy B. Farris's and the features of magical realism and some of the other features found in magical realism novels through qualitative methodology. The research identifies the qualities of magical realism under the heading of a combination of myth, illusion, and truth, language use pluralism, and mental function analysis. Thus, the use of ancient wisdom in the depiction of miraculous moments, the use of language that transcends the standard of time, space, and non-identity, the use of language, the use of language in protest dreams, and the use of occasions to represent the realm of the dead and the eternal world through the magic of novels have all been used to illustrate reality. Magical realism can be identified as a successful way of representing reality, and that novels with magical realistic features do not negate reality or deviate from reality, and that the use of magical realistic features gives the novelist a better approach to reality.

**Key Words**: Magical realism, Realism, Society, Myth, Dreams

### සාරසංක්ෂේපය

යථාර්ථයෙහි සංකීර්ණත්වය නිරූපණය කරමින් යථාර්ථවාදයෙහි මර්යාදා පුළුල් කෙරෙන විචාර සංකල්පයක් වන මායා යථාර්ථවාදය වර්තමානය වන විට තුන් වැනි ලෝකයේ රටවල ජනප්‍රිය වී ඇති සාහිත්‍ය සංකල්පයකි. අප ජීවත් වන සමාජයත්, මනුෂ්‍ය ජීවිතයත් සම්මතය ඉක්මවා ගිය අසම්මත ස්වරූපයකින් තත්ත්වානුකූලවත්, තර්කානුකූලවත් නිරූපණය කිරීම මායා යථාර්ථවාදයෙහි මූලික අරමුණ විය. මුල් කාලීන ව ජර්මානු චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ විචාර කාර්යය සඳහා යොදා ගෙන ඇති මෙම සංකල්පය සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රසිද්ධියට පත් වූයේ ප්‍රධාන වශයෙන් ම ලතින් ඇමරිකානු ලේඛකයන්ගේ කෘති මූලික කොට ගෙන ය. ලාංකේය සාහිත්‍යයෙහි ද කෙටිකතා සහ නවකතා ශානරයන්හි මායා යථාර්ථවාදයේ ලක්ෂණ ගැබ් ව පවතී. මෙම අධ්‍යයනයේ දී තත්කාලින සමාජ පරිස්ථිතිය නිරූපණය කිරීම උදෙසා මායා යථාර්ථවාදී ලක්ෂණ භාවිත කර ඇති ආකාරය පියල් කාරියවසම්ගේ වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාව ඇසුරින් විමර්ශනය කර ඇත. ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් පියල් කාරියවසම්ගේ වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාව පදනම් කර ගත් අතර ද්වීතීයික මූලාශ්‍රය වශයෙන් මායා යථාර්ථවාදය සහ නවකතා සම්බන්ධයෙන් රචනා වූ න්‍යායාත්මක ග්‍රන්ථ, සඟරා, විචාර ලිපි සහ අන්තර්ජාලය භාවිත කර ඇත. මෙම අධ්‍යයනය සඳහා වෙන්ඩි. බී ෆාරිස් ඉදිරිපත් කර ඇති මායා යථාර්ථවාදී ලක්ෂණ සහ මායා යථාර්ථවාදී නවකතාවල දැක ගත හැකි තවත් ලක්ෂණ කිහිපයක් ගුණාත්මක ක්‍රමවේදය ඔස්සේ විශ්ලේෂණය කර ඇත. මිථ්‍යාව - මායාව සහ සත්‍යය සංකලනය, භාෂා භාවිතය, මානසික ක්‍රියාකාරිත්වය විශ්ලේෂණය යන ප්‍රධාන කරුණු යටතේ තත්කාලීන සමාජය පිළිබඳ තතු නවකතාවෙහි

ගොනු කර ඇති ආකාරය මෙහි දී විමර්ශනයට පාත්‍ර වී ඇත. ඒ අනුව ආශ්චර්යාත්මක අවස්ථා නිරූපණය, පුරාණ ප්‍රඥාව භාවිත කිරීම, යථාර්ථ නිරූපණය, කාලය - අවකාශය සහ අනන්‍යතාව පිළිබඳ සම්මත තත්ත්වය අතික්‍රමණය කෙරෙන අවස්ථා භාවිතය, භාෂා භාවිතයේ විවිධතා, සිහින මගින් අවස්ථා නිරූපණය කිරීම සහ මළවුන්ගේ ලෝකය සහ සැබෑ ලෝකය යා කිරීම යන මායා යථාර්ථවාදී ලක්ෂණ භාවිතයෙන් නවකතාවෙහි යථාර්ථය නිරූපණය කර ඇති බව පැහැදිලි විය. මායා යථාර්ථවාදය යථාර්ථය නිරූපණය කිරීමේ සාර්ථක විධික්‍රමයක් බවත්, මායා යථාර්ථවාදී ලක්ෂණ අන්තර්ගත නවකතාවල යථාර්ථය නිෂේධනය කිරීමක් හෝ යථාර්ථයෙන් බැහැර වීමක් සිදු නොවන බවත්, මායා යථාර්ථවාදී ලක්ෂණ භාවිතයෙන් යථාර්ථයට වඩාත් හොඳින් ප්‍රවේශ වීමේ හැකියාව නවකතාකරුට ලැබෙන බවත් මෙම අධ්‍යයනයෙන් නිගමනය කළ හැකි විය.

**කේන්ද්‍රීය වචනඃ** මායා යථාර්ථවාදය, යථාර්ථවාදය, සමාජය, මිථ්‍යාව, සිහින

## හැඳින්වීම

පශ්චාත් යථාර්ථවාදී සාහිත්‍ය සංකල්පයක් වන මායා යථාර්ථවාදය, යථාර්ථවාදය නම් සාහිත්‍ය ශානරයෙන් වෙන් කර හඳුනා ගත හැකි සංකල්පයක් නොවේ. යථාර්ථවාදය යල් පැන ගිය රීතියක් ලෙස සලකා එය බැහැර කරන්නන්ගේ මතය වී ඇත්තේ ඒ වෙනුවට මායා යථාර්ථවාදයත්, අධි යථාර්ථවාදයත් භාවිත කළ යුතු බව වුවත් එය කරුණු නිවැරදි අයුරින් වටහා නොගෙන දැක් වූ දුර්මතයකි (අමරසේකර, 2008:16). මායා යථාර්ථවාදය සාහිත්‍යමය පාර්ශවයෙන් භාවිත කර ඇත්තේ යථාර්ථයෙන් පලා යාමේ අධ්‍යාශයෙන් නොව යථාර්ථයට වඩාත් හොඳින් ප්‍රවේශ වීම උදෙසා ය. මෙම අධ්‍යයනයට පදනම් වන මායා යථාර්ථවාදය බිහි වූයේ, යථා අර්ථය ඉදිරිපත් කිරීමට යථාර්ථවාදය ප්‍රාමාණික නොවුයෙන් අධියථාර්ථවාදය නම් සාහිත්‍ය සංකල්පයෙන් පැන නැගුණු, යථාර්ථය වඩාත් හොඳින් විශද කිරීමේ මාර්ගයක් වශයෙනි. මායා යථාර්ථවාදය, එහි ලක්ෂණ සහ ප්‍රවණතා පදනම් කොට ගෙන පශ්චාත් නූතන යථාර්ථවාදය (Post Modern Realism), අද්භූත යථාර්ථවාදය (Romantic Realism), රූපකාත්මක යථාර්ථවාදය (Magic Realism) සහ ආශ්චර්යාත්මක යථාර්ථවාදය (Marvelous Reality) සහ බරොක් යථාර්ථවාදය යන නම්වලින් හඳුන්වනු ලැබේ.

මායා යථාර්ථවාදය යන යෙදුම වර්ෂ 1725 දී පමණ ජර්මන් ජාතික කලා විචාරකයෙකු වූ **ෆ්‍රාන්ස් රෝ** (France Roh) විසින් මුලින් ම ලෝක සාහිත්‍යයට හඳුන්වා දී ඇත. මෙම සංකල්පය මුලින් ම විද්‍යමාන වී ඇත්තේ චිත්‍ර කලාව ආශ්‍රයෙනි. යථාර්ථවාදී සාහිත්‍යයේ ප්‍රවණතා ද මුලින් ම ප්‍රකට වන්නේ ස්පාඤ්ඤ ජාතික චිත්‍ර ශිල්පියෙකු වූ ෆ්‍රැන්සිස්කෝ ගෝයාගේ නිර්මාණවලින් ය (කුමාරසිංහ, 2019:16). මායා යථාර්ථවාදය මුල් කාලීන ව භාවිත කර ඇත්තේ ජර්මානු චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ විචාර කාර්යය සඳහා ය (කුමාරසිංහ, 2018:08). මෙම සංකල්පය නවකතාව නම් සාහිත්‍යාංගයෙහි මුලින් ම භාවිත වී ඇත්තේ ආජන්ටියානු ලේඛක **ජෝර්ජ් ලුයිස් බෝර්ගෙස්ගේ** (Jorge Luis Burges) නව ප්‍රබන්ධ කතා හැඳින්වීම සඳහා ය. විචාර සංකල්පයක් ලෙස මායා යථාර්ථවාදය නම් සංකල්පය ප්‍රසාරණය වීමෙහි ලා දායකත්වය ලබා දී ඇත්තේ කියුබානු ජාතික **ඇලෙජෝ කාපෙන්ටියර්** (Alejo Carpentier) නම් ලේඛකයා විසිනි (කුමාරසිංහ, 2018:9). ඔහුට 'මැජික් රියලිසම්' (Magic Realism) යන යෙදුම නිර්මාණය සහ භාවිතයට ගැනීම පිළිබඳ ගෞරවය පිරිනැමෙන අතර ප්‍රධාන එදිනෙදා ජීවිතයෙහි ම පවත්නා ආශ්චර්යය ද මැකී නොයන සේ සාහිත්‍ය කලාවන්ට හසු කර ගැනීම මායා යථාර්ථවාදය බව කාපෙන්ටියර් තවදුරටත් දක්වා ඇත (අමරකීර්ති, 2015:2012).

මායා යථාර්ථවාදයෙහි මූලික අභිප්‍රාය වන්නේ, අප ජීවත් වන සමාජයත්, මනුෂ්‍ය ජීවිතයත් සම්මතය ඉක්මවා ගිය අසම්මත ස්වරූපයකින් තත්ත්වානුකූලවත්, තර්කානුකූලවත් නිරූපණය කිරීම ය. යථාර්ථවාදයේ දී සමාජයත්, මනුෂ්‍යයාත් විවරණය කරනුයේ සම්මත ස්වරූපය හෙවත් පවත්නා තත්ත්වය තර්කානුකූල ව නිරූපණය කිරීම මගින් ය. මින් පැහැදිලි වන කරුණ නම්, මායා යථාර්ථවාදය මගින් යථාර්ථය නිශේධනය කිරීමක් සිදු නොවන බව ය. මෙයින් සිදු වන්නේ, වඩාත් හොඳින් යථාර්ථවාදයේ පරිමාව පුළුල් කිරීම, සංකීර්ණ කිරීම සහ ගැඹුරු කිරීම ය. මායා යථාර්ථවාදීන්ගේ අදහස වන්නේ, යථාර්ථවාදයට ජීවන සත්තාවෙහි ඒකදේශයක් හසු වන බවත්, එහි විවිධාංග වටහා ගැනීමට මායා යථාර්ථවාදය ඉවහල් වන බවත් ය (දිසානායක, 2004:104). යථාර්ථය පිළිබඳ අපගේ සම්මත අදහස අභියෝගයට ලක් කිරීම මායා යථාර්ථවාදයෙන් සිදු වේ.

සිංහල සාහිත්‍යය ද කලින් කලට වෙනස් වෙමින් විවිධ රීතීන් ඔස්සේ පෝෂණය වෙමින් ඉදිරියට පැමිණ ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස බටහිර රටවල ප්‍රචලිත රීතියක් වූ ඉන්ද්‍රජාලික යථාර්ථවාදය හෙවත් මායා යථාර්ථවාදය සිංහල නවකතා සහ කෙටිකතා යන සාහිත්‍ය ශානරයන්හි තම අනන්‍යතාව තහවුරු කර ගෙන ඇත. ලාංකේය සාහිත්‍යයේ මායා යථාර්ථවාදයේ පුරෝගාමියා වන්නේ සයිමන් නවගත්තේගමයි (කුමාර, 2014:9). නමුත් ඔහුගේ නිර්මාණවල බොහෝ අවස්ථාවල අධියථාර්ථවාදී ලක්ෂණ දැක ගත හැකි ය. සිංහල සාහිත්‍යයේ මායා යථාර්ථවාදී සංකල්පය භාවිත කළ ලේඛකයන් ලෙස සයිමන් නවගත්තේගම, ටෙනිසන් පෙරේරා, ලියනගේ අමරකීර්ති, මොහාන් රාජ් මඩවල, මංජුල වෙඩිවර්ධන, කපිල කුමාර කාලිංග, ආරියවංශ අබේසේකර, පියල් කාරියවසම් සහ නිශ්ශංක විජේමාන්න යන ලේඛකයන් දැක්විය හැකි ය. ඔවුන්ගේ කෘතිවල මායා යථාර්ථවාදී ලක්ෂණ අඩු වැඩි වශයෙන් දැක ගත හැකි ය. මෙකී ලේඛකයන් විවිධ ආඛ්‍යාන ශෛලීන්, විවිධ වස්තු විෂයන් ඔස්සේ තමන්ට ම ආවේණික අයුරින් මායා යථාර්ථවාදය සිය නවකතා සහ කෙටිකතාවල අන්තර්ගත කොට ඇත. නිදසුනක් වශයෙන් නවගත්තේගම සිය කෘතිවල බුදු දහම, ෆ්‍රොයිඩියානු සංකල්ප සහ මාක්ස්වාදය එක් තැන් කොට ඇත. ටෙනිසන් පෙරේරා සිය **සක්වල දඩයම** කෘතියෙහි ඉන්දීය උත්තරාරෝපනයේ සන්දර්භයක පුරාකෘතික ස්ත්‍රීවාදී කතිකාවක් ඉස්මතු කරයි (කුමාර, 2014:11). මොහාන් රාජ් මඩවල සිය **ලොවීනා**, **මාගම් සෝලිය**, **රැජින** සහ **ආදරණීය වික්ටෝරියා** වැනි නවකතාවලින් පාඨක අවධානයට යොමු කිරීමට ප්‍රයත්න දරා ඇත්තේ, පුරුෂ කේන්ද්‍රීය සමාජයක කාන්තාවට මුහුණ පෑමට සිදු වන විවිධාකාර දුක් ගැහැට පිළිබඳ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ව ය (කුමාරසිංහ, 2018:54). ලේඛකයන් සිය මුඛ්‍ය අරමුණ පාඨකයාට ඉදිරිපත් කිරීමේ විධික්‍රමයක් ලෙස ද මායා යථාර්ථවාදය භාවිත කර ඇත.

මායා යථාර්ථවාදය යන යෙදුමෙහි ඇති වචනද්වයෙහි එකිනෙකට සාම්‍යයක් දැක ගත නොහැකි ය. මෙම වචන විරෝධෝක්ති ලෙස සැලකේ. එකිනෙකට පරස්පරතාවක් දක්වන වචන වේ. මායා යථාර්ථවාදය යන වචනද්වයෙහි සංයෝගයෙන් නැගෙන සංකල්පයෙහි අර්ථය පැහැදිලි කිරීම අපහසු බව ඇතැම් විචාරකයෝ පවසති. එයට හේතුව වන්නේ, මායාව මගින් යථාර්ථය ඉදිරිපත් කිරීම කෙතෙක් දුරට සාර්ථක වන්නේ ද පිළිබඳ ගැටලු ඇති වීමයි. සාහිත්‍ය කෘතියක මායාව මගින් යථාර්ථය සාර්ථක අයුරින් නිරූපණය කළ හැකි ද? යන ගැටලුව ද එහිදී ඇති වේ. නමුත් මෙම මායාව සහ යථාර්ථය යන වචන දෙක අතර පරස්පරතාවක් පෙනී ගිය ද එහි ගැඹුරට කිඳා බැස සත්‍යය විනිවිද දක්නා විටෙක ඒ අතර දුරස්තර සමීපතාවක් දැක ගත හැකි ය (කුමාරසිංහ, 2018:6). මිනිසාගේ භෞතික ක්‍රියාවලිය පිළිබඳ මායා යථාර්ථවාදීන් විමසිලිමත් විය. මසැ'සින් දැකිය හැකි දේ එක ම තලයක දී විඥානවාදී නොවී භෞතික තත්ත්වය ඇසුරෙන් විවරණය කිරීම මායා යථාර්ථවාදයෙන් සිදු වේ. එනම්, මායා යථාර්ථවාදයෙන් සිදු වන්නේ පවත්නා සත්‍යය - යථාර්ථය වෙනස් සන්දර්භයක් මගින් විශ්ලේෂණය කිරීමයි. එසේ පවත්නා යථාර්ථය වෙනස් සන්දර්භයක් මගින් නිරූපණය කිරීමේ දී මායා යථාර්ථවාදී ලක්ෂණ භාවිත කර ඇති ආකාරය **පියල් කාරියවසම්ගේ වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාව** ඇසුරින් විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයෙන් සිදු වේ.

## සාහිත්‍ය විමර්ශන

කුලතිලක කුමාරසිංහගේ **මායා යථාර්ථවාදය** (2018) ග්‍රන්ථය මෙහිදී මූලික වශයෙන් උපයෝගී කොට ගෙන ඇත. එහි මායා යථාර්ථවාදයේ ප්‍රභවය, නිර්වචන සහ මූලික අරමුණ පිළිබඳ දක්වා ඇත. මායාව සහ යථාර්ථය නම් එකිනෙකට පරස්පර වචන දෙකේ සුසංයෝගයෙන් නැගෙන මෙම සංකල්පය ගැඹුරින් අධ්‍යයනය කර සත්‍ය විනිවිද දක්නා විට එම වචනවල දුරස්තර සමීපතාවක් දැකිය හැකි බව මෙම ග්‍රන්ථයේ සඳහන් වේ. මායා යථාර්ථවාදයේ අනන්‍යතා ලක්ෂණ පිළිබඳ ෆ්‍රාන්ස් කෆ්කා සහ සල්මන් රුෂ්දිගේ සාහිත්‍ය කෘති මගින් දක්වා ඇත. මායා යථාර්ථවාදය ලෝක සාහිත්‍යයේ ප්‍රචලිත කිරීමට ප්‍රධාන වශයෙන් දායක වූ ගබ්‍රියෙල් ගාර්ෂියා මාර්කේස් සහ ඔහුගේ කෘති පිළිබඳවත්, සල්මන් රුෂ්දි, ඉසබෙල් අයියන්දේ, ගුන්ටර් ග්‍රාස්, ටෝනි මොරිසන්, ඇන්ජලා කාටර් වැනි සාහිත්‍යධරයන්ගේ නිර්මාණ පිළිබඳවත් දක්වා ඇති කරුණු මෙම අධ්‍යයනයට දායක වී ඇත.

ලියනගේ අමරකීර්තිගේ **අමුතු කතාව** (2015) ග්‍රන්ථය ද මෙම අධ්‍යයනය සඳහා දායක කර ගෙන ඇත. එහි ආශ්චර්යාත්මක යථාර්ථවාදය පශ්චාත් යථාර්ථවාදයක් ලෙස යන ලිපිය මෙහි දී ප්‍රධාන වශයෙන් භාවිත කර ඇත. මෙම ලිපියෙහි අමරකීර්ති මායා යථාර්ථවාදය (Magic Realism) සඳහා **ආශ්චර්යාත්මක යථාර්ථවාදය** යන පාරිභාෂික පදය ඉදිරිපත් ඇති අතර එසේ හැඳින්වීමට හේතු වූ කරුණු ද දක්වා ඇත. මෙම ලිපියෙහි ආශ්චර්යාත්මක යථාර්ථවාදය, යථාර්ථවාදී සම්ප්‍රදාය මුළුමනින් ම අත්හැර යාමක් නොවන බවට කරුණු දක්වා ඇත. ගුන්තර් ග්‍රාස්ගේ තඹඩු බෙරය, හොසේ සරමාගෝගේ අන්ධභාවය, සල්මන් රුෂ්දිගේ රෑ මැදියමේ දරුවෝ සහ ඉසබෙල් අයියන්දේගේ භූත ගෙදර වැනි කෘතිවල ඇති අවස්ථා සහ සිද්ධි නිදසුන් වශයෙන් ගෙන ඒ ඇසුරෙන් යථාර්ථය පිළිබඳ පවතින සම්මත අදහස අභියෝගයට පත් කර ඇති ආකාරය මෙම පර්යේෂණ පත්‍රිකාවේ දක්වා ඇත. මෙහි දී වෙන්ඩි බී. ෆාරිස් ඉදිරිපත් කර ඇති ආශ්චර්යාත්මක යථාර්ථවාදී ප්‍රබන්ධ කතාවේ අංග ලක්ෂණ පහක් පිළිබඳ සවිස්තරාත්මක විවරණයක් විශ්ව සාහිත්‍යය කෘති ඇසුරෙන් දක්වා ඇත. ආශ්චර්යාත්මක යථාර්ථවාදයේ මහාර්ඝ කෘතිය වන වසර සියයක හුදෙකලාව කෘතියෙහි යථාර්ථවාදී ලක්ෂණ පිළිබඳ ව දක්වා ඇත. ආශ්චර්යාත්මක යථාර්ථවාදය, පශ්චාත් යථාර්ථවාදයක් ලෙස වටහා ගැනීමට අවශ්‍ය කරුණු පිළිබඳ අවබෝධයක් මෙමගින් ලබා ගැනීමට හැකි ය. කේ. කේ සමන් කුමාරගේ **සාහිත්‍ය ශානර විමංසා** (2014) ග්‍රන්ථය ද මෙම පර්යේෂණය සඳහා භාවිත වේ. එහි අන්තර්ගත මායා යථාර්ථවාදය (ඉන්ද්‍රජාලික යථාර්ථවාදය) යන ලිපියෙහි මායා යථාර්ථවාදී යෙදුමේ මුල් කාලීන නිර්මාණ සඳහා භාවිතය, එහි ලෝක ආගමනය සහ මෙම රීතියෙහි ලක්ෂණ පිළිබඳ කරුණු දක්වා ඇත. විශ්ව සාහිත්‍යයේ මායා යථාර්ථවාදය භාවිත කළ ලේඛකයන් අතර ගබ්‍රියෙල් ගාර්ෂියා මාර්කේස්, ඉසබෙල් අයියන්දේ, කැස්ටනේඩා වැනි ලේඛකයන්ගේ කෘතිවල මායා යථාර්ථය මගින් මතු කරන යථාර්ථයත්, සයිමන් නවගත්තේගම, ටෙනිසන් පෙරේරා වැනි ලාංකේය ලේඛකයන්ගේ කෘතිවල මායා යථාර්ථය මගින් මතු කරන යථාර්ථයත් පිළිබඳ දක්වා ඇති කරුණු මෙම අධ්‍යයනය සඳහා දායක වේ. මායා යථාර්ථවාදය කෙරෙහි බලපෑම් ඇති කළ සංකල්ප, විචාරවාද සහ විෂයන් සම්බන්ධයෙන් ද මෙම පර්යේෂණ පත්‍රිකාවේ සඳහන් වේ.

විමල් දිසානායකගේ **නව විචාර සංකල්ප** (2004) ග්‍රන්ථය ද මෙම අධ්‍යයනය සඳහා භාවිත කර ඇත. එහි මායා යථාර්ථවාදය යන ලිපියෙහි මායා යථාර්ථවාදයෙහි ව්‍යාප්තිය පිළිබඳ සහ එහි ස්වීයත්වය දැක්වීම සඳහා විශ්ව සාහිත්‍යයේ කෘති කිහිපයකින් නිදසුන් දක්වා ඇත. මායා යථාර්ථවාදී නවකතාවල ලක්ෂණ සහ එහි විශේෂත්වය මෙහි දී සාකච්ඡා කොට ඇත.

කුලතිලක කුමාරසිංහ විසින් රචිත **යථාර්ථවාදී ප්‍රභේද, රූපකාත්මක යථාර්ථවාදය හා මොහාන් රාජ් මඩවල** (2019) ග්‍රන්ථය ද මෙම අධ්‍යයනයේ සාහිත්‍ය විමර්ශනය සඳහා දායක කර ගෙන ඇත. මෙම කෘතියෙහි දැක්වෙන යථාර්ථවාදය, නව යථාර්ථවාදය, අධියථාර්ථවාදය, රූපකාත්මක යථාර්ථවාදය හා සිංහල නවකතාව, ලොවීනා, ආදරණීය වික්ටෝරියා, රැජින යන ලිපි මෙම අධ්‍යයනය සඳහා භාවිත කිරීමට අපේක්ෂිත ය. ඉහත දක්වා ඇති ග්‍රන්ථ මගින් මෙම පර්යේෂණයේ සාහිත්‍ය විමර්ශන ශානරය පෝෂණය කිරීමට අපේක්ෂිත ය.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පර්යේෂණ ගැටලුව

මායාව සහ යථාර්ථය නම් සංකල්ප දෙකෙහි සංකලයක් වන මායා යථාර්ථවාදය මගින් තත්කාලින සමාජ යථාර්ථය නිරූපණය කළ හැකි ද?

## පර්යේෂණ අරමුණ

තත්කාලීන සමාජ පරිස්ථිතිය විවරණය කිරීමෙහි ලා මායා යථාර්ථවාදය නම් සාහිත්‍යය සංකල්පය සිංහල නවකතාවන්හි භාවිත කොට ඇත්තේ කෙසේ දැයි පරීක්ෂා කිරීම මෙහි මුඛ්‍ය අරමුණ වේ.

## පර්යේෂණ වැදගත්කම

මායා යථාර්ථවාදය යන සාහිත්‍ය සංකල්පය ආශ්‍රය කොට ගනිමින් පර්යේෂණ ගණනාවක් කර ඇත. නවකතා පදනම් කොට ගනිමින් ද මායා යථාර්ථවාදය සම්බන්ධයෙන් අධ්‍යයනයන් සිදු කොට ඇත. නමුත් මෙම අධ්‍යයනයට පාදක කොට ගත් කෘතිය මෙතෙක් මායා යථාර්ථවාදය සම්බන්ධ අධ්‍යයනයන්ට භාවිත කර නැත. මෙහි දී අධ්‍යයනයන්ට පාදක නොවූ කෘතියක් භාවිත කර ඇති නිසා එමගින් නව දැනුමක් ලබා ගත හැකි වේ.

මෙම අධ්‍යයනයේ දී මූලික වශයෙන් 'වීදුරු කුඩු කැවුණු කලෙක' ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ගෙන විමර්ශනාත්මක ක්‍රමවේදය මගින් අධ්‍යයනයට ලක් කිරීමට අපේක්ෂිත ය . ද්විතීයික මූලාශ්‍රය ලෙස මායා යථාර්ථවාදය පිළිබඳ ලියැවුණු න්‍යායාත්මක කෘති සහ සිංහල නවකතාව පිළිබඳ රචනා වී ඇති කෘති, සඟරා, විචාර ලිපි සහ අන්තර්ජාලය භාවිත කෙරෙයි. දත්ත විශ්ලේෂණයේ දී මෙම අධ්‍යයනයේ විචල්‍යය වන මායා යථාර්ථවාදය ප්‍රදර්ශනය වන කරුණු කිහිපයක් තෝරා ගෙන ඒවා මෙම නවකතාවෙහි නිරූපණය වන්නේ දැයි විස්තරාත්මක ප්‍රවේශය යටතේ ඉදිරිපත් කෙරේ.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් පියල් කාරියවසම්ගේ වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාව භාවිත කළ අතර ද්විතීයික මූලාශ්‍රය ලෙස මායා යථාර්ථවාදය පිළිබඳ ලියැවුණු න්‍යායාත්මක කෘති සහ සිංහල නවකතාව පිළිබඳ රචනා වී ඇති කෘති, සඟරා, විචාර ලිපි සහ අන්තර්ජාලය භාවිත කෙරෙයි. ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් සිදු කිරීමට අපේක්ෂිත ය.

ද්විතියික මූලාශ්‍රය මගින් මෙම අධ්‍යයනයට අවශ්‍ය න්‍යායාත්මක කරුණු ගොනු කර ගැනීමට අපේක්ෂා කෙරේ. ප්‍රාථමික මූලාශ්‍රය වන වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාවෙහි නිරූපිත මායා යථාර්ථවාදී ලක්ෂණ මූලික කොට ගනිමින් මෙහි දී විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂිත ය.

## සාකච්ඡාව

පියල් කාරියවසම් විසින් රචිත 'වීදුරු කුඩු කැවුණු කලෙක' නවකතාව අගනුවර ආසන්නයේ සේවය කරන මහේස්ත්‍රාත්වරයෙකුගේ ජීවිතය කේන්ද්‍ර කර ගනිමින් තත්කාලීන සමාජ පරිස්ථිතිය හා සම්බන්ධ සිදුවීම් කිහිපයක් ආශ්‍රයෙන් නිර්මාණය වී ඇත. තුරුණුවිය ඉක්මවමින් සිටින මහේස්ත්‍රාත්වරයෙකු මෙන් ම විවාහක නාගරික පුරුෂයෙක් ද වන කථකයා සමාජ ජීවිතයේ දී අත්විඳින විවිධාකාර අවස්ථාවන් සම්බන්ධ විවිධ සංකීර්ණතා ද නවකතාවෙහි නිරූපණය කර ඇත. මෙම සංකීර්ණතා මතු කිරීමේ දී ඒ සඳහා උචිත ආකෘතියක් මෙන් ම කතා සන්දර්භයක් ද පැවතිය යුතු ය. කතුවරයා එම අභියෝගය ජය ගැනීම සඳහා යථාර්ථවාදී රීතිය මෙන් ම යථාර්ථවාදී රාමුවට එහා යමින් මායා යථාර්ථවාදී ලක්ෂණ ද නවකතාවට භාවිත කර ඇත. විශේෂත්වය වන්නේ එය නවකතාවෙහි කතා විකාසනය කෙරෙහි බලපෑමක් සිදු නොකිරීම ය.

මායා යථාර්ථවාදී සාහිත්‍ය කෘතියක පවතින ලක්ෂණ කිහිපයක් දැක ගත හැකි ය. වෙන්ඩි බී. ෆාරිස් විසින් දක්වා ඇති මායා යථාර්ථවාදී සාහිත්‍ය කෘතියක පවතින ලක්ෂණ පහක් පිළිබඳ ලියනගේ අමරකීර්ති විසින් සිය අමුතු කතාව කෘතියෙහි දක්වා ඇත. එම ලක්ෂණ අතරින් ආශ්චර්යාත්මක අවස්ථා නිරූපණය මගින් යථාර්ථය මනාව ඉස්මතු කිරීම, මළවුන්ගේ ලෝකය සහ සැබෑ ලෝකය වශයෙන් එකිනෙකට සපුරා වෙනස් ලෝක දෙකක සම්බන්ධය නිරූපණය සහ කාලය - අවකාශය සහ අනන්‍යතාව සම්බන්ධයෙන් පවත්නා සම්මතය අතික්‍රමණය කිරීම යන ලක්ෂණ ඇසුරින් මෙම අධ්‍යයනය කෙරෙයි.

වෙන්ඩි. බී ෆාරිස්ට අනුව මායා යථාර්ථවාදී නවකතාවල එක් ලක්ෂණයක් වන්නේ ආශ්චර්යාත්මක අවස්ථා ඇසුරු කර ගනිමින් යථාර්ථය නිරූපණය කිරීම ය. එහි දී යථාර්ථයත් ආශ්චර්යත් එකට බැඳී පවතින පරිදි නිරූපණය කොට ඇත. මෙම ආශ්චර්යාත්මක අවස්ථා විශ්වසනීයත්වය හා අවිශ්වසනීයත්වය අතරත්, භව්‍යත්වය හා අභව්‍යත්වය අතරත් දෝලනය වන පරිදි නිරූපණය කර ඇත. නිදහස් මතධාරීන්ට අත්වන ඉරණමෙහි ඛේදනීය පාර්ශවය නවකතාව මගින් නිරූපණය උදෙසා ආශ්චර්යාත්මක අවස්ථා භාවිතයට කතුවරයා සමත් වී ඇත.

නවකතාවෙහි කථකයා විසින් ලියමින් පවතින කෙටිකතාවෙහි ප්‍රධාන චරිතය වන ශිෂ්‍ය නායකයා තමන් මරණයට පත් වූ බව නොදැන සිය නිවෙස වෙත යයි. එසේ නිවසට යන්නේ ඔහුගේ මනෝකාය ය. ඔහුව දිස් වන්නේ තිරිසන් සතුන්ට සහ ඔහු වැනි කය මිය ගිය ආත්මය පමණක් විශ්වයේ පවතින අයට පමණි. මෙය ආශ්චර්යාත්මක අවස්ථාවකි. මෙම අවස්ථාව කතුවරයා යොදා ගන්නේ සමාජ යථාර්ථයෙහි එක් පැතිකඩක් නිරූපණය උදෙසා ය. මින් දුබලයාගෙන් ප්‍රයෝජන ගෙන ඔවුන් පීඩාවට පත් කරන ප්‍රබලයන්ගේ ස්වභාවය පෙන්නුම් කෙරෙයි. එය නිරූපණය කෙරෙන්නේ ඔහුගේ ම ගමේ ජීවත් වූ සිරි මාමා නමින් හැඳින්වෙන පුද්ගලයාගේ මනෝකාය සමඟ කෙරෙන සංවාදය මගින් ය.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**"අපි අවුරුදු ගාණක් වී දුන්නෙ අමුණුගම මහත්තයලට බව උඹ දන්නවනෙ?' නිහඬතාවයකි.**

**'එන්න එන්නම උන්නැහේ නරක අතට හැරුණා. අපේ වී කුණු කොල්ලෙට කිරලා ගබඩා කරගෙන ඉඳලා තිකිණි මාසෙ සාගතේ ගැහුවම අපටම කොටලා විකුණන්ඩ ගත්තා. මං ඔය වැඬේට විරුද්ධව සමිතියක් පිහිටුවා ගන්ඩ පිළියෙල කරා... එදාම බිං කරුවලේ පුංචි හතාගෙන් පොල් රා ඩිංගක් බීලා ගල්වල ලඟ කොරටුවෙන් ඇල නියරෙට ගොඩ වුණා විතරයි. ටීං... ගාන සද්දයක් පිපිරුවා මගේ කන ලඟ...' "(කාරියවසම්, 2009:47).**

ඔවුන් දෙදෙනාට ම මරණය හිමි ව ඇත්තේ, අසාධාරණයට විරුද්ධ වීම හේතුවෙනි. සත්‍යය වසන් නොකිරීමත්, අසාධාරණයට විරුද්ධ වීමත් නිසා සිය ජීවිතයෙන් වන්දි ගෙවූ පුද්ගලයන් පිළිබඳ යථාර්ථය නවකතාකරු ඉදිරිපත් කරන්නේ යථාර්ථවාදී රාමුවෙන් ඔබ්බට ගොස් මායා යථාර්ථවාදය භාවිතයට ගනිමිනි. ගමේ පන්සලට පිවිසෙන මිය ගිය ශිෂ්‍ය නායකයාගේ ආත්මයට දක්නට ලැබෙන්නේ ඇහැලේපොළ රජ පවුල අමානුෂීය ලෙස ඝාතනය වීම පිළිබඳ ව සඳහන් වන කාව්‍යයක් ගායනා කරන පන්සලේ ස්වාමීන් වහන්සේ ය.

**"ගායනයේ රළු ඕසයට අනුකූල ලෙස උන්නාන්සේගේ දෙනෙත් ගිණි අඟුරු මෙන් රතුව ඇත්තේය. සර්වාංගය වෙවුලවමින් උන් වහන්සේ ගයන කළ, ප්‍රලය වූ ඇඟ මසින් බිමට බේරී වැටෙන්නාවූ රසදිය වන් ඝන දහඩිය බිඳු, ලැගුම් ගෙයි බිම පතිත-පතිත වූ තැනින් නයි හතු පිපී මතු වෙයි..."(කාරියවසම්, 2009:46).**

මෙහි ස්වාමීන් වහන්සේගේ සිරුරෙන් වැටෙන දහඩිය වැටුණු තැන්වල නයි හතු පිපෙන බව දක්වා ඇත. එය ආශ්චර්යවත් අවස්ථාවකි. නයි හතු ඉතා උග්‍ර විෂක් සහිත ය. පෙනුමින් ඉතා සුන්දර ය. ස්වාමීන් වහන්සේගේ සිතෙහි අසාධරණය කෙරෙහි පවත්නා ප්‍රකෝපකාරී හැඟීම මෙම නයි හතු පිපීම ඔස්සේ නිරූපණය කර ඇත. මේ සිදුවීමෙන් පාලන පන්තිය කෙරෙහි සමාජයේ පවතින ද්වේෂ සහගත ප්‍රකෝපකාරීබව විස්තර කිරීමට කතුවරයා උත්සාහ ගෙන ඇත. ස්වාමීන් වහන්සේ ගායනා කරන කවියෙන් කියැවෙන්නේ ද අසාධාරණ පාලකයන් පිළිබඳ ව ද්වේශයක් සහ පීඩාවට පත් වූ පාලිතයන් පිරිසක් පිළිබඳ ව අනුකම්පාවක් ජනනය කරන සිදුවීමක් පිළිබඳව ය.

සමාජ සිදුවීම් නිරූපණය උදෙසා කතුවරයා විවිධ ආකෘති නවකතාව පුරා ම භාවිත කර ඇත. කථකයා අවසන් නොකළ කටයුතු රැසක් ඇත. ඒ අතර ලියා අවසන් නොකළ කෙටිකතා කිහිපයක්, ඔහුගේ පශ්චාත් උපාධිය සඳහා රැස් කළ ලේඛන ආදී වශයෙන් විය.

මින් එක් කෙටිකතාවක විශ්වවිද්‍යාල ශිෂ්‍ය මර්දනය පිළිබඳ දක්වා ඇත. එය ඔහුගේ ද සරසවි සමයේ ශිෂ්‍ය නායකයෙකු ඇසුරින් වූ නිර්මාණයකි. පිපාසය බඩගින්න සීතල ජ්ලේන්ටියකින් නිවා ගත් මෙම සිසු විරුවා අවසන ඝාතනය වේ.

**"තුම්මුල්ලෙන් හැරී වේගයෙන් ගමන් ගන්නා අංක තහඩු නොමැති වෑන් රිය. පිළියන්දලට ආසන්න වෙද්දී රථයේ පසුපස ආසනයේ හට ගන්නා මාරාන්තික පොර බැදීම. බොල්ගොඩ ගං ඉවුරේ කඳුරු, රිකිල්ල රුක් සෙවනේ නතර වන වෑන් රිය..."(කාරියවසම්, 2009:43).**

එවක සමාජයේ නිදහස් මතධාරීන්ගේ ඉරණම පිළිබඳ මෙවන් අවස්ථා මගින් නිරූපණයට කතුවරයා උත්සාහ ගෙන ඇත. මායා යථාර්ථවාදය යථාර්ථය වඩාත් හොඳින් ප්‍රවේශ වීමට භාවිත කෙරෙන සාහිත්‍ය සංකල්පයකි. යථාර්ථය නිරූපණය කිරීමේ දී භාෂාව භාවිත කළ ආකාරයේ ද විවිධ ස්වරූපයන් දැක ගත හැකි ය. සංක්ෂිප්ත බස් වහරක් නවකතාවෙහි භාවිත කර ඇත. කෙටි වාක්‍ය කිහිපයකින් ඉතා පුළුල් අදහසක් නිරූපණය කිරීමට කතුවරයා සමත් වී ඇත. තත්කාලීන සමාජය ගැඹුරින් නිරූපණය කෙරෙන අවස්ථාවක් වාක්‍ය තුනකට ගොනු කර ඉදිරිපත් කර ඇත. අංක තහඩු නොමැති වෑන් රිය, මාරාන්තික පොර බැදීම සහ රුක් සෙවණේ නතර වන වෑන් රිය යන වාක්‍ය අවසන් කෙරෙන වචන කිහිපය මගින් තත්කාලීන සමාජ සිදුවීම්වල ස්වරූපය පිළිබඳ පසක් වේ.

මෙම නවකතාව මුල, මැද අග පිළිවෙළින් ගලා යන නවකතාවක් නොවේ. කථකයා එක් වර ම අතීතයෙහි සක්මන් කරයි. තවත් අවස්ථාවක පාඨකයා හා සංකථනයෙහි යෙදේ. නැතිනම් ඔහු සිහින ලොවක තනි වෙයි. මෙවන් අවස්ථා අතරින් කථකයා අතීතයෙහි එක් සිදුවීමක් මගින් තත්යුගයේ පැවති භීෂණය පෙන්නුම් කිරීමට සමත් ව ඇත.

**"බෙර නාදය තුනී වනවාත් සමඟම දෙවොල් අවතාරයට වුව මා සිටින්නාවූ ඉසව්ව දැකගත හැකි වන ආකාරයට ෂෙල් වෙඩි පුපුරයි. මුඩුබිම දෙදරවමින් බිම් බෝම්බ පිපිරෙයි. ගිලා බසියි. සීතා වම් අතින් අල්ලා ගත් මම දුවන්නට වෙමි. අප දෙදෙනා දුවන්නාවූ මග දෙපස වැටී සිටින්නාවූ තරුණ සොල්දාදුවන්ගේ නොයෙක් ශරීර අංග කැඩී, දැවී, ඡේදනය වී ඇත්තේ ය..."(කාරියවසම්, 37:2009).**

1988 - 1989 භීෂණ සමය ලංකා ඉතිහාසයේ අඳුරුතම කාල පරිච්ඡේදයකි. සමස්ත රටෙහි ම කැලෑ නීතිය රජ කළ එම යුගයේ මෙරට බොහෝ ප්‍රදේශවල භීෂණය තදින් ම පැතිරී තිබිණ. කොළොන්න ආසනයට අයත් වූ ඇඹිලිපිටිය, සූරියකන්ද, උඩවලව, කුට්ටිගල යන ප්‍රදේශවල ජීවත් වූ ජනතාවට ද මෙකී භීෂණය පැතිර තිබිණ. කැලෑබද ප්‍රදේශ වැඩි ප්‍රමාණයක් පිහිටා තිබුණු එම ප්‍රදේශවල කැරලිකරුවන්ගේ ක්‍රියාකාරිත්වය වැඩි වශයෙන් පැවතිණ. ඇඹිලිපිටිය සිසු ඝාතනය ද මෙකී භීෂණ සමයේ සිදු වූ සත්‍ය සිදුවීමකි. කථකයා ඒ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සම්බන්ධයෙන් නිබන්ධයක් ලියමින් සිටී. නිබන්ධය සඳහා සත්‍ය තොරතුරු අවශ්‍යය වේ. ඔහුගේ රැකියාව අනුව එවැනි කරුණක් සම්බන්ධයෙන් සත්‍ය වාර්තා ලබා ගැනීමේ අපහසුවක් ඔහුට නොමැත. ඔහුගේ මිතුරෙකු වන නවකතාවේ අවස්ථා කිහිපයක දී ම හමුවන රජීව නැමැත්තා සහ ඔහුගේ නිලධාරීන් කථකයා සතු මෙම ඝාතනයට සම්බන්ධ විස්තර නිවස පරීක්ෂා කර සොයා ගනී. එම තොරතුරු ළඟ තබා ගැනීම වරදක් බව ඔවුහු පවසති. නවකතාව අවසන් වන්නේ කථකයාට මරණය ළඟා කරවමිනි.

> **"වෘත්තිය කියන්නෙ එකක් ! වෘත්තියට අදාළව පරිහරණය කරන ලේඛන ගැන, වෙන වෙනම දෘෂ්ටිකෝණවලින් බලන එක තවත් එකක් ! අනික බලකොටුවට අනුව ඒ විස්තර ඔක්කොම හොඳින් දන්න ජීවිතයකට, පවතින්න බැහැ..."(කාරියවසම්, 2009;90).**

සත්‍ය ප්‍රකාශ කරන්නන් සහ නිදහස් මතධාරීන්ට අත් වන ඉරණම නවකතාව අවසානයේ කථකයා හරහා ම ඉදිරිපත් කෙරෙයි. මනෝවිද්‍යාඥයින්ගේ අදහස වන්නේ පුද්ගලයෙකු තම ජීවිතය අහිමි කර ගැනීමට මනෝවිද්‍යාත්මක පසුබිම හේතු සාධක වන බවයි. ජීවිතය පිළිබඳ කලකිරීම ඇති කරවන ප්‍රධාන ම මානසික රෝගය විශාදය වුවත්, භින්නෝන්මාදය, පෞරුෂ අක්‍රමිකතාව ආදී රෝග තත්ත්වයන් ද සියදිවි නසා ගැනීමට බලපානු ලැබෙයි (පෙරේරා, 2009). අපේක්ෂා භංගත්වයට පත් මනුෂ්‍යාගේ හැසිරීම මායා යථාර්ථවාදී නවකතාවලින් නිරූපණය වේ. වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාවේ ද කථකයා අවසානයේ අපේක්ෂා භංගත්වයට පත් වේ. ඔහුගේ බිරිද මිය යාම, නොකළ වරදකට දඩුවම් ලබන්නට සිදු වීම, මානසික පීඩනය ආදී කරුණු හේතුවෙන් ඔහු දැඩි කනස්සල්ලට පත් ව සිටී. නවකතාව අවසාන වන්නේ කථකයා මිතුරා ලබා දුන් ගිනි අවියෙන් මරණයට පත් වීම නිරූපණය කරමිනි.

පුද්ගල අභ්‍යන්තරය විනිවිද දැකීමට මායා යථාර්ථවාදීන් සිහින උපයෝගී කර ගෙන ඇත(කුමාරසිංහ,2018:64). සිහින මගින් කාලාන්තරයක් පුරා පුද්ගල මනස ආකූල ව්‍යාකූල තත්ත්වයට පත් කර යටපත් කරනු ලැබූ හැඟීම් පියවි සිතෙහි ක්‍රියාත්මක වන ආකාරය නවකතාවන්හි නිරූපණය කෙරෙයි. ඔස්ට්‍රියානු නියුරෝන විශේෂඥයෙකු සහ මනෝ විශ්ලේෂණවාදයේ පියා වන සිග්මන් ෆ්‍රොයිඩ් අර්ථ දක්වන ආකාරයට සිහින යනු පුද්ගලයාගේ යටි හිතට ප්‍රවිෂ්ට වීමට ඇති රාජකීය මාවත වේ. "Dreams are royal road to the unconscious mind" ෆ්‍රොයිඩ් සිහින විග්‍රහ කළ ආකාරය අනුව ස්තර තුනකින් යුත් මනසේ විශාල ම කොටස වන්නේ යටි සිත ය. පුද්ගලයාගේ ප්‍රචණ්ඩ සිතුවිලි, ලිංගික ආශාවන්, බලය පිළිබඳ තිබෙන කෑදරකම යන මේ සියල්ල සැඟවී තිබෙන්නේ මේ යටි සිතෙහි බව ෆ්‍රොයිඩ්ගේ අදහස වේ. **වීදුරු කුඩු කැවුණු කලෙක** නවකතාවෙහි ද බොහෝ අවස්ථාවල සිහින භාවිත කරමින් පුද්ගල අභ්‍යන්තරය විවරණය කර ඇත. කථකයාත්, ඔහුගේ බිරිඳත් අතර විවාහ ජීවිතයේ පසු කාලීන ව පැවති දුරස්බව නවකතාවෙහි නිරූපණය කර ඇත. කථකයාගේ බිරිඳ වන සීතා පිළිබඳ කථකයා සිතමින් සිටින අතර නින්දට යන ඔහුට සිහිනයෙන් සිය උසාවි ලිපිකාරිනිය මංගලා සමඟ කම්සුව විඳින ආකාරය දර්ශනය වේ. ෆ්‍රොයිඩ්ගේ සිහින පිළිබඳ විග්‍රහය ද මෙහි දී භාවිතයට ගෙන ඇති බව සිතිය හැකි ය. මිනිසාගේ යටි සිතේ තැම්පත් ව ඇති තෘප්තිමත් නොවූ ආශාවන් සිහින මගින් දර්ශනය විය හැකි ය(හෙට්ටිගේ,2011:76). ඒ අනුව පුද්ගල යටි සිත හෙවත් අවිඥානයෙහි තැම්පත්ව ඇති කථකයාගේ හැඟීම් සිහින මගින් නිරූපණය කර ඇත. ජීවිතය පිළිබඳව නැවුම් බලාපොරොත්තු ඇති කර ගත් කථකයා නැවත සිහින ලොවකට පිවිසෙයි. ඒ සිහින ඔස්සේ නගරයට ගමන් කරන ඔහු දකින්නේ විකාරරූපී දර්ශන රැසකි. මෙමගින් අපට දකින්නට නොහැකි සමාජයේ සැබෑ වියරු බව නිරූපණය කෙරෙයි.

> **''වම්පස ගිනි ගන්නා රත්තරං බඩු සාප්පුවකි. දකුණුපස සිනමා ශාලාවක් ගින්නෙන් වෙලෙයි. විවිධ ආයුධ ගත් මිනිස් සමූහයා මාර්ග නීති නොතකමින් පාර හරහා පනිමින් සිටිති. පරිගණක යන්ත්‍රයක් මගේ ඉදිරියේ පාරට වැටී කුඩුවී යයි. දම් පැහැති සාරියක් ඇඳගත් තරුණියක් පිටුපස මාලූ පිහියක් ගත්තෙක් ලුහුබඳී. 'බෙලිඅත්ත' බත් කඩය ඉදිරිපිට වයලීනයක් ගිනි තබන්නට වෙහෙසෙන කොල්ලෝ රංචුවකි. කොට්ටම්බා අත්තක රැඳී ගිනි ගන්නා හවරියක රැඳුණු පිච්ච මල් පෙති, දුමාරය සමඟ විසිරෙයි...''(කාරියවසම්, 2009,82).**

එකිනෙකට සම්බන්ධයක් නොමැති මෙම සිදුවීම් කිහිපය මගින් තත් සමාජ පරිස්ථිතිය විවරණය කෙරෙයි. මේ සෑම අවස්ථාවක් ම කිසියම් සංකේතාත්මක අරුතක් දනවන පරිදි විවරණය කොට ඇත. වයලීනය ගිනි තබන්නට උත්සහ කරන තරුණ පිරිස මගින් තත් යුගයේ පැවති කැරල්ල පිළිබඳ ඉඟි කෙරෙයි. ජාති, ආගම් භේද නොතකා මිනිසුන් පීඩාවට පත් වී ඇති බව කොට්ටම්බා අත්තෙහි රැඳී ගිනි ගන්නා පිච්චමල් සහිත හවරිය මගින් නිරූපණය කෙරෙයි. මනුෂ්‍යයා කෙරෙන් මනුෂ්‍යත්වය වියැකී ගොස් ඇති, මානව ගුණධර්ම නොමැති පිරිහී ගිය සමාජ වටපිටාවක් කථකයාගේ සිහිනය මගින් නිරූපණය කිරීමට කතුවරයා ප්‍රයත්න දරා ඇත.

නවකතාවෙහි වර්තමානයේ දී රැකියාව සමඟ කාර්ය බහුලත්වයට පත් වන මිනිසාගේ ජීවිතයේ යථාව මහේස්ත්‍රාත්වරයාගේ ජීවිතය ඇසුරින් නිරූපණය කර ඇත. ඔහුට රැකියාවත්, එහි ඇති වගකීම් සම්භාරයත් හේතුවෙන් සිය බිරිඳ සහ ඔහුගෙන් ඉටු විය යුතු යුතුකම් මඟ හැරී ගොස් ඇත. ඒ බව මහේස්ත්‍රාත්වරයාගේ ම සිතුවිලි මගින් නවකතාවෙහි ඉදිරිපත් කර ඇත්තේ ඒ පිළිබඳ සත්‍යය තත්ත්වය පාඨකයා වෙත දැනවීමට ය. නිවාඩු දිනයේ දී සිය දෛනික කටයුතු කළ යුතු ආකාරය පෙළගස්වා ගන්නා පියසෝම නම් මහේස්ත්‍රාත්වරයා රෝහල්ගත වී සිටිනා සිය බිරිඳ බලන්නට යාම යොදා ගන්නේ පත්තර බැලීමෙන් ද අනතුරුව ය. රෝහලට යාමට පෙර රැවුල කැපීම, දණ්ඩ නීති සංග්‍රහය සහ අපරාධ නඩු විධාන සංග්‍රහය නැවත කියවීම, නඩු වාර්තා කියවීම ආදී කාර්යයන් රැසක් කිරීමට ඔහුට සිදු වේ. සිය දෛනික වැඩ කටයුතු ධූරාවලියේ අවසානයට


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

බිරිඳ බැලීමට යාම ස්ථානගත කිරීමෙන් ඔවුන් ගත කළ විවාහ ජීවිතයේ ස්වභාවය පිළිබඳව ඉඟියක් සැපයෙයි. එමෙන් ම රැකියාව හේතුවෙන් ලද මානසික අතෘප්තිය හේතුවෙන් නින්දක් නොලබන මෙකී මහේස්ත්‍රාත්වරයා රාත්‍රිය ගත කරනුයේ කන්තෝරු කාමරයේ මේසයෙහි හිස තබා ගෙන ය.

> **"මගේත් සීතාගේත් කායික ආස්වාදයේ ත්‍රාසය සෙමෙන් නිවී යමින් පැවති ඒ අවදියේදී රාජකාරී දිවියේත් විවිධ අසාමාන්‍ය සංසිද්ධීන්ට මට මුහුණ දීමට සිදු වූයේය. ඇප දීම් සලකා බැලීම - වරෙන්තු නිකුත් කිරීම - සිතාසි නිකුත් කිරීම - වෛද්‍ය වාර්තා - රස පරීක්ෂණ වාර්තා - කැඳවීමට අමතරව වැඩි කාලසීමාවක් මට ගත කරන්නට සිදු වූයේ ඝාතනය වූ ශරීර පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කිරීමටයි. දිනකට එවැනි සිරුරු දෙක තුනක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නින්ද නොයෑම, සුව කළ නොහැකි ආසාදිත තත්ත්වයක් මෙන් මා වෙළා ගත්තේය. සීතා තනිව සයනය කරද්දී මම කන්තෝරු කාමරයේ මේසය මත්තේ හිස ගසා ගත්තෙමි..."(කාරියවසම්, 2009:11).**

ඔවුන් දෙදෙනා අතර පැවති දුරස්බවට පියසෝමගේ රැකියාව ද බලපා ඇති බව මෙවන් අවස්ථා මගින් පැහැදිලි වේ. රැකියාවේ කාර්යබහුලත්වය හේතුවෙන් ඔහු පත් ව තිබූ ව්‍යාකූල මානසිකත්වය ද මෙහි දී ඉදිරිපත් කර ඇත. විවාහ දිවියේ ආරම්භක උණුසුම මැකී යාම සහ රැකියාවේ කාර්යබහුලත්වය හා අප්‍රසන්න බව යන කරුණු ද්විත්වය එක වර මතු වී ඇත. මිය ගිය ශරීර දිනපතා පරීක්ෂා කරන ඔහුට කය පිළිබඳ ඇති ඇල්ම ද වියැකී යමින් පැවතියා විය හැකි ය.

නවකතාවෙහි තත්කාලීන සමාජ පසුබිම වක්‍රාකාරයෙන් විවරණය කර ඇත. සිතෙහි චංචල ස්වභාවයක් පවත්නා විට කටයුතු සාර්ථක අයුරින් කර ගත නොහැකි ය. නවකතාවෙහි ප්‍රධාන චරිතය වන පියසෝම නම් මහේස්ත්‍රාත්වරයාට ද සිය කටයුතු කර ගැනීම සඳහා මානසික ඒකාග්‍රතාව අවශ්‍ය වේ. එනිසා ඔහු මුහුදු වෙරළේ ස්නානයට යාමට පිටත් වේ. මුහුදු වෙරළට ගිය පියසෝමට අවට පරිසරයේ දකින්නට ලැබෙනුයේ අපේක්ෂා කරන දර්ශන නොවේ.

> **"ගොඩකරයේ වැටකෙයි යාය දක්වා අපිළිවෙලට විසිරුණු ප්ලාස්ටික් බිස්කට් ඇසුරුම්, ෂොපින් බෑග්, බීර බෝතල්, සිගරට් කොට, අරක්කු බෝතල්, සහ කරවී ඇත්තාවූ අසූචි ගොඩවල්ය. වැටකෙයි ගාල් ආසන්නයේම මැතකදී වෙළඳපොළට හඳුන්වා දුන් ගැට්ටි සහිත උපත් පාලන කොපු වැටී ඇත..."(කාරියවසම්, 34:2009).**

පියසෝම වෙරළෙහි දකින දේ ඇසුරෙන් සමාජීය වශයෙන් සිදු වී ඇති පිරිහීම පිළිබඳ ව කතුවරයා ඉදිරිපත් කරයි. වනචාරී අවධියක සිට ශිෂ්ටාචාරගත වූ මිනිසා නැවතත් ශිෂ්ටාචාරගත නොවූ යුගය කරා ගමන් ගන්නා බව මෙමගින් පැහැදිලි වේ. ඉතා ම සුළු සිදුවීමක් මගින් එකී කරුණ කතුවරයා ඉදිරිපත් කර ඇත. මුහුදු වෙරළෙහි ඉදිරියට යන පියසෝමට විනෝද වීමට පැමිණි පිරිමින් සහ ඒ දෙස බලා සිටීමට පැමිණි ගැහැනුන් දැක ගැනීමට හැකි විය. එකී ගැහැනුන්ගේ සාම්ප්‍රදායික ගෘහනියක ලෙස වන භූමිකාවට මුහුදු වෙරළේ දී වුව ද සමු දීමට ඉඩක් ලැබී නැත. මන්ද යත්, විනෝද වීම සඳහා පැමිණි ගමනේ ඇයට විනෝද වීමට අවකාශයක් හිමි වී නැත. පිරිමින්ගේ මත් වතුර සාදය දෙසත්, දරුවන්ගේ සෙල්ලම් දෙසත් බලමින් ඔවුහු සිටිති. සැබවින් ම වෙරළට පැමිණ විනෝද වන්නේ පිරිමින් සහ දරුවන් පමණි. බිරිඳක ලෙසින් කාන්තාවක් ලබන ජීවන උරුමය කථකයා වටහා ගන්නේ ඔහුගේ බිරිඳ මිය යාමෙන් පසුව ය.

සමකාලීන සමාජය පිළිබඳ වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාවෙහි නිරූපිත එක් අවස්ථාවක් ලෙස පියසෝමගේ සහෝදරිය එවූ ලියුමෙහි නිරූපිත කරුණු පෙන්වා දිය හැකි ය. කතුවරයාට ඍජු ව මැදිහත් වී ඉදිරිපත් කිරීමට නොහැකි අවශේෂ චරිතවල ස්වභාවයත් සහ සමාජ යථාර්ථයත් නිරූපණය කිරීමට මෙන් ම ආකෘතියෙහි වෙනසක් ඇති කිරීමට මෙම ලිපිය උපයෝගී කරගෙන ඇති බව පැහැදිලි වේ. දේශපාලන සබඳතා මත හිතෛෂී පුද්ගලයන්ට රැකියා ලබා දීම සමාජයේ දැක ගත හැකි සුලභ තත්ත්වයකි. ඒ බව මෙම ලිපියෙන් ද දක්වා ඇත.

> **"මම හැත්තෑ හතේ ගුරුවරියක් හැටියට පත්වීම් ගත්තේ දේශපාලන සම්බන්ධකම් උඩ බවට කව්ද ගමේ බල්ලෙක් ඒ කාලේ කැලෑ පත්තර ගැහුවට දැන් මම කවුද, උන් කවුද?..."(කාරියවසම්, 2009:58).**

කාලයත් සමග මිනිසුන් පෙර කලෙක තමන් එල්බ සිටි මතවාදයන්වලින් බැහැර වීම දැක ගත හැකි ය. සමාජයට යහපතක් කිරීම තම අරමුණ කොට ගෙන සිටින ඇතැම් පුද්ගලයන් සිය ආකල්ප වෙනස් කරන බවට උදාහරණ සමාජයෙන් සොයා ගත හැකි ය. මෙකී මතවාද විපර්යාසයට මිනිසා කාලයත් සමග ලබන අත්දැකීම් මෙන් ම කුටුම්භ සංරක්ෂණයේ ගැටලු හා ආර්ථික ගැටලු ද හේතු වේ. මේ සම්බන්ධයෙන් ලිපියෙහි කරුණු දක්වා ඇත.

> **"සුනිල් අයියත් දැන් ඉස්සර වගේ නෙවෙයි. ළඟදි ගෙදරට සිමෙන්ති ගල් හදන්න පුළුවන් මැෂින් එකක් ගෙනාවා. ඉස්සර වගේ ඔය ගුරු සංගම් හදාගෙන නටපු නාඩගම් දැං නටන්නේ නෑ..."(කාරියවසම්, 2009:59).**

මිල මුදල්, අධ්‍යාපනය, සමාජ තත්ත්වය පිළිබඳ ව මිනිසුන්ගේ ඇති දෘෂ්ටිවාදය ද මෙකී ලිපිය මගින් දක්වා ඇත. පියසෝමගේ ඇතැම් උගත් මිතුරන් දැන් මිල මුදල් උපයා දියුණු වී ඇති ආකාරයත්, ගමේ පහත් පුද්ගලයන් ලෙස ජීවත් වූ පුද්ගලයන් වර්තමානය වන විට වෙනස් සමාජ තත්ත්වයන්ට උරුමකම් කියන ආකාරයත් අක්කාගේ ලිපියෙහි දක්වා ඇත. මේ ලිපිය මහේස්ත්‍රාත්වරයා උපන් පවුල් පරිසරය සහ ගමෙහි දැන් පවත්නා ස්වභාවයත්, මුදල් ඒකායන ඉලක්කය


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කරගැනීම සමාජයෙහි පැතිරී ඇති ආකාරයත් නිරූපණය කිරීමට සමත් වී ඇත.

මායා යථාර්ථවාදය එකිනෙකට සපුරා වෙනස් ලෝක දෙකක් නිරූපණය කෙරෙයි (අමරකීර්ති, 2015:218). වෙන්ඩි බී. ෆාරිස්ට අනුව එම ලෝක දෙක වන්නේ මළවුන්ගේ ලෝකය සහ ජීවත් වන්නවුන්ගේ ලෝකය වේ. නොඑසේ නම් සැබෑ ලෝකය සහ ප්‍රබන්ධ ලෝකයයි.

වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාවෙහි ද මළවුන්ගේ ලෝකය හා සැබෑ ලෝකය යා කිරීම යන මායා යථාර්ථවාදී ලක්ෂණය නිරූපණය කෙරෙයි. නවකතාවේ මහේස්ත්‍රාත්වරයාගේ චරිතය විකාසනය කිරීමට බොහෝ අවස්ථාවල මියගිය බිරිඳගේ ආත්මය යොදා ගැනීමට කතුවරයා උත්සාහ ගෙන ඇත. මහේස්ත්‍රාත්වරයාට සිහින ලෝකවලදී සහ මනෝ ලෝකවල දී බිරිඳ මුණ ගැසෙයි. නාන කාමරයේ කණ්නාඩියේ පිටුපසින් ඇතැම් විටෙන සීතා මතු වෙයි.

> **"ඔයා දවසෙන් දෙකෙන් හොඳ කුක් කෙනෙක් වෙලා නේද?**
>
> **මතකද අපි දෙන්න එකතු වෙලා කුස්සියේ ගත කරපු කාලයක් තිබුණා..."(කාරියවසම්, 2009:30).**

මියගිය සීතාගේ ආත්මය සහ කථකයා අතර සිදුවන සංවාදයෙන් ඔවුන්ගේ ගෘහ ජීවිතය නීරස වීමට බලපාන ලද ඇතැම් කාරණා පිළිබඳව හෙළි වේ. රැකියාවේ ස්ථාන මාරු ලැබ වෙනත් ප්‍රදේශවලට ගිය අවස්ථාවල ඔහු මුහුණ දුන් අත්දැකීම් ගැන සීතා මතක් කර සිටී. ඒ පිළිබඳ තමාට අමතක බව පවසන මහේස්ත්‍රාත්වරයා මුළුතැන්ගෙට පැමිණි විට ඔහුට බළලෙකු මුණගැසෙයි.

> **"සර්වාංගය පුරා කළු පැහැති ලොම් පිරුණු බළලෙක් මුලුතැන්ගෙයි මේසයට ගොඩ වී ඔම්ලට් දීසිය දෙස බලා සිටී..."(කාරියවසම්, 2009:32).**

මියගිය බිරිඳගේ ආත්මය ප්‍රථම වරට කතා කළ අවස්ථාවේ පවසන ලද බළල් ආත්මයක් පිළිබඳ තොරතුර මෙයට සම්බන්ධ වේ. මේ බළලා (බැළලිය) ඉදිරියට සීතාගේ සංකේතාත්මක චරිතය වශයෙන් නවකතාවේ හමු වේ. මිනිසෙකුටත් බළලෙකුටත් එක් ව හිඳ ආහාර ගත නොහැකි ය. නමුත් පියසෝමත් බළලාත් දෙදෙනා බිත්තර බැදුම බෙදාගෙන කන ආකාරය මගින් ඔවුන්ගේ විවාහ ජීවිතයේ දූරස්ථභාවය නිරූපණය කෙරෙයි. පූසා නගන පුරු පුරු හඬත් සමග ඔහුට සීතා මතක්කර දීමට උත්සාහ ගත්, අම්පාරට මාරුවීමක් ලැබ ගිය පසු මුහුණ දුන් අත්දැකීමක් සිහියට නැගෙයි. එය ඔහුගේ රාජකාරී ජීවිතයේ පීඩාකාරී ස්වභාවය පැහැදිලි කරන ඉපදුණු විගස ඉතා කෲර ලෙස ඝාතනයට ලක් වූ කුඩා බිළිඳෙකුගේ පශ්චාත් මරණ පරීක්ෂණයක අත්දැකීමකි. එමෙන් ම කතාව රේඛීය ව ගලා යාමෙන් මිදීමටත්, ආකෘතික වෙනස්වීම්වලටත් උචිත පරිදි සීතාගේ ආත්මය නවකතාවෙහි භාවිත කර ඇත.

කථකයාට සිය රැකියාව හේතුවෙන් බිරිද මඟහැරී ඇති බව වැටහේ. ඔහුට මිය ගිය බිරිද සම්බන්ධයෙන් විවිධ මනෝ ලෝකයන් මැවෙන්නේ එනිසා ය. තමන්ගේ පාර්ශවයෙහි පවත්නා සදොස්බව හේතුවෙන් ඔහුට නිරන්තරයෙන් මෙම මනෝලෝකවල සැරිසරමින් ඔහුගේත් බිරිදගේත් සබඳතාව පළුදු වීමට වරද තමා අත බව ප්‍රත්‍යක්ෂ කර ගැනීමට සිදුවිය. එක් අවස්ථාවක ආහාර පිසින උසාවි ලිපිකාරිණිය මංගලා හාල්මැස්සන් කඩමින් ඔළු බැළලියට ලබා දෙයි. බැළලිය ඇය ඉවත් කරන හාල්මැස්සන් ඔළු ආහාරයට ගනී. කථකයා මංගලා සමග ඇති කර ගන්නා සංවාදයෙන් ඔහුගේ විවාහ ජීවිතය සහ රාජකාරී ජීවිතයේ අත්‍යප්තිය පිළිබඳව යමක් කියා පායි.

> **"සර් මැඩම් එක්ක හැම හැමදාමත් කෑම මේසෙදි කලේ කෑම කන එක. දුරස් උනාට පස්සෙත්, වෙන් වෙන්ව කළේ කෑම කන එක... එතනත් ජීවිතේ තියෙනවා...**
>
> **අපි හිටියේ හොඳ කාලයක් ආවම දරුවො හදන්න මුල් කාලේ අපි එහෙට මෙහෙට දිව්ව විතරයි...**
>
> **ඒ උණාට හොඳ කාලයක් ආවෙ නෑ. අම්පාර.... ඔක්කම්පිටිය..... වව්නියාව...... අනුරාධපුරය...... හලාවත ......හැම තැනකම...... ඔළුවට වෙඩි තියපු...... කැලි කපපු...... සත්තු කෑව මනුස්ස ශරීර ගැන වාර්තා තිය තියා මං ඇවිදින අතරේ, සීතා ලෙඩ උනා...... වයසට ගියා..." (කාරියවසම්,2009,75-76).**

මේ සංවාදය අවසානය වන විට මංගලා වෙනුවට සීතා පෙනී සිටියි. මෙය සැබෑ සංවාදයක් නොව මහේස්ත්‍රාත්වරයාගේ මනසෙහි පීඩනය නිරූපණය කෙරෙන සංවාදයක් බව ඉන් පැහැදිලි වේ. සීතාත් මංගලාත් සමග කතුවරයා කරන මෙම සංවාද මගින් ඉස්මතු කිරීමට උත්සහ දරනුයේ තත් යුගයේ පැවති සමාජ පරිස්ථිතිය පිළිබඳ බව පැහැදිලි වේ. අම්පාර, ඔක්කම්පිටිය, හලාවත, අනුරාධපුරය, වව්නියාව වැනි සෑම ප්‍රදේශයක් ම වසා පැවති අඳුරු යුගයේ පැතිකඩ මෙමගින් නිරූපණය වේ.

## නිගමනය

නවකතාවක යථාර්ථය නිරූපණය කිරීම එහි සාර්ථකත්වය පෙන්නුම් කරන ලක්ෂණයකි. යථාර්ථය විවිධ ප්‍රවේශයන්ගෙන් නවකතාවල නිරූපණය වේ. සාහිත්‍ය සංකල්පයක් වන මායා යථාර්ථවාදය; යථාර්ථය නිරූපණය කිරීමේ දී යථාර්ථවාදී සීමාවන් අතික්‍රමණය කෙරෙමින් මායාව, ආශ්චර්යය සහ ඉන්ද්‍රජාලික අවස්ථා පදනම් කර ගනිමින් නිරූපණය කර ඇත. ඕනෑ ම සාහිත්‍ය සංකල්පයකට මෙන් ම මායා යථාර්ථවාදයට ද එයට ම අනන්‍ය වූ සීමා සහ ලක්ෂණ පවතී. මෙම අධ්‍යයනයේ දී පියල් කාරියවසම් විසින් රචිත වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාවෙහි එක්තරා යුගයක ලාංකේය සමාජයේ නිරූපිත යථාර්ථය පිළිබඳ සාකච්ඡා කර ඇත. එහි දී මායා යථාර්ථවාදයේ මූලික ලක්ෂණයක් වන


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ආශ්චර්යාත්මක අවස්ථා මගින් තත්කාලීන සමාජයෙහි පැවති තත්ත්වය මනාව නිරූපණය කොට ඇති බව හඳුනා ගත හැකි විය. නිදහස් මතධාරීන්ට අත්වන ඉරණම, භීෂණ සමයේ පැවති ක්‍රියාකලාප ආදියෙහි ඇතුළාන්තය නිරූපණය උදෙසා යථාර්ථවාදී සාහිත්‍ය ශානරය මගින් ළඟා විය නොහැකි මානයන්ට පාඨකයා ගෙන යාමට කතුවරයා භාවිත කළ මෙම මායා යථාර්ථවාදී රීතියට හැකි වී ඇති බව පැහැදිලි ය. එමගින් පැහැදිලි වන්නේ, මායා යථාර්ථවාදය, යථාර්ථය නිෂේධනය නොකරන බවත්, යථාර්ථයේ සීමාවන් වඩාත් පුළුල් කෙරෙන සාහිත්‍ය ශානරයක් බවත් ය. නවකතාකරු සිය මුඛ්‍ය අරමුණ වෙත ළඟා වීමට යථාර්ථවාදී රීතිය මෙන් ම මායා යථාර්ථවාදී රීතිය ද සාර්ථක ව භාවිත කර ඇති බව පැහැදිලි වේ.

### පරිශීලිත මූලාශ්‍රය


අමරසේකර, ගුණදාස. (2008). නොසෙවුනා කැඩපත බොරලැස්ගමුව, විසිදුනු ප්‍රකාශකයෝ.

අමරකීර්ති, ලියනගේ. (2015). අමුතු කතාව, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ

කරුණාතිලක, කේ. ජී (1997). රූප විපර්යාස, කොළඹ, දයාවංශ ජයකොඩි සහ සමාගම

කාරියවසම්, පියල්. (2009). වීදුරු කුඩු කැවුණු කලෙක, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ

කුමාරසිංහ, කුලතිලක (2018). මායා යථාර්ථවාදය, බත්තරමුල්ල, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

කුමාරසිංහ, කුලතිලක. 1995, 70 දශකයේ සිංහල නවකතා, කොළඹ (10), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

කුමාරසිංහ, කුලතිලක (2019). යථාර්ථවාදී ප්‍රභේද, රූපකාත්මක යථාර්ථවාදයසහ මොහාන් රාජ් මඩවල, කොළඹ (10), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

සමන් කුමාර, කේ,කේ. (1999.) නූතනවාදය වෙතට සහ ඉන් ඔබ්බට, කළුබෝවිල විදර්ශන ප්‍රකාශන.

සමන් කුමාර, කේ. කේ. (2014).) සාහිත්‍ය ශානර විමංසා, කිරිවත්තුඩුව, සයුර ප්‍රකාශන.

ගුණසේකර, නිව්ටන්. (2013). විස්මය ජනක මිනිස් සිත, කොළඹ, දයාවංශ ජයකොඩි සහ සමාගම.

දිසානායක, විමල්. (2004).) නව විචාර සංකල්ප, බොරලැස්ගමුව සී/ස විසිදුනු ප්‍රකාශකයෝ.

සුරවීර, ඒ. වී. (1989).) සම්ප්‍රදාය, නිර්මාණය සහ විචාරය, කොළඹ 10, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.

හෙට්ටිගේ, නිලන්ත 2011 ගුප්ත විද්‍යාව හා අධිමානසික හැකියාව කොළඹ 08, සමාධි ප්‍රකාශකයෝ.


### විද්‍යුත් මූලාශ්‍රය


උඩුවරගෙදර,'නියම මායා යථාර්ථවාදය අහුවුණේ ධර්මසේන හිමියන්ගෙන්',2019.09.29).

https://lankaepress.com/2019/10/06/නියම-මායා-යථාර්ථවාදය -අහු/)

කුමාරනායක, සිහින පිළිබඳ විද්‍යාත්මක මත, 201 9-01-19).

https://www.deshaya.lk/article/48/Health-



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහහතරවන කලාපය 2022 දෙසැම්බර්
පිටු 33-41
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# ගැටවරවියේ පසුවන පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමට බලපාන මනෝ සමාජීය සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

# (An Investigative Study on the Psychosocial Factors of Drug Addiction of School Children in their Adolescent: Based on a Selected Rehabilitation Center)

කළුබෝවිටියන සෝරත හිමි

සහාය කථිකාචාර්ය, සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
**sorathakalubovitiyana@gmail.com**

## Abstract

The basic concepts of society and the individual can be pointed out as essential factors that are intertwined from the very beginning of civilization. Individual evolution and social development can be depicted as two main factors that follow the same line. Because of the superior intelligence of mind, the man has an ability of reaching unbelievable goals and objectives. The attitudinal decline of a man in the society in which physical development has increased rapidly can be fully understood by examining the respective social strata. The degeneration of the field of economy, education, culture and religion as well as a country and a nation can be seen today. Drug addiction can be seen as one of the leading causes of degeneration in a person from the lower society to the upper society. The solutions were explored under the title of "an investigative study of psychosocial factors of drug addiction of school children who in their adolescent." The characteristics of drug addicted young school children, the value and the importance of adolescence of a child, the main concept of addiction, interpretation of drugs, the data on depressive and lethal types of narcotics, the psychological and social factors influencing children's drug addiction, were discussed in this research. A single case study was done selecting 21 children receiving residential treatment in rehabilitation center at Manpitiya in Kandy District. The information was collected through a questionnaire and interviews. The suggestions were made to show the dire consequences of drug addiction and importance of brighten the future of children.

**Key Words**: Adolescence, Schoolboy, Drug -Addiction, Psychological Factors, Sociological Factors

## සාරසංක්ෂේපය

පුද්ගලයා පරිහානියට ලක්වන හේතු සාධක අතරින් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම පහළ සමාජයේ සිට ඉහළ සමාජය දක්වා ම දැකිය හැකි ලක්ෂණයකි. රටක් සමාජයක් පුද්ගලයෙක් අගතියට පත්වෙන සමාජමය නිස්සාරත්වයට හේතුවක් ලෙස සියලු දෙනා අර්ථකථනයට ලක්කරන මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම නමැති සංකල්පය මූලික කරගෙන පවුල් පරිසරයෙන් පාසල් පරිසරයට මුදාහරින දරුවා ඔවුන්ගේ තරුණ කාලයේ දී මතට ඇබ්බැහි වීම පාදක කරගෙන ගැටවරවියේ පසුවන පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමට බලපාන මනෝ සමාජීය සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඇසුරින්) යන මාතෘකාව යටතේ විසඳුම් ගවේෂණය කරන ලදී. එහි දී ගැටවර වයසෙහි පසුවන දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම කෙරෙහි බලපාන, මනෝවිද්‍යාත්මක සාධක, සමාජ විද්‍යාත්මක සාධක කරුණු අනාවරණය කරමින් පුනරුත්ථාපන මධ්‍යස්ථානය ක්‍රියා කරන අයුරු පර්යේෂණ අරමුණු තුළින් අධ්‍යයනය කෙරිණි. මෙහි දී ගැටවර වයසෙහි පසුවන පාසල් දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ ගති ලක්ෂණ පිළිබඳ ව කරුණු අනාවරණය වූ අතර නව යොවුන් විය දරුවෙකුට ඉතා ම වැදගත් කාලපරිච්ඡේදයක් ලෙස පෙන්වා දී එහි ඇති වටිනාකම සාකච්ඡා කරන ලදී. එමෙන් ම ප්‍රධාන සංකල්පය වන ඇබ්බැහිවීම (Addiction) පිළිබඳ ව කරුණු පෙන්වා දී මත්ද්‍රව්‍ය (Drugs) පිළිබඳ අර්ථකථනයක් ද අවපීඩක හා මාරාන්තික ගණයේ මත් ද්‍රව්‍ය පිළිබඳ දත්ත අන්තර්ගත කරන ලදි. දරුවන් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමට බලපාන මනෝ විද්‍යාත්මක සාධක මෙන් ම සමාජීය සාධක පිළිබඳව කරුණු එකින් එක අනාවරණය කරන ලදී. මෙහි දී නියැඳිය වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ මාම්පිටිය ප්‍රදේශයේ පිහිටි පුනරුත්ථාපන මධ්‍යස්ථානය තෝරාගත් අතර, එහි නේවාසික ප්‍රතිකාර ලබන දරුවන් 21

දෙනෙකු යොදාගෙන ප්‍රත්‍යෙක අධ්‍යයනයක් (Case Study) (Single Case Study) ඔස්සේ මෙම පර්යේෂණය සිදු කරන ලදී. තොරතුරු ලබා ගැනීමේ දී ප්‍රශ්නාවලියක් මඟින් හා සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීම මඟින් තොරතුරු රැස්කරන ලද අතර දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම සඳහා බලපෑ විවිධ හේතු සාධක මෙමඟින් අනාවරණය විය. සමවයස් අනිසි ඇසුර ද, වැරදි පූර්වාදර්ශ ද, අසීමිත නිදහස හා දෙමාපියන්ගේ නොසැලකිල්ල ද නිගමනය වශයෙන් හඳුනා ගත හැකි ය. වැඩිහිටියන් වශයෙන් යහ මාර්ගය පෙන්වා දෙමින් මත්ද්‍රව්‍යයන්වල ඇති භයානක ප්‍රතිඵල දක්වමින් දරුවන්ගේ අනාගතය යහපත් කිරීමට යෝජනා ඉදිරිපත් කරන ලදී.

**කේන්ද්‍රීය වචන:** ගැටවරවිය, පාසල්, දරුවා, මත්ද්‍රව්‍ය, ඇබ්බැහි වීම, මනෝවිද්‍යාත්මක සාධක, සමාජ විද්‍යාත්මක සාධක

## හැඳින්වීම

මත්ද්‍රව්‍ය (Drugs) මත්වීමක් ඇති කරන ඕනෑ ම රසායනදයක් සඳහා මත්ද්‍රව්‍ය යන නම භාවිත වේ. බොහෝ විට මෙය යෙදෙන්නේ ස්නායු පද්ධතිය අවපීඩනය කරන රසායන සඳහා වුව ද, උත්තේජයනක් හෝ මනසේ විකෘති ස්වභාවයක් ඇතිකරන රසායන සඳහා යෙදෙන අවස්ථා ද ඇත. ඇතැම් රෝගයන් සමනය කර ගැනීමට මත්ද්‍රව්‍ය වශයෙන් හඳුන්වන දෑ අඩු මාත්‍රාවන් භාවිතයට ගනී. එමෙන් ම ස්නායු පද්ධතිය තුළ යම් ප්‍රබෝධයක් ඇති කරන සහ මනුෂ්‍ය ශරීරයේ යම්කිසි උත්තේජනයක් ඇති කිරීමට සමත් වන ද්‍රව්‍යයන් මත්ද්‍රව්‍ය ලෙස හඳුන්වයි. බොහෝ විට රෝගී තත්ත්වයෙන් පෙළෙන මිනිසාට එම රෝගී බවෙන් මිදීම හෝ සුවපත් වීමේ අරමුණ ඇතිව වෛද්‍යවරුන් විසින් මත්ද්‍රව්‍ය ගණයට අයත් විවිධ රසායන වර්ග නිර්දේශ කරනු ලබයි.

පුද්ලයෙකු මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට විවිධ සාධක බලපානු ලබන අතර මනෝ සමාජීය සාධක ඒ අතර ප්‍රධාන තැනක් ගනී. අධ්‍යාපනය ලබන වයසේ පසුවන දරුවන් ඉතා දරුණු ලෙස වර්තමානය වන විට මෙහි ගොදුරක් බවට පත් වී හමාර ය. ඕනෑම දෙයකට පහසුවෙන් ඇබ්බැහි වන වයස් සීමවක් වන මෙම කාලය තුළ දරුවා පිළිබඳ වැඩි අවධානයෙන් පසුවීම මෙහිලා ඉතා වැදගත් වන්නකි. දෙමව්පියන්ගේ කාර්ය බහුල ජීවන රටාව නිසා දරුවා පිළිබඳ අවධානය යොමු නොකිරීම, ආදරය නො දැක්වීම ආදී මානව හැඟීම් දැනීම් පිළිබඳ සංවේදී පුද්ගලයෙකු ලෙස නිර්මාණය නොකිරීම නිසා සමවයසේ පසුවන මිතුරන්ගෙන් හෝ වෙනත් පාර්ශවයක් මඟින් දරුවන් මත්ද්‍රව්‍යවල කරා යොමු වීම කෙරෙහි බලපාන ලබන ප්‍රධාන සාධක මනෝ සමාජීය සාධක පිළිබඳ නියැඳියෙන් ලබාගත් දත්ත මත පදනම් ව පැහැදිලි කෙරේ.

## පර්යේෂණ ගැටලුව

සමාජමය හා පුද්ගලික වශයෙන් පුද්ගලයා පරිහානියට බලපාන සාධක අතුරින් මත්ද්‍රව්‍ය මූලික ම සාධකයකි. සමාජය සංකීර්ණවත් ම විවිධ තරාතිරම්වල පුද්ගලයන් මත්ද්‍රව්‍ය වාහකයන් බවට පත් වී ඇත. ඒ අතරින් පාසල් සිසුන් මෙහි ප්‍රධාන ගොදුරක් බවට පත් වී ඇත. ඒ අනුව මෙම පර්යේෂණයේ දී ගැටවරවියේ පසුවන පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීමට බලපාන මනෝ සමාජීය සාධක මොනවාද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ.

## පර්යේෂණ ප්‍රධාන අරමුණ

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ ගැටවරවියේ පසුවන සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමේ මනෝ සමාජීය ලක්ෂණ පිළිබඳ අධ්‍යයනය කිරීම ය.

## අනු අරමුණු

- ගැටවරවියේ පසුවන පාසල් ශිෂ්‍යයින් භාවිත කරන මත්ද්‍රව්‍ය කවරේ දැයි විමසීම
- ගැටවරවියේ පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹී ඇති මනෝවිද්‍යාත්මක සාධක කවරේ දැයි සොයා බැලීම
- ගැටවරවියේ පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට පෙළඹී ඇති සමාජ විද්‍යාත්මක සාධක කවරේ දැයි සොයා බැලීම

## තාර්කිකකරණය

ගැටවරවියේ පසුවන දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම වර්තමානයේ දක්නට ලැබෙන ඉතා ම සෝචනීය තත්ත්වයකි. මතට ඇබ්බැහි වීමේ මනෝ සමාජීය ලක්ෂණ පිළිබඳ ගවේෂණය කිරීම හා එයට කඩිනම් පිළියම් යෙදීම කාලීන අවශ්‍යතාවකි. පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට යොමුවීම වළක්වා ගැනීමට ගත හැකි පියවර යෝජනා කිරීම, ළමුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම කෙරෙහි බලපාන පවුල් පසුබිම් සාධක වන අධ්‍යාපනය බිඳුණු පවුල, ක්‍රියාව, කුලවද්දා ගැනීම, වයස, කායික මානසික දුබලතාව, ආර්ථික බලපෑම, ආදි සාධක පිළිබඳ විධිමත් ලෙස හඳුනා ගැනීම සහ සාධක නිසා සිදුවන අහිතකර බලපෑම අවම කිරීම සඳහා ගතහැකි පියවර මඟින් යෝජනා කරනු ලැබේ.

## අධ්‍යයනයේ සීමා

පර්යේෂණයක් සිදු කිරීමේ දී අධ්‍යයනයේ පහසුව උදෙසා පර්යේෂකයා විසින් අධ්‍යයන සීමා පනවා ගනු ලබයි. ඒ අනුව පර්යේෂණය සඳහා නියදියක් තෝරා ගැනීමේ දී නියැඳියේ විශාලත්වය මත නිරවද්‍යතාව ආරක්ෂා වේ. එහි දී මෙම පර්යේෂණය සඳහා සාරම්මන නියදීකරණය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ මාම්පිටිය පුනරුත්ථාපන කඳවුරේ සිසුන් දස දෙනෙකු සහ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනෙකු පමණක් අධ්‍යයනය සඳහා යොදාගන්නා ලදි.

## සාහිත්‍ය විමර්ශනය

පර්යේෂණයේ සාර්ථකත්වය උදෙසා මෙම විෂයය ක්ෂේත්‍රය සම්බන්ධ ව පෙර කරන ලද පර්යේෂණ පිළිබඳ තොරතුරු සහ එම පර්යේෂණවලින් අනාවරණය කර ගත් තොරතුරු ගවේෂණය කිරීම වැදගත් වේ. එමගින් මෙම පර්යේෂණයේ විෂයය ක්ෂේත්‍රය කවරේ දැයි හඳුනා ගැනීම පහසු වේ. ඒ අනුව



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දයා රෝහණ හා හේළි නිමලා අතුකෝරාළ විසින් රචනා කර ඇති **"ළමා මනෝවිද්‍යාව හා ළමා සංවර්ධනය"** යන කෘතිය වැදගත්වේ.

> **'මාපියන් දෙදෙනාම රැකියාවට යන, වැඩිපුර සහෝදර සහෝදරියන් නොමැති වර්තමාන පවුල්වල වැඩෙන ළමයින් සමවයස් කණ්ඩායම් සමඟ පවත්වන සබඳතා වැඩිවේ.'**

මෙම කෘතිය මගින් ළමුන්ගේ පෞරුෂය සංවර්ධනය කෙරෙහි සමවයස් කණ්ඩායම්වල බලපෑම පිළිබඳ කරුණු ඉදිරිපත් කර ඇත. ඉහත සඳහනට අනුව දරුවන් කෙරෙහි දෙමව්පියන්ගේ අඩු අවධානය හා පවුලේ සාමාජිකයන් අඩුවීම, දරුවන් දෙමව්පියන්ගෙන් දුරස්වීමත් සමවයස් කණ්ඩායම්වල ඇසුරට පත්වීමත් හඳුනාගත හැකි ය.

මේ නිසා ළමුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම කෙරෙහි මෙම සමවයස් කණ්ඩායම්වල බලපෑම ද හේතුවන බව උක්ත කෘතියෙන් අවධාරණය කරනු ලබයි. මෙම කෘතියෙන් අනාවරණය වන ප්‍රධාන කරුණ වන්නේ සමවයස් කණ්ඩායම්වලට ආකර්ෂණය වීම කෙරෙහි දෙමාපියන් බලපානු ලබන බවයි. නමුත් එහි අහිතකර තත්ත්වය පිළිබඳ වඩාත් ගැඹුරු විවරණයක් සිදු නොවේ. එබැවින් මෙම පර්යේෂණය මඟින් ඒ පිළිබඳ ව ගැඹුරින් අධ්‍යයනය කරනු ලැබේ.

ගුණසේකර, ධනපාල විසින් රචිත **'දෙමාපිය වගකීම හා දරුවා'** නමැති කෘතියේ සමවයස් කණ්ඩායම්වල බලපෑම පිළිබඳ අවධානය යොමු කර ඇත.

දෙමාපියන් වෙතින් පිහිට සොයා යා නොහැකි දරුවෝ ඒ සඳහා තම සමවියන් වෙත හැරෙති. කණ්ඩායම් බිහි වන්නේත්, මත්ද්‍රව්‍යවලට යොමු වන්නේත් මෙම තරුණයෝමය' මෙම පර්යේෂණය මගින් මේ සම්බන්ධයෙන් ගැඹුරින් විග්‍රහ කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

මත්ද්‍රව්‍ය සඳහා යොමු වූ හා නැවත නැවත මත් ද්‍රව්‍ය භාවිත කරන ළමුන් විවිධ වූ අපරාධ සඳහා ද යොමු වේ. සමාජය තුළ පොදුවේ පවත්නා ප්‍රතිමාන බිඳ දමන බොහෝමයක් ළමුන් තමන් කරනුයේ වරදක් බව හොඳින් ම දන්නා කරුණකි.

'නිව්ජර්සි විශ්වවිද්‍යාලයේ කරන ලද අධ්‍යයනයකින් හෙළි වූයේ මව හෝ පියා සිගරට් පැකට් එකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් උරනවා නම් හොරොයින් වැනි මත්ද්‍රව්‍යවලට ඇදී යාමට එම දෙමාපියන්ගේ දරුවන් තුළ පවතින ප්‍රවණතාව සාමාන්‍ය දරුවන් තුළ ඇති වන ප්‍රවණතාවට වඩා හතර පස් ගුණයකින් වැඩි බවයි. එම සමීක්ෂණයේ දී හෙළි වූයේ මත්පැන් බොන කාන්තාවන්ගේ දරුවන් හෙරොයින්, එල්.එස්.ඩී. වැනි මත්ද්‍රව්‍ය ගැනීමට වැඩි වශයෙන් පෙළඹෙන බවයි. මේ නිසා මව හෝ පියා ඒ දෙදෙනා ම මත් ද්‍රව්‍ය භාවිත කරන්නේ නම් දරුවන් ඊට නැඹුරු වීමේ ප්‍රවණතාව ප්‍රබල බව පැහැදිලි වේ.'

මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ විවිධ පර්යේෂණ විශාල ප්‍රමාණයක් මේ වන විට සිදු කර තිබේ. ඒවාහි ප්‍රධාන සාධක කිහිපයක් පමණක් හඳුනාගෙන ඒවා ඔස්සේ සාකච්ඡා කර තිබේ. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ 2013 ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පිළිබඳ පර්යේෂණ ලිපි එකතුව 02 කෘතිය ගංජා වගා කරන පළාත්වල ගංජා භාවිතයෙහි ප්‍රවණතාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ අරමුණින් සකස් කර තිබේ. එහි ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ප්‍රතිකාර ලබා නැවත මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීමේ සාධක පිළිබඳ සඳහන් කර තිබේ. එහි ප්‍රධාන සාධක වශයෙන් හෙරොයින්වලට ඇති කැමැත්ත අඩු නොවීම, යහළුවන්ගේ භාවිතය දැකීම, කායික විරමණ ලක්ෂණ හා අධිෂ්ඨානය දුර්වල වීම හඳුනාගෙන ඇත. නමුත් එහි පවුල් පසුබිම් සාධක බලපෑම පිළිබඳ අවධානය යොමු වී නොමැත.

මේ ආකාරයට විවිධ හේතු සාධක පදනම් කොට ගෙන ළමුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වන අතර එහි නූතන ප්‍රවණතාව කෙබඳු ද යන්න අවබෝධ කර ගැනීම ද වැදගත් වේ. ශ්‍රී ලංකාවේ මත් ද්‍රව්‍ය භාවිතය පිළිබඳ සංඛ්‍යා දත්ත අත්පොත මෙහි දී වඩාත් ප්‍රයෝජනවත් වේ.

Table 66 - Treatment Admissions by Sex

| Gender | 2012 | | 2013 | | 2014 | | 2015 | | 2016 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | N | % | N | % | N | % | N | % | N | % |
| Male | 1096 | 98.8 | 1344 | 98.5 | 1629 | 99.0 | 1462 | 98.6 | 2321 | 98.5 |
| Female | 13 | 1.2 | 20 | 1.5 | 17 | 1.0 | 20 | 1.4 | 34 | 1.5 |
| Total | 1109 | 100.0 | 1364 | 100.0 | 1646 | 100.0 | 1482 | 100.0 | 2355 | 100.0 |

(අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 2017, පිටුව 43)

'2016 වර්ෂයේ දී ශ්‍රී ලංකාව තුළ මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගනු ලැබූ මුළු පුද්ගල සංඛ්‍යාව 79378 කි. එය 2015 වර්ෂය හා සසඳන කල 4%ක අඩු වීමකි. මත්ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට ගත් පුද්ගල සංඛ්‍යාවෙන් හෙරොයින් වැරදි සඳහා 35%ක් ගංජා ආශ්‍රිත වැරදි සඳහා 60%ක් ද වේ. මත් ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙන් බහුතරයක් බස්නාහිර පළාතින් ද (60%) දකුණු පළාතින් 9% ක්ද මධ්‍යම පළාතින් 10%ක්ද වාර්තා විය. අත්අඩංගුවට පත් මුළු සංඛ්‍යාවෙන් කොළඹ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දිස්ත්‍රික්කයේ 43%ක් ද ගම්පහ දිස්ත්‍රික්කයේ 13%ක් ද කුරුණෑගල දිස්ත්‍රික්කයේ 4%ක් ද වේ. 2016 වර්ෂයේ මත් ද්‍රව්‍ය වැරදි සඳහා අත්අඩංගුවට පත් පුද්ගල සංඛ්‍යාවෙහි ප්‍රවණතාව ජනගහනයේ පුද්ගලයින් ලක්ෂයකට පුද්ගලයින් 390 දෙනෙකි.'

යාපාරත්න, වීරසේකරගේ විසින් රචිත **'මිනිස් හැසිරීම'** නැමැති කෘතියේ සමාජ විරෝධි හා හිතකාමී චර්යා යන පරිච්ඡේදය මගින් ප්‍රචණ්ඩත්වය පිළිබඳ අවධානය යොමු කර තිබේ. එහි ප්‍රචණ්ඩත්වය කෙරෙහි බලපාන සාධක අතර මත්ද්‍රව්‍යවල බලපෑම ද වන බව දක්වා ඇත. නමුත් එහි ඒ සම්බන්ධයෙන් පුළුල් විග්‍රහයක් සිදු නොවේ. ළමුන්ගේ උපතින් පසු ඇති වන පෞරුෂ ආබාධ මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන් වඩාත් වෙනස් අතකට යොමු වේ. ඒ අතර ක්ෂණික කෝපය ප්‍රධාන තැනක් ගනී. නමුත් මත් ද්‍රව්‍ය භාවිතය සමඟ ළමුන්ගේ හැසිරීම පවුල් කෙරෙහි බලපාන ආකාරය පිළිබඳ ව ද අවධානය යොමු කරනු ලැබේ. දයා රෝහණ අතුකෝරාළ විසින් රචිත **'සඵලවත් විවාහ ජිවිතයකට මග'** නමැති කෘතියේ පවුලේ අසතුටට හේතු මෙන් ම සඵලවත් විවාහ දිවියක් සඳහා පවුලේ ඥාතින් සමඟ සබඳතා පැවැත්වීම ආදිය පිළිබඳ අවධානය යොමු කර ඇත. මෙම පර්යේෂණය මගින් මත්ද්‍රව්‍ය භාවිත කරන ළමුන්ගේ ඥාතින් අතර ඇති සබඳතාව පිළිබඳ විග්‍රහ කිරීමට අපේක්ෂා කෙරේ. ඇතැම් අවස්ථාවල දී මෙම ළමුන් වඩාත් අපහසුතාවට පත් කිරීමට හේතු වන්නේ ද මෙම ඥාතින් වේ. විශේෂයෙන් ලේබල් කිරීම සඳහා විශේෂ දායකත්වයක් දක්වන්නේ මොවුන් ය. නමුත් ඇතැම් අවස්ථාවල දී තම දෙමාපියන්ට වඩා මෙම ළමුන්ට උපකාර කරනු ලබන්නේ මෙම ඥාතින් වේ. මේ ආදී වශයෙන් ග්‍රන්ථ රාශියක් පරිශීලනය කිරීමෙන් මෙම පර්යේෂණය වඩාත් සාර්ථක ව අවසන් කිරීමට අපේක්ෂා කරනු ලැබේ. විශේෂයෙන් වර්තමානයේ මත් ද්‍රව්‍ය භාවිතයට යොමු වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ අවධානය යොමු කෙරේ.

## ප්‍රතිඵල සාකච්ඡාව

මත්ද්‍රව්‍ය යනු එය භාවිත කරන ඕනෑ ම මිනිසකුගේ ශාරීරික සහ මානසික ගති පැවතුම්වල යම් කිසි වෙනසක් ඇති කරන රසායනික ද්‍රව්‍යයකි. මත් ද්‍රව්‍ය ගණයට වැටෙන ද්‍රව්‍ය වෛද්‍යවරු විසින් ලෙඩ සුව කිරීම සඳහා ලෙඩින් පෙළෙන මිනිසුන්ට දෙනු ලැබෙති. එහෙත් වර්තමාන සමහර අය මත් ද්‍රව්‍ය ලෙස පිළිගෙන දෑ මිනිසුන්ගේ ලෙඩ සුව කිරීම නොව ශරීරය හා මනස තුළ වෙනත් බලපෑම් ඇති කිරීමට භාවිත කරන බවත්, එම අවස්ථාවන්හි දී එම භාවිතයන් මත්ද්‍රව්‍ය යනුවෙන් හඳුන්වන බවත් හඳුනාගෙන ඇත.

වත්මන් සමාජයේ මිනිසුන් විසින් භාවිත කරන මත්ද්‍රව්‍ය ගණයට අයත් රසාංගද වර්ග සහ වෙනත් ආකාරයේ මත් ද්‍රව්‍ය වර්ග ගණනාවක් පවතී. ඒවා සෑම විටක ම මිනිසා විසින් භාවිත කරනනේ රෝගී තත්ත්වයන් සමනය කිරීමේ අපේක්ෂාවෙන් ම නොවන බව පෙනී යයි. බොහෝ විට ඔවුන්ගේ ශරීර හා මනස තුළ වෙනත් ආකාරයක බලපෑමක් උත්තේජනයක් ඇති කර ගැනීමේ අරමුණ ඇතිව එවැනි රසාංගද වර්ග භාවිත කරනු දැකගත හැකි ය. මෙහි දී රසාංගද ලෙස හැඳින්වූයේ මනුෂ්‍ය ශරීරය තුළ සුළු ප්‍රමාණයක් දේහ ගත වීමෙන් ශරීරය තුළ සැලකිය යුතු මට්ටමේ වෙනසක් ඇති කරන රසාංගද සඳහායි. මේ සඳහා මේ රසාංගද හෙවත් මත්ද්‍රව්‍ය වර්ග භාවිත කිරීමෙන් පසු ව ශරීර තුළ ඇති කරන වෙනස නිසා එම මත් ද්‍රව්‍ය භාවිත කිරීමට පෙළඹීමක් ඇති කරනු ලැබේ.

මෙසේ බලන විට මත් ද්‍රව්‍ය සියල්ලට ම පොදු වූ ලක්ෂණයක් ඇත. එනම් සෑම මත්ද්‍රව්‍යයක් ම පුද්ගලයාගේ සිතුම් පැතුම් හැඟීම් හා හැසිරීම් රටාව විකෘති කිරීමයි. මෙසේ මනුෂ්‍ය ශරීරය තුළ සැලකිය යුතු වෙනසක් ඇති කරන ද්‍රව්‍ය දිගින් දිගට ම ගැනීමෙන් හෝ ආඝ්‍රහණය තුළින් ඇබ්බැහිවීමට පත්වෙන රසායන ද්‍රව්‍ය රාශියකි. නිදසුන් ලෙස බුලත්විට, බීඩි, සිකරට්, සුරුට්ටු, අරක්කු, විස්කි ආදී බීම වර්ග මෙන් ම ගංජා, අබිං, හෙරොයින්, පෙති වර්ග, අයිස්, තුල් යන ආදිය පෙන්වා දිය හැකි ය.

මෙරට අතීතයේ සිට ම විවිධ මත් ද්‍රව්‍ය වර්ග භාවිතය පැවති බව සාක්ෂි පවතී. බීම වර්ග අතරට මත්පැනට ද එහිදී නිසි තැනක් ලැබී තිබේ. මධු හැරුණු විට පාවිච්චි කරන ලද මත්පැනට නැතහොත් සුරා පාවිච්චි කරන ලදැයි කිව යුතු බවත් මේ මත්පැනට සාමාන්‍ය ජනයා පමණක් නොව රජවරුන් ද වසඟ වූ බව චූල වංශයේ තොරතුරු ඇසුරින් අනාවරණය කර ඇත. එමෙන් ම මෙරට මත්ද්‍රව්‍ය තිබූ බවට ද එයට ජනතාව දැක්වූ ප්‍රතිචාරය පිළිබඳ ව ද මත් ද්‍රව්‍යයක් සේ සලකා දුම්කොළ හැපීමෙන් වැලකී තිබෙන බව ද එහි සඳහන් වෙයි. මෙරට දුම්කොළ භාවිතය දී ඒවා කෝචේ දමා දුම්බීම කරනවාට වඩා දුම්කොළ මුව තුළට දමා සැපීම මිනිසුන් විසින් බහුල ලෙස සිදුකර ඇති බැව් සඳහන් වේ.

මත්ද්‍රව්‍ය රසාංගද යනුවෙන් ද හඳුන්වයි. ඉතා කුඩා මාත්‍රයක් ශරීරගත වුව ද එමගින් ජෛව පද්ධතිය තුළ ක්‍රියාකාරීත්වය අඩු කමක් වැඩි කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කිරීමට යම් රසායනයක් සමත් වන්නේ නම් එය රසාංගන්ධයකි. මත් ද්‍රව්‍ය ඒවායේ නීත්‍යානුකූලභාවය අනුව නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය හා නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කර ඇති වර්ගීකරණයට අනුව මත්ද්‍රව්‍ය ප්‍රධාන වශයෙන් කොටස් හතරකට වෙන් කොට හඳුනාගෙන ඇත.

- උත්තේජකයක් STIMULANTS
- අපීඩකයන් DEPRESSANTS
- මායාකාරී / වියමෝහ ජනක / භ්‍රාන්තිජනක HALUCIANOGEN
- කංසා CANNABIS


මෙම අධ්‍යයනය මගින් ළමුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය සිදු කළ අතර ඒ අනුව අධ්‍යයනයෙන් හඳුනා ගන්නා ලද සාධක පහත පරිදි දැක්විය හැකි ය.

දරුවන්ගේ මුල් මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ කරුණු අනාවරණයන්හි දී විවිධ මත්ද්‍රව්‍යය වර්ග භාවිත කර ඇති බව හඳුනා ගත හැකි ය. එහි දී නියැදියේ ඇති ප්‍රමාණය එකින් එක සාකච්ඡා කිරීමේ දී,


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

- සිගරට් 21
- තුල් 11
- මාවා 10
- ගංජා 17
- හෙරෝයින් 16
- අයිස් 14
- පෙති 14,


ආදි වශයෙන් මුල් භාවිතය සිදුකර ඇත. පහත දැක්වෙන ප්‍රස්තාරයෙන් එය වඩාත් පැහැදිලි කරගත හැකි ය.




**ප්‍රස්තාරය 4.1 දරුවන් භාවිත කරන ලද මත් ද්‍රව්‍ය**

සමාජය තුළ බහුල ව දක්නට ලැබෙන මත්ද්‍රව්‍ය දරුවන්ගේ මුල් භාවිතය සඳහා යොමු වන අයුරු දැකගත හැකි ය. මෙහි දී විශේෂයෙන් ම බලාපොරොත්තු වන්නේ අරමුණු ඔස්සේ සකස් කරන ලද අරමුණු ප්‍රශ්න සාකච්ඡා කරමින් එහි ප්‍රතිඵලයන් විශ්ලේෂණය කරමින්, පර්යේෂණ මාතෘකාව කෙතරම් දුරට සාර්ථක වේදැයි විමසීමටයි. එසේ ම පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ නේවාසික ව සිටිමින් මෙම අධ්‍යයනය මගින් ළමුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම කෙරෙහි බලපාන මනෝ සමාජීක සාධක පිළිබඳ අධ්‍යයනය කිරීමට ය. ඒ අනුව අධ්‍යයනයෙන් හඳුනා ගන්නා ලද සාධක පහත පරිදි දැක්විය හැකි ය.

- බිඳුණු පවුල්,
- අධ්‍යාපනය,
- කායික මානසික සෞඛ්‍ය,
- ආර්ථික බලපෑම,
- දෙමාපියන්ගේ නිසි අවධානයක් නොමැති වීම,
- ගුරුවරුන්ගේ නිසි මැදිහත් වීමක් නොමැති වීම.





ප්‍රස්තාරය : 02 දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම

දරුවන්ගේ ක්‍රියාකලාපයට දෙමව්පියන් ලබා ඇති අධ්‍යාපන මට්ටම ඉතාමත් ම වැදගත් වේ. මෙම නියැදියේ දී දරුවන් විසි එක් (21) දෙනාගෙන් දරුවන් දහ තුන්දෙනකුගේ මව්වරු සාමාන්‍ය පෙළ විභාගයට


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පෙනී සිටි ඇති අතර උසස් පෙළ විභාගය සඳහා මව්වරු පස් දෙනෙකු පෙනී සිටි ඇත. එමෙන් ම මෙහි දී ඉන් එහා උසස් අධ්‍යාපනය නිම කරන ලද මව්වරුන් දක්නට නොලැබේ. එමෙන් ම පියවරුන්ගේ ලේඛනය ගත් කල දරුවන් විසිඑක් දෙනාගෙන් පියවරු දහදෙනකු සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිට ඇත. එමෙන් ම පියවරු අටදෙනෙකු උසස් පෙළ විභාගය ද උපාධිධාරී පියවරු හතර දෙනෙක් ද වූ බව දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම සෙවීමේ දී අනාවරණය කරගත හැකි විය.


දෙමාපිය දෙපළගේ රැකියා මට්ටම දරුවන්ගේ අනාගතය සඳහා ඉතාමත් ම වැදගත් වන අයුරු මෙම අධ්‍යයනයේ දී පෙන්වා දිය හැකි ය. මව පියා සිදු කරන රැකියාව අනුව දරුවන්ගේ ජීවිතයට බලපාන යම් යම් කාරණා සමස්ත ජීවිතය කෙරෙහි බලපාන අයුරු මෙම ගැටලුව නිරාකරණය කිරීමේ දී වැදගත් වෙයි. දෙමාපියන් සිදු කරන රැකියා අතර විදේශ ශ්‍රමිකයන්, ගෘහණියන් ගුරුවරු, රාජ්‍ය සේවකයන්, පෞද්ගලික සේවකයන් සහ කුලීකරුවන් වශයෙන් වර්ග කළ හැකි ය. අනිකුත් රැකියාවලට සාපේක්ෂ ව කුලී වැඩ කරන දෙමව්පියන් මෙම පර්යේෂණයේ දී සොයා ගන්නා ලදී. ඒ අනුව කුලී වැඩ සිදු කරන පියවරු ගත් කල දරුවන් විසි එක් දෙනාගෙන් හත්දෙනෙකු කුලිවැඩ සේවයේ ද රාජ්‍ය සේවයෙහි පියවරුන් හතරදෙනෙකු ද වෙළඳාම් සිදු කරන පියවරු හතරදෙනෙකු ද විදෙස්ගත පියවරු දෙදෙනෙකු ද දක්නට වූහ.




ප්‍රස්තාරය : 03 දෙමාපියන්ගේ රැකියා තොරතුරු

මව්වරුන්ගේ රැකියා පිළිබඳ ව විමසීමේ දී විදෙස්ගත මව්වරු හතර දෙනෙකු ද වෙළඳාමෙහි නියුතු මව්වරු හතර දෙනකු ද ගුරු සේවයෙහි එක් මවක් ද රාජ්‍ය සේවක පෞද්ගලික සේවක කුලී වැඩ මෙම අංශවල මව්වරු එක්කෙනා බැගින් ද රැකියාවන්හි නියුතු ව සිටිති. කෙසේ වෙතත් දරුවන් කෙරෙහි ඇති නොසැලකිලිමත් භාවය නිසා ම දරුවන් විවිධ වැඩවලට යොමු වන බව හඳුනා ගත හැකි ය. දරුවන් කෙරෙහි දැඩි අවධානයෙන් යුක්ත ව දෙමව්පියන් කටයුතු සිදුකරනවා නම් මෙවැනි අපහසුකම්වලට දරුවන් පත් නොවනු ඇත. උදාහරණ වශයෙන් එක්තරා සේවාලාභියෙක් තම නිවසේ මල් බඳුනක ගංජා වගා කර ඇත. මවගේ නොදැනුවත් බව නිසා හා පියා විදේශ ගතවී සිටි අතර එම සේවා ලාභියා ගංජා වගා කිරීමේ වරද යටතේ අත්අඩංගුවට පත් විය.

එමෙන් ම part time jobs යන තේමාව ඔස්සේ ඉගෙන ගන්නා දරුවන් ඉගෙන ගන්නා කටයුතු සිදු කරමින් රැකියාවක නිරත වෙමින් මුදල් සොයමින් මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම සහ මත්ද්‍රව්‍ය ලබා ගැනීමට මුදල් උපයා ගෙන ඇති අයුරු පහත දැක්වෙන ප්‍රස්තාරය දෙස බැලීමෙන් මනාව අවබෝධ කරගත හැකි විය.





ප්‍රස්තාරය : 04 මත්ද්‍රව්‍යය සඳහා මුදල් සපයා ගත් ආකාරය

අධ්‍යයනය සිදු කිරිමේ දී පෙනී ගිය වෙනත් හේතු සාධක කීපයක් ද හඳුනා ගැනීමට හැකි විය. එනම් කුලවද්දා ගැනීම් නිසා ද ළමුන් මත්ද්‍රව්‍යය භාවිතයට යොමු වී ඇති බව ය. උදාහරණ වශයෙන් දරුවන් නොමැති අඹුසැමි යුවලක් විසින් ළමයෙකු හදාවඩා ගෙන තිබුණි. පසු ව මෙම ළමයා තම මුල් දෙමාපියන් සොයා බලන විට තමන් ගණිකාවකගේ දරුවෙක් බව සොයා ගෙන තිබුණි. ඒ අනුව කුලවද්දා ගැනීම ද ඇතැම් අවස්ථාවල දී ළමුන් කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි. තව ද දෙමාපියන්ගේ වයස ද ළමුන් කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරයි. උදාහරණ

 © 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වශයෙන් එක්තරා සේවාලාභියෙකුගේ පියා මරණයට පත් වී ඇති අතර මව ඉතා ම අඩු වයසක අයෙකි. ඇ ඒ නිසා වෙනත් විවාහයක් කර ගැනීමට උත්සාහ කොට ඇති අතර ඒ නිසා ළමයා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී තිබුණි.


ආදරය ගිලිහුණු දරුවන් නොමඟට යන්නන් බව පසක් වෙයි. දරුවන්ට නිසි ලෙස ආදරය හා සෙනෙහස ලබා දිය යුතු ය. ඔවුන් රැක බලා ගත යුතු ය. නැතහොත් මෙවැනි තත්ත්වයකට පත්වෙන බව අවිවාදයෙන් යුතු ව පිළිගත යුතු ය.




ප්‍රස්තාරය : 05 දරුවන්ට ආදරය ලබා දුන් පුද්ගලයන්

දරුවන් සමාජය තුළ ජීවත් වන ආකාරය ඉගෙන ගනු ලබන්නේ දෙමාපියන් සහ තම සහෝදර සහෝදරියන් සමඟ නිරන්තර ව පවත්වනු ලබන සබඳතාවන් මුල් කරගෙන ය. දෙමාපියන් විසින් තම තමන්ගේ දෛනික කටයුතුවල නිරත වෙමින් දරුවන්ට තම කාර්ය කොටස ඉටු කිරීමට අවශ්‍ය මනා පුහුණුව ලබා දෙනු ලැබේ. එමෙන් ම මානව දරුවා අනෙකුත් සතුන් මෙන් නොව දීර්ඝ කාලයක් තිස්සේ ඇතිදැඩි කිරීමෙන් හා නොයෙකුත් ආපදාවන්ගෙන් ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය කාර්යයක් වෙයි.

මෙහි දී සමවයස් ඇසුර හේතු කොට ගෙන වැඩි ප්‍රතිශතයක් දරුවන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වීම සිදුවී ඇති අයුරු දක්නට ලැබේ. ඒ අනුව 45 දෙනෙකු මිතුරන් නිසා ද 04 දෙනෙකු ආදර සබඳතා පළුදු වීම නිසා ද 23 දෙනෙකු විනෝදය සඳහා ද තව ද 23 දෙනෙකු කුතුහලය නිසා ද මත් ද්‍රව්‍යවලට යොමු වී ඇති අයුරු පහත දැක්වෙන ප්‍රස්තාරය විමර්ශනය කිරීමෙන් පෙන්වා දිය හැකි ය.




ප්‍රස්තාරය : 06 මත් ද්‍රව්‍ය භාවිත කිරීමට බලපෑ ප්‍රධාන හේතු

විශේෂයෙන් මත් ද්‍රව්‍ය සඳහා ළමුන් යොමු වන්නේ වයස අවුරුදු 13 දී පමණ සිට ය. නමුත් බහුතරයක් දෙනා වයස අවුරුදු 15න් ඉහළ අය වෙති. ළමුන් නව යොවුන් වියට පා තබනුයේ මෙම කාල වකවානුවේ ය. මෙම වයසේ දී ඇති වන කායික වෙනස් වීම් මත මානසික ව්‍යාකුලතා ඇති වීම සාමාන්‍ය දෙයකි. දෝලනය වන සිතුවිලි සමූහයක් සමඟ කටයුතු කරන මෙම ළමුන් කෙරෙහි සාවධාන ව සවන් දිය යුතු ය. අත්හදා බැලීම සඳහා විශේෂ කැමැත්තක් දක්වන බැවින් හරිවැරැද්ද පෙන්වා දිය යුතු ය. අතහැර දැමීම නොකළ යුතු ය.

යම් දරුවෙක් මත්ද්‍රව්‍ය භාවිතයට මුලින් ම යොමු වන වයස් සීමාව පිළිබඳ ව සැලකීමේ දී බහුතරයක් දරුවන් වයස අවුරුදු 15ත් 19ත් අතර වයස් මට්ටමක දී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කිරීම සිදු කර ඇති අතර වයස අවුරුදු 14 හෝ ඊට අඩු වයස් මට්ටමක දී ද දරුවන් ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වූ අවස්ථා දක්නට ලැබේ. සමවයස් කණ්ඩායම්වල බලපෑම මෙහිලා ප්‍රමුඛ ව හේතු වී ඇති අයුරු දක්නට ලැබේ.

මෙම අධ්‍යයනය මගින් අනාවරණය වූ ආකාරයට නගරාසන්න පාසල්වල පිරිමි ළමුන් සුලුතරයක් තුළ මෙවැනි චර්යාවන් සහ සම්බන්ධ සිද්ධීන් වාර්තා වී ඇත. ඒ පිළිබඳ ව ගැඹුරින් විමසීමේ දී තහවුරු වූ කරුණක් නම් බොහෝ ප්‍රදේශවල පාසල් සිසුන් මත්කාරක දුම් කුඩු විශේෂයන් භාවිතයට යොමු වීම සම්බන්ධ ප්‍රවණතාවක් උද්ගත වෙමින් පවතින බවයි. මෙම දුම් කුඩු නිෂ්පාදන නීත්‍යානුකූල අවසරයක් සහිත ව නිෂ්පාදනය කරන ලද ඒවා වූ අතර වයස අවුරුදු 21ට අඩු දරුවන් වෙත අලෙවි කිරීම තහනම් වුවත් ඇතැම් ස්ථානවල පාසල් සිසුන් ඉලක්ක කර ගෙන මෙවැනි ද්‍රව්‍ය අලෙවි කරන අවස්ථා වාර්තා වී ඇත.

නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් සමඟ කරන ලද සම්මුඛ සාකච්ඡාවලින් ලද දත්ත අනුව පෞද්ගලික නිෂ්පාදන ආයතන මගින් නිෂ්පාදනය කර අලෙවි කරන දුම් කුඩු විශේෂයන්ට අමතර ව දුම් කොළ සහ වෙනත් ද්‍රව්‍ය උපයෝගී කර ගනිමින් පාසල් සිසුන් විසින් ම යම් යම් මත්කාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කර ගන්නා අවස්ථාවන් ද වාර්තා වී ඇත. නමුත් එවැනි තත්ත්වයන් සම්බන්ධ සුළු ප්‍රවණතාවක් හඳුනා ගත හැකි ය. ඊට අමතර ව මාවා වැනි පුවක් විශේෂයක් පාසල් ළමුන් අතර ව්‍යාප්ත වීම සම්බන්ධ සුළු සිද්ධීන් කිහිපයක් යම් යම් නාගරික ප්‍රදේශ ආශ්‍රිත ව වාර්තා වී ඇත. එමෙන් ම පාසල් සිසුන් ඇතැම් අවස්ථාවල, මද්‍යසාර වර්ග භාවිත කිරීමට යොමු වූ අවස්ථාවන් සම්බන්ධයෙන් ද අධ්‍යයනය මගින් අනාවරණය විය. විශේෂයෙන් ම පාසල් අතර ක්‍රීඩා තරග ඉසව් පැවැත්වෙන කාල සීමාවන් තුළ මෙවැනි ක්‍රියාවන්ට යොමු වීමේ වැඩි ප්‍රවණතාවක් පවතින බවට ද අනාවරණය විය. සමස්ත පාසල් ශිෂ්‍ය ප්‍රජාව හා සැසඳීමේ දී මෙම තත්ත්වය ඉතා සුළු ප්‍රවණතාවක් පවත්නා කරුණක් වුවත් ඒ තුළ ගැබ්ව පවතින අවදානම කෙරෙහි සුවිශේෂ අවධානයක් යොමු විය යුතු ය. ප්‍රාථමික මත්ද්‍රව්‍යක් වශයෙන් මෙවැනි ද්‍රව්‍යයන් භාවිත කිරීම මත් ද්‍රව්‍ය කෙරෙහි දීර්ඝ කාලීන ව යොමු වීමේ මූලික අවස්ථාව විය හැකි ය. හෙරොයින් භාවිත කරන ජනගහනය අතර මත් ද්‍රව්‍ය ශරීරගත කර ගන්නා


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රචලිත ක්‍රමය බවට පත්ව ඇත්තේ, චයිනීස් (chase to the Dragon) ක්‍රමයයි. හෙරොයින් භාවිත කරන දරුවන් දිනකට හෙරොයින් භාවිත කරන සාමාන්‍ය වාර ගණන 03 ක් වන අතර හෙරොයින් භාවිත කරන දරුවන් දිනකට භාවිත කරන සාමාන්‍ය හෙරොයින් පැකට් ගණන 03 කි. හෙරොයින් නොමැති අවස්ථාවල දී, භාවිත කරන විකල්ප ද්‍රව්‍ය අතරින් Morphine පෙති බහුතරයක් දරුවන් විසින් භාවිත කරනු ලැබ ඇත. ඊට අමතරව Pseudoephedrine Tramodol iy Diazapam වැනි පෙතිවර්ග ද භාවිත කරනු ලබයි. මත්ද්‍රව්‍යය ආශ්‍රිත වැරදි සඳහා දරුවන් යොමු වීමේ පවත්නා කාලීන තත්ත්වය පිළිබඳ සැලකීමේ දී තහවුරු වූ ප්‍රධාන කරුණක් නම් මත්ද්‍රව්‍යය භාවිත කිරීම සම්බන්ධයෙන් පිරිමි දරුවන්ට වඩා ගැහැණු දරුවන් ඉතා සුළු ප්‍රතිශතයක් වාර්තා වී ඇති බවයි.

පාසල් සිසුන් මත්කාරක ද්‍රව්‍ය භාවිතයට යොමුවීම සම්බන්ධ යම් යම් සිද්ධීන් අනාවරණය වී ඇති අතර එය සමස්ත පාසල් ප්‍රජාව හා සැසඳීමේ දී ඉතා අඩු ප්‍රවණතාවක් ලෙස සැලකිය හැකි ය. නමුත් එම තත්ත්වය නොසළකා හැරිය නොහැකි අතර එහි පවත්නා අවදානම පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. ගංජා, හෙරොයින් නොමැති අවස්ථාවල දී, භාවිත කරන විකල්ප ද්‍රව්‍ය අතරින් Morphine පෙති බහුතරයක් විසින් භාවිත කරනු ලැබ ඇත. ඊට අමතර ව Tramadol" Rohypnol" Diazepam" Artane iy pregaballin වැනි පෙති වර්ගයන් ද හෙරොයින්වලට විකල්ප ද්‍රව්‍යයන් ලෙස භාවිත කරනු ලබයි. ගංජා දිනපතා භාවිත කරන දරුවෙක් දිනකට භාවිත කරනු ලබන සාමාන්‍ය ගංජා පැකට් ගණන එකකි. එනම් බහුතර පිරිසක් දිනකට පැකට් එකක් භාවිත කරන අතර මෙහි දී පැකට් එකක් යන්න භාවිත කිරීමේ පහසුව සඳහා සහ දෛනික ව පහසුවෙන් අලෙවි කිරීමේ හා හුවමාරු කර ගැනීමේ පහසුව පිළිබඳ සලකමින් සකසන ලද ප්‍රමාණයකි. ගංජා, හෙරොයින් වැනි මාදක ගණයේ මත්කාරක ද්‍රව්‍ය භාවිතයට යොමු වූ දරුවන් එයට අමතර හෝ විකල්පයන් ලෙස ඖෂධ වර්ග අනිසි ලෙස භාවිත කිරීම සම්බන්ධ ප්‍රවණතාවක් නිර්මාණය වෙමින් පවතියි. වෛද්‍යවරයෙකු විසින් නිර්දේශ කරන ලද ඖෂධ වට්ටෝරු අයුතු ලෙස භාවිත කරමින් ඖෂධ සැල්වලින් ඖෂධ ලබා ගන්නා අතර අනෙක් ක්‍රමය නම් සමහර ඖෂධසැල් හිමියන් සමග පෞද්ගලික ව ගොඩනගා ගත් සම්බන්ධතාවන් මත වෛද්‍ය නිර්දේශයකින් තොර ව අදාළ ඖෂධ ලබා ගැනීම ය.

වෛද්‍යමය නිර්දේශයන් මත නිකුත් කරනු ලබන ඖෂධ වර්ග සහ අනෙකුත් ඖෂධ වර්ග සම්බන්ධයෙන් තාක්ෂණික සහ නෛතික දැනුම ප්‍රමාණවත් නොවීම සහ වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ අවභාවිත කිරීමේ සිද්ධීන් සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කිරීමේ දී නෛතික කාර්යය පටිපාටිය තුළ ප්‍රායෝගික දුෂ්කරතාවන් මතුවීම නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් මුහුණ පාන ප්‍රධාන ගැටලු දෙකකි. මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා ස්ත්‍රී හා පුරුෂ වශයෙන් යොමු වීමේ පවත්නා කාලීන තත්ත්වය පිළිබඳ සැලකීමේ දී තහවුරු වූ ප්‍රධාන කරුණක් නම් මත් ද්‍රව්‍ය භාවිත කිරීම සම්බන්ධයෙන් පුරුෂයින්ට සාපේක්ෂ ව කාන්තාවන් ඉතා සුළු ප්‍රතිශතයක් වාර්තා වී ඇති බවයි. නමුත් මත්ද්‍රව්‍ය අලෙවිය සහ ජාවාරම් කිරීම සම්බන්ධයෙන් සැලකීමේ දී කාන්තාවන්ගේ යොමු වීමේ ප්‍රවණතාවක් හඳුනා ගත හැකිවිය. අන්තරායකර ඖෂධ ගණයට ගැනෙන මත්කාරක ද්‍රව්‍ය භාවිත කරන දරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා අනුව බහුතරයක් පිරිස බහුවිධ මත් ද්‍රව්‍ය භාවිත කරන්නන් (Multiple drug users) බව නිගමනය කළ හැකි ය.

## සමාලෝචනය

මතින් නිදහස් රටක් සඳහා වූ ඉදිරි දැක්ම යාවත්කාලීන කිරීම උදෙසාත්, ගෝලීය වශයෙන් මානව වර්ගයාගේ ප්‍රගමනයට බාධාකාරී වන විෂයයක් වූ මත්ද්‍රව්‍යය දුර්භාවිතය සහ එහි බලපෑම් අවම කිරීම සඳහාත් සමාජ පර්යේෂණ ක්ෂේත්‍රය ඔස්සේ ඉටු කළ හැකි වගකීම පුළුල් පරාසයක් තුළ විහිදී පවතී. එකී සමාජ වගකීම තුළ මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ එහි ප්‍රවණතා හඳුනා ගැනීම අත්‍යවශ්‍ය සාධකයක් වෙයි. මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ එහි ප්‍රවණතා පිළිබඳ සැලකීමේ දී අවධාරණය කළයුතු ප්‍රධාන ම කරුණ නම්, උක්ත ප්‍රපංච කාලානුරූපී ව විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් පැවතීමයි. කාලානුරූපී ව පැන නගින සමාජ, ආර්ථික සහ දේශපාලන ප්‍රවාහයන්ගේ ඍජු සහ වක්‍ර බලපෑම්වලට නතු වෙමින් එම ප්‍රපංචයන්ගේ ස්වරූපය මෙකී වෙනස්කම්වලට බඳුන් වෙයි. මෙවැනි පසුබිමක් තුළ මත්ද්‍රව්‍ය සඳහා පවත්නා ඉල්ලුම, මත් ද්‍රව්‍ය සැපයුම, මත්ද්‍රව්‍ය, ශුද්ධතාව සහ මිල ගණන්, වෙනස් ස්වරූපයන්ගෙන් සහ බලපෑම්වලින් යුතු නව මත්ද්‍රව්‍ය වර්ග ආදී කරුණු පිළිබඳව නව ප්‍රවණතා සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී අවධානය යොමු කළ යුතුයි. මෙම අධ්‍යයනය තුළ දී මත්ද්‍රව්‍ය භාවිතයේ ප්‍රචලිත බව මිනුම් කිරීමට ලක්කර ඇති අතර මත් ද්‍රව්‍ය භාවිත කරන්නන්ගේ කාලීන පැතිකඩ කෙරෙහි ද අවධානය යොමු කර ඇත. විශේෂයෙන් මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත නව ප්‍රවණතා එනම්, නව මත්ද්‍රව්‍ය ප්‍රභේදයන්, ප්‍රදේශ අනුව මත්ද්‍රව්‍ය ආශ්‍රිත ව්‍යාප්තියේ විෂමතා, කාන්තාවන් හා පාසල් ළමුන්ගේ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සඳහා යොමුවීම වැනි සංරචක පිළිබඳ අධ්‍යයනය කර ඇත.

ප්‍රබුද්ධ සමාජයක් වශයෙන් දරුවන් යහමගට ගැනීම සහ දරුවන්ගේ අනාගතය මෙන් ම ඔවුන්ගේ ජීවන රටාව සුබිත කිරීම් සඳහා ගුරු දෙගුරුන් මෙන් ම වැඩිහිටියන් දෙන අවවාද මෙන් ම යහපත් මාර්ගය පෙන්වා දීම ඉතාමත් ම වැදගත් වන බව මෙහි දී පෙන්වා දිය හැකි ය. එමගින් පුද්ගලයාගේ මෙන් ම පාසල් යන දරුවාට ඉතාමත් වැදගත් වන කාරණාවක් මෙහි දී සාකච්ඡා කරන ලදී. අතීතය වර්තමානය අනාගතය යන කාල තුනට ම ව වැදගත් වන මෙම ගැටලුව සම්බන්ධ ව සමාජමය කතිකාවක් ගොඩනගා ගත යුතු බවත් පෙන්වා දිය යුතු ය.

## යෝජනා

- දරුවන් අනිසි ලෙස භාවිත කරන මත්ද්‍රව්‍ය පිළිබඳව හා එහි අනිසි ප්‍රතිඵල පිළිබඳ ව පෙන්වා දීම.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

- මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳව දෙමව්පියන් හා වැඩිහිටියන් දැනුවත් කිරීම.
- මත්ද්‍රව්‍ය නිසා ජීවිතය අනතුරට ලක්වූ දරුවන්ගේ ජීවිත කතා පිළිබඳව සමාජය දැනුවත් කිරීම.
- මත්ද්‍රව්‍යවලට දැනට පවතින නීතිමය රාමුව පිළිබඳව දරුවන් හා දෙමව්පියන් දැනුවත් කිරීම.
- මත්ද්‍රව්‍ය නිසා ශාරීරික මානසික පීඩනය ඇතිවන අයුරු ක්‍රමානුකූලව සමාජය දැනුවත් කිරීම.
- මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් සමාජගත කිරීම සහ ව්‍යාප්ත කිරීම.
- මත්ද්‍රව්‍ය බෙදාහැරීම් සිදු කරන පුද්ගලයන් නීතිය ඉදිරියට රැගෙන යෑම.
- මත්ද්‍රව්‍යයෙන් තොර යහපත් සමාජයක් බිහි කිරීමට දරුවන්ට උපදේශන වැඩසටහන් පාසල් මට්ටමින්, ගම් මට්ටමින්, නගර මට්ටමින් සිදු කිරීම.
- පාසල් සිසුන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වළක්වා ගැනීම සඳහාවූ නිවාරණ ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කළ යුතු ය. එහි දී මත්ද්‍රව්‍ය වෙනුවට වෙනත් ආදේශකයන් භාවිතයට යොමු වීමේ ප්‍රවණතාවක් ඇති බැවින් නිවාරණයේ දී ඒ සම්බන්ධ ආකල්පයන් වෙනස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.
- ඖෂධ අනිසි භාවිතය සම්බන්ධයෙන් විශේෂයෙන් අලුතින් වෙළඳ පොළට නිකුත් වන ඖෂධ වර්ග ඒවායේ බලපෑම්, අයත් කාණ්ඩයන් පිළිබඳව නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන් උදෙසා තවදුරටත් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

## පරිශීලිත මූලාශ්‍රය


අතුකෝරළ, එච්. එන්. (2000). **යොවුන් වියේ ගැටලු විසඳා ගත හැකි මග,** කොළඹ 08: ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අතුකෝරළ, ඩී. ආර්. (2004). **සාර්ථක පවුල් ජිවිතයකට මනෝවිද්‍යාත්මක මග පෙන්වීමක්**, කොළඹ 08: ශික්ෂා මන්දිර ප්‍රකාශන.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය .(2017). **ශ්‍රී ලංකාවේ මත් ද්‍රව්‍ය භාවිතය පිළිබඳ තොරතුරු අත්පොත,** බොරලැස්ගමුව: අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

අමරසේකර ,ඩී. (2015). **සමාජ මානව විද්‍යාව**, කොළඹ 10: සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්ග) සමාගම.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය. **ශ්‍රී ලංකාවේ දූර්මත් ද්‍රව්‍ය භාවිතය පිළිබඳ පර්යේෂණාත්මක ලිපි එකතුව,** (2013). බොරලැස්ගමුව: අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය. (2017) **ශ්‍රී ලංකාවේ මත් ද්‍රව්‍ය දූර්භාවිත තොරතුරු**

අබේපාල, රෝලන්ඩ්. (2010). **අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම**, සාර ප්‍රකාශන, අතුරුගිරිය: සාර ප්‍රකාශන.

කුමාර, එන්.වි.ජී.ඒ.එච්.(2016). **සමාජ විද්‍යාව මූලික සංකල්ප න්‍යාය හා ක්‍රමවේදය.** මරදාන: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය

ධර්මප්‍රිය,ජේ.ඩී, (2001). **මත් ද්‍රව්‍ය සහ සමාජය**, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහහතරවන කලාපය 2022 දෙසැම්බර්
පිටු 42-70
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

# (A Sociological Study on the Importance of School Sex Education to Control Anti-Social Behaviors; From Valasmulla Regional Secretariat, Hambantota District)

ඩබ්ලිව්. ටී. ඩී. විජේතුංග*[1], එස්. ඩී. වයි. ජයරත්න[2] සහ රිශිනි ෆර්නැන්ඩෝ [3]

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව, මානව විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, නුගේගොඩ ශ්‍රී ලංකාව[12]
ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය.[3]
**yeshani.jayarathna@gmail.com**

## Abstract

Sexuality is a topic that can be used to build different interpretations for different sections of society in this country. Statements about the need for sex education are not unfamiliar to the eyes of the people of Sri Lanka. The purpose of sex education in schools is to provide age-appropriate sex education to the country's teenagers. It is questionable whether this sex education is still done properly in schools. When you pay attention to the daily news in Sri Lanka, the reports of sexual crimes such as rape and child abuse are high. Young children and young people are often identified as victims of this. Accordingly, the main purpose of this research is to study the importance of sex education of school students to control anti-social behavior. Also, as special objectives, the study of the relationship between the school teacher and the school student in sex education, the investigation of the contribution of the school teacher and the syllabus to the control of anti-social behavior, identifying how the current school health education syllabus should be changed and recommendations for that. The presentation, the study of how the teacher's role affects the society as well as the student's education, personality, and discipline can be pointed out. For this study, 03 schools out of 13 schools in Valasmulla regional secretariat have been selected as the study area due to the research period being limited to 6 months. Accordingly, 32 students from Northern Kanumuldeniya University, 13 students from Oluara Bandaranaike University and 15 students from Kandebedda University will be enrolled in the total number of 60 students. Students aged 12 to 18 years were selected in this sample. Also, 4 teachers were selected from the three schools and information was obtained using an interview schedule. Also, case studies have been done from the information obtained from them. In examining whether the students have an understanding of what sex education is, all those selected from the entire population said that there is an understanding of sex education. The percentage of female students who have an understanding of the difference between health education and sex education is 41.7% and the percentage of students who do not have an understanding of the difference between health education and sex education is 58.3%. Also, 76.7% of the total respondents said that sex education of school students is important to control anti-social behavior. Also, according to the information obtained from the teachers, it is clear that the school students should receive complete sex education in the school.

**Key Words**: Education, Students, Sexuality, Anti-social, Health

### සාරසංක්ෂේපය

ලිංගිකත්වය යනු මෙරට සමාජයේ විවිධ පාර්ශවයන්ට විවිධ අර්ථකථන ගොඩනඟා ගැනීමට උපයෝගී කොට ගත හැකි මාතෘකාවකි. ලිංගික අධ්‍යාපනයක අවශ්‍යතාව පිළිබඳ පළ වන ප්‍රකාශ මෙරට වැසියන්ගේ දෙනෙතට දෙසවනට නුහුරු නුපුරුදු නොවන දේය. පාසල් තුළ සිදුවන ලිංගික අධ්‍යාපනය මගින් ඉලක්ක කොට ගැනෙන්නේ ද රටේ නව යොවුන් වියේ පසු වන පිරිසට ඔවුන්ගේ වයසට ගැළපෙන ආකාරයේ ලිංගික අධ්‍යාපනයක් ලබාදීමයි. මෙම ලිංගික අධ්‍යාපනය පාසල් තුළ තවමත් හරිහැටි සිදු වන්නේ ද යන්න ප්‍රශ්නාර්ථයකි. ශ්‍රී ලංකාවේ දිනෙන් දින වාර්තා වන ප්‍රවෘත්ති පිළිබඳ අවධානය කරන විට ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන වැනි ලිංගිකත්වය පිළිබඳ අපරාධයන් වාර්තා වීම ඉහළ අගයක් ගෙන ඇත. බොහෝ විට කුඩා

දරුවන් සහ නව යොවුන් තරුණ තරුණියන් මේ සඳහා ගොදුරු වීම හඳුනාගත හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණයෙහි ප්‍රධාන අරමුණ වන්නේ සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ ව අධ්‍යයනය කිරීමයි. එමෙන් ම සුවිශේෂ අරමුණු ලෙස ලිංගික අධ්‍යාපනයේ දී පාසල් ගුරුවරයා හා පාසල් ශිෂ්‍යයා අතර ඇති සබඳතාව පිළිබඳ අධ්‍යයනය කිරීම, සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් ගුරුවරයාගේ හා විෂය නිර්දේශයේ ඇති දායකත්වය පිළිබඳ විමර්ශනය කිරීම, දැනට පවතින පාසල් සෞඛ්‍ය අධ්‍යාපන විෂය නිර්දේශය වෙනස් වියයුතු ආකාරය හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම, ගුරු භූමිකාව සමාජයට මෙන් ම ශිෂ්‍යයාගේ අධ්‍යාපනයට, පෞරුෂයට, විනයට බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම යන කරුණු පෙන්වාදිය හැකි ය. මෙහි දී අධ්‍යයනය සඳහා වලස්මුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති පාසල් 13ක් අතරින් පාසල් 03ක් අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගෙන ඇත. ඒ අනුව නියැදිය හ/උතුරු කණුමුල්දෙණිය මහා විද්‍යාලයෙන් සිසුන් 32ක් ද හ/ඕලුආර බණ්ඩාරනායක කනිෂ්ඨ විද්‍යාලයෙන් සිසුන් 13ක් ද හ/කන්දෙබැද්ද කනිෂ්ඨ විද්‍යාලයෙන් සිසුන් 15ක් වශයෙන් ඇතුළත් වන පරිදි සම්පූර්ණ නියැදිය 60 කි. මෙම නියැදිය තෝරා ගැනීමේ දී වයස අවුරුදු 12 සිට 18 දක්වා සිසුන් තෝරාගනු ලැබිණි. එමෙන් ම පාසල් තුනෙන් ගුරුවරුන් 4 දෙනෙක් තෝරා ගෙන සම්මුඛ සාකච්ඡා උපලේඛනයක් භාවිතයෙන් තොරතුරු ලබාගෙන ඇත. එමෙන් ම ඔවුන්ගෙන් ලබාගත් තොරතුරුවලින් සිද්ධි අධ්‍යයනයන් සිදුකර තිබේ. ලිංගික අධ්‍යාපනය යනු කුමක් ද යන්න පිළිබඳ අවබෝධයක් සිසුන්ට පවතිනවා ද යන්න විමසා බැලීමේ දී සමස්ත සංගහනයෙන් නියැඳියට තේරී පත් වූ සියලු දෙනා කියා සිටියේ ලිංගික අධ්‍යාපනය පිළිබඳ අවබෝධයක් පවතින බවයි. සෞඛ්‍ය අධ්‍යාපනය හා ලිංගික අධ්‍යාපනය අතර වෙනස පිළිබඳ වැටහීමක් පවතින ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රතිශතය 41.7%ක් වන අතර සෞඛ්‍ය අධ්‍යාපනය සහ ලිංගික අධ්‍යාපනය අතර වෙනස පිළිබඳ වැටහීමක් නොමැති සිසුන් ප්‍රතිශතය 58.3%ක් වේ. එමෙන් ම සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනය වැදගත් වනවාය යනුවෙන් සමස්ත නියැඳියෙන් 76.7%ක් ප්‍රකාශ කොට තිබේ. එමෙන් ම ගුරුවරුන්ගෙන් ලබාගත් තොරතුරු අනුව ද පැහැදිලි වනුයේ පාසල් සිසුන්ට පාසල තුළ දී පරිපූර්ණ ලිංගික අධ්‍යාපනයක් ලැබිය යුතු බවයි.

කේන්ද්‍රීය වචන (අධ්‍යාපනය, සිසුන්, ලිංගිකත්වය, සමාජ විරෝධී)

## හැඳින්වීම

ලිංගික අධ්‍යාපනය නව යොවුන් වියේ තරුණ තරුණියන්ගේ ජීවිතයට ඉතාමත් වැදගත් අංගයකි. ඒ මගින් අනවශ්‍ය ගැබ්ගැනීම්, ලිංගිකත්ව අවභාවිතයන් ඇතිවීමට හේතු වන ලිංගිකත්ව දැනුම මදකම, ලිංගාශ්‍රිත රෝග ඇතිවීම, ලිංගිකත්වය හා සම්බන්ධ අපරාධවලට යොමු වීම වැනි දේවලින් තරුණ තරුණියන් මුදවාගත හැකි ය. ලිංගික අධ්‍යාපනය මගින් උපත් පාලනය පිළිබඳ, ලිංගිකත්වයට හැඩගැසීමට, සෞඛ්‍ය සම්පන්න සම්බන්ධතාවන් පවත්වාගෙන යාමට අවශ්‍ය අඩිතාලම සපයයි. ඉහත සියල්ලට අනුව ලිංගික අධ්‍යාපනය මගින් සම්බන්ධතා සහ ලිංගිකත්වය හා සම්බන්ධ දැනුම සංවර්ධනය කිරීමත්, ලිංගිකත්වය හා ලිංගික සෞඛ්‍යය සම්බන්ධයෙන් නිවැරදි තෝරාගැනීම් සිදු කිරීමට අවශ්‍ය දැනුම සන්නිවේදනය කිරීමත් සිදුවේ . මීට දශක කිහිපයකට පෙර සමග සසඳා බලන විට තරුණ තරුණියන් පූර්ව විවාහ ලිංගික සම්බන්ධතා පවත්වන ප්‍රමාණය සාපේක්ෂ ව වැඩි වෙමින් පවතින බව සංඛ්‍යා ලේඛනවලින් හෙළි වී තිබේ. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හා පවුල් සංවිධාන සංගමය වාර්තා කරන අන්දමට දිනකට කොළඹ පමණක් නිල නොවන ගබ්සා 100කට වඩා සිදුවේ. බොහෝ දුරට මේවා සිදු කරනුයේ වෛද්‍ය පහසුකම් නොමැති රහසිගත සායනවල නිසා ජීවිතවලට ඇති අනතුරත් පසුකාලීන ව විවිධ රෝගවලට නැඹුරු වීමේ ඇති භව්‍යතාවත් වැඩි බව වෛද්‍යවරු පවසති. මෙම තත්ත්වයට පත්වීමට හේතු රැසක් පැවතිය හැකි ය (අතුකෝරළ, 2003; 4). මේ සඳහා සමාජයේ පිළිනොගත් සාරධර්මවලට පටහැනි එනම් සමාජ විරෝධී ලිංගික චර්යාවන් හේතු වී තිබීම හඳුනාගත හැකි වේ.

ලිංගිකත්වය පිළිබඳ දක්වන්නාවූ නම්‍යතාව පදනම් කරගනිමින් මූලික වශයෙන් මිනිසාගේ ලිංගික ජීවිතය සතුන්ගේ ලිංගික ජීවිතයෙන් වෙනස් වේ. මිනිස් ලිංගික චර්යා හුදෙක් සතුන්ගේ මෙන් ස්වයංක්‍රීය ව ඇතිවන්නක් නොවේ. මිනිස් ලිංගික ජීවිතයේ විවිධතාවයන් පවතිනවා මෙන් ම පූර්ව ලිංගික අත්දැකීම් හා සබඳතාවන් ද පවතී. මිනිසුන් ජීවත් වන සංස්කෘතිය මගින් ඔවුන්ගේ ලිංගික ජීවිතය හැඩගස්වා තිබේ. හෝමෝන ක්‍රියාකාරීත්වය පදනම් කරගනිමින් මිනිසාගේ සහ සතුන්ගේ ලිංගික ක්‍රියා එකිනෙකට වෙනස් බව විද්‍යාඥයන් විසින් පෙන්වා දී තිබේ. මීයන් සහ බළලුන් වැනි සතුන්ගේ ලිංගික චර්යාවන් බොහෝ දුරට හෝමෝන මත තීරණය වේ. නමුත් මිනිසාගේ ලිංගික චර්යාවන් බොහෝ දුරට ඔහුගේ මානසික අවශ්‍යතාවක් බව පැහැදිලි වේ. මිනිස් ලිංගික චර්යාවන් කාලයට, වයසට මෙන් ම සංස්කෘතියට ද සාපේක්ෂ වේ. බටහිර රටවල "සාමාන්‍ය" ලෙසින් හඳුන්වන සමහර ලිංගික චර්යා ශ්‍රී ලංකාව වැනි පෙරදිග රටවල "අසම්මත" චර්යා විය හැකි වේ (කංකානම්ගේ, 2003; 145).

## පර්යේෂණ ගැටලුව

ස්ත්‍රී දූෂණයක්, කාන්තාවකට එරෙහි ව සිදුවන කිසියම් ආකාරයේ හිංසනයක්, බාල අපරාධයක්, ලිංගික වශයෙන් සිදුවන ඕනෑ ම ආකාරයේ සූරාකෑමක්, අපහාස කිරීමක්, වෙනස්කොට සැලකීමක් සමබන්ධ සිදුවීමක් මාධ්‍ය මගින් හෝ වෙනත් ආකාරයකින් දැනගත් වහා ම බොහෝ දෙනා පැවසීමට පුරුදු වී සිටින්නේ නිසි ආකාරයේ ලිංගික අධ්‍යාපනයක් ලැබෙන්නේ නම් මිනිසුන් මෙවැනි ආකාරයේ ක්‍රියාකාරකම් සිදු කිරීමට නොපෙළඹෙනු ඇති බවයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ දිනෙන් දින වාර්තා වන ප්‍රවෘත්ති පිළිබඳ අවධානය කරන විට ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන වැනි ලිංගිකත්වය පිළිබඳ අපරාධයන් වාර්තා වීම ඉහළ අගයක් ගෙන ඇත. බොහෝ විට කුඩා දරුවන් සහ නව යොවුන් තරුණ තරුණියන් මේ සඳහා ගොදුරු වීම හඳුනාගත හැකි ය.

වගු අංක 2.1 (ලිංගිකත්වය හා සම්බන්ධ අපරාධවලට ලක්වූ අයගේ ප්‍රමාණය


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

| අපරාධ වර්ගය | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|
| අවුරුදු 16 ට වැඩි කාන්තාවන් දූෂණය කිරීම | 385 | 294 | 250 | 179 |
| අවුරුදු 16 ට අඩු ළමුන් දූෂණය කිරීම | 1499 | 1006 | 1394 | 1339 |
| බරපතල ලිංගික අපයෝජන | 749 | 610 | 716 | 533 |
| ළමා ලිංගික සූරාකෑම | 50 | 43 | 49 | 75 |

(https://www.police.lk/index.php/crime-trends, 2019)

ශ්‍රී ලංකාවේ වාර්ෂික අපරාධ දත්තයන්ට අනුව ලිංගිකත්වය හා සම්බන්ධ අපරාධවලට ලක්වූ අයගේ ප්‍රමාණය ඉහළ අගයක් ගන්නා බව හඳුනාගත හැකි ය. මෙහි දී වැඩි වශයෙන් මෙම අපරාධවලට ලක් වී පවතිනුයේ ළමා වයසේ සිටින්නවුන් ය. තවත් දෘෂ්ටිකෝණයකින් ඉහත දත්ත දෙස බලන විට ලිංගිකත්වය හා සම්බන්ධ අපරාධ සමාජයේ සාමාන්‍ය තත්ත්වයක් බවට වාර්ෂිකව වාර්තා වී ඇති අපරාධ සංඛ්‍යාව එක් එක් වර්ෂවල වෙනස් වී ඇති ප්‍රමාණ අනුව වටහාගත හැකි ය. මේ නිසා මෙම අපරාධ පාලනය පිළිබඳ අධ්‍යයනයට ලක් කළ යුතු වේ.

සමාජ ක්‍රමය විපර්යාසයට ලක්වීම මේ සඳහා ප්‍රධානතම හේතුවක් විය හැකි ය. සරල ජීවන රටාවෙන් නාගරීකරණය වෙතට පැමිණ සංකීර්ණ ජීවන රටාවකට ද උරුමකම් කීමට පටන් ගත් දා සිට සදාචාර ධර්ම පිරිහීම සිදුවිය. එය ලාංකික සමාජ සංදර්භය කෙරෙහි බලපාන ලද්දේ විවිධ අපරාධ හා ඒවායේ ස්වභාවය වඩාත් බරපතල තත්ත්වයකට පත්වීම හේතුවෙනි. ලිංගික අවශ්‍යතාව මිනිස් කායික අවශ්‍යතාවක් වුව ද අසාමාන්‍ය ලිංගික ව්‍යාපගමනයන් හේතු කොට ගෙන බොහෝවිට කාන්තා පාර්ශවය අතවරයට සහ පීඩාවට පත් වේ. මෙවන් අපගාමී තත්ත්වයන් සඳහා ඒ ඒ පුද්ගලයාගේ කායික, මානසික, සමාජීය තත්ත්වයන් බලපාන බව ද තහවුරු කළ හැකි ය.

වර්තමානයේ පාසල්වල 7" 8" 9 ශ්‍රේණිවල සිසුන්ට ප්‍රජනන සෞඛ්‍යය වශයෙන් විෂය නිර්දේශයක් උගන්වනු ලබයි. නමුත් මල්වර වීම සහ ලිංගික රෝග පිළිබඳ වැඩිදුර අධ්‍යාපනයක් මෙම විෂය නිර්දේශය මගින් හිමිවන්නේ නැත. ලිංගික අධ්‍යාපනය යනු ලිංගික අවයව හා ප්‍රජනන පද්ධතිය පිළිබඳ හඳුන්වා දීම පමණක්ම නොවේ. එය ලිංගික චර්යාවන් සම්බන්ධයෙන් ද අදාළ වන්නකි. පාසල් සිසුන් ඉලක්ක කරගෙන සිදුවන විවිධ කල්ලිවලින් හා ප්‍රචාරණයන්ගෙන් ආරක්ෂා වීමට ඔවුන්ට හැකියාව ලැබෙන්නේ නිවැරදි දැනුම සමාජගත වීමෙන් පමණි. එමෙන් ම ළමයින්ට සිදුවන විවිධ අපචාරවලින් මිදීමට ඔවුන්ට අවශ්‍ය දැනුම හා සංවේදීභාවය මෙම දැනුම හා සම්බන්ධ වේ. බොහෝ ගුරුවරුන් තම ශිෂ්‍ය ප්‍රජාවට ලිංගික අධ්‍යාපනය ලබාදීමේ දී මැලිකමක් සහ ලැජ්ජාශීලීත්වයක් පෙන්වයි. ඇතැම් අවස්ථාවල විෂය නිර්දේශයේ එන වැදගත්ම කොටස් ඇතුළත් පාඩම් මගහැරීම ද සිදුවේ. පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය ලබාදීම දුෂ්කර වැයමක් වන්නේ පවත්නා සමාජ සංස්කෘතික වටපිටාව තුළ දේවල් කියාදීමේ දී ගුරුවරුන් විසින් තමන්ට ම සංස්කෘතික වාරණයක් පවත්වා ගැනීමයි. ලිංගිකත්වය යන වචනය පවා ප්‍රකාශ කිරීම ලැජ්ජාසහගත දෙයක් බවට පත් වී තිබේ. මේ නිසා පාසල් දරුවන්ට ලිංගික අධ්‍යාපනය හරි හැටි නොලැබී යාම සිදුවේ. එබැවින් ලිංගික අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් අවශ්‍ය වී තිබේ. මේ සඳහා ලිංගික අධ්‍යාපනය පාසල් සිසුන්ට ලබාදීමේ අවශ්‍යතාව සපුරාලීම ගැටලුවක් වී තිබේ.

ඉහත දක්වා ඇති කරුණුවලට අනුව, ශ්‍රී ලංකාව තුළ පවතින පාසල්වල උගන්වන විෂය නිර්දේශය තුළ ලිංගික අධ්‍යාපනය අයත්ව පැවතිය ද මෙසේ තරුණ තරුණියන් විවිධ සමාජ විරෝධී ලිංගික චර්යාවන්ට ගොදුරු වීමේ ගැටලුව සහ ලිංගික අධ්‍යාපනය තුළ පාසල් සිසුන් හා ගුරුවරුන් මුහුණ දී ඇති ගැටලු තත්ත්වයන් සඳහා බලපා ඇති හේතු මොනවාද යන්නත් හොයා බැලීම සිදු කරනු ලැබේ. ඒ අනුව සමාජ විරෝධී ලිංගික චර්යාවන් පාලනයට පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනය වැදගත් වේ ද? යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටලුව වේ.

## පර්යේෂණ අරමුණු

### ප්‍රධාන අරමුණ

- සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ ව අධ්‍යයනය කිරීම.

### සුවිශේෂ අරමුණු

- ලිංගික අධ්‍යාපනයේ දී පාසල් ගුරුවරයා හා පාසල් ශිෂ්‍යයා අතර ඇති සබඳතාව පිළිබඳ අධ්‍යයනය කිරීම.
- සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් ගුරුවරයාගේ හා විෂය නිර්දේශයේ ඇති දායකත්වය පිළිබඳ විමර්ශනය කිරීම.
- දැනට පවතින පාසල් සෞඛ්‍ය අධ්‍යාපන විෂය නිර්දේශය වෙනස් වියයුතු ආකාරය හඳුනා ගැනීම සහ ඒ සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.
- ගුරු භූමිකාව සමාජයට මෙන් ම ශිෂ්‍යයාගේ අධ්‍යාපනයට, පෞරුෂයට, විනයට බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම-

### පර්යේෂණයේ ප්‍රායෝගික වැදගත්කම

ශ්‍රී ලංකාවේ පාසල්වල සිදුකරනු ලබන ලිංගික අධ්‍යාපනයේ පවතින දුර්වලතාවන් හඳුනා ගැනීම සඳහා මෙම අධ්‍යයනය වැදගත් වේ. මෙහි දී ශ්‍රී ලංකාවේ දිනෙන් දින වාර්තාවන අපරාධ පිළිබඳ ප්‍රවෘත්තිවලින් සැලකියයුතු සංඛ්‍යාවක් ලිංගිකත්වය හා සම්බන්ධ අපරාධ බව පසක් වේ. බොහෝදුරට මේ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

අවස්ථාවලට ගොදුරු වන්නේ සහ යොමු වන්නේ පාසල් යන වයසේ දරුවන් සහ තරුණ තරුණියන් ය. මේ තුළින් සමාජය තුළ දෙමාපියන්ට දරුවන් ආරක්ෂා කරගැනීම පිළිබඳ සැකයක් සහ බියක් ඇති වේ. හුදෙකලාව තම දරුවන් බියෙන් සැකෙන් තොර ව පාසලට උපකාරක පන්තියට හෝ නෑදෑ නිවෙසකට යවන්නේ කෙසේ ද යන්න පිළිබඳ පවතිනුයේ විශාල ගැටලුවකි. මෙයින් කියැවෙන්නේ ලිංගිකත්වය හා සම්බන්ධ දැනුම සහ අවබෝධය අතින් ශ්‍රී ලංකාවේ ජනතාව සිටින ස්ථානය කුමක් ද යන්නයි. මෙහි දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ ලිංගික අධ්‍යාපනය කෙරෙහි ලැබී ඇති අවධානය කෙසේ ද දුර්වලතාවන් පවතින්නේ කුමන ස්ථානයන්හි ද වෙනස් විය යුත්තේ කුමන ස්ථානයන්ද වශයෙන් මෙම පර්යේෂණය මගින් පුළුල් අධ්‍යයනයක් සිදු කිරීමට නියමිත වේ. මේ නිසා ජාතික වශයෙන් ගැටලුවක් වී ඇති මාතෘකාවක් වන ශ්‍රී ලංකාවේ පාසල්වල සිදුවන ලිංගික අධ්‍යාපනයේ දුර්වලතා පිළිබඳ අධ්‍යයනය වැදගත් වේ.

ජාතික ප්‍රතිපත්ති සම්පාදනයේ දී එයට අදාළ අධ්‍යයනයන් පැවතීම ප්‍රතිපත්ති සම්පාදනයේ පහසුව සහ නිරවද්‍යතාව ඇති කරයි. මේ නිසා ශ්‍රී ලංකාවේ වර්තමානයේ කතාබහට ලක් වන මාතෘකාවක් වන ලිංගිකත්වය හා සම්බන්ධ සමාජ විරෝධී ක්‍රියාකාරකම් සඳහා ලිංගික අධ්‍යාපනයේ පවතින දුර්වලතා පිළිබඳ අධ්‍යයනය තුළින් ලැබෙන නිගමන සහ යෝජනා ඉතාමත් වැදගත් වේ. අධ්‍යාපනික වශයෙන් ප්‍රතිපත්ති සම්පාදනය සිදුකරන රජයේ වගකිව යුතු ආයතන වලට නව ප්‍රතිපත්ති කෙසේ වෙනස් විය යුත්තේ ද යන්න පිළිබඳ අධ්‍යයනයේ දී සාහිත්‍යමය මූලාශ්‍රයක් වශයෙන් ඒ පිළිබඳ සිදුකර ඇති අධ්‍යයනයක් වශයෙන් මෙම අධ්‍යයනය ප්‍රායෝගික ව වැදගත් වේ. ලිංගික අධ්‍යාපනය සම්බන්ධ විෂය නිර්දේශ සම්පාදනය කරන ආයතනවලට ද විෂය නිර්දේශ සම්පාදනයේ දී අලුතින් එකතු විය යුතු කරුණු සහ ගුරුභවතුන් ඉගැන්වීම සම්බන්ධ ව ඇති නව ඉගැන්වීමේ ක්‍රම හඳුන්වා දීමට මෙම පර්යේෂණය මගින් ලබාගත් දත්ත සහ නිගමනයන් විශාල වශයෙන් ප්‍රයෝජනවත් වේ.

පාසල්වල සිදුවන ලිංගික අධ්‍යාපනයේ දුර්වලතා සම්බන්ධයෙන් මෙරට පර්යේෂකයන් විසින් සිදුකරන ලද පර්යේෂණ ඉතාමත් දුලභ වේ. ජාත්‍යන්තර වශයෙන් ගත් විට ද මේ සම්බන්ධ පර්යේෂණයන් සිදු කර ඇති වුවත් දියුණු වෙමින් පවතින ආසියානු බහු සංස්කෘතිකමය සහ සමාජමය ලක්ෂණ පවතින රටක පවතින තත්ත්වයන් ඊට වඩා බොහෝ සෙයින් වෙනස් වේ. මේ නිසා පර්යේෂණයක් වශයෙන් මෙම අධ්‍යයනය වැදගත්කමක් උසුලයි. එමෙන් ම විෂයානුබද්ධ දැනුම උත්පාදනය කෙරෙහි ද මෙම පර්යේෂණය වැදගත් වේ. මෙහි දී පාසල්වල සිදුවන ලිංගික අධ්‍යාපනය යනු කුමක් ද, ලිංගික අධ්‍යාපනයේ ප්‍රවණතා සහ නව මානයන්, අධ්‍යාපනික ක්‍රමෝපායන්, ශ්‍රී ලංකාවේ ලිංගික අධ්‍යාපනයේ පවතින දුර්වලතාවන් සහ වෙනසක්ම්වලට ලක්විය යුතු ස්ථාන ආදිය පිළිබඳ දැනුම උත්පාදනය මෙම අධ්‍යයනය මගින් සිදුවේ.

සමාජ විද්‍යාව යනු සාකල්‍ය ප්‍රවේශයක් ඇති විෂය ක්ෂේත්‍රයකි. සමාජයේ පවතින සියලුම සංසිද්ධි පිළිබඳ සමාජ විද්‍යාවෙන් අධ්‍යයනය කරනු ලබයි. මෙහි දී සමාජ සංස්ථා, පවුල, සමාජ සම්බන්ධතා, සමාජ ස්තර, ලිංගිකත්වය, අධ්‍යාපනය, සමාජ ආයතන ආදී මාතෘකා පිළිබඳ අධ්‍යයනය සමාජ විද්‍යාව මගින් සිදු කරයි. මේ සියල්ල ඇතුළත් සමාජ මනෝ විද්‍යාව, අධ්‍යාපන සමාජ විද්‍යාව, උපදේශනය, ලිංගිකත්වය පිළිබඳ සමාජ විද්‍යාව, සංස්කෘතික සමාජ විද්‍යාව ආදී විෂය සමාජ විද්‍යාව හා සම්බන්ධ ක්ෂේත්‍රයන් ගණනාවකට ම වැදගත් වන දැනුම් සම්භාරයක් මෙම පර්යේෂණය මගින් අනාවරණය කරනු ලබයි. එමගින් විෂය කරුණු වල දියුණුවක් ඇතිකරයි. දිනෙන් දින වර්ධනය වන වෙමින් පවතින සමාජ ගැටලුවලට සාර්ථක විසඳුම් ඉදිරිපත් කරනු ලබන විෂය ක්ෂේත්‍රයක් වන සමාජ විද්‍යාවේ විෂය සංවර්ධනයට ද යම් දායකත්වයක් මෙම පර්යේෂණය මගින් ලබාදීමට නියමිත නිසා මෙම අධ්‍යයනය ප්‍රායෝගික වශයෙන් වැදගත් වේ.

## ක්‍රමවේදය

### සංකල්පමය රාමුව

මෙහි දී පරායත්ත විචල්‍ය ශ ලෙසත්, ස්වායත්ත විචල්‍ය ඔ ලෙසත්, ගන්නා අතර පරායත්ත විචල්‍ය ලෙස හැඳින්වෙන්නේ ගැටළු විචල්‍ය වන අතර ස්වායත්ත විචල්‍ය ලෙස හැඳින්වෙන්නේ ගැටළු විචල්‍ය සඳහා බලපාන සාධකයි.

රූපසටහන 1.2 : සංකල්ප රාමුව

| පරායත්ත විචල්‍ය Y | ස්වායත්ත විචල්‍ය X |
|---|---|
| සමාජ විරෝධී ලිංගික චර්යාවන් පාලනය | පාසල්වල සිදුකරන ලිංගික අධ්‍යාපනය |

(මූලාශ්‍රයඃ පර්යේෂිකාව විසින් සකසන ලදී, 2019)

ඒ අනුව ස්වායත්ත හා පරායත්ත විචල්‍ය අතර ඇති ශ්‍රිතීක සම්බන්ධතාව පහත පරිදි දැක්විය හැකි ය.

$$Y=f(X1, X2, X3……Xn)$$

ඉහත සඳහන් ආදර්ශය මත පිහිටා උපන්‍යාස පහත පරිදි ගොඩනැගිය හැකි ය.

H0 = සමාජ විරෝධී ලිංගික චර්යාවන් පාලනයට පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනය බලපානු නොලැබේ.

H1= සමාජ විරෝධී ලිංගික චර්යාවන් පාලනයට පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනය බලපානු ලැබේ.

මෙහි දී දක්වා ඇති ආකාරයට අප්‍රතිෂ්ඨයේ කල්පිතය ලෙස සමාජ විරෝධී ලිංගික චර්යාවන් පාලනයට ස්වායත්ත විචල්‍ය අතර සබඳතාවක් නැත යන්න පෙන්වාදිය හැකි අතර වෛකල්පිතය ලෙස සමාජ විරෝධී ලිංගික චර්යාවන් පාලනයට ස්වායත්ත විචල්‍ය අතර සබඳතාවක් පවතී යන්න පෙන්වාදිය හැකිවේ.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

**අධ්‍යයන ප්‍රදේශය, සංගහණය, නියැදිය හා නියදීම**

අධ්‍යයන ප්‍රදේශය

අධ්‍යයන ක්ෂේත්‍රය හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වේ. ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය තුළ ග්‍රාම නිලධාරී වසම් 27 ක් පවතී. අධ්‍යයනය සඳහා වලස්මුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති පාසල අතුරින් පාසල් 13 අතරින් පාසල් 03 ක් අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගෙන ඇත. මෙම පාසල් අතුරින් පාසල් 3ක් තෝරා ගැනීමට හේතු වූයේ පර්යේෂණ කාලසීමාව මාස 6කට සීමාවීම හේතුවෙනි.

සංගහනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාසල් 13 අතරින් පාසල් 03 ක් තෝරා ගන්නා ලදී.

හ/උතුරු කණුමුල්දෙණිය- H/Kanumuldeniya North Navodya School

හ/ඕලුආර බණ්ඩාරනායක ක.වි - H/Oluara Bandaranayaka Secondary School

හ/කන්දෙබැද්ද ක.වි - H/ Kandebadda Secondary School

යන විද්‍යාල එම පාසල් වේ. මෙම අධ්‍යයනය සඳහා දත්ත ලබාගත යුත්තේ ලිංගික අධ්‍යාපනය හිමිවන වයස් කාණ්ඩවලට අයත් සිසුන් වන අතර එහි දී ලිංගික අධ්‍යාපනය හිමිවන ශිෂ්‍ය කණ්ඩායම වන්නේ 9,10,11 ශ්‍රේණිවල ශිෂ්‍යයින් ය. පාසල් තුනේ ම මෙම වයස් කාණ්ඩවලට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 119 ක් සිටින අතර සමස්ත සංගහනය වන්නේ එම ශිෂ්‍ය කණ්ඩායමයි.

වගු අංක 6.2 : හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාසල්වල 9,10,11 ශ්‍රේණිවල ශිෂ්‍යයින් සංඛ්‍යාව සහ ගුරුවරු සංඛ්‍යාව

| පාසල | ගුරුවරු සංඛ්‍යාව | 9,10,11 ශ්‍රේණි වල ශිෂ්‍යයින් සංඛ්‍යාව | සෞඛ්‍ය ගුරුවරු සංඛ්‍යාව |
|---|---|---|---|
| හ/උතුරු කණුමුල්දෙණියම.වි | 49 | 64 | 2 |
| හ/මොදරවාන ම.වි | 49 | 55 | 1 |
| හ/දකුණු කණුමුල්දෙණියක.වි | 22 | 31 | 1 |
| හ/කන්දෙබැද්ද ක.වි | 20 | 29 | 1 |
| හ/නකුළුවල ක.වි | 19 | 14 | 1 |
| හ/රාජපුරගොඩ ක.වි | 20 | 15 | 1 |
| හ/ උඩදෙනිය ක.වි | 20 | 12 | 1 |
| හ/ඕලුආර බණ්ඩාරනායක ක.වි | 23 | 26 | 1 |
| හ/මොදරවාන ම.වි | 15 | 0 | 0 |
| හ/ලුම්බිණි ප්‍රා.වි | 16 | 0 | 0 |
| හ/වාච්ච ප්‍රා.වි | 10 | 0 | 0 |
| හ/මොරකන්දෙගොඩ ශ්‍රී ධම්මදස්සි ප්‍රා.වි | 9 | 0 | 0 |
| හ/තලහගම්වාඩුව ශ්‍රී රේවත ප්‍රා.වි | 11 | 0 | 0 |

නියැදිය හා නියදීම

සම්භාවිතාමය නියැදි ක්‍රමයට අයත් අහඹු නියැදි ක්‍රමය අනුගමනය කොට පර්යේෂණය සඳහා නියැදිය තෝරා ගෙන ඇත. ඒ අනුව නියැදිය පහත පරිදි වේ.

| | |
|---|---|
| H/Kanumuldeniya North Navodya School | ශිෂ්‍යයින් තෝරා ගත් ආකාරය |

| | |
|---|---|
| H/Oluara Bandaranayaka Secondary School | ශිෂ්‍යයින් තෝරා ගත් ආකාරය |

| | |
|---|---|
| H/ Kandebadda Secondary School | ශිෂ්‍යයින් තෝරා ගත් ආකාරය |

ඒ අනුව නියැදිය හ/උතුරු කණුමුල්දෙණියම.වි න් සිසුන් 32 ක් ද හ/ඕලුආර බණ්ඩාරනායක ක.වි න් සිසුන් 13 ක් ද හ/කන්දෙබැද්ද ක.වි න් සිසුන් 15 ක් වශයෙන් ඇතුළත් වන පරිදි සම්පූර්ණ නියැදිය 60 ක් වේ. අධ්‍යයනය සඳහා පාසල් තුනෙන් හ/උතුරු කණුමුල්දෙණියම.වි න් ගුරුවරුන් 2 ක්ද හ/ඕලුආර බණ්ඩාරනායක ක.වි න් ගුරුවරුන් 1 ක් ද හ/කන්දෙබැද්ද ක.වි න් ගුරුවරුන් 1 ක් ගුරුවරුන් 4 ක් අවශ්‍යතාව අනුව තෝරාගෙන ඇත.

දත්ත රැස් කිරීමේ ක්‍රම

ප්‍රාථමික මූලාශ්‍රය භාවිතය

ප්‍රාථමික මූලාශ්‍රය පර්යේෂිකාව විසින් තම පර්යේෂණ ක්ෂේත්‍රය ආශ්‍රිත ව තමන් විසින් තහවුරු කර ගනු ලබන දත්ත වේ. පසු ව මෙම දත්ත කේත කිරීම හා සංස්කරණය කිරීම මගින් පර්යේෂණය සඳහා භාවිතයට ගැනේ. පර්යේෂණ සඳහා යොදා ගන්නා ප්‍රාථමික මූලාශ්‍ර ලෙස

- ප්‍රශ්නාවලී ක්‍රමය
- සම්මුඛ සාකච්ඡා ක්‍රමය
- නිරීක්ෂණය

ප්‍රශ්නාවලී ක්‍රමය භාවිත කිරීමට අපේක්ෂිත අතර පාසල් සිසුන් අතට ප්‍රශ්නාවලී ලබා දීමෙන් දත්ත ලබාගෙන ඇත. සම්මුඛ සාකච්ඡා ක්‍රමය හරහා ගුරුවරුන්, පාසල් සිසුන්, දෙමව්පියන්, විශ්‍රාම ලත්


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

පාසල් ගුරුවරුන් විදුහල්පතිවරුන්, පිරිවෙන් අධ්‍යාපන ආචාර්යවරුන්, ස්වාමීන්වහන්සේලා හා පෞද්ගලික උපකාරක පංති ගුරුවරුන් ඇසුරු කර ගනිමින් සම්මුඛ සාකච්ඡා ක්‍රමය හරහා දත්ත ලබාගෙන ඇත. එමෙන් ම සිසුන් හා ගුරුවරුන්ගේ හැසිරීම් හා ඔවුන්ගේ හැඟීම් ප්‍රකාශනයන් නිරීක්ෂණයෙන් දත්ත ලබා ගන්නා ලදී.

වගු අංක 6.3 : ප්‍රාථමික දත්ත භාවිතය හා රැස් කරන ලද දත්තවල ස්වරූපය

| භාවිත කරන ක්‍රමය | මූලික කණ්ඩායම් | රැස්කළ දත්තවල ස්වභාවය |
|---|---|---|
| ප්‍රශ්නාවලි ක්‍රමය | පාසල් ළමයින් ගුරුවරුන් | - පාසල් සිසුන්ගේ හා ගුරුවරුන්ගේ පර්යේෂණ ආශ්‍රිත දැනුම, අදහස් ආකල්ප පිළිබඳ ඔවුන්ගේ තොරතුරු ලබා ගැනීම. |
| සම්මුඛ සාකච්ඡා ක්‍රමය | සමවයස් සමූහ පාසල් සිසුන් ගුරුවරුන් විදුහල්පතිව රුන් පිරිවෙන් අධ්‍යාපන ආචාර්යවරු න් ප්‍රදේශයේ සාමාන්‍ය ජනතාව | - පංති කාමරය තුළ ගුරුවරයාගේ කාර්යභාරය හා සමාජ විරෝධී හැසිරීම් සම්බන්ධයෙන් ගුරුවරුන්ගේ අදහස් හා ශිෂ්‍යයන්ගේ අදහස් පිළිබඳ විමසා බැලීම.<br>- සිසුන්ට ආවරණය කරන ලද විෂය ඒකක පිළිබඳ විමසීම.<br>- සිසුන් පාසල හා ප්‍රජාව අතර සම්බන්ධතා ගොඩනගා ගන්නා ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම.<br>- පාසල තුළ විෂය කරුණු ඉගැන්වීම පිළිබඳ සාකච්ඡා කිරීම. |
| නිරීක්ෂණය | පාසල් සිසුන් ගුරුවරුන | - සිසුන් හා ගුරුවරුන්ගේ හැසිරීම් ඔවුන්ගේ ප්‍රකාශයන් මගින් දත්ත ලබා ගැනීම. |

(මූලාශ්‍රය පර්යේෂිකාව විසින් සකස් කරන ලදී)

මෙම වගුවෙන් පැහැදිළි කරනුයේ ඉලක්කගත මූලික කණ්ඩායම් සඳහා භාවිත කරන ලද දත්තවල ස්වභාවයයි.

**ද්විතීයික මූලාශ්‍රය භාවිතය**

මෙම අධ්‍යයනය සඳහා පොත්, සඟරා, අන්තර්ජාලය, ලිපි ලේඛන, දින පොත්, පුද්ගලයන්ගේ ජීවන ඉතාහාසය පිළිබඳ වාර්තා, පර්යේෂණ වාර්තා ආදිය ද්විතියික මූලාශ වශයෙන් භාවිත කර ඇත.

## 07. දත්ත විශ්ලේෂණය

ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය

සොයා ගත් දත්ත Excel සහ SPSS යන මෘදුකාංග මගින් විශ්ලේෂණය කර එම තොරතුරු ඉදිරිපත් කර ඇත-

වගු අංක 7.4 : ඉදිරිපත් කර ඇති තොරතුරු

| ක්‍රමශිල්පය | ඉදිරිපත් කර ඇති තොරතුරු |
|---|---|
| සිතියම් | අධ්‍යයන ප්‍රදේශය දැක්වෙන සිතියම (භූගෝලීය තොරතුරු පද්ධති මෘදුකාංගය භාවිතයෙන්) |
| ප්‍රස්තාර | පාසල්වල උගන්වන ලිංගික අධ්‍යාපනය ප්‍රමාණවත් ද යන්න<br>පාසල් සිසුන් ලිංගික අධ්‍යාපනය පිළිබඳ දක්වන දැනුවත්භාවය<br>පාසල්වල සිදුවන ලිංගික අධ්‍යාපනයේ වර්ධනය<br>ගුරුවරුන් ලිංගික අධ්‍යාපනය ලබාදීමට පවතින කැමැත්තේ විෂමතාව<br>අධ්‍යයන ප්‍රදේශයේ වාර්තා වී ඇති ලිංගිකත්වය හා සම්බන්ධ අපරාධවල වර්ධන විෂමතා ආදී තොරතුරු. |
| වගු සටහන් | අධ්‍යයන ප්‍රදේශයේ ඇති පාසල්වල සෞඛ්‍ය අධ්‍යාපනය උගන්වන ගුරුවරුන් සංඛ්‍යාව<br>ශ්‍රී ලංකාවේ වාර්ෂිකව වාර්තාවන ලිංගික අපරාධ ප්‍රමාණය<br>අධ්‍යයන ප්‍රදේශයේ පාසල්වල වසර අනුව ලිංගික අධ්‍යාපනය හදාරන සිසුන් ප්‍රමාණය ආදී තොරතුරු. |
| කෛ වර්ග පරීක්ෂණය | ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතික කැමැත්ත. |

ගොඩනගාගත් කල්පිතයන් හෙවත් උපන්‍යාස පරීක්ෂා කිරීම සඳහා විශේෂයෙන් ම සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමශිල්ප යටතේ එන කෛවර්ග පරීක්ෂාව සිදුකර ඇත. ප්‍රශ්නාවලියක් භාවිතයෙන් ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතික කැමැත්ත පිළිබඳ දත්ත ලබාගෙන ඇති අතර ඒ මගින් ලබාගන්නා දත්ත මගින් කෛවර්ග පරීක්ෂණය සිදු කර ඇත. මෙහි දී විශ්ලේෂණයට අපේක්ෂා කරනු ලබන දත්ත ගුණාත්මක දත්ත වන අතර එම දත්ත ප්‍රමාණාත්මක බවට පත් කිරීම සඳහා ලිකර්ට් පරිමාණය භාවිත කිරීම සඳහා පහත පරිදි අගයන් ලබාදීම සිදු කර ඇත.

- ඉහළ
- මධ්‍යම
- පහළ

ඒ අනුව ගොඩනගා ගත් ප්‍රමාණාත්මක දත්ත පදනම් කරගෙන උපන්‍යාස පරීක්ෂා කර ඇත. මේ සඳහා යොදා ගන්නා කෛ-වර්ග පරීක්ෂණ ආකෘතිය වගු අංක 8.4 න් දැක්වේ.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගු අංක 7.5 : කෛ-වර්ග පරීක්ෂණ ආකෘතිය (පාසල් සිසුන්ගේ අදහස)

| පාසල් සිසුන්ගේ අදහස පුම්තිරි බව | ඉහළ | මධ්‍යම | පහළ | nc |
|---|---|---|---|---|
| ස්ත්‍රී | XXX | XXX | XXX | XXX |
| පුරුෂ | XXX | XXX | XXX | XXX |
| nr | XXX | XXX | XXX | XXX |

H0 ලෙස ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතික කැමැත්ත වෙනස් වේ. H1 ලෙස ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතික කැමැත්ත වෙනස් නොවේ යන්නත් වශයෙන් උපන්‍යාස ගොඩනැගිය හැකි අතර එය පහත සූත්‍රය භාවිතයෙන් ගණනය කර ඇත.

$$X^2=\Sigma(fo-fe)^2 / fe$$

ගුණාත්මක දත්ත විශ්ලේෂණය

ගුණාත්මක දත්ත යනු බොහෝ විට යම් සිද්ධීන් තත්ත්වයන් පුද්ගලයන් හෝ ඔවුන් අතර ඇති අන්තර් පුද්ගල සම්බන්ධතාවන් , ආකල්ප , විස්වාස සහ අදහස් යනාදී ලෙස සඳහන් කරන දත්ත ගුණාත්මක දත්ත වේ.

## 08. දත්ත හා තොරතුරු විශ්ලේෂණය

හැඳින්වීම

මෙම පරිච්ඡේදය මගින් සමාජ විරෝධී චර්යාවන් පාලනය සඳහා පාසල තුළ සිදු කරනු ලබන ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයින්ගෙන් සහ ගුරුවරුන්ගෙන් ලබාගත් තොරතුරු විශ්ලේෂණය කරනු ලබයි. මෙහි දී සම්භාවිතාමය නියැදි ක්‍රමයට අයත් අහඹු නියැදි ක්‍රමය අනුගමනය කොට පර්යේෂණය සඳහා නියැදිය තෝරා ගෙන ඇත. ඒ අනුව නියැදිය හ/උතුරු කණුමුල්දෙණියම. වි ත් සිසුන් 32ක් ද හ/ඕලුආර බණ්ඩාරනායක ක.වි ත් සිසුන් 13ක් ද හ/කන්දෙබැද්ද ක.වි ත් සිසුන් 15ක් වශයෙන් ඇතුළත් වන පරිදි සම්පූර්ණ නියැදිය 60ක් වේ. අවසාන වශයෙන් පර්යේෂණයේ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමවේදයක් වන කෛ වර්ග පරීක්ෂණයක් මගින් පර්යේෂණයේ ලිංගික අධ්‍යාපනය සඳහා පවතින කැමැත්ත ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනස් වන බව සහ නොවන බව උපකල්පනය කරමින් උපන්‍යාස පරීක්ෂාවක් සිදුකර ඇත. අධ්‍යයනය සඳහා පාසල් තුනෙන් හ/උතුරු කණුමුල්දෙණියම.වි ත් ගුරුවරුන් 2ක් ද හ/ඕලුආර බණ්ඩාරනායක ක.වි ත් ගුරුවරුන් 1ක් ද හ/කන්දෙබැද්ද ක.වි ත් ගුරුවරුන් 1ක් වශයෙන් ගුරුවරුන් 4ක් අවශ්‍යතාව අනුව තෝරා ගෙන ඇත. මෙහි දී ගුරුවරුන්ගෙන් සම්මුඛ සාකච්ඡා උප ලේඛනයක් භාවිතයෙන් විස්තරාත්මක ලෙස තොරතුරු ලබාගෙන ඇති අතර මෙම ගුරුවරුන්ගේ අත්දැකීම් පදනම් කරමින් සිද්ධි අධ්‍යයනයන් ද සිදු කර ඇත.

**ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය**

8.1 පාසල අනුව තොරතුරු ලබාගත් ශිෂ්‍ය ප්‍රමාණය

මෙහි දී අධ්‍යයනය සඳහා තෝරාගත් නියැදිය අනුව පාසල්වල සිටින 10 සහ 11 වසරවල ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රමාණය වෙනස් වන නිසා සෑම පාසලකට ම සාධාරණ අවස්ථාවන් හිමි වන පරිදි ශිෂ්‍ය ප්‍රතිශතය අනුව සමානුපාතික ලෙස දත්ත ලබා ගැනීම සඳහා ශිෂ්‍ය ශිෂ්‍යාවන් තෝරාගෙන ඇත. එය ප්‍රතිශතාත්මක ව ප්‍රස්තාර අංක 8.1න් දැක්වේ.

වගු අංක 8.1 ( පාසල අනුව තොරතුරු ලබා ගත් ශිෂ්‍ය ප්‍රමාණය සහ ප්‍රතිශතය

| Name of the school | Number of Students | Percentage |
|---|---|---|
| H/Kanumuldeniya North Navodya School | 13 | 21.7% |
| H/Oluara Bandaranayaka Secondary School | 15 | 25% |
| H/ Kandebadda Secondary School | 32 | 53.3% |
| Total | 60 | 100% |

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත (2020)

ප්‍රස්තාර අංක 8.1 ( පාසල අනුව තොරතුරු ලබාගත් ශිෂ්‍ය ප්‍රමාණයේ ප්‍රතිශතය

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

මෙම අධ්‍යයනයට අනුව වලස්මුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාසල් තුනක් වන හ/ ඕලු ආර බණ්ඩාරනායක කනිෂ්ඨ විද්‍යාලයේ සිසුන් 13ක් ද හ/ කන්දේබැද්ද කනිෂ්ඨ විද්‍යාලයේ සිසුන් 15 ක් ද එසේ ම හ/ උතුරු කණුමුල්දෙණිය මහා විද්‍යාලයේ සිසුන් 32ක් වශයෙන් ශිෂ්‍ය ශිෂ්‍යාවන් 60ක් තෝරාගෙන ඇත. එහි දී එය ප්‍රතිශතාත්මක ව ගත් විට හ/ ඕලු ආර බණ්ඩාරනායක කනිෂ්ඨ විද්‍යාලයේ 21.7% ක් ද හ/ කන්දේබැද්ද කනිෂ්ඨ විද්‍යාලයෙන් 25.0%ක් ද එසේ ම හ/ උතුරු කණුමුල්දෙණිය මහා විද්‍යාලයෙන් 53.3%ක් ද මෙම අධ්‍යයන සඳහා සහභාගි වී ඇත. මෙහි දී ශිෂ්‍ය ශිෂ්‍යයාවන්ගේ ප්‍රමාණය සලකා බලා නියැදියට සාධාරණයක් වන පරිදි සමානුපාතික ක්‍රමය යටතේ ඉහත ප්‍රතිශතයන් තෝරා ගෙන ඇත.

8.2 නියැදියට අයත් සිසුන් ස්ත්‍රී පුරුෂභාවය අනුව

ලිංගිකත්වය සම්බන්ධ තොරතුරු පිළිබඳ සාකච්ඡා කිරීමේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන වෙන ම ලබාගන්නා තොරතුරු වැදගත් වේ. මෙහි දී ශිෂ්‍ය ශිෂ්‍යාවන් දෙපාර්ශවය ම සමාන වන පරිද්දෙන් තොරතුරු ලබාගෙන ඇත. එය ප්‍රතිශතාත්මක ව ප්‍රස්තාර අංක 8.2 න් දැක්වේ.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රස්තාර අංක 8.2 : තොරතුරු ලබාගත් ශිෂ්‍ය ප්‍රමාණයේ ප්‍රතිශතය ස්ත්‍රී පුරුෂභාවය අනුව

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.2 : තොරතුරු ලබාගත් ශිෂ්‍ය ප්‍රමාණය සහ ප්‍රතිශතය ස්ත්‍රී පුරුෂභාවය අනුව

| ප්‍රමිතිරි ව්‍යුහය | ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ස්ත්‍රී | 32 | 53.3% |
| පුරුෂ | 28 | 46.7% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

අධ්‍යයනය සඳහා තොරතුරු ලබාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී සමස්ත නියැදියෙන් 32 ක් සිසුවියන් වන අතර ඉතිරි 28 දෙනා සිසුන් වේ. එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් 53.3% ක් සහ 46.7%ක් වේ.

8.3 අධ්‍යාපනය ලබන ශ්‍රේණිය ස්ත්‍රී පුරුෂභාවය අනුව

ප්‍රස්තාර අංක 8.3 : අධ්‍යාපනය ලබන ශ්‍රේණිය ස්ත්‍රී පුරුෂභාවය අනුව

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.3 : අධ්‍යාපනය ලබන ශ්‍රේණිය ස්ත්‍රී පුරුෂභාවය අනුව

| | ශ්‍රේණිය | | එකතුව |
|---|---|---|---|
| | **10** | **11** | |
| ස්ත්‍රී | 14 | 18 | 32 |
| පුරුෂ | 17 | 11 | 28 |
| එකතුව | 31 | 29 | 60 |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

අධ්‍යයනයට ලක් වූ පාසල්වල ශිෂ්‍යයින් පිළිබඳ විග්‍රහ කිරීමේ දී සමස්තයක් ලෙස 10 ශ්‍රේණියෙන් සිසුවියන් 14 දෙනෙක් ද සිසුන් 17 දෙනෙක් ද වශයෙන් සිසු සිසුවියන් 31 වන ලෙස තොරතුරු ලබා ගෙන ඇති අතර 11 ශ්‍රේණියෙන් සිසුවියන් 18 දෙනෙක් ද සිසුන් 11 දෙනෙක් ද ඇතුළු ව සිසු සිසුවියන් 29 දෙනෙකුගෙන් තොරතුරු ලබාගන්නා ලදී.

8.4 අධ්‍යාපනය ලබන පාසල අනුව දත්ත දායකයින්ගේ ස්ත්‍රී පුරුෂ භාවය

ප්‍රස්තාර අංක 8.4 : අධ්‍යාපනය ලබන පාසල අනුව දත්ත දායකයින්ගේ ස්ත්‍රී පුරුෂභාවය

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.4 : අධ්‍යාපනය ලබන පාසල අනුව දත්ත දායකයින්ගේ ස්ත්‍රී පුරුෂභාවය

| පාසල | ස්ත්‍රී පුරුෂ භාවය | | එකතුව |
|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | |
| H/Oluara Bandaranayaka Secondary School | 8 | 5 | 13 |
| H/ Kandebadda Secondary School | 8 | 7 | 15 |
| H/Kanumuldeniya North Navodya School | 16 | 16 | 32 |
| එකතුව | 32 | 28 | 60 |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020).

අධ්‍යනයට ලක් කළ පාසල් අතරින් හ/බණ්ඩාරනායක කනිෂ්ඨ විද්‍යාලයෙන් සිසුවියන් 8ක් හා සිසුන් 5ක් වශයෙන් ශිෂ්‍ය ශිෂ්‍යයාවන් 13 දෙනෙක් ද හ/ කන්දෙබැද්ද කනිෂ්ඨ විද්‍යාලයෙන් සිසුවියන් 8ක් සහ සිසුන් 7ක් වන සේ ශිෂ්‍ය ශිෂ්‍යයාවන් 15ක් ද උතුරු කණුමුල්දෙණියමහා විද්‍යාලයෙන් සිසුවියන් 16ක් ද සිසුන් 16ක් ද වන සේ ශිෂ්‍ය ශිෂ්‍යයාවන් 32 ක් වශයෙන් සමානුපාතික නියැදි ක්‍රමය යටතේ නියැදිය තෝරා ගෙන ඇත.

8.5 අධ්‍යාපනය ලබන ශ්‍රේණිය අනුව ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රමාණය

ප්‍රස්තාර අංක 8.5 : අධ්‍යාපනය ලබන ශ්‍රේණිය අනුව ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රමාණය

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.5 : අධ්‍යාපනය ලබන ශ්‍රේණිය අනුව ශිෂ්‍ය ශිෂ්‍යාවන් ප්‍රමාණය සහ ප්‍රතිශතය

| ශ්‍රේණිය | ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| 10 | 31 | 51.7% |
| 11 | 29 | 48.3% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

ඒ අනුව අධ්‍යයනයට ලක් කරනු ලබන මාතෘකාවට අදාළ ව නියැදිය සඳහා සිසුන් තෝරා ගැනීමේ දී 10 ශ්‍රේණිය හා 11 ශ්‍රේණි වලින් සිසුන් නියැදියට තෝරාගත් අතර 10 ශ්‍රේණියෙන් සිසුන් 31ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 51.7%කි. එමෙන් ම 11 ශ්‍රේණියෙන් සිසුන් 29 දෙනෙක් තෝරාගෙන ඇති අතර ප්‍රතිශතයක් ලෙස 48.3%ක් වේ.

8.6 ලිංගික අධ්‍යාපනය යනු කුමක් ද පිළිබඳ අවබෝධයක් පවතී ද?

සිසුන්ගෙන් ලිංගික අධ්‍යාපනය පිළිබඳ විමසීමේ දී ලිංගික අධ්‍යාපනය පිළිබඳ අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය සාධකයකි. එසේ අවබෝධයක් නොතිබුණහොත් ලබාගන්නා තොරතුරු නිරවද්‍යතාවකින් තොර විය හැකි ය. මේ නිසා පළමු ව අවධානය යොමු කළ යුතු වන්නේ මොවුන්ට ලිංගික අධ්‍යාපනය පිළිබඳ අවබෝධයක් පවතී ද යන්නයි. එය වගු අංක 8.6 න් දැක්වේ.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගු අංක 8.6 : ලිංගික අධ්‍යාපනය යනු කුමක් ද පිළිබඳ අවබෝධයක් පවතී ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.6 : ලිංගික අධ්‍යාපනය යනු කුමක් ද පිළිබඳ අවබෝධයක් පවතී ද?

| ප්‍රතිචාරය | ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඔව් | 60 | 100% |
| නැත | 0 | 0 |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

මෙහි දී ලිංගික අධ්‍යාපනය යනු කුමක්ද යන්න පිළිබඳ අවබෝධයක් සිසුන්ට පවතිනවා ද යන්න විමසා බැලීමේ දී සමස්ත සංගහනයෙන් නියැදියට තේරී පත් වූ සියලූ දෙනා කියා සිටියේ ලිංගික අධ්‍යාපනය පිළිබඳ අවබෝධයක් පවතින බවයි. මේ නිසා අධ්‍යයනය සාර්ථක ලෙස කරගෙන යාමට මෙය ඉතාමත් හොඳ තත්ත්වයක් ලෙස පෙන්වා දිය හැකි ය.

8.7 ලිංගික අධ්‍යාපනය යනුවෙන් අදහස් කරනුයේ

සිසුන්ගෙන් ලිංගිකත්ව අධ්‍යාපනය පිළිබඳ විමසීමේ දී ලිංගිකත්ව අධ්‍යාපනය යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද යන්න විමසීම වැදගත් වේ. මෙහි දී ලබාගෙන ඇත්තේ එක් එක් සිසුන් ලිංගිකත්ව අධ්‍යාපනය තුළ පවතින අංග පිළිබඳ පවතින අවබෝධය කුමන ආකාර ද යන්න පිළිබඳ දත්තයන් වේ. ඒ අනුව සිසුන් විසින් ලබා දී ඇති තොරතුරු බහු අගයන් විශ්ලේෂණ ක්‍රමය යටතේ විශ්ලේෂණය කර ප්‍රතිශතයන් දක්වා ඇත. එය ප්‍රස්තාර අංක 8.7 වශයෙන් පහතින් දක්වා තිබේ.

ප්‍රස්තාර අංක 8.7 : ලිංගික අධ්‍යාපනය යනුවෙන් අදහස් කරනුයේ

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

01. පුරුෂ හා ස්ත්‍රී ලිංගික අවයව පිළිබඳ විස්තරාත්මකව අධ්‍යයනනය කිරීම

02. ස්ත්‍රී - පුරුෂ ලිංගික සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීම

03. ලිංගික රෝග සහ ලිංගික සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනය කිරීම

04. මානව ප්‍රජනනය පිළිබඳ ව අධ්‍යයනය

05. ඉහත සියල්ලම

වගු අංක 8.7 : ලිංගික අධ්‍යාපනය යනුවෙන් අදහස් කරනුයේ

| ප්‍රතිචාරය | ප්‍රතිශතය |
|---|---|
| පුරුෂ හා ස්ත්‍රී ලිංගික අවයව පිළිබඳ විස්තරාත්මකව අධ්‍යයනනය කිරීම | 15% |
| ස්ත්‍රී - පුරුෂ ලිංගික සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීම | 3.8% |
| ලිංගික රෝග සහ ලිංගික සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනය කිරීම | 21.3% |
| මානව ප්‍රජනනය පිළිබඳ අධ්‍යයනය | 13.8% |
| ඉහත සියල්ලම | 46.3% |
| එකතුව | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

ලිංගික අධ්‍යාපනය යනු කුමක් ද පිළිබඳ පාසල් සිසුන් තුළ ඇති අවබෝධය පරීක්ෂා කිරීමේ දී සිසු සිසුවියන්ගේ ප්‍රතිචාර එකිනෙකාට අනුව වෙනස් වේ. ඉහත ප්‍රස්තාර අංක 3.7 ට අනුව ලිංගික අධ්‍යාපනය යනු ඉහත සඳහන් කරන සියලු ම කරුණු ඇතුළත් විෂයක් ලෙස හඳුනා ගන්නා ශිෂ්‍ය ප්‍රතිශතය 46.3% ලෙස පැහැදිලි වන අතර එය වාර්තා වී ඇති ඉහළම ප්‍රතිශතයයි. ඉන් පසුව ඉහළ ප්‍රතිශතයක් පෙන්වා ඇත්තේ ලිංගික රෝග සහ ලිංගික සෞඛ්‍ය පිළිබඳ අධ්‍යයනය කිරීම යනුවෙනි. ඒ අනුව 21.25%ක ප්‍රතිශතයක් මේ බව ප්‍රකාශ කොට ඇත. අවරෝහණ පිළිවෙලට අනුව ලිංගික අධ්‍යාපනය යනු පුරුෂ හා ස්ත්‍රී ලිංගික අවයව පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනය කිරීමක් ලෙස හඳුනාගත් ශිෂ්‍යය ප්‍රතිශතය 15.0%ක් වන අතර ලිංගික අධ්‍යාපනය යනු මානව ප්‍රජනනය පිළිබඳ අධ්‍යයනය කිරීමක් ලෙස හඳුනා ගන්නා ශිෂ්‍ය ප්‍රතිශතය 13.75%ක් වේ. එමෙන් ම ලිංගික අධ්‍යාපනය යනු ස්ත්‍රී පුරුෂ ලිංගික සබඳතා පිළිබඳ අධ්‍යයනය කිරීමක් ලෙස හඳුනා ගන්නා සිසුන්ගේ ප්‍රතිශතය 3.75%ක් වන අතර එය වාර්තා වී ඇති අඩුම ප්‍රතිශතයයි.

8.8 සෞඛ්‍ය අධ්‍යාපනය සහ ලිංගික අධ්‍යාපනය අතර වෙනස පිළිබඳ වැටහීමක් පවතිනවා ද?

ශ්‍රී ලංකාව තුළ පවතිනුයේ සෞඛ්‍ය අධ්‍යාපනය යන විෂය ක්ෂේත්‍රයයි. මෙහි දී අධ්‍යාපනය කරනු ලබන ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු සීමිත වේ. නමුත් ලිංගිකත්ව අධ්‍යාපනය තුළ සවිස්තරාත්මක ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු විෂය නිර්දේශයානුකූලව ඉගෙනගනු ලබයි. මේ නිසා මෙම දෙක අතර පැහැදිලි වෙනසක් පවතී. මෙම වෙනස පිළිබඳ සිසුන් අවබෝධයක් පවතී ද යන්න ප්‍රස්තාර අංක 8.8 මගින් පෙන්වා දී ඇත.

ප්‍රස්තාර අංක 8.8 : සෞඛ්‍ය අධ්‍යාපනය සහ ලිංගික අධ්‍යාපනය අතර වෙනස පිළිබඳ වැටහීමක් පවතිනවාද

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.8 : සෞඛ්‍ය අධ්‍යාපනය සහ ලිංගික අධ්‍යාපනය අතර වෙනස් පිළිබඳ වැටහීමක් පවතිනවා ද?

| ප්‍රතිචාරය | ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඔව් | 25 | 41.7% |
| නැත | 35 | 58.3% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මෙම අධ්‍යයනයට අනුව අධ්‍යයනයට ලක් වූ පාසල් සිසුන්ගෙන් සෞඛ්‍යය අධ්‍යාපනය හා ලිංගික අධ්‍යාපනය අතර වෙනස පිළිබඳ වැටහීමක් පවතින ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව 25ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 41.7%ක් වේ. සෞඛ්‍ය අධ්‍යාපනය සහ ලිංගික අධ්‍යාපනය අතර වෙනස පිළිබඳ වැටහීමක් නොමැති සිසුන් සංඛ්‍යාව 35ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 58.3 %ක් වේ.

8.9 සෞඛ්‍ය අධ්‍යාපනය සහ ලිංගික අධ්‍යාපනය අතර වෙනස

මෙහි දී විශ්ලේෂණය කර ඇත්තේ විස්තරාත්මක දත්ත වේ. එහි දී ප්‍රස්තාර අංක 3.8 ට අනුව අධ්‍යයනයට ලක් වූ පාසල් සිසුන්ගෙන් සෞඛ්‍යය අධ්‍යාපනය හා ලිංගික අධ්‍යාපනය අතර වෙනස පිළිබඳ වැටහීමක් පවතින ශිෂ්‍ය ශිෂ්‍යාවන් සංඛ්‍යාව 25ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 41.7%කි. එම සිසුන් පෙන්වා දී ඇත්තේ සෞඛ්‍ය අධ්‍යාපනය තුළ ශාරීරික සෞඛ්‍ය පවත්වාගෙන යාම, ව්‍යායාම, නිවැරදි සෞඛ්‍ය පුරුදු, විවිධ ක්‍රීඩා, ආහාර රටා ආදිය පිළිබඳ සෞඛ්‍ය අධ්‍යාපනය තුළ ඉගෙන ගන්නා බවයි.

එමෙන් ම ඔවුන්ට අනුව ලිංගික අධ්‍යාපනය තුළ එවැන්නක් අධ්‍යයනය නොකරයි. මෙහි දී ඔවුන් පෙන්වා දී ඇත්තේ ලිංගිකත්වය සම්බන්ධ කාරණා එනම් වැඩිවිය පැමිණීම, පුරුෂ සහ ස්ත්‍රී ලිංගික පද්ධතිය, උපත් පාලන ක්‍රම (පවුල් සැලසුම් ක්‍රම), ලිංගික සෞඛ්‍ය (ලිංගික රෝග ආදිය), සෞඛ්‍යමත් ලිංගික සබඳතා, ලිංගික උපදේශනය ආදී කරුණු පිළිබඳ සවිස්තරාත්මක ව අධ්‍යයනය කිරීම ලිංගිකත්ව අධ්‍යාපනය තුළින් සිදු කරනු ලබන බවයි.

8.10 පාසල හැරුණු විට ලිංගිකත්වය පිළිබඳ දැන ගැනීමට හැකි වන වෙනත් අංශ මොනවා ද?

ලිංගික අධ්‍යාපනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ලිංගික අධ්‍යාපනය විධිමත් සහ අවිධිමත් යන ආකාර දෙකෙන් ම හිමි වේ. පාසල තුළින් ලැබෙනුයේ විධිමත් ආකාරයේ ලිංගික අධ්‍යාපනයකි. අධ්‍යාපනයේ දී වඩාත් වටිනුයේ විධිමත් අධ්‍යාපනය වුව ද අවිධිමත් අධ්‍යාපනය තුළින් ද සැලකිය යුතු කාර්යය භාරයක් ඉටු වේ. ඒ අනුව පහත අංක 5.9 ප්‍රස්තාරයෙන් දක්වා තිබෙනුයේ සිසුන් පවසන ආකාරටය අවිධිමත් ආකාරයට පාසල් සිසුන් ලිංගික අධ්‍යාපනය ලබා ගන්නා මාධ්‍යයන්ගේ දායකත්වයයි.

ප්‍රස්තාර අංක 8.9 : පාසල හැරුණු විට ලිංගිකත්වය පිළිබඳ දැන ගැනීමට හැකි වන වෙනත් අංශ

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.9 : පාසල හැරුණු විට ලිංගිකත්වය පිළිබඳ දැන ගැනීමට හැකි වන වෙනත් අංශ

| ප්‍රතිචාරය | ප්‍රතිශතය |
|---|---|
| පවුල | 15% |
| ජනමාධ්‍ය | 3.8% |
| වැඩිහිටියන් | 21.3% |
| අන්තර්ජාලය | 13.8% |
| සමවයස් කණ්ඩායම් | 46.3% |
| වෙනත් | |
| එකතුව | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

මෙම අධ්‍යයනයට අනුව පාසල හැරුනු විට ලිංගිකත්වය පිළිබඳ දැන ගැනීමට හැකිවන වෙනත් අංශ මොනවා දැයි යන්න සිසුන්ගේ ප්‍රතිචාර විමසීමේ දී පැහැදිලි වූයේ පාසල හැරුණු විට පවුල තුළින් 15.2% ප්‍රතිශතයක් ලිංගිකත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා බවත් ජනමාධ්‍ය තුළින් 7.6% ප්‍රතිශතයක් ලිංගිකත්වය පිළිබඳ අවබෝධයක් ගන්නා බවත් මෙහි දී පැහැදිලි විය. එසේම වැඩිහිටියන් තුළින් 4.5% ප්‍රතිශතයක් ලිංගිකත්වය පිළිබඳ අවබෝධයක් ගන්නා අතර අන්තර්ජාලය තුළින් 3.41%ක ප්‍රතිශතයක් ලිංගිකත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගනී. එපමණක් නොව සමවයස් කණ්ඩායම් තුළින් 29.5%ක් ලිංගිකත්වය පිළිබඳ අවබෝධයක් ගන්නා අතර වෙනත් ක්‍රම තුළින් 9.1 % ප්‍රතිශතයක් ලිංගිකත්වය පිළිබඳ අවබෝධයක් ලබා ගනියි. මෙහි දී වැඩි ම ප්‍රතිශතයක් ලිංගිකත්වය හා සම්බන්ධ දැනුම ලබාගනුයේ අන්තර්ජාලය මගිනි. එමෙන් ම පිළිවෙළින් සමවයස් කණ්ඩායම්, පවුල, වෙනත්, ජනමාධ්‍ය මේ සඳහා දායකත්වයක් ලබා දී ඇති අතර අඩුම දායකත්වයක් දක්වා තිබෙනුයේ වැඩිහිටියන් මගිනි.

8.11 ලිංගිකත්වය සම්බන්ධ ඇතැම් විෂය කරුණු ඉගෙනීමේ දී පන්ති කාමරය තුළ දී ඇතිවන අපහසුතා

ශ්‍රී ලංකාව පෙරදිග රටකි. විවිධ සංස්කෘතික, ආගමික සහ සදාචාරාත්මක විවිධත්වයක් පවතී. මේ නිසා එම කරුණුවල බලපෑම මත ලිංගිකත්වය යන්න ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ සඟවා තබන මාතෘකාවකි. කිසි විටෙකත් ප්‍රසිද්ධියේ කතාබහකට ලක් වීමක් සිදු නොවේ. මේ වටපිටාව තුළ පාසල තුළ ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳ ඉගෙනීමේ දී විවිධ අපහසුතාවයන්ට ලක් විය හැකි ය. එසේ ඇති විය හැකි අපහසුතාවයන් සම්බන්ධයෙන් දත්ත දායකයින් පෙන්වා දී ඇති කරුණු ප්‍රස්තාර අංක 8.10 න් පහත දක්වා ඇත.

ප්‍රස්තාර අංක 8.10 : ලිංගිකත්වය සම්බන්ධ ඇතැම් විෂය කරුණු ඉගෙනීමේ දී පන්තිකාමරය තුළ දී ඇතිවන අපහසුතා

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

01. තම යහළු යෙහෙළියන්ට මුහුණ දීමේ අපහසුතා

02. ගුරුවරයාට මුහුණ දීමේ අපහසුතා

03. ඇතැම් විෂය කරුණු පිළිබඳ නොත්රෙයි

04. බාහිරින් ලැබුණු දැනුම සහ විෂය නිර්දේශයෙන් ඉගෙනගත් දැනුම අතර විවිධ පරස්පරතාවයන් පැවතීම


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

වගු අංක 8.10 : ලිංගිකත්වය සම්බන්ධ ඇතැම් විෂය කරුණු ඉගෙනීමේ දී පන්තිකාමරය තුළ දී ඇතිවන අපහසුතා

| ප්‍රතිචාරය | ප්‍රතිශතය |
|---|---|
| තම යහළු යෙහෙළියන්ට මුහුණ දීමේ අපහසුතා | 42.1% |
| ගුරුවරයාට මුහුණ දීමේ අපහසුතා | 33.6% |
| ඇතැම් විෂය කරුණු පිළිබඳ නොත්රෙයි | 15.9% |
| බාහිරින් ලැබුණු දැනුම සහ විෂය නිර්දේශයෙන් ඉගෙනගත් දැනුම අතර විවිධ පරස්පරතාවයන් පැවතීම | 8.4% |
| එකතුව | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

මෙම අධ්‍යයනයට අනුව ලිංගිකත්වය සම්බන්ධ ඇතැම් විෂය කරුණු ඉගනීමේ දී යම් අපහසුතාවයකට ලක් වන්නේ ද යන්න පිළිබඳ සිසුන්ගෙන් ප්‍රතිචාර විමසීමේ දී ලිංගිකත්ව සම්බන්ධ කරුණු කාරණා ඉගනීමේ දී සිසුන්ගෙන් 42.06% කට යහළු යෙහෙළියන්ට මුහුණදීමේ අපහසුතාවයට ලක්වන බව ප්‍රකාශ කර සිටි අතර ගුරුවරයාට මුහුණ දීමේ අපහසුතා ඇති සිසුන්ගේ ප්‍රතිශතය 33.64%ක් වේ. එසේ ම ඇතැම් විෂය කරුණු නොතේරෙන ශිෂ්‍ය ප්‍රතිශතය ලෙස 15.9%ක් සිටි අතර බාහිරින් ලැබෙන දැනුම සහ විෂය නිර්දේශයන්ගෙන් ඉගෙනගත් දැනුම අතර විවිධ පරස්පරතා පවතින බව සිතන ශිෂ්‍ය ප්‍රතිශතය 8.4%ක් ක් සිටී. මෙහි දී සිසුන් බහුතරයක් ම මුහුණ දී ඇති අපහසුතාව වනුයේ යහළු යෙහෙළියන්ට මුහුණදීමේ අපහසුතාවයි.

8.12 ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ලැජ්ජාශීලීත්වයක් පෙන්නුම් කරන්නේ ද?

මෙයට හේතු වන්නේ ද පෙර සාකච්ඡා කළ ආකාරයෙන් ම ශ්‍රී ලංකාව තුළ පවතින සංස්කෘතික, ආගමික සහ සදාචාරාත්මක විවිධත්වය තුළ ඇති වී ඇති තත්ත්වයයි. මෙහි දී මෙම තත්ත්වය පසුගාමී පෞරුෂ ලක්ෂණයක් වශයෙන් ද හැඳින්විය හැකි ය. ගුරුවරයා තුළ ඉහළ පෞරුෂ ලක්ෂණ පවතී නම් මේ ආකාරයෙන් ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳ ඉගැන්වීමේ දී ලැජ්ජාශීලීත්වයක් පෙන්නුම් නොකරයි. මේ තුළින් සිසුන්ට අහිමි වනුයේ නිවැරදි ලිංගික අධ්‍යාපනයයි. ඒ අනුව මෙම අධ්‍යයනය තුළ දත්ත දායකයින් වන පාසල් සිසුන් තම සෞඛ්‍ය අධ්‍යාපන විෂය තුළ ඇති ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳ ගුරුවරයා ඉගැන්වීම තුළ පවතින ලැජ්ජාශීලීත්වය පිළිබඳ ප්‍රස්තාර අංක 8.11 මගින් දැක්වේ.

ප්‍රස්තාර අංක 8.11 : ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ලැජ්ජාශීලීත්වයක් පෙන්නුම් කරන්නේ ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.11 : ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ලැජ්ජාශීලීත්වයක් පෙන්නුම් කරන්නේද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| නැත | 28 | 46.7% |
| ඔව් | 23 | 38.3% |
| ඇතැම් විට | 9 | 15% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

ඒ අනුව අධ්‍යයනයට ලක්වූ පාසල් තුළ ගුරුවරුන් විසින් ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේදී ලැජ්ජාශීලී පෙන්නුම් කරන බව ශිෂ්‍යයින් 23 දෙනෙකු ප්‍රකාශ කරන ලද අතර එය ප්‍රතිශතයක් ලෙස 38.3%කි. ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ලැජ්ජාශීලිත්වයක් නොපෙන්වන බව සිසුන් 28 දෙනෙක් ප්‍රකාශ කරන ලද අතර එය ප්‍රතිශතයක් ලෙස 46.7% කි. ඇතැම් විට ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ලැජ්ජාශීලීත්වයක් පෙන්නුම් කරයි යනුවෙන් සිසුන් 9 දෙනෙක් ප්‍රකාශ කරන ලද අතර එය ප්‍රතිශතයක් ලෙස 15.0% කි.

8.13 ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ඇතැම් පාඩම් මග හරින්නේ ද?

ලිංගික අධ්‍යාපනය තුළ ගුරු භූමිකාව ඉතාමත් වැදගත් තීරණාත්මක සාධකයකි. ගුරුවරයාගේ පෞරුෂත්වය තුළ සිසුන්ට ලැබෙන ලිංගික අධ්‍යාපන දැනුම වෙනස් වේ. ලැජ්ජාශීලීත්වය තුළ ගුරුවරයෙකු ලිංගිකත්වය හා සම්බන්ධ පාඩම් මගහැරීම සිදු කළ හැකි ය. මෙහි දී අධ්‍යයනය සඳහා සහභාගී කර ගත් සිසුන් ගුරුවරයා ලිංගිකත්වය හා සම්බන්ධ පාඩම් මග හැරීම සම්බන්ධව දක්වා ඇති ප්‍රතිචාර ප්‍රස්තාර අංක 8.12 න් පෙන්වා දී තිබේ.

ප්‍රස්තාර අංක 8.12 : ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ඇතැම් පාඩම් මගහරින්නේ ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.12 : ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ඇතැම් පාඩම් මගහරින්නේ ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| නැත | 41 | 68.3% |
| ඔව් | 19 | 31.7% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

ගුරුවරුන් ලිංගිකත්වය සම්බන්ධ පාඩම් ඉගැන්වීමේ දී ඇතැම්විට ලැජ්ජාශීලීත්වයක් පෙන්නුම් කිරීම සාමාන්‍ය කරුණකි. බොහෝ විට මෙවැනි අවස්ථාවන් වලදී ලිංගිකත්වය සම්බන්ධ පාඩම් මගහැර යාම දැකගත හැකි ය. අධ්‍යයනයට අනුව ගුරුවරුන් ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ලිංගිකත්වයේ සම්බන්ධ පාඩම් මග හැරීම පිළිබඳ සිසුන්ගේ මතය විමසීමේ දී ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඉගැන්වීමේ දී ඇතැම් පාඩම්


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මගහරින බව ශිෂ්‍යයන් 19ක් දක්වා ඇති අතර එය ප්‍රතිශතයක් ලෙස 31.7% ක් ලෙස පෙන්වා දිය හැකි ය. එසේ ම ගුරුවරයා ලිංගිකත්වය සම්බන්ධ පාඩම් මග හැරීමකින් තොර ව සිදුකරන බවට ශිෂ්‍යයින් 41 පෙන්වා දී ඇත. එය ප්‍රතිශතයක් ලෙස 68.3% ක් වේ.

8.14 සෞඛ්‍ය ගුරුවරයා සමග ලිංගිකත්වය සම්බන්ධ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට හැකියාවක් පවතී ද?

මීට පෙර පෙන්වා දුන් පරිදි ගුරුවරයා ලිංගිකත්වය හා බැඳුණු කරුණු පිළිබඳ ඉගැන්වීමේ දී වැදගත් සාධකයකි. මෙම විෂය තුළ ගුරුවරයා සහ ශිෂ්‍යයා අතර මනා සම්බන්ධතාවක් පැවතීම ඉතාමත් වැදගත් වේ. සෞඛ්‍ය අධ්‍යාපනය තුළ පමණක් නොව අනෙකුත් විෂයන් ඉගෙනීමේ දී ද මෙය ඉතාමත් වැදගත් වේ. ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු ඉගෙනීමේ දී ගුරුවරයාගෙන් නොතේරෙන යමක් වෙතොත් එය අසා දැන ගැනීමට හැකියාවක් පැවතිය යුතුය. මේ පිළිබඳ අධ්‍යයනයට සහභාගී කරගත් සිසුන්ගෙන් ලැබුණ දත්තයන් වගු අංක 8.13න් දැක්වේ.

ප්‍රස්තාර අංක 8.13 : සෞඛ්‍ය ගුරුවරයා සමග ලිංගිකත්වය සම්බන්ධ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට හැකියාවක් පවතී ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.13 : සෞඛ්‍ය ගුරුවරයා සමග ලිංගිකත්වය සම්බන්ධ කරුණු පිළිබඳ සාකච්ඡා කිරීමට හැකියාවක් පවතී ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| නැත | 18 | 30% |
| ඔව් | 42 | 70% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

බොහෝ අවස්ථාවල දී ළමුන්ගේ ලැජ්ජාශීලීත්වය හේතුකොට ගෙන ලිංගිකත්වය සම්බන්ධ කරුණු කාරණා ගුරුවරුන් සමඟ සාකච්ඡා කිරීමට ශිෂ්‍යයින් උනන්දු නොවීම සාමාන්‍ය කරුණකි. කෙසේ වෙතත් මෙම අධ්‍යයනය තුළ දී සෞඛ්‍යය ගුරුවරයා සමග ලිංගිකත්වය සම්බන්ධ කාරණා සාකච්ඡා කිරීමට හැකියාවක් පවතින්නේ ද නැද්ද යන්න පරීක්ෂා කිරීමේදී ශිෂ්‍යයින් 18 ප්‍රකාශ කර ඇත්තේ ගුරුවරුන් සමග ලිංගිකත්වය සම්බන්ධ කාරණා සාකච්ඡා කළ හැකි බවයි. එය ප්‍රතිශතයක් වශයෙන් 30.0%කි. එසේ ම සෞඛ්‍ය ගුරුවරයා සමඟ ලිංගිකත්වය සම්බන්ධ කාරණා සාකච්ඡා කළ හැකි බව ශිෂ්‍යයින් 42ක් පෙන්වා දී ඇත. එම සංඛ්‍යාව ප්‍රතිශතයක් වශයෙන් 71.0 %දැක්විය හැකි ය. මේ අනුව පෙනී යන්නේ ගුරුවරයා සමග ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳ සාකච්ඡා කළ හැකි බවයි.

8.15 විරුද්ධ ලිංගිකයන් (ගැහැණුන් / පිරිමින් ) ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ව ඉගෙනීම මගින් අපහසුතාවට පත් වන්නේ ද?

ප්‍රස්තාර අංක 8.14 : විරුද්ධ ලිංගිකයන් (ගැහැණුන් / පිරිමින්) ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳව ඉගෙනීම තුළින් අපහසුතාවයට පත් වන්නේ ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.14 : විරුද්ධ ලිංගිකයන් (ගැහැණුන් / පිරිමින්) ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ව ඉගෙනීමෙන් අපහසුතාවට පත් වන්නේ ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | | එකතුව |
|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | |
| නැත | 9 | 21 | 30 |
| ඔව් | 23 | 7 | 30 |
| එකතුව | 32 | 28 | 60 |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

පන්ති කාමරය තුළ ලිංගිකත්වය සම්බන්ධ කාරණා ඉගෙන ගැනීමේ දී ශිෂ්‍යයන් මුහුණ දෙන අපහසුතා අධ්‍යයනය කිරීම මෙහි දී වැදගත් වේ. ඒ අනුව විරුද්ධ ලිංගිකයින් (ගැහැණු/ පිරිමි) ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ඉගෙනීම තුළින් අපහසුතාවයකට පත්වන ප්‍රමාණය සොයා බැලීමේදී ශිෂ්‍යාවන් 9ක් පෙන්වා දී ඇත්තේ කිසිදු අපහසුතාවයකින් තොර ව ලිංගිකත්වය සම්බන්ධ කාරණා ඉගෙන ගත හැකි බවයි. එසේ ම ශිෂ්‍යාවන් 23ක් පෙන්වා දී ඇත්තේ විරුද්ධ ලිංගිකයන් ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ඉගෙනීම හේතු කොටගෙන අපහසුතාවකට ලක්වන බවයි. එසේ ම ශිෂ්‍යයන් 21ක් පෙන්වා දී ඇත්තේ විරුද්ධ ලිංගිකයන් ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ඉගනීමෙන් අපහසුතාවකට ලක් නොවන බවයි. නමුත් ශිෂ්‍යයින් 7ක් පෙන්වා දී ඇත්තේ විරුද්ධ ලිංගිකයන් ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ඉගෙනීම තුළින් අපහසුතාවකට ලක්වන බවයි.

8.16 විරුද්ධ ලිංගිකයන් ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ව ඉගෙනීමේ දී විරුද්ධ ලිංගිකයන්ගෙන් විවිධ උසුළු විසුළුවලට ලක් වන්නේ ද?

මෙම ලක්ෂණය මිශ්‍ර පාසල්වල බොහෝ දුරට දක්නට ලැබෙන ලක්ෂණයක් වන අතර එක් පාර්ශවයක් අනිවාර්යය අපහසුතාවයට ලක් වීම මෙහි ලක්ෂණයයි. මෙය ලිංගික අධ්‍යාපනය කෙරෙහි බලපාන ප්‍රධානම කාරණයක් වන අතර නිවැරදි ලිංගිකත්ව අධ්‍යාපනයක් හිමි නොවීම කෙරෙහි ඍජු ව බලපෑ හැකි ය. ඒ අනුව උසුළු විසුළුවලට ලක් වන්නේ ද? නැති ද යන්න පිළිබඳ ප්‍රස්තාර අංක 8.15න් නිරූපණය වේ.

ප්‍රස්තාර අංක 8.15 : විරුද්ධ ලිංගිකයන් (ගැහැනුන් / පිරිමින්) ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ව ඉගෙනීම එහිදී විරුද්ධ ලිංගිකයන්ගෙන් විවිධ උසුළු විසුළුවලට ලක් වන්නේ ද?

මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.15 : විරුද්ධ ලිංගිකයන් (ගැහැණුන් / පිරිමින්) ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳව ඉගෙනීම එහි දී විරුද්ධ ලිංගිකයන්ගෙන් විවිධ උසුළු විසුළුවලට ලක් වන්නේ ද?


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | | එකතුව |
|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | |
| නැත | 9 | 21 | 30 |
| ඔව් | 23 | 7 | 30 |
| ඇතැම් විට | 14 | 1 | 15 |
| එකතුව | 32 | 28 | 60 |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

මෙම දත්තවලට අනුව විරුද්ධ ලිංගිකයන්ගෙන් විවිධ උසුළු විසුළුවලට ලක්වන්නේද යන්න සොයා බැලීමේ දී ශිෂ්‍යාවන් 12ක් කිසිදු උසුළු විසුළුවලට ලක් නොවන බවත් ශිෂ්‍යාවන් 6ක් විසුළුවලට ලක්වන බවත් ශිෂ්‍යාවන් 14ක් ඇතැම් විට උසුළු විසුළු වලට ලක් වන බවත් මෙහි දී පෙන්වා දී ඇත. එසේ ම ශිෂ්‍යයින් 25ක් විරුද්ධ ලිංගිකයන්ගේ උසුළු විසුළුවලට ලක් නොවන බවත්, ශිෂ්‍යයින් 2ක් විරුද්ධ ලිංගිකයන්ගේ උසුළු විසුළුවට ලක් වන බවත්, 1 ක් අයෙක් ඇතැම් විට විරුද්ධ ලිංගිකයින්ගේ උසුළු විසුළු වලට ලක් වන බවත් පෙන්වා දී ඇත.

8.17 සෞඛ්‍ය අධ්‍යාපනයෙන් ප්‍රමාණවත් දැනුමක් ලැබේ ද?

ශ්‍රී ලංකාව තුළ ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඍජුව සාකච්ඡා කරන ලිංගික අධ්‍යාපන ක්‍රමවේදයක් නොපවතී. ශ්‍රී ලංකාව තුළ පවතිනුයේ සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රමවේදයක් වන අතර ලිංගිකත්වය හා සම්බන්ධ ව එම විෂය නිර්දේශය තුළින් ප්‍රමාණවත් අධ්‍යාපනයක් හිමි වන්නේ ද යන්න පිළිබඳ සොයා බැලීම කාලීන අවශ්‍යතාවකි. මේ අනුව මෙම අධ්‍යයනයේ දත්ත දායකයින් වන සිසුන් මේ පිළිබඳ ඉදිරිපත් කර ඇති දත්තයන් ප්‍රස්තාර අංක 8.16 න් දැක්වේ.

ප්‍රස්තාර අංක 8.16 : සෞඛ්‍ය අධ්‍යාපනය මගින් ලැබෙන ලිංගික අධ්‍යාපනය තුළ ප්‍රමාණවත් දැනුමක් ලැබේ ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.16 : සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ලැබෙන ලිංගික අධ්‍යාපනය තුළ ප්‍රමාණවත් දැනුමක් ලැබේ ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| නොදනී | 18 | 30% |
| නැත | 29 | 48.3% |
| ඔව් | 13 | 21.7% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

සිසුන්ට ලිංගිකත්වය සම්බන්ධ දැනුමක් යම්තාක් හෝ ලබා දෙනු ලබන්නේ සෞඛ්‍ය අධ්‍යාපනය තුළිනි. ඒ අනුව සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ලැබෙන සෞඛ්‍ය අධ්‍යාපනය තුළ ප්‍රමාණවත් දැනුමක් ලැබෙන්නේදැයි සොයා බැලීමේ දී සිසුන් 18ක් පෙන්වා දෙන්නේ සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ප්‍රමාණවත් දැනුමක් ලැබෙන්නේදැයි පිළිබඳ අවබෝධයක් නොමැති බවයි. එය සමස්ත නියැදියෙන් 30.0%ක් වෙයි. එසේ ම ශිෂ්‍යයින් 29ක් සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ලැබෙන දැනුම ප්‍රමාණවත් නොවන බව පෙන්වා දෙන අතර එය සමස්ත නියැදියෙන් 48.3% වේ. එසේ ම ශිෂ්‍යයන් 13ක් පෙන්වා දෙන්නේ සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ප්‍රමාණවත් දැනුමක් ලබාදෙන බවයි. එය සමස්ත නියැදියෙන් 21.7%ක් වේ.

8.18 සෞඛ්‍ය අධ්‍යාපනය තුළ තව දුරටත් ඉගැන්විය යුතු යැයි හැඟෙන කොටස් තිබේද?

සෞඛ්‍ය අධ්‍යාපනය විෂය නිර්දේශය පිළිබඳ සිසුන්ට පවතින අවබෝධය පිළිබඳ මෙහි දී අවධානය යොමු කරනු ලබයි. ඒ අනුව සිසුන් විසින් ලබා දී ඇති තොරතුරු බහු අගයන් විශ්ලේෂණ ක්‍රමය එමකළුසවකැ ඒකමැ 'ඩ්කහ'ෑ යටතේ විශ්ලේෂණය කර ප්‍රතිශතයන් දක්වා ඇත. ඒ අනුව ප්‍රස්තාර අංක 8.17 මගින් සිසුන් මේ පිළිබඳ දක්වා ඇති ප්‍රතිචාරයන් ප්‍රතිශතාත්මකව ඉදිරිපත් කර ඇත.

ප්‍රස්තාර අංක 8.17 : සෞඛ්‍ය අධ්‍යාපනය තුළ තව දුරටත් ඉගැන්විය යුතු යැයි හැඟෙන කොටස් තිබේද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

01. ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග

02. පුද්ගලික කටයුතු පහසු කරගැනීමේ ක්‍රම (වැඩි විය පත් වීමෙන් පසු)

03. ඔසප් චක්‍රය හා සම්බන්ධ තොරතුරු

04. ලිංගික හැඟීම් පාලනය කිරීම

05. ලිංගික අපයෝජනවලින් ගැලවීමේ ක්‍රම

06. නවයොවුන් සබඳතා පවත්වා ගැනීම

07. ලිංගික චර්යා සම්බන්ධ නීති

08. ලිංගික උපදේශනය

වගු අංක 8.17 : සෞඛ්‍ය අධ්‍යාපනය තුළ තව දුරටත් ඉගැන්විය යුතු යැයි හැඟෙන කොටස් තිබේද?

| ප්‍රතිචාරය | ප්‍රතිශතය |
|---|---|
| ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග | 10% |
| පුද්ගලික කටයුතු පහසු කර ගැනීමේ ක්‍රම (වැඩි විය පත් වීමෙන් පසු) | 7.5% |
| ඔසප් චක්‍රය හා සම්බන්ධ තොරතුරු | 14.9% |
| ලිංගික හැඟීම් පාලනය කිරීම | 9.1% |
| ලිංගික අපයෝජන වලින් ගැලවීමේ ක්‍රම | 14.9% |
| නවයොවුන් සබඳතා පවත්වාගැනීම | 9.5% |


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

| | |
|---|---|
| ලිංගික චර්යා සම්බන්ධ නීති | 17.8% |
| ලිංගික උපදේශනය | 16.2% |
| එකතුව | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

සෞඛ්‍ය අධ්‍යාපනය තුළ තව දුරටත් ඉගැන්විය යුතු යැයි හැඟෙන කොටස් තිබේ ද යන්න පිළිබඳ සිසුන්ගේ ප්‍රතිචාරය පිළිබඳ විමසීමේ දී ලිංගික සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ තව දුරටත් ඉගැන්විය යුතු යැයි හැඟෙන සිසුන් සමස්ත සංගහනයෙන් 10.0 ?ක ප්‍රතිශතයක් ගන්නා අතර පුද්ගලික කටයුතු පහසු කර ගැනීමේ ක්‍රම (එනම් වැඩිහිටි වියට පත්වීමෙන් පසු) යනාදිය තව දුරටත් ඉගැන්විය යුතු යැයි හැඟෙන සිසුන් ප්‍රමාණය 7.5%ක් වේ. එසේ ම ඔසප් චක්‍රය සම්බන්ධ තොරතුරු සෞඛ්‍ය අධ්‍යාපනයට ඇතුළත් කළ යුතු යැයි හැඟෙන සිසුන් ප්‍රතිශතයක් ලෙස 14.9%ක් වේ. ලිංගික අපයෝජනවලින් ගැලවීමේ ක්‍රම පිළිබඳ සෞඛ්‍ය අධ්‍යාපනය විෂය තුළ තව දුරටත් ඇතුළත් විය යුතු බව පෙන්වා දෙන සිසුන් සමස්ත නියැදියෙන් 14.9%ක ප්‍රතිශතයක් වේ. නව යොවුන් සබඳතා පවත්වා ගැනීම පිළිබඳ සෞඛ්‍ය අධ්‍යාපනයට ඇතුළත් විය යුතු බව සමස්ත නියැදියෙන් 9.5%ක ප්‍රතිශතයක්ද ලිංගික චර්යා සම්බන්ධ නීති පිළිබඳ දැනුම සෞඛ්‍ය අධ්‍යාපනයට ඇතුළත් විය යුතු බව හඟවන පිරිස 17.8%ක් වේ. ලිංගික උපදේශනය සෞඛ්‍ය අධ්‍යාපනයට ඇතුළත් විය යුතු බව 16.2%ක පිරිසක් මෙහි දී පෙන්වා දෙයි.

8.19 ගුරුවරයා නිසි කාල පරිච්ඡේදයේ දී විෂය නිර්දේශය පිළිවෙළකට උගන්වන්නේ ද?

ප්‍රස්තාර අංක 8.18 : ගුරුවරයා නිසි කාල පරිච්ඡේදය ඇතුළත දී විෂය නිර්දේශය පිළිවෙළකට උගන්වන්නේ ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක : 5.18 ගුරුවරයා නිසි කාල පරිච්ඡේදය ඇතුළත දී විෂය නිර්දේශය පිළිවෙළකට උගන්වන්නේ ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| නැත | 9 | 15% |
| ඔව් | 51 | 85% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

ගුරුවරයා නිසි කාල පරිච්ඡේදයේ දී විෂය නිර්දේශය පිළිවෙළකට උගන්වන්නේ ද යන්න සොයා බැලීමේ දී සිසුන් 51ක් කියා සිටියේ ගුරුවරයා සිය කාල කාල පරිච්ඡේදයේ දී විෂය නිර්දේශය පිළිවෙලකට උගන්වන බව වන අතර මෙය සමස්ත නියැදියෙන් 85.0%ක් වේ. නමුත් සිසුන් 9ක් කියා සිටියේ ගුරුවරයා නිසි කාලපරිච්ඡේදයේ දී විෂය නිර්දේශය පිළිවෙලකට උගන්වන්නේ නොමැති බවයි. මෙය සමස්ත නියැදියෙන් 15% වේ.

8.20 සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ඔබට ප්‍රමාණවත් තරම් මානව ලිංගිකත්වය සම්බන්ධ දැනුම ලැබෙන්නේ දැයි ඔබට සිතෙන්නේ ද?

සෞඛ්‍ය අධ්‍යාපනය යන වචනය තුළින්ම ගම්‍ය වනුයේ එම විෂය නිර්දේශය තුළ මානව සෞඛ්‍ය සම්බන්ධ කරුණු කතාබහට ලක් වන බවයි. එහි දී ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු ද ඇතුළත් කර ඇති අතර එය වර්තමාන තාරුණ්‍යයට කෙතරම් ප්‍රමාණවත් වේ ද යන්න ප්‍රශ්නාර්ථයකි. මේ පිළිබඳ දත්ත දායකයින්ගේ අදහස ප්‍රස්තාර අංක 8.19 න් දැක්වේ.

ප්‍රස්තාර අංක 8.19 : සෞඛ්‍ය අධ්‍යාපනය මගින් ඔබට ප්‍රමාණවත් තරම් මානව ලිංගිකත්වය සම්බන්ධ දැනුම ලැබෙන්නේදැයි ඔබට සිතෙන්නේ ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.19 : සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ඔබට ප්‍රමාණවත් තරම් මානව ලිංගිකත්වය සම්බන්ධ දැනුම ලැබෙන්නේ දැයි ඔබට සිතෙන්නේ ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| වැටහීමක් නැත | 9 | 15% |
| නැත | 34 | 56.7% |
| ඔව් | 17 | 28.3% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

සෞඛ්‍ය අධ්‍යාපනය මගින් පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය ලබා නොදෙන බව බොහෝ දෙනාගේ මතයයි. ඒ අනුව සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ප්‍රමාණවත් තරම් මානව ලිංගිකත්වය පිළිබඳ දැනුමක් ලබා දෙන්නේද යන්න පිළිබඳ මෙහි දී අධ්‍යයනය කර ඇත. ඒ අනුව සිසුන් 9ක් සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ප්‍රමාණවත් මානව ලිංගිකත්වය පිළිබඳ දැනුමක් ලැබෙන්නේ ද යන්න වැටහීමක් නොමැති අතර එය සමස්ත නියැදියෙන් 15.0% ප්‍රතිශතයක් වේ. එසේ ම සිසුන් 34 දෙනෙකු පෙන්වා දෙන්නේ සෞඛ්‍ය අධ්‍යාපනයෙන් ප්‍රමාණවත් ලිංගිකත්ව පිළිබඳ දැනුමක් නොලැබෙන බවයි. එය සමස්ත නියැදියෙන් 56.7%ක් වේ. නමුත් සිසුන් 17ක් පෙන්වා දෙන්නේ සෞඛ්‍ය අධ්‍යාපනය මගින් ප්‍රමාණවත් ලිංගික අධ්‍යාපන දැනුමක් ලබා දෙන බවයි. එය 28.3% ක ප්‍රතිශතයකින් යුක්ත ය.

8.21 නිවැරදි ලිංගික අධ්‍යාපනය මගින් හිමි වන වාසි මොනවා ද?

මෙහි දී විශ්ලේෂණය කර ඇත්තේ විස්තරාත්මක දත්ත වේ. එහි දී පර්යේෂණයට දායක වූ සිසුන්ගෙන් ඍජු ප්‍රශ්නයක් වශයෙන් නිවැරදි ලිංගික අධ්‍යාපනයේ වාසි මොනවා ද? යැයි විමසා තිබේ. එහි දී සිසුන්ගෙන් ලැබුණු පිළිතුරු සියල්ල සලකා බලා නිවැරදි ලිංගික අධ්‍යාපනයේ වාසි පහත පරිදි ලැයිස්තු ගත කළ හැකි ය.

- යහපත්, හොඳ සම්බන්ධතා පිළිබඳ හැඟීමක් ඇති කර ගැනීම හැකි වීම.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

- යහපත් විනයකින් යුත් පුද්ගලයෙක් වීමට හැකි වීම.
- ලිංගික අපයෝජනයන්ගෙන් ආරක්ෂා වීමට ඉගෙන ගැනීමට හැකි වීම.
- ශරීරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ අනවශ්‍ය බියක් ඇතිකර නොගැනීමට හැකි වීම.
- ස්ත්‍රී පුරුෂ වෙනස්කම තුළ අන් අයට ගරු කිරීමට ඉගෙනීමට හැකි වීම.
- නොගැළපෙන මාධ්‍යවලින් විකෘති තොරතුරු රැස් කිරීමට ඇති ඉඩකඩ අවම වීම.
- අනාරක්ෂිත ලිංගික සබඳතාවලට යොමුවීම.
- කුඩා වයසෙන් ගැබ් ගැනීම වැනි දේ අවම කර ගැනීමට.
- ලිංගික හැඟීම් පාලනය කරගැනීමට හැකි වීම.
- සමාජය තුළ සිදුවන සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් මිදීමට හැකි වීම.

ආදී වශයෙන් ඉතාමත් වැදගත් වාසි රැසක් නිවැරදි ලිංගික අධ්‍යාපනය ලැබීම තුළින් හිමි වන බව දත්ත දායකයින් පෙන්වා දී තිබේ.

8.22 ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන්ව ඉගෙනීමට කැමැත්තක් දක්වන්නේ ද?

ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ බව යන්න ඉතාමත් තීරණාත්මක සාධකයකි. එහිදී ලිංගික කරුණු ඉගෙනීමේ දී ඇතිවන විවිධ අපහසුතාවයන් තුළ ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන්ව ලිංගික අධ්‍යාපනය ලැබීම සිදු විය යුතුය වැනි අදහස් මතු විය හැකි ය. බොහෝ විට සිසුන්ගේ පෞරුෂ දුර්වලතා මේ සඳහා හේතු විය හැකි ය. නමුත් ප්‍රවණතාවක් වශයෙන් මේ පිළිබඳ අදහස් ලබා ගැනීම වැදගත් විය හැකි වන අතර මේ පිළිබඳ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් වෙන් වෙන් ව ලබාගත් දත්තයන් ප්‍රස්තාර අංක 8.20 න් දැක්වේ.

ප්‍රස්තාර අංක 8.20 : ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් ව ඉගෙනීමට කැමැත්තක් දක්වන්නේ ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.20 : ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන්ව ඉගෙනීමට කැමැත්තක් දක්වන්නේ ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | | එකතුව |
|---|---|---|---|
| | නැත | ඔව් | |
| ස්ත්‍රී | 26 | 6 | 32 |
| පුරුෂ | 24 | 4 | 28 |
| එකතුව | 60 | 10 | 60 |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන්ව ඉගනීමට කැමැත්තක් දක්වන්නේද? යන්න පිළිබඳ පාසල් සිසුන්ගෙන් විමසීමේදී ශිෂ්‍යාවන් 26 දෙනෙක් දක්වා ඇත්තේ ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන්ව ඉගන ගැනීමට ගැනීමට කැමැත්තක් නැති බවයි. එය සමස්ත ශිෂ්‍යාවන් සංඛ්‍යාවෙන් 81.25% කි. එසේ ම ශිෂ්‍යාවන් 6 දෙනෙකු දක්වා ඇත්තේ ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන්ව ඉගෙනීමට කැමැත්තක් දක්වන බවයි. එය සමස්ත ශිෂ්‍යාවන් සංඛ්‍යාවෙන් 18.75% කි. එසේ ම ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් ව ඉගෙනීමට ශිෂ්‍යයන් 4 ක් කැමැත්තක් දක්වන අතර එය සමස්ත ශිෂ්‍යයින් සංඛ්‍යාවෙන් 14.28% කි. ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් ව ඉගෙනීමට කැමැත්තක් නොදක්වන ශිෂ්‍යයන් 24 අදහස් දක්වා ඇත. එය සමස්ත ශිෂ්‍යයින් සංඛ්‍යාවෙන් 85.72% කි.

8.23 සමාජ විරෝධී චර්යාවන් පාලනයට ලිංගිකත්වය පිළිබඳ අධ්‍යාපනය වැදගත් වේ ද?

ප්‍රස්තාර අංක 8.21 : සමාජ විරෝධී චර්යාවන් පාලනයට ලිංගිකත්වය පිළිබඳ අධ්‍යාපනය වැදගත් වේ ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.21 : සමාජ විරෝධී චර්යාවන් පාලනයට ලිංගිකත්වය පිළිබඳ අධ්‍යාපනය වැදගත් වේ ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| වැටහීමක් නැත | 8 | 13.3% |
| නැත | 6 | 10% |
| ඔව් | 46 | 76.7% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

සමාජ විරෝධී චර්යාවන් සහ ලිංගික අධ්‍යාපනය අතර කිසියම් වූ සබඳතාවක් දැක ගත හැකි ය. ඒ අනුව සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ වැටහීමක් නැති සිසුන් සංඛ්‍යාව 8ක් වන අතර එය ප්‍රතිශතයක් ලෙස 13.3%ක් වේ. එසේ ම සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනය වැදගත් නොවන බව සිසුන් 6ක් පෙන්වා දෙන අතර එය සමස්ත නියැදියෙන් 10.0%ක් වේ. එසේ ම සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනය වැදගත් වනවාය යනුවෙන් සමස්ත නියැදියෙන් සිසුන් 46ක් පෙන්වා දී ඇත. එය සමස්ත නියැදියෙන් 76.7%ක් වේ.

8.24 සමාජ විරෝධී චර්යාවන් පිළිබඳ ඔබ දැනුවත් ද?

සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල තුළ සිදු කෙරෙන ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනය කිරීමට නම් සමාජ විරෝධී චර්යාවන්


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද යන්න පිළිබඳ සිසුන් තුළ අවබෝධයක් තිබීම වැදගත් වේ. මේ පිළිබඳ විමසීමේ දී දත්ත දායකයිනගෙන් ලැබුණු තොරතුරු ප්‍රස්තාර අංක 8.22 න් නිරූපණය කර ඇත.

ප්‍රස්තාර අංක 8.22 : සමාජ විරෝධී චර්යාවන් පිළිබඳ දැනුවත්භාවය

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.22 : සමාජ විරෝධී චර්යාවන් පිළිබඳ දැනුවත්භාවය

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| නැත | 13 | 21.7% |
| ඔව් | 47 | 78.3% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

සමාජ විරෝධී චර්යාවන් පිළිබඳ සිසුන්ගේ දැනුවත් භාවය පිළිබඳ විමසීමේ දී සමාජ විරෝධී චර්යාවන් පිළිබඳ දැනුවත් භාවයක් නොමැති සිසුන් සංඛ්‍යාව 13ක් වන අතර එය සමස්ත නියැදියෙන් 21.7 %ක් වේ. එසේ ම සමාජ විරෝධී චර්යාවන් පිළිබඳ දැනුවත් භාවයකින් යුත් සිසුන් සංඛ්‍යාව 47ක් වන අතර එය සමස්ත නියැදියෙන් 78.3%ක් වේ.

8.25 සමාජ විරෝධී චර්යාවන් මොනවා ද?

මෙහි දී විශ්ලේෂණය කර ඇත්තේ විස්තරාත්මක දත්ත වේ. එහි දී පර්යේෂණයට දායක වූ සිසුන්ගෙන් ඍජු ප්‍රශ්නයක් වශයෙන් සමාජ විරෝධී චර්යාවන් මොනවාද? යැයි විමසා තිබේ. එහි දී සිසුන්ගෙන් ලැබුණු පිළිතුරු සියල්ල සලකා බලා ඔවුන් සිතන ආකාරයට සමාජ විරෝධී චර්යාවන් වන්නේ කුමන චර්යාවන් ද යන්න පහත පරිදි ලැයිස්තු ගත කළ හැකි ය.

1. ස්ත්‍රී දූෂණ
2. බාල අපචාර
3. අසභ්‍ය වීඩියෝ දර්ශන නැරඹීම
4. අඩු වයසින් ගැබ් ගැනීම
5. ගබ්සාවන් සිදු කිරීම
6. අඩු වයසින් ලිංගිකව හැසිරීම
7. අඩු වයසින් ආදර සබඳතා පැවැත්වීම
8. මත්ද්‍රව්‍ය ආදියට ඇබ්බැහි වීම
9. කාන්තාවන්ට අතවර කිරීම

ආදී චර්යාවන් සමාජ විරෝධී චර්යාවන් ලෙස දත්ත ලබා දුන් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහන් කර තිබේ.

8.26 සෞඛ්‍යය අධ්‍යාපනය වෙනුවට නිවැරදි විෂය නිර්දේශයට අනුකූල ලිංගික අධ්‍යාපනයක් පාසල තුළින් ලැබිය යුතු යැයි ඔබ සිතන්නේ ද ?

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ කාලයක සිටම ක්‍රියාත්මක වූයේ සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රමවේදයකි. මේ තුළින් සිසුන්ට හිමි වූයේ සීමිත ලිංගිකත්වය පිළිබඳ අධ්‍යාපනයකි. මේ නිසා සිසුන්ට පාසල තුළ විෂය නිර්දේශයානුකූල ව සිදුකරන ලිංගික අධ්‍යාපනයක් සිදුවිය යුතු ද යන්න පිළිබඳ විමසීම වැදගත් වේ. ඒ අනුව දත්ත දායකයින්ගෙන් ලබා ගත් තොරතුරු ප්‍රස්තාර අංක 8.23 න් දැක්වේ.

ප්‍රස්තාර අංක 8.23 : සෞඛ්‍යය අධ්‍යාපනය වෙනුවට නිවැරදි විෂය නිර්දේශයට අනුකූල ලිංගික අධ්‍යාපනයක් පාසල තුළින් ලැබිය යුතු ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.23 : සෞඛ්‍යය අධ්‍යාපනය වෙනුවට නිවැරදි විෂය නිර්දේශයට අනුකූල ලිංගික අධ්‍යාපනයක් පාසල තුළින් ලැබිය යුතු ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| නැත | 7 | 11.7% |
| ඔව් | 53 | 88.3% |
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වර්තමාන පාසැල් විෂය නිර්දේශය තුළ ලිංගික අධ්‍යාපනයක් දැකගත නොහැකි අතර ඒ වෙනුවට දැකගත හැක්කේ සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය පමණි. එහි දී ලිංගික අධ්‍යාපනයේ අවශ්‍යතාව පිළිබඳ පාසල් සිසුන්ගෙන් විමසීමේ දී සෞඛ්‍ය අධ්‍යාපනය වෙනුවට නිවැරදි විෂය නිර්දේශයක් යටතේ ලිංගික අධ්‍යාපනයක් පාසල තුළින් ලැබිය යුතු යැයි සිතන සිසුන් සංඛ්‍යාව වන්නේ 7කි. එය සමස්ත නියැදියෙන් 11.7%ක් වේ. එසේ ම සෞඛ්‍ය අධ්‍යාපනයෙ වෙනුවට නිවැරදි විෂය නිර්දේශය අනුකූල ලිංගික අධ්‍යාපනයක් පාසල තුළින් ලැබිය යුතු යැයි සිතන ශිෂ්‍ය සංඛ්‍යාව 53කි. එය සමස්ත නියැදියෙන් 88.3% ක් වේ.

8.27 ලිංගික අධ්‍යාපනය තුළ පාසල් ශිෂ්‍යයකු වශයෙන් චර්යාත්මක ශික්ෂණයක් ඔබට හිමි වන්නේ යැයි ඔබ සිතන්නේ ද?

ප්‍රස්තාර අංක 8.24 : ලිංගික අධ්‍යාපනය තුළ පාසල් ශිෂ්‍යයකු වශයෙන් චර්යාත්මක ශික්ෂණයක් ඔබට හිමි වන්නේ ද?

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

වගු අංක 8.24 : ලිංගික අධ්‍යාපනය තුළ පාසල් ශිෂ්‍යයකු වශයෙන් චර්යාත්මක ශික්ෂණයක් ඔබට හිමි වන්නේ ද?

| ප්‍රතිචාරය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| නැත | 4 | 6.7% |
| ඔව් | 56 | 93.3% |


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

| | | |
|---|---|---|
| එකතුව | 60 | 100% |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

පාසැල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනය පිළිබඳ විමසීමේ දී ලිංගික අධ්‍යාපනය තුළ පාසල් ශිෂ්‍යයකු වශයෙන් චර්යාත්මක ශික්ෂණයක් හිමි වන්නේ ඇයි නොසිතන ශිෂ්‍යයින් සංඛ්‍යාව 4ක් වන අතර එය සමස්ත නියැදියෙන් 6.7%ක් වේ. නමුත් ලිංගික අධ්‍යාපනය තුළ පාසල් ශිෂ්‍යයකු වශයෙන් චර්යාත්මක ශික්ෂණයක් ඇති වේ යැයි සිතන සංඛ්‍යාව 56ක් වේ. එය සමස්ත නියැදි ප්‍රතිශතය 93.3%ක් වේ.

8.28 ස්ත්‍රී හා පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනයට ඇති කැමැත්ත වෙනස් වන බව

ප්‍රශ්නාවලිය භාවිතයෙන් ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතික කැමැත්ත පිළිබඳ දත්ත ලබාගෙන ඇති අතර ඒ මගින් ලබාගත් දත්ත මගින් පහත පරිදි කෛවර්ග පරීක්ෂණය සිදු කෙරේ. මෙහි දී විශ්ලේෂණය කරනු ලබන දත්ත ගුණාත්මක දත්ත වේ.

- ඉහළ
- මධ්‍යම
- පහළ

ඒ අනුව ගොඩනගාගත් ගුණාත්මක දත්ත පදනම් කරගෙන උපන්‍යාස පරීක්ෂා කිරීම සිදු කෙරේ. මෙහි දී අධ්‍යයනය සඳහා යොදාගත් පාසල්වල ශිෂ්‍යය ශිෂ්‍යාවන් ලිංගික අධ්‍යාපනය සඳහා පවතින කැමැත්ත ස්ත්‍රී සහ පුරුෂ බව අනුව වෙනස්වන බව එනම් පුමිතිරි බව අනුව වෙනස් වේ යන උපකල්පනය මත පිහිටා උපන්‍යාස පරීක්ෂා කෙරේ.

H0 - ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතික කැමැත්ත වෙනස් වේ.

H1 - ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතින කැමැත්ත වෙනස් නොවේ.

වගු අංක 5.28 කෛවර්ග පරීක්ෂණ දත්ත වගුව

| පුමිතිරි බව | ඉහළ | මධ්‍යම | පහළ | nc |
|---|---|---|---|---|
| පුරුෂ | 18 | 12 | 8 | 38 |
| ස්ත්‍රී | 3 | 5 | 14 | 22 |
| nr | 21 | 17 | 22 | 60 |

(මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ දත්ත, 2020)

පහත සමීකරණයට භාවිතයෙන් 0.05 වෙසෙසියා මට්ටමට අනුව උපන්‍යාස පරීක්ෂා කෙරේ.

$$X^2 = \Sigma(fo - fe)^2 / fe$$

| $fo$ | $fe$ | $(fo - fe)$ | $(fo - fe)^2$ | $(fo - fe)^2 / fe$ |
|---|---|---|---|---|
| 18 | 13.3 | 4.7 | 22.09 | 1.7 |
| 12 | 10.7 | 1.3 | 1.69 | 0.16 |
| 8 | 13.9 | - 5.9 | 34.81 | 2.5 |
| 3 | 7.7 | - 4.7 | 22.09 | 2.87 |
| 5 | 6.2 | - 1.2 | 1.4 | 0.22 |
| 14 | 8.1 | 5.9 | 34.81 | 4.29 |
| | | | | 11.74 |

$$X^2 = \Sigma(fo - fe)^2 / fe$$

$$= 11.74//$$

සුචලන අගය

$$df = (c - 1) + (r - 1)$$
$$df = (3 - 1) + (2 - 1)$$
$$df = 2 * 1$$
$$df = 2 //$$

2 සුචලන අගයට සහ 0.05 වෙසෙසියා මට්ටමට කෛවර්ගයේ න්‍යායාත්මක අගය 5.991 කි. පරයේෂණයේ ප්‍රායෝගික ගැටලුවට අදාළ ව ආගණනිත කෛවර්ග අගය 11.74 කි. ආගණනිත අගය වගුවේ න්‍යායාත්මක අගය ඉක්මවා යන නිසා අප්‍රතිෂ්ඨයේ කල්පිතය ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත් සාක්ෂි පවතී. ඒ අනුව මෙම උපන්‍යාස පරීක්ෂාවේ එන අප්‍රතිෂ්ඨයේ කල්පිතය වන ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතික කැමැත්ත වෙනස් නොවේ යන්න ප්‍රතික්ෂේප වන අතර වෛකල්පිතය වන ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතික කැමැත්ත වෙනස් වේ යන්න පිළිගැනේ.

**ගුරුවරුන්ගෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය**

8.29 ගුරුවරයෙකු වශයෙන් සමාජ විරෝධී චර්යාවන් මොනවාද යන්න පිළිබඳ දැනුවත්භාවය.

ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ වසරක් තුළ සිදුවන ලිංගිකත්වය සම්බන්ධ අපරාධකාරී ක්‍රියාවන් විශාල වශයෙන් ජන මාධ්‍ය තුළින් අසන්නට දකින්නට හැකි ය. ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන ක්‍රමය තුළ ලිංගික අධ්‍යාපනය කෙරෙහි ස්ථානයක් වෙන්ව පැවතියත් ලිංගිකත්වය සම්බන්ධ අපරාධකාරී ක්‍රියාවන් බහුල ලෙස වාර්තා වන්නේ මන්ද යන්න සොයා බැලිය යුතු කාරණාවකි. මේ නිසා පාසල් තුළ සිදුකරන ලිංගික අධ්‍යාපනය සමාජ විරෝධී ක්‍රියාකාරකම් පාලනයට කෙසේ බලපාන්නේද යන්න වැදගත් වේ.

සමාජ විරෝධී ලිංගික චර්යාවන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ශ්‍රී ලාංකික සමාජ සංදර්භය අධ්‍යයනය ඉතා වැදගත් වේ. මන්දයත් රටකින් රටකට සමාජ විරෝධී චර්යාවන් යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද යන්න වෙනස් වන බැවිනි. දකුණු ආසියාතික රටක් වන ශ්‍රී ලංකාවේ සමාජ සංස්කෘතික ආගමික සාධක එහි දී බලපායි. එහි දී අඩු වයසින් ළමා හා නව යොවුන් වියේ ලිංගික සබඳතා පැවැත්වීම, අඩු වයස් ගැබ් ගැනීම්, බාල අපරාධ, පූර්ව විවාහ ලිංගික සබඳතා අවිවාහක ලිංගික සබඳතා ආදිය සමාජ විරෝධී චර්යාවන් වශයෙන් හැඳින්විය හැකි ය.



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

8.30 ලිංගික අධ්‍යාපනය සම්බන්ධ ඇතැම් පාඩම් ඉගැන්වීමේ දී ගුරුවරයා අපහසුතාවයකට පත්වී තිබේ ද යන්න.

ලිංගික අධ්‍යාපනය සම්බන්ධ ඇතැම් පාඩම් ඉගැන්වීමේදී ගුරුවරයාට කිසියම් වූ අපහසුතාවක් දැනීම සාමාන්‍ය කරුණකි. ඒ අනුව අධ්‍යයනයට ලක් වූ පාසල් ත්‍රිත්වයම මිශ්‍ර පාසල් වන හෙයින් පන්ති කාමරය තුළ ගුරුවරයා මුහුණ දෙන අපහසුතාවයන් ගණනාවක් මෙහි දී පෙන්වා දී ඇත. ඒ අනුව ලිංගිකත්වය සම්බන්ධ පාඩම් ගුරුවරයා විසින් උගන්වන අවස්ථාවේ දී සිසුන් විසින් අසනු ලබන ප්‍රශ්න හේතුවෙන් ගුරුවරයාට ලැජ්ජාශීලීත්වක් ඇතිවන බව මෙහි දී ගුරුවරුන් විසින් පෙන්වා දෙන ලදී. එසේම ඒ තුළින් යම් අපහසුතාවයක් ඇති වන බවත් එහිදී සිසුන්ගෙන් අසන ප්‍රශ්නවලට සිසුන් පිළිතුරු ලබා නොදෙන බවත් ගුරුවරුන්ට පන්තිය හසුරවා ගත නොහැකි බවත් මෙහි දී පෙන්වා දී ඇත. එසේම විෂය නිර්දේශය තුළ අඩංගු ලිංගිකත්වය සම්බන්ධ කාරණාවන් තේරුම් කිරීමට නොහැකි වීම මෙහි දී ප්‍රධාන ගැටලුවක් ලෙස මොවුන් පෙන්වා දී ඇත. එසේ ම ඇතැම් කාරණාවක් වක්‍රාකාරයෙන් තේරුම් කිරීමට යාමෙන් ළමුන් වැරදි ලෙස එය තේරුම් ගැනීමට උත්සාහ කිරීම ගුරුවරුන් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වේ. එසේ ම බොහෝ ශිෂ්‍යයන් මෙවැනි ලිංගිකත්වය සම්බන්ධ කාරණා හාස්‍යයට ගැනීම ද මෙහි දී සිදුවන අපහසුතාවක් ලෙස පෙන්වා දී ඇත.

8.31 සේවය කරන පාසල තුළ ළමයින් සමාජ විරෝධී චර්යාවන් සඳහා චෝදනාවන්

පාසල තුළදී ළමුන් සමග කටයුතු කිරීමේ දී ගුරුවරයෙකු සුහදත්වය මූලික කරගෙන කටයුතු කිරීම දැකගත හැකි ය. එහි දී ළමුන් මුහුණ දෙන විවිධාකාරයේ ගැටලු, ප්‍රශ්න ගුරුවරුන්ට යොමු කරන ආකාරය හඳුනාගත හැකි ය. මෙවැනි ගැටලු බොහෝ විට ළමුන් සඟවන අතර මේ පිළිබඳ ගුරුවරුන් දැනුවත් වන්නේ අවට සමාජයෙන් හා පාසල් පරිසරය තුළිණි. කෙසේ වෙතත් යහපත් ගුරු ගෝල සබඳතාවක් තුළින් හා වර්තමානය වන විට පාසල් තුළ ක්‍රියාත්මක වන උපදේශන සේවාව මගින් ද මෙවැනි සිද්ධි හඳුනා ගත හැකි ය. එසේ ම සිසුන් මුහුණ දෙන ගැටලු පන්ති කාමරයේ දී ගුරුවරයා සමඟ සාකච්ඡා කරන ආකාරය හඳුනාගත හැකි ය. ඒ අනුව පාසල් තුළ ළමුන් සමාජ විරෝධී චර්යාවන් සඳහා චෝදනාවට ලක් වී තිබේ ද යන්න විමසීමේ දී ඔවුන් පෙන්වා දුන්නේ වර්තමානය වන විට පාසල් පරිසරය තුළ එවැනි සමාජ විරෝධී චර්යාවන් සඳහා ළමුන් ලක් වී ඇති බවයි. මෙහි දී ගුරුවරුන් විසින් හඳුනා ගත් සමාජ විරෝධී චර්යාවන් ගණනාවක් පහත් දැක්වේ.

- බාලාපචාර
- ජංගම දුරකථන සහ පරිගණක භාවිතයෙන් අසභ්‍ය දර්ශන නැරඹීම
- ලිංගික අපහරණයට ලක්වීම

ආදී සමාජ විරෝධී චර්යාවන් ගුරුවරයකුව වශයෙන් කටයුතු කිරීමේ දී අසන්නට ලැබී ඇති බව මෙහි දී පෙන්වා දුන්නේ ය. අධ්‍යයන ක්ෂේත්‍රය තුළ දී ගුරුවරුන් පෙන්වා දුන්නේ පරිපූර්ණ ලිංගික අධ්‍යාපනයක් නොමැති වීම හේතුවෙන් තරුණ ප්‍රජාව නොයෙකුත් ලිංගික රෝග සහ මානසික, කායික, සමාජීය ගැටලුවලට මුහුණ දෙන ආකාරය දැක ගත හැකි බවයි. ලංකාවේ තරුණ ජනගහණයනය බිලියන 44ක පමණක් වේ. ඉන් සියයට 50% ක් පමණ නිසි ලිංගික අධ්‍යාපනයක් නොමැති බව අතර නිසි අධ්‍යාපනයක් නොලැබීම හරහා අනවශ්‍ය ලෙස නව යොවුන් වියේ දී සිදු වන ගැබ් ගැනීම් ලිංගික සම්ප්‍රේෂණ ව්‍යාප්තවීම කායික මානසික පීඩනයට සහ අවහිරතාවලට මුහුණ දීම යනා දී බේදවාචකයන් දැකගත හැකි බව මෙහි දී පෙන්වා දී ඇත.

8.32 එම චර්යාවන් ඇතිවීමට වීමට බලපා ඇති හේතු සාධක

ගුරුවරුන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව පෙර සඳහන් කළ සමාජ විරෝධී චර්යාවන් ඇති වීම සඳහා බලපා ඇති සාධක ගණනාවක් ගුරුවරුන් විසින් මෙහි දී පෙන්වා දී ඇත. ඒ අනුව අධ්‍යයනයට ලක් වූ පාසල්වල සමාජ විරෝධී චර්යාවන් ඇති වීම සඳහා බලපෑ සාධක ලෙස,

- ලිංගික අධ්‍යාපනයක් නොමැතිවීම
- පවුල් පසුබිම තුළ ඇති ගැටලුකාරී තත්ත්වයන් හා දෙමවුපියන්ගේ අවධානයක් හා මග පෙන්වීමක් දරුවන් කෙරෙහි නොමැති වීම
- ජනමාධ්‍ය මගින් ලැබෙන වැරදි තොරතුරු
- ජංගම දුරකථන භාවිතය
- නොගැළපෙන පුද්ගලයින් ඇසුරු කිරීම ආදිය හඳුනාගත හැකි ය.

ඉහත සාධක අතර ලිංගික අධ්‍යාපනයක් නොමැති වීම ප්‍රධාන හේතුවක් ලෙස අධ්‍යයනයට ලක් වූ පාසල්වල ගුරුවරුන් සියල්ල විසින් පෙන්වා දී ඇත. එසේම පවුල් පසුබිම තුළ ඇති ගැටලුකාරී තත්ත්වයන් එනම් දෙමාපියන් දරුවන් කෙරෙහි අවධානයක් නොමැති වීම, දෙමව්පියන් දරුවන් කෙරෙහි මගපෙන්වීමක් නොමැති වීම, දෙමාපියන් විදේශගත වීම, දරුවන් අනාරක්ෂිත ස්ථානවල දමා දෙමාපියන් රැකියා සඳහා යාම වැනි හේතු සාධක ප්‍රධාන වශයෙන්ම ළමුන්ගේ සමාජ විරෝධී චර්යාවන් ට ගොදුරු වීම හෝ යොමු වීම කෙරෙහි සෘජු ව සහ වක්‍ර ව බලපාන බව මෙහි දී ඔවුන් පෙන්වා දී ඇත.

8.33 ගුරුවරයකු ලෙස සිසුන්ට ලිංගික අධ්‍යාපනයක් ලබාදීමේ ඇති වැදගත්කම.

ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ නිසි අධ්‍යාපනය ලබා දීමෙන් ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය ගැටළුවලින් ආරක්ෂා කිරීම, ළමා හා කාන්තා අපයෝජන සහ ලිංගික ආසාදන රෝගී තත්ත්වයන් අවම කිරීම ආදී විසඳුම්


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ලබා දීමට සෘජුව හෝ වක්‍රව ඉඩ කඩ ලැබේ. ඒ අනුව ඉහත කාරණා සළකා බැලීමේ දී ගුරුවරුන් පෙන්වා දුන්නේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිලිබඳ නිසි අධ්‍යාපනයක් ලබා දීමට වඩාත් සුදුසු විධිමත් සහ වගකිව යුතු ආයතනය පාසල බවයි. සෞඛ්‍යය පිළිබඳ වෛද්‍ය මතය වන්නේ ද පාසලේ දී එම කරුණු විෂයක් ලෙස ඉගැන්වීම තුළින් යහපත් ප්‍රතිඵල අත් කර ගත හැකි බවයි.ළමා අපචාර අඩු කිරීමටත් වැළැක්වීමටත් දීර්ඝකාලීන පිළියමක් ලෙස ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පාසල් විෂය නිර්දේශය හඳුන්වා දිය යුතු බවත්, ලිංගික අධ්‍යාපනයක් ලබාදීමෙන් ළමුන් තමන්ගේ මිත්‍ර කණ්ඩායම් මගින් හෝ අසත්‍ය තොරතුරු ලබා ගැනීමට පෙළඹීම වැළැක්විය හැකි බවත් මෙහි දී පෙන්වා දී ඇත. අඩු වයස් ගැබ් ගැනීම්, උපත් පාලනය, ලිංගික අප අපයෝජනය, ළදරු මරණ අනුපාතිකය අඩු වීම මෙහි දී සිදු වෙයි. එසේ ම සමාජයේ කාන්තාවන් ගණිකා වෘත්තියට යොමු වීම ද මෙහි දී අඩු වෙන බව පෙන්වා දෙයි.

- ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය සම්බන්ධ නව යොවුන් වියේ දරුවන්ගේ දැනුම සහ ආකල්ප වර්ධනය වීම.
- පාසල තුළ හෝ බාහිරව ලබා දෙන පරිපූර්ණ ලිංගික අධ්‍යාපනය නිසා අවදානම් සහගත ලිංගික හැසිරීම් හෝ ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ අවබෝධය වර්ධනය වීම.
- එවැනි අවදානම් සහගත ක්‍රමයන්ගෙන් දුරස් වී සිටීමට හැකියාව ලැබීම.
- ලිංගිකත්වය පිළිබඳ පවතින ගැටලු අවම කරගත හැකි වීම.

යනාදිය ආදිය ලිංගික අධ්‍යාපනය තුළින් ලබා ගත හැකි වැදගත්කම් ලෙස මොවුන් පෙන්වා දෙයි.

8.34 සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනයය විෂය තුළ ඇතුළත් ලිංගිකත්වය සම්බන්ධ විෂය කරුණුවල ප්‍රමාණවත්භාවය.

මෙහි දී සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂය තුළ ලිංගිකත්වය සම්බන්ධ කරුණු ප්‍රමාණවත් නොවන බව හඳුනා ගත හැකි විය. ඒ අනුව ගුරුවරුන් පෙන්වා දෙන්නේ ළමුන්ට ප්‍රමාණවත් ලිංගික අධ්‍යාපනයක් ලබා දිය යුතු බවයි. එහි දී පහත සදහන් විෂය කරුණු ලිංගික අධ්‍යාපනය විෂය මාලාවට ඇතුළත් විය යුතු බව පෙන්වා දෙන ලදී.

- ප්‍රජනක සෞඛ්‍ය හැඳින්වීම
- ප්‍රජනක පද්ධතිය
- නව යොවුන්විය ආශ්‍රිත ගැටලු
- ලිංගිකව සම්ප්‍රේෂණ වන රෝග තත්වයන්
- ලිංගික අභියෝග ජය ගැනීම
- ඔසප් චක්‍රයට අදාළ ස්වස්ථතාවය පවත්වා ගැනීම
- දෙමාපිය වගකීම්
- යහපත් පවුල් ජීවිතයක් සඳහා පවුල් සැලසුම් කිරීම
- ලිංගික චර්යාව හා නීතිය

8.35 පාසල තුළ උපදේශන සේවාවක් ක්‍රියාත්මක වන්නේ ද ? යන වග.

මෙහි දී අධ්‍යයනයට ලක් කළ පාසල් ත්‍රිත්වය වන හ/උතුරු කණුමුල්දෙණිය පාසලෙහි පමණක් උපදේශන සේවාවක් ක්‍රියාත්මක වන අතර අනෙකුත් පාසල් වන හ/ ඕලුආර බණ්ඩාරනායක කනිෂ්ඨ විද්‍යාලය හා කන්දෙබැද්ද කනිෂ්ඨ විද්‍යාලය යන පාසල් දෙකෙහි උපදේශන සේවාවක් ක්‍රියාත්මක නොවේ.

8.36 ගුරුවරයෙකු ලෙස ලිංගික අධ්‍යාපනයේ ඉගැන්වීමේ දී ඇති කරගත යුතු පෞරුෂ ලක්ෂණ

ගුරුවරයෙකු ලෙස ලිංගික අධ්‍යාපනයක් ලබා දීමේ දී ඇතිකරගත යුතු පෞරුෂ ගුණාංග පිළිබඳව සොයා බැලීම ඉතා වැදගත් වේ. ඊට හේතුව වන්නේ සාමාන්‍ය විෂයක මෙන් නොව ලිංගික අධ්‍යාපනය ලබා දීමේ දී ලිංගික කරුණු පිළිබඳ සාකච්ඡා කරන බැවින් ඒ පිළිබඳ ගුරුවරයාට මෙන් ම ශිෂ්‍යයාට ද ලැජ්ජාවක්, බියක්, සන්නිවේදන අපහසුතා ඇතිවිය හැකි බැවිනි. එම නිසා ගුරුවරයා විසින් ලිංගික අධ්‍යාපනය ඉගැන්වීමේ දී සුවිශේෂ වූ පෞරුෂ ගුණාංග වර්ධනය කරගත යුතුය. තව ද ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ම ඉදිරියේ ලිංගික අධ්‍යාපනය ලබා දෙන බැවින් සිසුන්ට අපහසුතාවක් නොවන පරිදි ලිංගික අධ්‍යාපනය ලබා දීමට ගුරුවරයා වග බලා ගත යුතු වෙයි. ඒ අනුව ගුරුවරයකු විසින් ප්‍රගුණ කළ යුතු ප්‍රධාන පෞරුෂ ලක්ෂණ ගණනාවක් තොරතුරු ලබා දුන් ගුරුවරුන් විසින් පෙන්වා දී ඇත.

- නිවැරදි සන්නිවේදනය
- සබකෝලයෙන් තොර වීම
- සෘජු බව
- නිවැරදි දැනුම
- ඉවසීම
- ඇහුම්කම් දීම

8.37 ලිංගික අධ්‍යාපනය ඉගැන්වීමේ දී ගුරුවරුන් හා සිසුන් අතර සබඳතාව

තම සිසුන්ගේ ප්‍රශ්න විසඳා ගනිමින් ඔවුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදෙමින් දයා බරිත වූ ඔවදන්


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දෙමින් අධ්‍යාපන ක්‍රියාවලියට යොමු කරලීමේ සැබෑ වුවමනාව ගුරු භූමිකාව සතු විය යුතුය. සෑම විට ම සිසුන් පිළිබඳ තමාට සාපේක්ෂ ව සිතීමට ගුරුවරයා වග බලා ගත යුතු ය. ගුරුවරයා ප්‍රියශීලී, කාරුණික කෙනෙකු වීම අත්‍යවශ්‍ය වේ. ඊට හේතුව අප්‍රසන්න පුද්ගලයින් කියන දේට අවධානය යොමු කිරීම අඩු වීමයි. ගුරුවරයා ගෞරවය රැකෙන අන්දමට උගන්වන දේ දරුවන්ගේ සිතට අවධාරණය කිරීම අවශ්‍ය වේ. පාසලේ දී පමණක් නොව ඉන් බැහැරව ද කතාව සහ හැසිරීම පිළිබඳ අවධානය යෙමු විය යුතුය. කාරුණික ව ඉගැන්වීම් කළ හොත් බොහෝ විට විනීත සිසු පරපුරක් දැකගත හැකි ය. මෙහි දී ලිංගික අධ්‍යාපනය ලබාදෙන හෙයින් සාමාන්‍ය ඉගැන්වීමෙන් බැහැර ව යහපත් පෞරුෂ ලක්ෂණ ගොඩ නගා ගනිමින් කටයුතු කිරීම ගුරුවරයාට ඉතා වැදගත් වේ. එහි දී සිසුන් සමග ගෞරවනීය සහ මනා සබඳතාවක් ගොඩ නගා ගැනීම ඉතා වැදගත් වන බව මෙහි දී ගුරුවරුන් පෙන්වා දී ඇත. එමෙන් ම ගුරුවරයා විසින් ළමුන්ගේ විෂය සම්බන්ධ ගැටලු මෙන් ම සිසුන්ගේ පෞද්ගලික ජීවිතය තුළ ඇති ලිංගිකත්වය සම්බන්ධ ගැටලු පිළිබඳ පවා විමසා දැන ගැනීමට තරම් ළමුන් සමග යහපත් සමීප සබඳතාවක් ගොඩ නගා ගනිමින් කටයුතු කිරීම මෙහි දී වැදගත් වන බව පෙන්වා දී ඇත.

## 8.38 පාසල් සිසුන්ට ලිංගික අධ්‍යාපනය ලබාදීම කෙරෙහි බලපාන සමාජ සංස්කෘතික බාධාවන්

මෙහි දී දත්ත දායකයින් වන ගුරුවරුන් පෙන්වා දෙන ආකාරයට දෙමාපියන් බොහෝ විට සදාචාරය මත පදනම්ව ලිංගිකත්වය පිළිබඳ තම දරුවන්ට අවබෝධ කර දීමට ඉදිරිපත් නොවේ. පාසල තුළ බොහෝ විට සදාචාරය හා සංස්කෘතිය මතට මුවාවෙමින් ලිංගිකත්වය පිළිබඳ පාඩම් මග හරිමින් හෝ අතපසු කරමින් ඉදිරියට යන ආකාරය දැකගත හැකි ය. මෙලෙස මව්පියන් හෝ ගුරුවරුන් යන දෙපාර්ශවය ම තමන්ගෙන් ඉටුවිය යුතු වගකීම් මඟ හැරීම හෝ අතපසු කිරීම හරහා තරුණ පරම්පරාවට ලිංගිකත්වය පිළිබඳ විධිමත් දැනුමක් ලැබීමේ ඉඩකඩ අහිමි වන බව බොහෝ ගුරුවරුන්ගේ මතයයි. බෞද්ධ සංස්කෘතික වටපිටාවක් තුළ බටහිර සංස්කෘතික වටපිටාවට වඩා පටු ආකල්පයකින් ලිංගිකත්වය පිළිබඳ දකින බව මොවුන්ගේ අදහසයි. මේ නිසා නිවැරදි ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු නව යෞවනයන්ට නිසි කාලයේ දී හිමි නොවීම තුළ විවිධ ගැටලු පැන නැගිය හැකි ය. මීට අමතර ව සමාජ බාධාවක් ලෙසින් ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු වැඩිහිටියන්ට පමණක් වෙන් වූ මාතෘකාවක් ලෙස වෙන්ව පැවතීමයි. ඇතැමුන් පෙන්වා දී ඇත්තේ ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු ප්‍රසිද්ධියේ කතා නොකරන දෙයක් යැයි ඇති පුහු සමාජ ආකල්පයයි. මෙය වර්තමානය වන විට අඩු ප්‍රවණතාවක් වුව ද එම ආකල්පය ඇතැම් අවස්ථාවල දී ඉස්මතු වන බව පෙනේ. බොහෝ යෞවනයන්ට ළමාවියෙන් වැඩිහිටිවියට සංක්‍රමණය වෙන අවස්ථාවේ දී ලිංගිකත්වය පිළිබඳ ව්‍යාකූල හා විසංවාදී තොරතුරු නැති විය හැකි බවත් එහි දී ලිංගික අධ්‍යාපනය තුළින් ආරක්ෂාකාරී ඵලදායි හා පරිපූර්ණ ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලැබෙන බවත් මොවුන් තව දුරටත් පෙන්වා දී ඇත. යෞවනයින්ට ආරක්ෂාකාරී ඵලදායි හා පරිපූර්ණ ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමේ දැඩි අවශ්‍යතාවක් මේ නිසාම උද්ගත වන බව ද මොවුන් පෙන්වා දී තිබේ. පරිපූර්ණ ලිංගික අධ්‍යාපනයක් ලබා දීම හරහා යෞවනයන්ට ඔවුන්ගේ සමාජ සම්බන්ධතා සහ ලිංගිකත්වය පිළිබඳ දැනුවත් තීරණ ගැනීමට, පවුල් ජීවිතයේ යහපැවැත්මට, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, අසමානතාව, අනවශ්‍ය ගැබ් ගැනීම්, ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග වැනි අවදානම්වලින් තොර යහපත් ජීවන රටාවකට පියනැගීමට සමාජීය හා සංස්කෘතිකමය බාධාවන් පිටු දැකීම මගින් මනා පිටුවහලක් වන බව ද මෙහි දී ගුරුවරුන් විසින් පෙන්වා දී ඇත.

## 8.39 බටහිර රටවල හා ශ්‍රී ලංකාවේ ලිංගික අධ්‍යාපන විෂමතාවයන් පාසලට බලපාන ආකාරය

දියුණු රටවල් දරුවන්ට විධිමත් සහ විවෘත ලෙස කුඩා කාලයේ සිට ම ලිංගිකත්වය පිළිබඳ පූර්ණ දැනුමක් ලබා දෙයි. විවෘත අධ්‍යාපනික පසුබිමක් සහිත රටවල පාසල තුළ දී මෙන් ම විවෘත සංස්කෘතික පසුබිමක් සහිත රටවල නිවසේ දී මවුපියන් විසින් දරුවන්ට එකී ලිංගික දැනුම ලබාදෙනු ලැබේ. පාසල් අධ්‍යාපනය හා නිවසේ දී දරුවන්ට ලිංගිකත්වය පිළිබඳ දැනුම ලබා දුන්නත් සමාජයේ දියුණු තලයක පවතින වර්තමානයේ අන්තර්ජාලය ඔස්සේ ජංගම දුරකථනයේ මෙන් ම විවිධ මුද්‍රිත ප්‍රකාශන මාධ්‍ය ඔස්සේ ද දරුවෝ ලිංගික්ත්වය පිළිබඳ සොයා යති. බටහිර රටවල් හා ශ්‍රී ලංකාවේ ලිංගික අධ්‍යාපන විෂමතාව සංස්කෘතිය අනුව වෙනස් විය හැකි ය. එය බටහිර යුරෝපා රටවල් තුළ ලිංගික අධ්‍යාපනය ලබා දීමේදී යම් විවෘත ස්වභාවයක් ගන්නා අතර ලංකාව තුළ එය සැඟවුණු ස්වරූපයක් ගන්නා බව මෙහි දී වැඩි දුරටත් පෙන්වා දී ඇත.

## 8.40 පාසල් සිසුන්ට ලිංගික අධ්‍යාපනය ලබාදීම කෙරෙහි දෙමාපියන්ගේ කාර්යයභාරය කෙබඳු ද?

ශ්‍රී ලාංකීය සමාජයේ සදාචාරය හා සංස්කෘතියට අනුව ලිංගිකත්වය යන්න දෙමාපියන් සහ දරුවන් අතර නොව වැඩිහිටියන් වැඩිහිටියන් අතර විවෘතව කතා නොකරන මාතෘකාවකි. දෙමව්පියන්ගෙන් ලිංගික අධ්‍යාපනය සඳහා නිවැරදි අඩිතාලමක් නොලැබුණහොත් දරුවා ඒ සම්බන්ධ අතාත්වික ගුණාත්මක බවකින් තොර දැනුමක් මිතුරු මිතුරියන්ගෙන්, නොගැළපෙන පුද්ගලයන්ගෙන්, රූපවාහිනි, චිත්‍රපටවලින්, පත්තරවලින්, අන්තර්ජාලයෙන් ලබා ගැනීමට ඉඩ ඇති බව බොහෝ ගුරුවරුන්ගේ මතය වේ. දෙමාපියන්ගෙන් දරුවන්ට හිමිවන ලිංගිකත්වය හා සම්බන්ධ දැනුම ගැඹුරු දැනුමක් නොවන බවත් කුඩා කල සිට ක්‍රම ක්‍රමයෙන් සිදුවිය යුත්තක් බව ද පෙන්වා දී ඇත. හුදෙක් එය පාසලෙන් ලැබෙන ලිංගික අධ්‍යාපනයට ඇති කරන අඩිතාලමක් විය යුතු බව මොවුන් තව දුරටත් පෙන්වා දෙයි. දරුවන්ට ලිංගික අධ්‍යාපනය ලබා දීම දෙමව්පියන් මුහුණ දෙන විශාල අභියෝගයක් විය හැකි බව මෙහි දී මොවුන් පෙන්වා දෙන දී ඇත. ඇතැම් දෙමවුපියන් මේ පිළිබඳ දරුවා සමඟ කතා කිරීමට ලැජ්ජාසහගත වන බවත්, එය නුසුදුසු ක්‍රියාවක් ලෙස සළකන බවත් මොවුන්ගෙන් බහුතරයකගේ


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මතය වේ. මෙම මතයන්ගෙන් බැහැර ව එය තමාගේ වගකීමක් ලෙස සලකා කුඩා කාලයේ සිට නිවැරදි ලිංගික අධ්‍යාපනයක් පවුල කේන්ද්‍ර කොට ගෙන දරුවන්ට ලබාදීම මගින් යහපත් සමාජයක් ගොඩනැගීමට දායක වීම දෙමාපියන්ගේ කාර්යයභාරයක් බව ද තව දුරටත් ගුරුවරුන් සඳහන් කර ඇත.

## නිගමන හා යෝජනා

### නිගමන

මෙම පරිච්ඡේදය තුළින් සමාජ විරෝධී චර්යාවන් පාලනය සඳහා පාසල තුළ සිදු කරනු ලබන ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනය කිරීමට ශිෂ්‍යයින්ගෙන් සහ ගුරුවරුන්ගෙන් ලබාගත් දත්ත විශ්ලේෂණය කර එළඹි නිගමනයන් ඉදිරිපත් කර ඇත. මෙහි දී පාසල් සිසුන්ගෙන් සහ ගුරුවරුන්ගෙන් ලබාගත් දත්ත සහ තොරතුරු පාදක කරගෙන තිබේ. ඒ අනුව පහත නිගමනයන් ට එළඹිය හැකි ය. මෙම අධ්‍යයනයේ දී ප්‍රශ්නාවලියක් භාවිතයෙන් ශිෂ්‍යයින්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව පහත නිගමනයන්ට එළඹිය හැකි ය. සිසුන්ගෙන් ලිංගිකත්ව අධ්‍යාපනය පිළිබඳ විමසීමේ දී ලිංගිකත්ව අධ්‍යාපනය පිළිබඳ අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය සාධකයකි. එසේ අවබෝධයක් නොතිබුණහොත් ලබාගන්නා තොරතුරු නිරවද්‍යතාවකින් තොර විය හැකි ය. මේ නිසා සිසුන්ට ලිංගික අධ්‍යාපනය පිළිබඳ අවබෝධයක් පවතී ද යන්න විමසා ඇති අතර එහි දී දත්ත ලබාගැනීමට දායක කරගත් සියලු ම සිසුන් ලිංගිකත්ව අධ්‍යාපනය පිළිබඳ අවබෝධයක් පවතින බව පවසා ඇති නිසා සාපේක්ෂ වශයෙන් සිසුන්ට මේ සම්බන්ධ යම් දැනුමක් පවතී යැයි නිගමනය කළ හැකි ය.

සිසුන්ගෙන් ලිංගිකත්ව අධ්‍යාපනය යනුවෙන් හැඳින්වෙන්නේ කුමක් ද යන්න පිළිබඳ දක්වා ඇති පිළිතුරුවලට අනුව සිසු සිසුවියන්ගේ ප්‍රතිචාර එකිනෙකාට අනුව වෙනස් වේ. එහි දී පුරුෂ හා ස්ත්‍රී ලිංගික අවයව පිළිබඳ විස්තරාත්මක ව අධ්‍යයනනය කිරීම, ස්ත්‍රී - පුරුෂ ලිංගික සබඳතා පිළිබඳ අධ්‍යනය කිරීම, ලිංගික රෝග සහ ලිංගික සෞඛ්‍ය පිළිබඳ අධ්‍යනය කිරීම, මානව ප්‍රජනනය පිළිබඳ අධ්‍යයනය යන අංගයන් අතරින් සියල්ල ම අධ්‍යයනය ලිංගික අධ්‍යාපනය යනුවෙන් හැඳින්විය හැකි බව බහුතර ශිෂ්‍ය සංඛ්‍යාවක් එනම් 46.3% ක් ප්‍රකාශ කර තිබේ. නමුත් ඉහත අංගවලට වෙන වෙන ම ප්‍රතිචාර දැක්වූවන් සිටිනුයේ සාපේක්ෂ ව සමාන ප්‍රතිශතයකි. මේ නිසා සිසුන්ගේ අදහසට අනුව ඉහත සියලු අංග පිළිබඳ අධ්‍යයනය ලිංගික අධ්‍යාපනය යනුවෙන් හඳුනාගත හැකි ය. ශ්‍රී ලංකාවවේ සෞඛ්‍ය අධ්‍යාපනය යන විෂය ක්ෂේත්‍රය පාසල් තුළ උගන්වනු ලබන අතර ඒ තුළ ඉගෙනගනු ලබන ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු සීමිත වේ. නමුත් ලිංගිකත්ව අධ්‍යාපනය තුළ සවිස්තරාත්මක ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු විෂය නිර්දේශයානුකූලව ඉගෙනගනු ලබයි. මේ නිසා මෙම දෙක අතර පැහැදිලි වෙනසක් පවතී. මෙම වෙනස පිළිබඳ සිසුන්ගේ පවතින අවබෝධය පිළිබඳ විමසීමේ දී සිසුන් දක්වා ඇති ආකාරයට අවබෝධයක් පවතී සහ නොපවතී යන ප්‍රතිචාර දෙකට ම සමාන ප්‍රතිශත ලැබෙන ආකාරයට සිසුන් ප්‍රතිචාර දක්වා ඇත. මේ අනුව සිසුන්ට සෞඛ්‍ය අධ්‍යාපනය සහ ලිංගික අධ්‍යාපනය පිළිබඳ පැහැදිලි අවබෝධයක් නොමැති බව නිගමනය කළ ඇකිය. එමෙන් ම මොවුන්ට අනුව සෞඛ්‍ය අධ්‍යාපනය සහ ලිංගික අධ්‍යාපනය අතර වෙනස පිළිබඳ එම සිසුන් පෙන්වා දී ඇත්තේ සෞඛ්‍ය අධ්‍යාපනය තුළ ශාරීරික සෞඛ්‍ය පවත්වාගෙන යාම, ව්‍යායාම, නිවැරදි සෞඛ්‍ය පුරුදු, විවිධ ක්‍රීඩා, ආහාර රටා ආදිය පිළිබඳ සෞඛ්‍ය අධ්‍යාපනය තුළ ඉගෙනගන්නා බවත් ලිංගික අධ්‍යාපනය තුළ ලිංගිකත්වය සම්බන්ධ කාරණා එනම් වැඩිවිය පැමිණීම, පුරුෂ සහ ස්ත්‍රී ලිංගික පද්ධතිය, උපත් පාලන ක්‍රම (පවුල් සැලසුම් ක්‍රම), ලිංගික සෞඛ්‍ය (ලිංගික රෝග ආදිය), සෞඛ්‍යමත් ලිංගික සබඳතා, ලිංගික උපදේශනය ආදී කරුණු පිළිබඳ සවිස්තරාත්මක ව අධ්‍යයනය කරන බවත් ය.

පාසල් සිසුන්ට ලිංගික අධ්‍යාපනය හිමිවන වෙනත් මාධ්‍යන් පිළිබඳ ලැබී ඇති තොරතුරු අනුව වැඩි වශයෙන් විද්‍යුත් සන්නිවේදන මාධ්‍යයක් වන අන්තර්ජාලය ප්‍රධානතම ස්ථානයක් ගන්නා බව හඳුනාගත හැකි ය. ඉන් අනතුරුව සමවයස් කණ්ඩායම් මේ සඳහා දායක වේ. ලිංගික අධ්‍යාපනය යන්න පුද්ගලයෙකුගේ ජීවිතයේ වැදගත්ම අත්‍යවශ්‍ය අංගයකි. මේ නිසා සිසුන්ට නිරවද්‍ය ලිංගික අධ්‍යාපනයක් අවශ්‍ය වුව ද මෙවැනි අවිධිමත් ආකාර වලින් වැරදි ලිංගිකත්වය සම්බන්ධ මතවාද සහ කරුණු ළමුන් උකහා ගත හැකි ය. ශ්‍රී ලංකාවේ සමාජය තුළ ලංගිකත්වය යන්න සඟවා තබන මාතෘකාවකි. කිසි විටෙකත් ප්‍රසිද්ධියේ කතාබහකට ලක් වීමක් සිදු නොවේ. මේ වටපිටාව තුළ පාසල තුළ ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳ ඉගෙනීමේ දී විවිධ අපහසුතාවයන්ට ලක් විය හැකි ය. එසේ ඇති විය හැකි අපහසුතාවයන් සම්බන්ධයෙන් දත්ත දායකයින් ලෙස පෙන්වා දී ඇති කරුණු අනුව හඳුනාගත හැක්කේ සිසුන් ලිංගික කරුණු ඉගෙනීමේ දී යහළු හෙහෙළියන්ට මුහුණදීමේ අපහසුතාවයට ලක්වන බවයි. එමෙන් ම ඇතැමුන් ගුරුවරයාට මුහුණ දීමේ අපහසුතාවයන්ට ලක් වෙයි. ඒ අනුව මෙම අධ්‍යයනය තුළ දත්ත දායකයින් වන පාසල් සිසුන් තම සෞඛ්‍ය අධ්‍යාපන විෂය තුළ ඇති ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳ ගුරුවරයා ඉගැන්වීම තුළ ඇතැම් ගුරුවරුන් ලැජ්ජාශීලීත්වයක් පෙන්නුම් කරයි. එමෙන් ම මේ නිසා ගුරුවරුන් ඇතැම් පාඩම් මගහැරීමට පෙළඹී ඇති බව හඳුනාගත හැකි ය. නමුත් මේ පිළිබඳ " නැත " ප්‍රකාශ කර ඇති පිරිස " ඔව් " යනුවෙන් ප්‍රකාශ කර ඇති පිරිසට වඩා අඩු වුව ද එය සැලකිය මට්ටමකට ගුරුවරුන් අතින් සිදුවන බව නිගමනය කළ හැකි ය. මෙහි දී ශ්‍රී ලංකාව තුළ පවතින සංස්කෘතික, ආගමික සහ සදාචාරාත්මක විවිධත්වය තුළ ඇති වී ඇති තත්ත්වය, ගුරුවරයා තුළ ඇති පසුගාමී පෞරුෂ ලක්ෂණයන් මේ සඳහා හේතු වී ඇති බව නිගමනය කළ හැකි අතර අතර ගුරුවරයා තුළ ඉහළ පෞරුෂ ලක්ෂණ පවතී නම් මේ ආකාරයෙන් ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු පිළිබඳ ඉගැන්වීමේ දී ලැජ්ජාශීලීත්වයක් පෙන්නුම් නොකරයි. එමෙන් ම දත්ත දායකයින්ගෙන් 70% ක් පමණ ගුරුවරුන් සමග ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු සාකච්ඡා කළ හැකි බවත් ගුරුවරුන් නිසිපරිදි සම්පූර්ණ කාල පර්ච්ඡේදයේ දී විෂය නිර්දේශය පිළිවෙළකට උගන්වන බව සිසුන්ගෙන් වැඩි


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ප්‍රතිශතයක් ම ප්‍රකාශ කොට තිබේ. මෙය අනාගත ලිංගික අධ්‍යාපනය වර්ධනය කිරීම සම්බන්ධ සාධනීය ලක්ෂණයක් බව පෙන්වාදිය හැකි ය.

පන්ති කාමරය තුළ ලිංගිකත්වය සම්බන්ධ කාරණා ඉගෙන ගැනීමේ දී ශිෂ්‍යයන් මුහුණ දෙන අපහසුතා අධ්‍යනය කිරීම සඳහා විරුද්ධ ලිංගිකයින් (ගැහැණු/ පිරිමි) ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ඉගෙනීම මගින් අපහසුතාවකට පත් වීම සම්බන්ධයෙන් සොයා බැලීමේ දී ශිෂ්‍යාවන් බහුතරයක් පෙන්වා දී ඇත්තේ විරුද්ධ ලිංගිකයන් ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ඉගෙනීම තුළින් අපහසුතාවකට ලක්වන බවයි. නමුත් ශිෂ්‍යයන් පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙයට විරුද්ධ තත්ත්වයක් පවතී. එහි දී බහුතරයක් සිසුන් විරුද්ධ ලිංගිකයන් ඉදිරියේ ලිංගිකත්වය පිළිබඳ ඉගනීම අපහසුතාවකට ලක් නොවන බව පෙන්වා දී ඇත. මේ අනුව සිසුවියන් ලිංගික අධ්‍යාපනය තුළ යම් පසුගාමී මානසික මට්ටමක සිටින බව නිගමනය කළ හැකි ය. එමෙන් ම ඇතැම් කරුණු ඉගෙනීමේ දී විරුද්ධ ලිංගිකයන්ගේ උසුළු විසුළුවලට ලක්වීම මේ සඳහා හේතු වන බව හඳුනාගත හැකි ය. මෙයින් බහුතරයක් ශිෂ්‍යාවන් වන අතර ශිෂ්‍යයින් මේ ආකාරයේ උසුළු විසුළුවලට ලක් වන්නේ ඉතාමත් සුළුවෙනි. තව ද ස්ත්‍රී පුරුෂ වශයෙන් අධ්‍යාපනය ලබන්නන් ලිංගික අධ්‍යාපනය පිළිබඳ දක්වන ආකල්ප වෙනස් වන බව ද මේ නිසා තහවුරු වේ. ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් ව ඉගනීමට කැමැත්තක් දක්වන්නේ ද පිළිබඳ පාසල් සිසුන්ගෙන් විමසීමේ දී බහුතරයක් ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් ව ඉගෙන ගැනීමට කැමැත්තක් නැති බවයි. එය සමස්ත ශිෂ්‍යාවන් සංඛ්‍යාවෙන් 81.25% කි. එසේ ම ශිෂ්‍යාවන් 6 දෙනෙකු දක්වා ඇත්තේ ලිංගික අධ්‍යාපනයේ දී ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් ව ඉගෙනීමට කැමැත්තක් දක්වන බවයි. ශ්‍රී ලංකාව තුළ ලිංගිකත්වය සම්බන්ධ කරුණු ඍජු ව සාකච්ඡා කරන ලිංගික අධ්‍යාපන ක්‍රමවේදයක් නොපවතී. ශ්‍රි ලංකාව තුළ පවතිනුයේ සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රමවේදයක් වන අතර ලිංගිකත්වය හා සම්බන්ධ ව එම විෂය නිර්දේශය තුළින් ප්‍රමාණවත් අධ්‍යාපනයක් හිමි වන්නේ ද යන්න පිළිබඳ සොයා බැලීම කාලීන අවශ්‍යතාවකි. මේ අනුව මෙම අධ්‍යයනයේ දත්ත දායකයින් වන සිසුන් මේ පිළිබඳ ඉදිරිපත් කර අදහස්වලට අනුව " නැත " සහ " නොදනී " යන ප්‍රතිචාරයන්ට වඩා වැඩි සිසුන් ප්‍රතිශතයක් සෞඛ්‍ය අධ්‍යාපනය තුළින් ප්‍රමාණවත් ලිංගික අධ්‍යාපනයක් හිමි නොවන බවයි. මෙයට අමතර ව සිසුන්ගෙන් ලබාගත් දත්තයන්ට අනුව ලිංගික ව සම්ප්‍රේෂණය වන රෝග, පුද්ගලික කටයුතු පහසු කරගැනීමේ ක්‍රම (වැඩි විය පත් වීමෙන් පසු), ඔසප් චක්‍රය හා සම්බන්ධ තොරතුරු, ලිංගික හැඟීම් පාලනය කිරීම, ලිංගික අපයෝජනවලින් ගැලවීමේ ක්‍රම, නවයොවුන් සබඳතා පවත්වා ගැනීම, ලිංගික චර්යා සම්බන්ධ නීති, ලිංගික උපදේශනය වැනි කරුණු පාසල් විෂය නිර්දේශයට අලුතින් එකතු කළයුතු කරුණු වශයෙන් නිගමනය කළ හැකි ය.

සෞඛ්‍ය අධ්‍යාපනය යන වචනය මගින් ම ගම්‍ය වනුයේ එම විෂය නිර්දේශයෙහි මානව සෞඛ්‍ය සම්බන්ධ කරුණු කතාබහට ලක් වන බවයි. එහි දී ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු ද ඇතුළත් කර ඇති අතර එය වර්තමාන තාරුණ්‍යයට කෙතරම් ප්‍රමාණවත් වේ ද යන්න ප්‍රශ්නාර්ථයකි. මේ පිළිබඳ දත්ත දායකයින්ගේ අදහස අනුව 50% වැඩි පිරිසක් පෙන්වා දී ඇත්තේ සෞඛ්‍ය අධ්‍යාපනය මගින් ප්‍රමාණවත් ලිංගිකත්ව පිළිබඳ දැනුමක් නොලැබෙන බවත් 15% ක් පමණ ඒ සම්බන්ධ ව වැටහීමක් නොමැති බවත් පෙන්වා දී තිබේ. මේ අනුව පැහැදිලි වනුයේ සෞඛ්‍ය අධ්‍යාපනය මගින් ප්‍රමාණවත් ලිංගික දැනුමක් නොලැබෙන බවයි. සිසුන්ගෙන් ලැබුණු පිළිතුරු සියල්ල සලකා බලා ලබාගත් තොරතුරු අනුව නිවැරදි ලිංගික අධ්‍යාපනයේ වාසි ලෙස යහපත් සම්බන්ධතා පිළිබඳ හැඟීමක් ඇති කරගැනීම හැකි වීම, යහපත් විනයකින් යුත් පුද්ගලයෙක් වීමට හැකි වීම, ලිංගික අපයෝජනයන්ගෙන් ආරක්ෂා වීමට ඉගෙන ගැනීම හැකි වීම, ශරීරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ අනවශ්‍ය බියක් ඇතිකර නොගැනීමට හැකි වීම, ස්ත්‍රී පුරුෂ වෙනස්කම තුළ අන් අයට ගරු කිරීමට ඉගෙනීමට හැකි වීම, නොගැළපෙන මාධ්‍යවලින් විකෘති තොරතුරු රැස් කිරීමට ඇති ඉඩකඩ අවම වීමට, අනාරක්ෂිත ලිංගික සබඳතාවලට යොමුවීම, කුඩා වයසෙන් ගැබ් ගැනීම වැනි දේ අවම කර ගැනීමට, ලිංගික හැඟීම් පාලනය කරගැනීමට හැකි වීම, සමාජය තුළ සිදුවන සමාජ විරෝධී ක්‍රියාවන්ගෙන් මිදීමට හැකි වීම ආදී වශයෙන් ඉතාමත් වැදගත් වාසි රැසක් නිවැරදි ලිංගික අධ්‍යාපනය ලැබීමෙන් හිමි වන බව නිගමනය කළ හැකි ය.

සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල තුළ සිදුකෙරෙන ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී විරෝධී චර්යාවන් යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද? යන්න පිළිබඳ සිසුන්ගෙන් ලැබී ඇති තොරතුරු අනුව වැඩි ප්‍රතිශතයක් ප්‍රකාශ කොට ඇත්තේ සමාජ විරෝධී චර්යාවන් පිළිබඳ දැනුවත් භාවයකින් යුත් බවයි. මේ අනුව එම සිසුන්ට අනුව සමාජ විරෝධී චර්යාවන් වශයෙන් හඳුනාගෙන ඇත්තේ ස්ත්‍රී දූෂණ, බාල අපචාර, අසභ්‍ය වීඩියෝ දර්ශන නැරඹීම, අඩු වයසින් ගැබ් ගැනීම, ගබ්සාවන් සිදු කිරීම, අඩු වයසින් ලිංගිකව හැසිරීම, අඩු වයසින් ආදර සබඳතා පැවැත්වීම, මත්ද්‍රව්‍ය ආදියට ඇබ්බැහි වීම, කාන්තාවන්ට අතවර කිරීම ආදී වශයෙන් නිගමනය කළ හැකි අතර සමස්තයක් ලෙස ගත්විට එම හඳුනාගෙන ඇති සමාජ විරෝධී චර්යාවන් සමාජය තුළ බහුල ලෙස හඳුනාගත හැකි සමාජ විරෝධී චර්යාවන් වේ. පාසල් සිසුන්ගේ ලිංගික අධ්‍යාපනය පිළිබඳ විමසීමේ දී ලිංගික අධ්‍යාපනය තුළ පාසල් ශිෂ්‍යයකු වශයෙන් චර්යාත්මක ශික්ෂණයක් හිමි වන්නේ දැයි විමසීමේ දී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ මතය වන්නේ ලිංගික අධ්‍යාපනය මගින් පාසල් සිසුන්ට චර්යාත්මක ශික්ෂණයක් හිමවන බවයි.

ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතින කැමැත්ත පිළිබඳ දත්ත ලබාගෙන ඇති අතර ඒ මගින් ලබාගත් දත්ත මගින් කෛ වර්ග පරීක්ෂණය සිදුකර ඇත. ඒ අනුව මෙම උපන්‍යාස පරීක්ෂාවේ එන අප්‍රතිෂ්ඨයේ කල්පිතය වන ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතින කැමැත්ත වෙනස් නොවේ යන්න ප්‍රතික්ෂේප වන අතර වෛකල්පිතය වන ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතික කැමැත්ත වෙනස් වේ යන්න පිළිගැනේ. එහි දී 2


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සුවලන අගයට සහ 0.05 වෙසෙසියා මට්ටමට කෛ වර්ගයේ න්‍යායාත්මක අගය 5.991 කි. පරයේෂණයේ ප්‍රායෝගික ගැටලුවට අදාළ ව ආගණනිත කෛ වර්ග අගය 11.74 කි. ආගණනිත අගය වගුවේ න්‍යායාත්මක අගය ඉක්මවා යන නිසා අප්‍රතිෂ්ඨයේ කල්පිතය ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත් සාක්ෂි පවතී. මේ නිසා කෛ වර්ග පරීක්ෂාවට අනුව ස්ත්‍රී සහ පුරුෂ බව අනුව ලිංගික අධ්‍යාපනය සඳහා සිසුන් තුළ පවතින කැමැත්ත වෙනස් වන බවට නිගමනය කළ හැකි ය.

මෙම අධ්‍යයනයේ දී සම්මුඛ සාකච්ඡා උපලේඛනයක් භාවිතයෙන් ගුරුවරුන්ගෙන් ලබාගත් තොරතුරුවලට අනුව පහත නිගමනයන්ට එළඹිය හැකි ය. මෙහි දී ගුරුවරුන්ගෙන් ලැබී ඇති තොරතුරු අනුව සමාජ විරෝධී චර්යාවන් ලෙස ස්ත්‍රී දූෂණ, ළමා අපයෝජන, අඩු වයස් ගැබ් ගැනීම, අඩු වයස් අවිධිමත් ගබ්සා කිරීම, අඩු වයසින් ලිංගිකව හැසිරීම, අඩු වයසින් ආදර සබඳතා පැවැත්වීම, කාන්තාවන්ට අතවර කිරීම ආදිය හඳුනාගත හැකි බව නිගමනය කළ හැකි ය. එහි දී බොහෝ ගුරුවරුන්ගේ අදහස වූයේ මෙම සමාජ විරෝධී චර්යාවන් ලිංගිකත්වය මත හා අපරාධ ආදී වශයෙන් ලෙස වර්ගීකරණය කළ හැකි බවයි. මෙම අධ්‍යයනයට අනුව ලිංගික අධ්‍යාපනය සම්බන්ධ ඇතැම් පාඩම් ඉගැන්වීමේ දී ගුරුවරයාට කිසියම් වූ අපහසුතාවක් දැනීම සාමාන්‍ය කරුණක් වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව අධ්‍යයනයට ලක් වූ පාසල් ත්‍රිත්වය ම මිශ්‍ර පාසල් වන හෙයින් පන්ති කාමරය තුළ ගුරුවරයා මුහුණ දෙන අපහසුතාවන් ගණනාවක් පවතී. ඒ අනුව ලිංගිකත්වය සම්බන්ධ පාඩම් ගුරුවරයා විසින් උගන්වන අවස්ථාවේ දී සිසුන් විසින් අසනු ලබන ප්‍රශ්න හේතුවෙන් ගුරුවරයාට ලැජ්ජාශීලීත්වයක් ඇති වේ. එයට හේතු ලෙස සිසුන්ගෙන් අසන ප්‍රශ්නවලට සිසුන් පිළිතුරු ලබා නොදීමත්, ගුරුවරුන්ට පන්තිය හසුරවා ගත නොහැකි වීමත්, ඇතැම් කාරණාවක් වක්‍රාකාරයෙන් තේරුම් කිරීමට යාමෙන් ළමුන් වැරදි ලෙස එය තේරුම් ගැනීමට උත්සාහ කිරීමත් සහ ශිෂ්‍යයන් ලිංගිකත්වය සම්බන්ධ කාරණා හාස්‍යයට ගැනීමත් යන කරුණු හඳුනාගත හැකි විය.

අධ්‍යයනයට යොදාගත් පාසල් පරිසරය තුළ සමාජ විරෝධී චර්යාවන් සඳහා ළමුන් ලක් වී ඇති බවත් ඇතමුන් සමාජ විරෝධී චර්යාවන්ට යොමු වී ඇති බවත් මෙහි දී හඳුනාගත හැකි ය. එහි දී බාලාපචාර, ජංගම දුරකථන, පරිගණක තුළින් අසභ්‍ය දර්ශන නැරඹීම, ලිංගික අපහරණයට ලක්වීම ආදී සමාජ විරෝධී චර්යාවන් මෙම පාසල්වලින් වාර්තා වන සමාජ විරෝධී චර්යාවන් ලෙස හඳුනාගත හැකි ය. මේ සඳහා බලපෑ සාධක ගණනාවක් ගුරුවරුන් විසින් මෙහි දී පෙන්වා දී ඇත. ඒ අනුව අධ්‍යයනයට ලක් වූ පාසැල්වල සමාජ විරෝධී චර්යාවන් ඇති වීම සඳහා බලපෑ සාධක ලෙස, ලිංගික අධ්‍යාපනයක් නොමැතිවීම, පවුල් පසුබිම තුළ ඇති ගැටලුකාරී තත්ත්වයන් හා දෙමවුපියන්ගේ අවධානයක් හා මගපෙන්වීමක් දරුවන් කෙරෙහි නොමැති වීම, ජනමාධ්‍ය මගින් ලැබෙන වැරදි තොරතුරු, ජංගම දුරකථන භාවිතය, නොගැළපෙන පුද්ගලයින් ඇසුරු කිරීම ආදිය හඳුනාගත හැකි ය. ඉහත සාධක අතර ලිංගික අධ්‍යාපනයක් නොමැති වීම ප්‍රධාන හේතුවක් ලෙස නිගමනය කළ හැකි ය. ගුරුවරුන් ලෙස සිසුන්ට ලිංගික අධ්‍යාපනයක් ලබා දීමේ දී ඇති වැදගත්කම ලෙස, ළමා අපචාර අඩු කිරීමටත්, වැළැක්වීමටත් දීර්ඝකාලීන පිළියමක් ලෙස ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පාසල් විෂය නිර්දේශය හඳුන්වා දියයුතු බවත් ලිංගික අධ්‍යාපනයක් ලබාදීම තුළින් ළමුන් තමන්ගේ මිත්‍ර කණ්ඩායම් මගින් හෝ අසත්‍ය තොරතුරු ලබා ගැනීමට පෙළඹීම වැළැක්විය හැකි බවත් ය. අඩු වයස් ගැබ් ගැනීම්, උපත් පාලනය, ලිංගික අප අපයෝජනය, ළදරු මරණ අනුපාතිකය අඩු වීම මෙහි දී සිදුවෙයි. එසේ ම සමාජයේ කාන්තාවන් ගණිකා වෘත්තියට යොමු වීම ද මෙහි දී අඩුවෙන බව නිගමනය කළ හැකි ය.

අධ්‍යයනය සඳහා යොදාගත් පාසල් තුළ උපදේශන සේවාවක් ක්‍රියාත්මක වන්නේ ද? යන්න පිළිබඳ සොයා බැලීමේ දී පර්යේෂිකාව විසින් අධ්‍යයනයට ලක් කළ පාසල් ත්‍රිත්වයෙන් හ/උතුරු කණුමුල්දෙණිය පාසලෙහි පමණක් උපදේශන සේවාවක් ක්‍රියාත්මක වන අතර අනෙකුත් පාසල් වන හ/ ඕලුආර බණ්ඩාරනායක කනිෂ්ඨ විද්‍යාලය හා කන්දබැද්ද කනිෂ්ඨ විද්‍යාලය යන පාසල දෙකෙහි උපදේශන සේවාවක් ක්‍රියාත්මක නොවෙන බවයි. ලිංගික අධ්‍යාපනය ලබා දීමේ දී ලිංගික කරුණු පිළිබඳ සාකච්ඡා කරන බැවින් ඒ පිළිබඳ ගුරුවරයාට මෙන් ම ශිෂ්‍යයාට ද ලැජ්ජාවක්, බියක්, සන්නිවේදන අපහසුතා ඇතිවිය හැකි අතර ගුරුවරයා විසින් ලිංගික අධ්‍යාපනය තුළ සුවිශේෂ වූ පෞරුෂ ගුණාංග වර්ධනය කරගත යුතු ය. තව ද ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවය ම අපහසුතාවයක් නොවන පරිදි ලිංගික අධ්‍යාපනය ලබා දීමට ගුරුවරයා වග බලාගත යුතු ය. ඒ අනුව ගුරුවරයකු විසින් ප්‍රගුණ කළ යුතු ප්‍රධාන පෞරුෂ ලක්ෂණ මෙහි දී හඳුනාගෙන ඇත. ඒ අනුව නිවැරදි සන්නිවේදනය, සබකෝලයෙන් තොරවීම, සෘජු බව, නිවැරදි දැනුම, ඉවසීම, ඇහුම්කම් දීම යන ආදිය ලක්ෂණ ගුරුවරුන් තුළ පැවතිය යුතු බව නිගමනය කළ හැකි ය.

පාසල් සිසුන්ට ලිංගික අධ්‍යාපනය ලබාදීම කෙරෙහි බලපාන සමාජ සංස්කෘතික බාධාවන් ලෙස බෞද්ධ සංස්කෘතික වටපිටාවක් තුළ බටහිර සංස්කෘතික වටපිටාවට වඩා පටු ආකල්පයකින් ලිංගිකත්වය දෙස බලයි. මේ නිසා නිවැරදි ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු නව යෞවනයන්ට නිසි කාලයේ දී හිමි නොවීම තුළ විවිධ ගැටලු පැන නැගිය හැකි ය. මීට අමතර ව සමාජ බාධාවක් ලෙසින් ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු වැඩිහිටියන්ට පමණක් වෙන් වූ මාතෘකාවක් ලෙස වෙන් ව පැවතීමයි. ඇතමුන් පෙන්වා දී ඇත්තේ ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු ප්‍රසිද්ධියේ කතා නොකරන දෙයක් යැයි ඇති පුහු සමාජ ආකල්පයයි. මෙය වර්තමානය වන විට අඩු ප්‍රවණතාවක් වුව ද එම ආකල්පය ඇතැම් අවස්ථා වලදී ඉස්මතු වන බව පෙනේ. දරුවන්ට ලිංගික අධ්‍යාපනය ලබා දීම දෙමව්පියන් මුහුණ දෙන විශාල අභියෝගයක් විය හැකි ය. ඇතැම් දෙමවුපියන් මේ පිළිබඳ දරුවා සමඟ කතා කිරීමට ලැජ්ජාසහගත වන බවත්, එය නුසුදුසු ක්‍රියාවක් ලෙස සළකන බවත් මොවුනගෙන් බහුතරයකගේ මතය වේ. මෙම මතයන්ගෙන් බැහැර ව එය තමාගේ වගකීමක් ලෙස සලකා කුඩා කාලයේ සිට නිවැරදි ලිංගික අධ්‍යාපනයක් පවුල කේන්ද්‍ර කොට ගෙන දරුවන්ට


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ලබාදීම මගින් යහපත් සමාජයක් ගොඩනැගීමට දායක වීම දෙමාපියන්ගේ කාර්යයභාරයකි.

**යෝජනා**

මෙම පර්යේෂණයෙන් අනාවරණය වූ කරුණු අනුව පහත සඳහන් යෝජනාවන් පෙන්වා දිය හැකි ය.

- දෙමාපියන් විසින් දරුවන්ට කුඩා කාලයේ සිටම ලිංගිකත්ව අධ්‍යාපනය සඳහා මූලික අඩිතාලම දැමිය යුතු ය.
- මව හෝ පියා දරුවන්ට නිසි වයසේ දී ලිංගිකත්වය පිළිබඳ දැනගත යුතු මූලික කරුණු පිළිබඳ දැනුමක් ලබා දිය යුතු ය.
- දෙමවුපියන් විසින් දරුවන්ට කුඩා කාලයේ සිට සමාජ සාරධර්ම පිළිබඳ අවබෝධයක් ලබා දිය යුතු ය.
- ලිංගිකත්වය යන්න පිළිබඳ පවතින අනියත බිය දුරු වන ලෙස පාසල් තුළ ඒ සම්බන්ධව ඉගැන්වීමට පෙර සිසුන් දැනුවත් කළ යුතු ය.
- පාසල තුළ විධිමත් විෂය නිර්දේශයක් යටතේ දරුවන්ට ලිංගික අධ්‍යාපනය ලබාදිය යුතු ය.
- ලිංගික අධ්‍යාපනය හිමි වන වයස් සීමාව තව දුරටත් පුළුල් කළ යුතු ය.
- පාසල් විෂය නිර්දේශයට ලිංගික උපදේශනය යන අංශය ඇතුළත් කළ යුතු ය.
- සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය වෙනුවට ශාරීරික සහ ලිංගිකත්ව අධ්‍යාපනය යනුවෙන් විෂය නිර්දේශය වෙනස් කළ යුතු ය.
- ලිංගිකත්ව අධ්‍යාපනය උගන්වන ගුරුවරුන් සඳහා විශේෂ පුහුණුවක් ලබා දිය යුතුය.
- ලිංගිකත්ව අධ්‍යාපනය ලබා දීමේ දී ඒ ඒ වයස් සීමාවන්ට අනුකූලව ගැළපෙන ලිංගිකත්වය හා සම්බන්ධ කරුණු ඇතුළත් කළ යුතු ය.
- ගුරුවරුන් ලිංගිකත්ව අධ්‍යාපනය ඉගැන්වීමේ දී ඉහළ පෞරුෂයකින් යුතුව ඉගැන්වීමේ ක්‍රියාවලියේ නිරත විය යුතු ය.
- ගුරුවරුන් ඉගැන්වීමේ දී වචන භාවිතයේ දී පරික්ෂාකාරීව කටයුතු කළ යුතු ය.
- ගුරුවරුන් ස්ත්‍රී පුරුෂ බේදයකින් තොර ව සිසුන්ට ඇතිවන ගටලුවලට සාවධානව පිළිතුරු ලබා දිය යුතු ය.
- දෙමවුපියන්ට දරුවන්ට ලිංගික අධ්‍යාපනය ලබා දීමේ වැදගත්කම පිළිබඳ දැනුවත් කළ යුතු ය.
- පාසැල්වලට ලිංගික අධ්‍යාපනය සහ ලිංගික උපදේශනය පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත ගුරුවරුන් බඳවාගැනීම කළ යුතු ය.
- සිසුන්ගේ ලිංගික සහ පෞද්ගලික ගැටලු පිළිබඳ සාකච්ඡා කර විසඳුම් ලබාදීම සඳහා උපදේශන වැඩපිළිවෙලක් සකස් කිරීම.
- පාසල තුළ සහ ග්‍රාමීය වශයෙන් සමාජ විරෝධී චර්යාවන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ඇති කිරීම.
- ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ ජනමාධ්‍ය මගින් දැනුවත් කිරීම.
- සමාජ විරෝධී චර්යාවන් පාලනය සඳහා නව නීති රීති සම්පාදනයට කටයුතු කිරීම.
- සමාජයේ ලිංගිකත්වය හා සම්බන්ධව නිර්මාණය වී ඇති දුර්මතයන් පිටුදැකීමට කටයුතු කිරීම.
- පාසල් දරුවන්ට ස්මාර්ට් ජංගම දුරකතන ලබා නොදීම මගින් වැරදි තොරතුරු අන්තර්ජාලය හරහා ඉගෙනීම වැළැක්වීම.
- දරුවන් ඇසුරු කරන බාහිර කණ්ඩායම් සහ යහළු යෙහෙළියන් පිළිබඳ අවධානයෙන් පසුවීම.

මීට අමතර ව මෙම අධ්‍යයනය මගින් ලැබී ඇති තොරතුරු පාදක කරගනිමින් පාසල් සිසුන්ට ලබාදිය යුතු ලිංගික අධ්‍යාපනය හා සම්බන්ධ පෙළපොතකට ගත හැකි විෂය නිර්දේශයක් පහත පරිදි යෝජනා කළ හැකි ය. පාසල් සිසුන් සඳහා ප්‍රජනන සෞඛ්‍යය ඉගැන්වීමේ අත් පොතෙහි අඩංගු විය යුතු විෂය කරුණු

1.0 ප්‍රජනක සෞඛ්‍ය හැඳින්වීම

1.1 නව යොවුන් විය

1.2 නව යොවුන් වියේ ගැහැනු දරුවා

1.3 නව යොවුන් වියේ පිරිමි දරුවා

2.0 ප්‍රජනක පද්ධතිය

2.1 ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය

2.2 ඔසප් චක්‍රය

2.3 පුරුෂ ප්‍රජනක පද්ධතිය

3.0 නව යොවුන්විය ආශ්‍රිත ගැටලු


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

3.1 නව යොවුන් විය ප්‍රමාදවීම හඳුනා ගැනීමේ සාධක

3.2 පුරුෂ ප්‍රජනක පද්ධතිය පිළිබඳ මිථ්‍යා මත

4.0 ලිංගික ව සම්ප්‍රේෂණ වන රෝග තත්ත්වයන්

5.0 ඔසප් චක්‍රයට අදාළ ස්වස්ථතාව පවත්වා ගැනීම

5.1 ඔසප් වීමේ ස්වස්ථතාව අදාළ ව භාවිත කළ හැකි මෙවලම්

5.2 පරිසර හිතකාමී ලෙස සනීපාරක්ෂක මෙවලම් ඉවත දැමීම

5.3 සනීපාරක්ෂක උපකරණ මාරුකරන ක්‍රමවේද

5.4 පුද්ගලික ස්වස්ථතාව අදාළ පොදු ක්‍රියාමාර්ග පවත්වා ගැනීම

5.5 ඔසප්වීමේ ස්වස්ථතාවට අදාළ මිත්‍යා මත

6.0 පුද්ගලික ස්වස්තථතාව රැකගත හැකි ක්‍රම

6.1 පෞද්ගලික ස්වස්තථතාව සඳහා අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග

6.2 ප්‍රථම වරට මුහුණේ ඇති රැවුල කපා ගැනීම

7.0 නව යොවුන් වියේ දී සිසුන්ට මුහුණ දීමට සිදුවනවන අභියෝග

7.2 ප්‍රේම සම්බන්ධතා ඇති කර ගැනීම

7.2 අසභ්‍ය චිත්‍රපටි බැලීම

8.0 මානව ලිංගිකත්වය හැඳින්වීම

9.0 ලිංගික අභියෝග ජය ගනිමු

9.1 ලිංගික හැඟීම් ඇතිවීම සහ පාලනය කරගැනීම

9.2 අන් අයෙකු ලිංගික සම්බන්ධතාවකට සෘජු ව හෝ වක්‍රාකාරයෙන් පෙළඹීමක් ඇති කිරීම

9.3 ලිංගික අපයෝජනවලින් (ලිංගික බලහත්කාරකම් වලින්) වැළකීම

10.0 නව යොවුන් වියේ පවත්නා සම්බන්ධතා ගොඩනගා ගැනීම

11.0 දෙමාපිය වගකීම්

12.0 යහපත් පවුල් ජීවිතයක් සඳහා පවුල් සැලසුම් කිරීම

13.0 ලිංගික චර්යාව හා නීතිය

14.0 ලිංගික උපදේශනය

## පරිශීලිත මූලාශ්‍රය


අතුකෝරළ, ඩී. ආර්. (2003). ස්වර්ණමය යෞවනය. නවයොවුන් සබඳතා. කඳාන; පුබුදු ප්‍රින්ටර්ස්.

අබේපාල, ආර්. (1996). නව යොවුන් විය පිළිබඳ සංකල්ප අධ්‍යනය. නව යොවුන් සංකල්ප. කොළඹ විශ්ව විශ්වවිද්‍යාලය.

අමරසේකර, ඩී (2012). අපරාධ විද්‍යාව. අපචාරී චර්යා. වරකාපොළ; ආරිය ප්‍රකාශකයෝ.

කංකානම්ගේ, එම්. (2003). මිනිසා සහ ලිංගිකත්වය. අසම්මත චර්යා. රඹුක්කනඃ මිත්‍ර ප්‍රකාශන.

කරුණාතිලක, කේ. (1990). අපරාධ විද්‍යා ප්‍රවේශය. කොළඹ; මාලිංග ප්‍රකාශකයෝ.

කරුණාතිලක, කේ. (1998). අපරාධ, බාලාපරාධ සහ පුනරුත්ථාපනය. කොළඹ; මාලිංග ප්‍රකාශකයෝ.

කුරේ, කේ. එන්. (2016). ලිංගික සමාජ රෝග සහ මානසික රෝග. සමාජ විරෝධී චර්යා. මොරටුව; සී. එන්. සී ප්‍රකාශන.

ගලප්පත්ති, වි. (2016). දෙමාපියන්ට මගපෙන්වීමක්. ලිංගිකතාවය සහ අබලතාවය. මීගමුවඃ අරටුව ප්‍රකාශන.

ගලප්පත්ති, වි. (2016). ලිංගිකතාවය සහ අබලතාවය. ලිංගික අධ්‍යාපනය යනු කුමක්ද? එය ලැබිය යුත්තේ ඇයි?. මීගමුවඃ අකුර ප්‍රකාශන.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය. (2015). සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය. 10, 11 සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය. මහරගම; ජාතික අධ්‍යාපන ආයතනය.

ජයතුංග, එන්. (2010). ශ්‍රී ලංකාවේ අපරාධ හා එහි සමාජ සංස්කෘතික පසුබිම. බාලාපචාරය. කොළඹ; ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයවීර, එස්. (2008). සමාජ විචාර ලිපි. අපගාමී චර්යාවේ ස්වභාවය. නුගේගොඩ; සරසවි ප්‍රකාශකයෝ.

ජයසිංහ, ආර්. (1998). ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය. සමාජ සංවර්ධනය. කොළඹ; ශ්‍රී ලංකා රාජ්‍ය මුද්‍රණ දෙපාර්තමේනතුව.

ජයසිංහ, ඒ. කේ. ජී. (2013). සමාජ විද්‍යාව. මූලික සංකල්ප. කඩුල්ල ප්‍රකාශන; කොළඹ.

ජාතික අධ්‍යාපන ආයතනය. (1989). අධ්‍යාපන මනෝවිද්‍යාව. අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම. මහරගම; ජාතික අධ්‍යාපන ආයතනය.

ඥානදාස, පී. (2009). ලිංගික උපදේශනය. අපගාමී ලිංගික චර්යාවන්. කොළඹ; සහස්‍ර ප්‍රකාශන. 157



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දයාරෝහණ, ඒ. (1991). ළමා මනෝවිද්‍යාව හා ළමා සංවර්ධනය. ළමුන් වර්ගීකරණය. පානදුර; ශික්ෂා මන්දිර ප්‍රකාශන.

පෙරේරා, එස්. (2006). සමාජ ගැටළු. වර්තමාන සමාජයේ තරුණ ගැටලු. නුගේගොඩ; වින්දන ප්‍රකාශන.

බෝපෙආරච්චි, ඒ. (1998). පිළිබිඹුව සහ නොපෙනෙන සැබෑව. යෞවනය හා තාරුණ්‍යය. කර්තෘ ප්‍රකාශන.

මුණසිංහ, එම්. (1997). මානසික කැළඹුම් සහ උපදේශනය. ලිංගික අධ්‍යාපනය පක්ෂ විපක්ෂ මතවාද. මහරගම; තරංජි ප්‍රින්ටර්ස්.

රත්නපාල, එන්. (1990). අපරාධ විද්‍යාවේ මූලධර්ම. ලිංගික අපරාධ. වරකාපොළ; ආරිය ප්‍රකාශකයෝ.

ලොවෙල්, කේ. ආර්. (1981). අධ්‍යාපන මනෝවිද්‍යාව සහ ළමයා. අපචාරීභාවය. කොළඹ; තිසර මුද්‍රණාලය.

සම්පත් පැතිකඩ. (2019). ප්‍රදේශයේ අධ්‍යාපනික තත්ත්වය. ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පාසල්වල තොරතුරු. ඕකෙවෙල; ප්‍රදේශීය ලේකම් කාර්යාලය.

හෙට්ටිආරච්චි, එච්. (2015). යොවුන් වියට ලිංගික අධ්‍යාපනය. නිවැරදි ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම. බත්තරමුල්ල; සදීප ප්‍රකාශන.

හෙට්ටිආරච්චි, එච්. (2017). ලිංගිකත්වය හා ලිංගික සෞඛ්‍යය. ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම. බත්තරමුල්ල; සදීප ප්‍රකාශන.

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (1963). සිංහල විශ්ව කෝෂය. අපචාරීභාවය. කොළඹ; සංස්කෘතික දෙපාර්තමේන්තුව.

Ajith, D. (2017). *School textbooks and reproductive education in Sri Lanka*. Retrieved from: https://www.ivoice.lk/school_text_books_sri_lanka_sinhala?id=188. (2019.10.12).

Akush, F. (1986). *Sex education of girls (materials for a talk with adolescent girls and young women).* Retrieved from : https://www.ncbi.nlm.nih.gov/pubmed/3639024. (2019.10.02).

Ann, C et al. (1996). *Sex education for students with severe learning difficulties. Health Education*.Vol. 96 Issue: 6. p.11-18. Retrieved from: https://doi.org/10.1108/09654289610148395. (2019.06.10).

Anthony, J and Williams, S. (1994). *Sex Education: One Comprehensive's Experienc*e. Health Education. Vol. 94 Issue: 4. pp.23-26. Retrieved from: https://doi.org/10.1108/09654289410064417. (2019.06.10).

Australian Parentin Website. (2019*). Sex education and talking with children about sex: 0-8 years.* Retrieved from: https://raisingchildren.net.au/school-age/development/sexual-development/sex-education-children. (2019.10.20).

Berry street. (2019). *Abnormal sexual behavior*. Retrieved from: https://www.berrystreet.org.au/child-abuse-and-neglect/abnormal-sexual-behaviour. (2019.07.25).

Burt, J.J et al. (1970). *Education for Sexuality. Concepts and Programs for Teaching*. Retrieved from: https://eric.ed.gov/?id=ED117083. (2019.06.10).

Bustle. (2019). 1*7 Important Things They Should Teach in Sex Education But don't.* Retrieved from: https://www.bustle.com/articles/46868-17-important-things-they-should-teach-in-sex-education-but-dont. (2019.11.10).

Charles, A. E. (1912). *Lombroso 's Theory of Crime. Journal of criminal law and criminology.* Retrieved from: https://scholarlycommons.law.northwestern.edu/cgi/viewcontent.cgi?article=1128&context=jclc. (2019.07.02).

Claire, M. (2006). *Context and contextualisation in sex and relationships education*. Health Education, Vol. 106. Issue: 6, pp.437-449. Retrieved from: https://doi.org/10.1108/09654280610711398. (2019.06.09).

Coleman, E. (2002). *Promoting sexual health and responsible sexual behavior: An introduction. The Journal of Sex Research*. Volume 39, pp138-139, Kluwer Dordrecht: Academic Publishers.

Cortes, N., Eisler, A., & Desiderio, G. (2016). *Tip sheet.* Gender, sexuality, and inclusive sex education. Baltimore; Healthy Teen Network.

 © 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Daniel, W. (1999). *Limits to empowerment-based sex education.* Health Education, Vol. 99 Issue: 6, pp.233-243 Retrieved from: https://doi.org/10.1108/09654289910302291. (2019.07.12).

Daniel, W.(1997). *Does sex education make a difference?*. Health Education. Vol. 97 Issue: 2, pp.52-56, Retrieved from: https://doi.org/10.1108/09654289710158375. (2019.06.10).

Daschel, R. L. (2012). *The Effectiveness of Sex Education Programs in the Schools. Phd thesis.* University of Wisconsin-Stout. Graduate School.
David, C. (2019). *Animal Sexuality*. Retrieved from: https://www.researchgate.net/publication/14913950_Animal_Sexuality. (2019.08.11).

David, P. (1999). *Sex education policies in schools: the first hurdle*. Health Education. Vol. 99. Issue: 3. pp.110-116. Retrieved from: https://doi.org/10.1108/09654289910272772. (2019.06.10).

De Silva, H. (1997). *Child abuse in Sri Lanka.* Ceylon Journal of Child Health.

Dennis, A.F. (2009). *Sexuality education in South Africa: Three essential questions. International Journal of Educational Development*. Volume 30, Issue 3, pp 314-319.

Department of Health (2012). *Talk soon, talk often.* Perth; Government of Western Australia. http://healthywa.wa.gov.au/~/media/Files/HealthyWA/Original/Sexual-health/TSTO_V2.ashx. (2019.08.11).

Dicenso, A et al. ( 2002*). Interventions to reduce unintended pregnancies among adolescents: systematic review of randomized controlled trials.* BMJ (Clinical research ed.*)*. **324** (7351. Retrieved from: https://www.cochranelibrary.com/cdsr/doi/10.1002/14651858.CD005215.pub3/epdf/full. (2019.07.02).

Dicenso, A et al. (2002). *Interventions to Reduce Unintended Pregnancies Among Adolescents: Systematic Review of Randomized Controlled Trials*. British Medical Journal. 324 (7351). Retrieved from: https://doi.org/10.1136/bmj.324.7351.1430. (2019.06.10).

Edwin, D. D. (1957). *Pioneers in Criminology* XIV--Charles Buckman Goring. Journal pf criminal law and criminology. Retrieved from: https://scholarlycommons.law.northwestern.edu/cgi/viewcontent.cgi?article=4531&context=jclc. (2019.06.14).

Ferry, S. (2010). *Psychology and Law.* A Critical Introduction to children and Law. UK; Cambridge University Press.

Fraudian Psychology. (1939). *Sigmund Freud*. Retrieved from: https://www.psychologistworld.com/psychologists/sigmund-freud. (2019.07.02).

Gekoski, A.(2016). *The prevalence, nature, and impact of interfamilial child sexual abuse.* findings from a rapid evidence assessment. Journal of Criminological Research. Vol. 2 No. 4, pp. 231-243.

Groundviews. (2019). *Sri Lanka's Pandemic of Sexual Violence*. Retrieved from: https://groundviews.org/2018/04/26/sri-lankas-pandemic-of-sexual-violence/. (2019.07.12).

Hand book on Educational Psychology. (1996). *MEHE GTZ, Vol 1.* Battaramulla: Ministry of education and higher education.

Hearnshaw, L. (1979). *Ithaca.*Cyril Burt: Psychologist. NY: Cornell University Press.

Inayathullah, H. (2017). *Age-appropriate sex education. A must in schools.* Sunday Observer. Colombo; Lake house.

John H. L and Robert J. S. (1991). *The Sutherland-Glueck Debate: On the Sociology of Criminological Knowledge.* American Journal of Sociology. Vol. 96, pp. 1402-1440.

Juping,Y. (2010). *Sex education beyond school: Implications for practice and research. Sex Education.* Retrieved from : 10. 187-199. 10.1080/14681811003666515. (2019.07.07).

Kamin, L. J. (1974). *The science and politics of IQ. Potomac.* MD; Lawrence Erlbaum Associates.

 © 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Karofsky, P. S. (2000). Relationship between adolescent parental communication and initiation of first intercourse by adolescents. Journal of Adolescent Health, 28, pp 41-45.

Kearney, C. A. (2008). *School absenteeism and school refusal behavior in youth: a contemporary review*. Vol:28(3). pp.451-71. Retrieved from: https://www.ncbi.nlm.nih.gov/pubmed/17720288 . (2019.06.07).

Kehily, M. J and Nayak, A. (2001*). Schoolgirl frictions: Young women, sex education and social experiences*. Genders and Sexualities in Educational Ethnography (Studies in Educational Ethnography, Volume 3. Melbourne; Emerald Group Publishing Limited.

Kellogg, E., & Stepan, J. (1978). *Legal Aspects of Sex Education.* The American Journal of Comparative Law. 26(4). 573-608.

Kimberly, R. M. and Dennis, J. F. (2019). *Heterosexual Anal Sexuality and Anal Sex Behaviors.* Retrieved from: https://www.tandfonline.com/doi/abs/10.1080/00224490903402538?src=recsys&journalCode=hjsr20. (2019.17.18).

Kirby, D. (2001). *Emerging Answers: Research Findings on Programs to Reduce Teen Pregnancy.* National Campaign to Prevent Teen Pregnancy. Retrieved from: https://eric.ed.gov/?id=ED456171. (2019.07.05).

Kirby, D. (2007). *Emerging Answers 2007: Research Findings on Programs to Reduce Teen Pregnancy and Sexually Transmitted Diseases. National Campaign to Prevent Teen Pregnancy.* Retrieved from: https://powertodecide.org/sites/default/files/resources/primary-download/emerging-answers.pdf. (2019.06.11).

Kirkendall, L. A. et al. (1968). *Sex Education Research.* Mental and Physical Health American Educational Research Association. Vol. 38. pp. 528-544.

Krebbekx, W. (2018). *What else can sex education do? Logics and effects in classroom practices.* Sage Journals. Retrieved from: https://journals.sagepub.com/doi/full/10.1177/1363460718779967. (2019.10.10).

Krzaklewska, E. (2016). *Future agenda for youth research – exploring young people's lives for development of youth policy and youth work.* Pp. 5-7. Poland; Jagiellonian University in Krakow.

Line, A. R et al. (2018). *The research landscape of school-based sexuality education: Systematic mapping of the literature*. Health Education. Vol. 118 Issue: 2. pp.159-170. Retrieved from: https://doi.org/10.1108/HE-05-2017-0030.(2019.07.05).

Manoj, T. (2018). *Complete sex education produces a trustworthy and safe sex creature.* Retrieved from: https://outboundtoday.com/health-sex-edu/. (2019.08.20).

McAvoy, P. (2013). *The Aims of Sex Education: Demoting Autonomy and Promoting Mutuality.* Wiley online library. Retrieved from: https://onlinelibrary.wiley.com/doi/abs/10.1111/edth.12036. (2019.07.16).

Ministry of Women & Child Affairs and Social Security. (2019). *The Convention on the Rights of the Child.* Retrieved from: http://www.childwomenmin.gov.lk/institutes/dep-probation-and-child-care-services/child-rights/crc. (2019.07.10).

NCSBY. (2019). *What is problematic sexual behavior?.* Retrieved from: http://www.ncsby.org/content/what-problematic-sexual-behavior. (2019.11.20).

New Straits times. (2019). *What to teach in sex education.* Retrieved from: https://www.nst.com.my/opinion/columnists/2019/01/452079/what-teach-sex-education. (2019.10.05).

Nicholas, B. (2015). *Sex-Education in France: A Case-Study in Curriculum Change.* Vol. 12, No. pp. 115-128. France; French Publishers.

Oringanje et al. ( 2009). *Interventions for preventing unintended pregnancies among adolescents.* The Cochrane database of systematic reviews (4). Retrieved from: https://www.ncbi.nlm.nih.gov/pubmed/19821341 . (2019.06.11).


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

Parker, R et al (2009). *Sexuality Education in Europe*: An Overview of Current Policies. Sex Education. 9. Pp 227-242. Britain; Aston Publishers.

Perera, N. (2019). *How to talk to your child about sex education?. The Asian parent sri lanka.* Retrieved from: https://lk.theasianparent.com/sex-education-for-kids-sri-lanka. (2019.12.02).

Psychiatric times. (2019). *Ramifications of Incest*. Retrieved from: https://www.psychiatrictimes.com/sexual-offenses/ramifications-incest. (2019.08.14).

Psychiatry. (2019). *Understanding and Managing Compulsive Sexual Behaviors.* Retrieved from: https://www.ncbi.nlm.nih.gov/pmc/articles/PMC2945841/. (2019.11.10).

Psychology today. (2019). *Exhibitionism*. Retrieved from: https://www.psychologytoday.com/intl/conditions/exhibitionism. (2019.11.10).

Ratnaweera, O. (2016). *Education on Sexual and Reproductive Health for Undergraduates*. Retrieved from: https://www.lk.undp.org/content/srilanka/en/home/Blog/2016/2/24/Education-on-Sexual-and-Reproductive-Health-for-Undergraduates.html. (2019.07.02).


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
දහහතරවන කලාපය 2022 දෙසැම්බර්
පිටු 71-82
ISSN 1800-1459 eISSN 2386-2041
© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සිංහල නවකතාවෙන් නිරූපිත යටත්විජිත යුගයෙහි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදු වූ සමාජ විපර්යාස : තෝරාගත් සිංහල නවකතා කිහිපයක් ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක්

# (Social changes in the Sri Lankan Society during the colonial period depicted in the Sinhala novel: An Investigative study based on selected Sinhala novels)

ඩබ්. ඩී. එන්. ඩබ්. කුමාරි[1], සහ චම්පා එස්. ද සිල්වා[2] සහ ඩබ්. එම්. ආරියරත්න[3]

භාෂා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා භාෂා පීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය
***nethmawathsala56@gmail.com**

## Abstract

The period of the middle 19th century to the beginning of the 20th century can be identified as a period that made distinct changes in the culture that existed in this country until then. This study explores how the social transitions in the colonial period are mirrored in the Sinhala novels. A study has hardly been done on how the social transitions of the mid-19th century to the beginning of the 20th-century colonial period are depicted in the Sinhala novels. Henceforth, the objective of this study is to explore how the social, cultural, educational, religious, and economic changes are portrayed in the Sinhala novels. In this qualitative research, the unit of analysis is the selected Sinhala novels; the 'Kuṇḍāvāḍaya' by Langani Fernando Abedeera, 'Maḍaran', by Sena Thoradeniya, 'Māṇikkāvata', by Mahinda Prasad Masimbula, 'Dulvala alaṁkārē' by Sumudu Niragi Senevirathne and 'Sakkāraṁ' by Chamminda Welagedara. Reviewing the content of those selected novels and archive references were the data collection methods deployed. Content analysis and interpretation were used as data analyzing methods. Through this study, it was clearly identified that these socio-cultural changes which have affected Sri Lankan society during the period of the colonial era, both in a positive and a negative way, have been depicted in Sinhala novels. Hence, Sri Lankan colonial era can be identified as a fertile ground that provides the seed to the Sinhala novelists. Further, Social transitions that occurred in Sri Lankan society from the middle 19th century to the beginning of the 20th century were the subject matter of the masterpieces of above mention Sinhala novelists.

**Key words:** Colonial era, Social transitions, Sinhala novel, Sri Lankan society.

## සාරසංක්ෂේපය

මෙරට එතෙක් පැවති දේශීය සංස්කෘතියේ පැහැදිලි වෙනසක් ඇති කිරීමට සමත් වූ කාල පරිච්ඡේදයක් ලෙස 19 වන සියවසෙහි මැද භාගයේ සිට 20 වන සියවස මුල් භාගය දක්වා වූ කාල පරිච්ඡේදය පෙන්වා දිය හැකි ය. මෙම අධ්‍යයනය මගින් විමර්ශනය කෙරෙනුයේ, යටත්විජිත යුගයෙහි ලාංකේය සමාජයෙහි සිදු වූ සමාජ විපර්යාසයන් සිංහල නවකතාවෙන් ප්‍රතිබිම්භනය වන ආකාරය පිළිබඳ ව ය. සිංහල සාහිත්‍යයෙහි, 19 වන සියවසෙහි මැද භාගයේ සිට 20 වන සියවසෙහි මුල් භාගය දක්වා වූ යටත්විජිත කාල පරිච්ඡේදයෙහි මෙරට සමාජයෙහි සිදු වූ සමාජ විපර්යාසයන් සිංහල නවකතාවෙන් නිරූපණය වන ආකාරය පිළිබඳ ව මෙතෙක් අධ්‍යයනයට පාත්‍ර වී නොමැත. එබැවින්, මෙම පර්යේෂණයෙහි පරමාර්ථය වනුයේ, මෙරට සමාජ, සංස්කෘතික, අධ්‍යාපනික, ආගමික හා ආර්ථික යන අංශයන්හි සිදු වූ සමාජ විපර්යාසයන් සිංහල නවකතාවෙන් ප්‍රතිබිම්භනය වන ආකාරය අධ්‍යයනය කිරීම යි. මෙය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කළ පර්යේෂණයකි. මෙම පර්යේෂණයේ දී විග්‍රහ ඒකකය (Unit of Analysis) වශයෙන් තෝරා ගත් නවකතාවන් ලෙස, ලාංගනී ප්‍රනාන්දු අබේදීරගේ 'කුණ්ඩාවාඩය', සේන තෝරදෙනියගේ 'මඩරන්', මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ 'මාණික්කාවත', සුමුදු නිරාගී සෙනෙවිරත්නගේ 'දූල්වල අලංකාරේ', චම්මින්ද වෙලගෙදරගේ 'සක්කාරං' යන කෘති පෙන්වා දිය හැකි ය. මෙහි දත්ත විශ්ලේෂණ ක්‍රමවේදය වන්නේ අන්තර්ගත විශ්ලේෂණය යි (Content Analysiss) මෙම අධ්‍යයනය මගින් යටත්විජිත යුගයෙහි, ලාංකේය සමාජයෙහි පැවති අංශ ගණනාවක් කෙරෙහි මෙම විපර්යාසයන් යහපත් මෙන් ම අයහපත් අයුරින් ද බලපා ඇති බැව් පැහැදිලි ව හඳුනා ගැනුණු අතර වෙනස් වන සමාජ තත්ත්වයන් සමඟ යමින් ශීඝ්‍රයෙන් වෙනස් වීම මෙහි සමාජ පදනම වූ බැව් පසක් කරගත හැකි විය. සිංහල නවකතාකරුවාට ලිවීමට වස්තුබීජ සපයන්නා වූ සාරවත් වපසරියක් ලෙස ලාංකේය යටත්විජිත යුගය පෙන්වා දිය හැකි ය. 19 වන සියවසෙහි මැද භාගයේ සිට 20 වන සියවසෙහි මුල් භාගය

දක්වා වූ කාල පරිච්ඡේදයෙහි ලාංකේය සමාජයෙහි සිදු වූ සමාජ විපර්යාසයන්, සිංහල නවකතාකරුවා විසින් අමුද්‍රව්‍ය ලෙස තම සිංහල නවකතාවන්ට වස්තු විෂය කොටගෙන තිබෙනා බව නිර්ණය කළ හැකි ය.

**කේන්ද්‍රීය වචනඃ** යටත්විජිත යුගය, සමාජ විපර්යාස, සිංහල නවකතාව, ලාංකේය සමාජය

## හැඳින්වීම

නවකතාව යනු, ප්‍රබන්ධ චරිත සහ සිදුවීම් ගොඩනංවමින් අනුක්‍රමික කතා පුවතක විලාසයෙන් ගලා යන දීර්ඝ ගද්‍ය ආඛ්‍යානයකි. මැල්කම් කව්ලි නම් විචාරකයා නවකතාව නිර්වචනය කරනුයේ, "කිසියම් වෙනස් වීමකට තුඩු දෙන පරිද්දෙන් චරිත සමූහයක් අන්‍යෝන්‍ය සම්බන්ධය ප්‍රකාශ වන්නා වූ ද, එක් වරක දී දිගට ම කියවා අවසන් කළ නොහැකි තරම් ප්‍රමාණයකින් යුක්ත වූ ද, දීර්ඝ එහෙත් ඒකාබද්ධ කතාවකි" (සරච්චන්ද්‍ර,2005:09) යනුවෙනි. අපරදිග සාහිත්‍යයන් හා ගැටීම් හේතු කොටගෙන සිංහල සාහිත්‍යයේ නියම විකාශනයක් සිදු වූයේ දහනව වන සියවසෙහි ඉංග්‍රීසීන්ගේ පැමිණීමෙන් පසු ව යැයි කිව හැකි ය (සරච්චන්ද්‍ර,2005:09). ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල නවකතාව ලෙස සැලකෙන්නේ 1905 දී අලුත්ගමගේ සයිමන් ද සිල්වා විසින් රචිත "මීනා" නවකතාවයි. මෙරට සිංහල ප්‍රබන්ධ කතා සාහිත්‍යයට පදනම වැටුණේ 1866 දී රුවන් මල්දම සඟරාවට ඇල්.අයිසෙක් ද සිල්වා ලියූ "වාසනාවන්ත පවුල හා කාලකණ්ණි පවුල" යනුවෙන් කොටස් වශයෙන් ලියන ලද නවකතාවෙනි. 1905 වර්ෂය සිංහල නවකතා ඉතිහාසයෙහි සංධිස්ථානයක් වූවා සේ ම 1944 වර්ෂය ද සිංහල නවකතාව සම්බන්ධයෙන් ප්‍රමුඛ වර්ෂයකි. ඒ මන්දයත් මාර්ටින් වික්‍රමසිංහයන් විසින් ගම්පෙරළිය නම් වූ නවකතාව රචනා කරනු ලැබීමයි. එය ප්‍රථම යථාර්ථවාදී සිංහල නවකතාව යනුවෙන් හඳුන්වනු ලබයි.

දහනව වැනි සියවස එතෙක් පැවති දේශීය සංස්කෘතියේ පැහැදිලි වෙනසක් ඇති කිරීමට සමත් වූ කාල පරිච්ඡේදයක් වශයෙන් ලංකා ඉතිහාසයේ වැදගත් ය. එමෙන් ම මෙහි දී සලකා බැලෙන දහනව වන සියවසේ මැද භාගයේ සිට විසිවන සියවසෙහි මුල් භාගය දක්වා වූ කාල පරිච්ඡේදයෙහි ද මෙරට දේශපාලන, සාමාජික, ආර්ථික, ආගමික ආදී කවර අංශයක වුව ද මෙකී වෙනස පැහැදිලි ව දක්නට ලැබේ. මෙම අධ්‍යයනයෙන් අදහස් කරනු ලබන්නේ 1815 - 1948 යන කාල පරිච්ඡේදයෙහි යටත්විජිත ශ්‍රී ලංකාවේ සිදු වූ සමාජ විපර්යාසය සිංහල නවකතාවන්හි කෙතරම් දුරට නිරූපණය වන්නේ ද යන්න විමර්ශනය කිරීමයි. 16 වන සියවසේ පෘතුගීසින් හා ලන්දේසින් මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රිත ව තම බලය ගොඩනගා ගෙන සිටි සමයේ දිවයිනේ විශාල ප්‍රදේශයක උඩරට රාජධානියේ බලය ව්‍යාප්ත ව පැවති හෙයින් සාම්ප්‍රදායික සමාජ, ආර්ථික රටාවේ පුළුල් වෙනසක් ඇති කිරීමට එකී යුරෝපීයයන්ට හැකියාව නොලැබුණි. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව යටත්විජිතයක් බවට පත් කර ගන්නා විට සාම්ප්‍රදායික සමාජ, ආර්ථික ක්‍රමය ඇසුරෙන් ගොඩනැගුණු සමාජ ක්‍රමයක් මෙරට පැවතුණි. සමාජයෙහි ප්‍රභූ පන්තියක් සිටි අතර එම පිරිස රටේ ජනගහනයෙන් ඉතා සුළු පිරිසකි. ප්‍රභූ පන්තිය බොහෝ විට රටේ පරිපාලන කටයුතු මෙහෙයවා ඇත. රටේ අතිබහුතර ජනතාව සාමාන්‍ය ජනයා වූ අතර ඔවුහු කෘෂිකර්මාන්තය මත යැපුණහ. ඉංග්‍රීසින් මෙරට පාලනය කිරීමේ දී රජයේ ආදායමට වඩා වියදම වැඩි විය. එය ආර්ථික කරුණක් වන බැවින් ඉංග්‍රීසින්ගේ අරමුණුවලට ගැළපෙන ආර්ථික ක්‍රමයක් මෙරට බිහි වන ආකාරයේ ප්‍රතිසංස්කරණ රැසක් හඳුන්වා දීමට කොල්බෲක් පියවර ගෙන ඇත. 1833 වර්ෂය දිවයිනේ ඉතිහාසයෙහි තීරණාත්මක වර්ෂයක් ලෙස දැක්විය හැකි ය. මේ වර්ෂයේ දී හඳුන්වා දෙන ලද කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ, ධනවාදී කෘෂිකාර්මික සංවර්ධනයට අවශ්‍ය නෛතික හා දේශපාලන රාමුව සකස් කළේ ය(බණ්ඩාරගේ,2005:21). කොල්බෲක් - කැමරන් ප්‍රතිසංස්කරණ මඟින් එය නීතිමය - දේශපාලනික නිර්මාණය හා බ්‍රිතාන්‍ය වැවිලි ආර්ථිකයේ දියුණුව සැපයූ අතර, අතිරික්ත විසර්ජනය, ජනගහනයේ දේශපාලනය සහ යටත්විජිත සමාජ පර්යාය නීත්‍යනුකූල කිරීම ප්‍රතිවිරුද්ධ මානයන් අතර මැදිහත් වී රාජ්‍ය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේ ය. 19 වන සියවසේ කෝපි වගාවේ උන්නතියක් ඇති වූ අතර 1830 සිට 19 වන සියවසේ මැද භාගය දක්වා කෝපි නිෂ්පාදනය ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක විය.

එක්දහස් අටසිය අසූ හය සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ ඉතා වැදගත් වෙනසක් සිදු වූ වර්ෂයක් ලෙස ය. එම වර්ෂයේ දී ලංකා වතු ආර්ථිකය කෝපි වගාවෙන් තේ වගාවට මාරු විය. 1886 දී ප්‍රථම වරට ලංකාවෙන් අපනයනය කරන ලද තේ ප්‍රමාණය කෝපි ප්‍රමාණය අභිභවා සිටියේ ය. වඩාත් පුළුල් ලෙස සලකන කල මේ වෙනස විසිවන සියවසට පරිවර්තනය වීමේ මඟ සලකුණක් ලෙස සැලකිය හැකි ය (බණ්ඩාරගේ, 2005:22). කෝපි වතු ආරම්භයේ දී ම ඉන්දීය දෙමළ ජාතිකයන් ලංකාවට ගෙන ඒමෙන් විශාල වර්ධනයක් සිදු වූ අතර අපනයන වෙළඳාම වැඩි වීම නිසා කොළඹ වරාය ව්‍යාප්ත වීමටත්, දුම්රිය හා මහා මාර්ග ඉදිකිරීමටත් එය හේතු විය.

බ්‍රිතාන්‍ය පාලන කාලයෙහි මෙරට සිදු වූ සමාජ වෙනස්වීම් අතර පැරණි ප්‍රභූ පන්තිය අභාවයට ගොස් නව මධ්‍යම පන්තිය නැගී ඒම කැපී පෙනෙන ලක්ෂණයකි. කොල්බෲක් ප්‍රතිසංස්කරණ මඟින් මෙරට ධනවාදී ආර්ථික ක්‍රමයකට පදනම සැකසුණු බැවින් සාම්ප්‍රදායික ධනෝපාය මාර්ග වෙනුවට ධනය උපයා ගත හැකි අලුත් මාර්ග රැසක් විවෘත විය. වතු වගාව මුල් කරගෙන බිහි වූ මෙම ආර්ථික ක්‍රමය හමුවේ වතුකරයට අවශ්‍ය දේ සපයන කොන්ත්‍රාත්කරුවන් ලෙස කටයුතු කිරීම, අරක්කු නිෂ්පාදනය හා බෙදා හැරීම හෙවත් අරක්කු රේන්ද කටයුතු, මිනිරන් කර්මාන්තය, තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහන කටයුතු හා පොල් වගාව ආදී ස්වදේශකයන්ට ද ධනය ආයෝජනය කළ හැකි ව්‍යාපාර බිහි විය. මේ නිසා 20 වන සියවස ආරම්භ වන විට ඉහත ව්‍යාපාරවලට මුදල් යොදවා ධනය උපයා ගත් ස්වදේශීය ධනවත්තු පිරිසක් බිහි වූහ. මෙම ධනවත් පන්තිය තම දූ දරුවන්ට මෙරට දී මෙන් ම විදේශයන්හි ද උසස් අධ්‍යාපනයක් ලබා දීමට ධනය වැය කළහ. බ්‍රිතාන්‍ය පාලන කාලයේ දී නීතිඥ, වෛද්‍ය, ඉංජිනේරු, මිනින්දෝරු, ලිපිකාර, සිවිල් සේවය වැනි අලුත් රැකියා අවස්ථා ජනිත වී තිබුණි.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

ඉංග්‍රීසි අධ්‍යාපනය මඟින් මෙබඳු රැකියාවන්ට ඇතුළු වී උසස් ජීවන තත්ත්වයක් මෙන් ම ඉහළ සමාජ පිළිගැනීමක් ද ලබා ගත හැකි විය. මේ නිසා එය මධ්‍යම පන්තියට ඇතුළු වීමේ තවත් දොරටුවක් බවට පත් ව තිබිණි (දෙපාර්තමේන්තුව, 2018:78-79).

බ්‍රිතාන්‍ය පාලන කාලයෙහි සමාජ වෙනස්වීම්වලට සමගාමී ව මෙරට සංස්කෘතික ක්ෂේත්‍රයේ ද වෙනස්කම් රැසක් සිදු විය. බටහිර සංස්කෘතිය රටෙහි පැතිරයාම ඒ අතරින් කැපී පෙනෙ (දෙපාර්තමේන්තුව, 2018:80). කෝල්බෲක් කොමිසම ඉංග්‍රීසි භාෂාව සහ බටහිර අධ්‍යාපනය හඳුන්වා දීමේ අරමුණක් වූයේ වැවිලි ආර්ථිකය හා සම්බන්ධ පාලන ක්‍රමය පවත්වා ගෙන යාමේ දී වුවමනා සේවකයන් මේ රටෙන් ම සපයා ගැනීමයි. සිංහල භාෂාව සහ පාරම්පරික අධ්‍යාපනයත් ව්‍යාප්ත වීම නිසා කොමිසමේ අරමුණු ඉටු විය. සිංහලයන්ගේ සිතුම්, පැතුම් ආකල්ප හා සාරධර්ම වැවිලි ආර්ථිකයකට හිතකර වන ලෙසින් හැඩ ගැසීමට ද මේ යෝජනාව ඉවහල් විය. දේශීයත්වයෙන් ඈත් වූ බටහිර ක්‍රමයට නැඹුරු වූ ආකල්ප මහජනයා තුළ වර්ධනය වීමට මේ නිර්දේශ හේතු විය. තමන්ගේ කටයුතුවලින් ඉවත් වී අනුන්ගේ කටයුතු කිරීමට ශ්‍රී ලාංකිකයන් පටන් ගත්තේ මෙයින් පසුවයි. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ වැවිලි කර්මාන්තය පදනම් කරගත් පරාධීන ආර්ථිකයක් මෙරට වර්ධනය වීමයි (ඊරියගම, 2011:18). කොල්බෲක් ප්‍රතිසංස්කරණවලින් පසු ව ඉංග්‍රීසි භාෂා අධ්‍යයනය හා බටහිර අධ්‍යාපනය වේගයෙන් ව්‍යාප්ත විය. බොහෝ විට මිෂනාරි පාසල් හා රජයේ අනුග්‍රහය ලැබූ පාසල්වල විෂය නිර්දේශය සැකසුවේ හා ඉගැන්වීම් කටයුතුවල නිරත වූයේ ද විදේශිකයන් ය. මේ නිසා එබඳු පාසල් මඟින් ද බටහිර සංස්කෘතිය පැතිර යාමට මඟ සැලසිණි. අධ්‍යාපන කටයුතු සඳහා විදේශගත වූවන් මඟින් ද බටහිර සංස්කෘතියේ ඇතැම් අංග මෙරට පැතිරිණි. 19 වන සියවසෙහි වතු වගා ව්‍යාප්තිය, වෙළඳාම දියුණු වීම, ගමනාගමන කටයුතු හා සන්නිවේදන කටයුතුවල ඇති වූ දියුණුව නිසා යුරෝපීයයෝ වැඩි වශයෙන් මෙරටට පැමිණියහ. මේ නිසා ඔවුන්ගේ සමාජ ශාලා, නිවාඩු නිකේතන ආදිය මෙරටෙහි බිහි වූ අතර එබඳු හේතු ද බටහිර සංස්කෘතිය රටෙහි පැතිර යාමට ඉවහල් විය. මෙසේ විවිධ සාධකවල බලපෑම නිසා බටහිර ඇඳුම් පැළඳුම්, සිරිත් විරිත්, ආචාර සමාචාර විධි බටහිර ගෘහ නිර්මාණ ශිල්පය, ආහාර පාන මෙරට සංස්කෘතිය සමඟ මිශ්‍ර විය (දෙපාර්තමේන්තුව, 2018:80).

ලාංකේය සමාජ විපර්යාසය පිළිබඳ ව දීර්ඝ ලෙස අදහස් දැක් වූ පුද්ගලයෙකු ලෙස මාර්ටින් වික්‍රමසිංහයන් පෙන්වා දිය හැකි ය. වික්‍රමසිංහයන් ඒ පිළිබඳ ව දීර්ඝ ලෙස විවරණය කරනුයේ, ගම්පෙරළිය, කලියුගය සහ යුගාන්තය යන තුන් ඈඳුතු නවකතා සහ කළුවර ගෙදර නවකතාව මඟිනි. සමාජ පරිණාමය පිළිබඳ අර්ථවත් විශේෂිත දර්ශනයක් මෙම නවකතාවන්හි ගැබ් වී පැවතීම ඊට හේතුවයි. ගම්පෙරළියෙන් වැඩවසම් සමාජ ක්‍රමයේ බිඳ වැටීම සහ නව ධනේශ්වර සමාජ ක්‍රමයේ ක්‍රමික වර්ධනය කියාපායි. යුගාන්තයෙන් එහි බිඳ වැටීම සහ අනාගතයේ ඇති වන සමාජවාදී ක්‍රමය පිළිබඳ ඉඟියක් ලබා දෙයි. නිෂ්පාදන බලවේගවල ඇති වන වෙනස්කම් නිෂ්පාදන සබඳතාවල වෙනස්කම්වලට බලපායි. සමාජීය සබඳතා, නිෂ්පාදන සබඳතා හා සම්බන්ධ වන නිසා අලුත් නිෂ්පාදන බලවේග ඇති කර ගැනීමේ දී සමාජය නිෂ්පාදන ක්‍රමය වෙනස් කරන අතර ඒ මඟින් ජීවන ක්‍රමය වෙනස් කිරීමත් මිනිසුන් ඔවුන්ගේ සමාජ සම්බන්ධතා ඒ අනුව වෙනස් කිරීමත් සිදු වේ.

මෙම පර්යේෂණයේ දී යටත්විජිත යුගයෙහි ශ්‍රී ලාංකේය ජන සමාජයේ සිදු වූ සමාජ විපර්යාස සිංහල නවකතාවෙන් නිරූපණය කර ඇති ආකාරය විමර්ශනය කෙරෙයි. ඒ සඳහා පහත දැක්වෙන කෘති භාවිත කෙරෙයි.

ලාංගනී ප්‍රනාන්දු අබේදීර-කුණ්ඩාවාඩය (1998)

මහින්ද ප්‍රසාද් මස්ඉඹුල-මාණික්කාවත (2015)

සුමුදු නිරාගී සෙනෙවිරත්න-දූල්වල අලංකාරය (2018)

චම්මින්ද වෙලගෙදර-සක්කාරං (2019)

සේන තෝරදෙනිය-මඬරත් (2020)

## සාහිත්‍ය විමර්ශනය

අසෝකා බණ්ඩාරගේගේ ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදය (2005) ග්‍රන්ථය මෙහි දී මූලික වශයෙන් උපයෝගී කොට ගෙන ඇත. පහළොස්වන සියවසේ අග භාගයේ සිට බටහිරින් පැමිණි ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික බලපෑම් ආසියාව පුරා ද ව්‍යාප්ත වීම නිසා එම සමාජයන්හි මූලික සමාජ ආර්ථික පරිවර්තන ක්‍රියාවලියක් දක්නට ලැබුණි. යුරෝපීයයන් කෙලින් ම සිය ආධිපත්‍ය යටත්විජිත කෙරෙහි පැතිරූ මෙම යුගය හඳුන්වනු ලබන්නේ සම්භාව්‍ය යටත්විජිත යුගය යනුවෙනි. යටත්විජිත බවට පරිවර්තනය වීම ද එහි දීර්ඝ කාලීන ප්‍රතිඵලය තුන්වන ලෝකයේ සමාජ පරිණාමයේ දක්නට ලැබුණ බලපෑම් ද යන මේවා ස්වාධීන ව අවබෝධ කර ගැනීමට විවිධ දෘෂ්ටිකෝණ යොදා ගෙන ඇත. බ්‍රිතාන්‍ය වතු ආර්ථිකය හා යටත්විජිත දේශපාලන අධිකාරිය ලංකාවේ උඩරට ප්‍රදේශවලට කෙසේ බලපෑවේ ද යන ගැටලුව මෙහි දී අධ්‍යයනය කෙරෙයි. දහනවවන සියවසේ දී කඳුරට බ්‍රිතාන්‍ය යටත්විජිත බලපෑම් න්‍යායාත්මක ව අර්ථ නිරූපණය කිරීමට ද උත්සාහ දරා ඇත.

මනෝජ් ආරියරත්නගේ Sociocultural Milieu, Cultural Dilemma and Early Sinhala Fiction (1866-1906) ග්‍රන්ථය ද මෙම අධ්‍යයනය සඳහා දායක කරගෙන ඇත. එහි දී එම කෘතියෙහි සඳහන් හැඳින්වීම සහ එහි පළමු පරිච්ඡේදය වන සමාජ සංස්කෘතික පරිසරය යන පරිච්ඡේදය මෙහි දී ප්‍රධාන වශයෙන් අධ්‍යයනය කර ඇත. මෙම ලිපියෙහි සමාජ සංස්කෘතික පරිසරය යටතේ ආර්ථික වෙනස්වීම්, මහාමාර්ග හා දුම්රිය මාර්ග, අරක්කු රේන්දය, කුලය හා සමාජ පන්තිය, ක්‍රිස්තියානිකරණය හා සංස්කෘතික උකහා ගැනීම යන කරුණු මේ සඳහා පාදක කොටගෙන ඇත. වර්තමාන ශ්‍රී ලාංකේය සමාජය මතු වූයේ නව සමාජ සංස්කෘතික තත්ත්වයක බලපෑම සමඟින් මූලික පරිවර්තනයකට දායක වූ යටත්විජිත


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

දේශපාලන අධිකාරිය, වතු ආර්ථිකය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ සංස්කෘතික ප්‍රචාරණයේ ප්‍රතිඵලයකිනි. මෙම පරිවර්තනය සමග සමකාලීන ශ්‍රී ලංකාවේ සමාජ ක්ෂේත්‍රයෙහි සංස්කෘතික උභතෝකෝටිකයක් ඇති කළේ ය. මෙම අධ්‍යයනයෙන් අදහස් කරන්නේ යටත්විජිත ශ්‍රී ලංකාවේ මෙම සැබෑ සමාජ තත්ත්වය එම යුගයේ මුල් සිංහල ප්‍රබන්ධවල කෙතරම් දුරට නිරූපණය වී ඇත් ද යන්න නිරූපණය කිරීමයි.

අනුලා අත්තනායකගේ දහනව වැනි සියවසේ බ්‍රිතාන්‍යයන් දුටු ලංකාව (2021) ග්‍රන්ථය ද මෙම අධ්‍යයනය සඳහා යොදා ගෙන ඇත. මෙම කෘතියෙහි දැක්වෙන යටත්විජිත කෙරෙහි බ්‍රිතාන්‍ය චින්තනයෙහි පසුබිමත්, ආර්ථික හා සාමාජික වශයෙන් මෙරට පැවති තත්ත්වයත්, කුල ක්‍රමය හා සමාජ සම්බන්ධතා කෙරෙහි දැක්වූ අවධානයත් පිළිබඳ ව අවධානය යොමු කිරීමට අපේක්ෂිත ය.

තිස්ස ඊරියගමගේ ශ්‍රී ලංකාවේ වතු විප්ලවය (2011) ග්‍රන්ථය ද මෙම අධ්‍යයනය සඳහා දායක වේ. මෙහි දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණ සහ ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තයේ වර්ධනය අතර පැවති සබඳතා ව පිළිබඳවත්, කුරුඳු වගාව, කෝපි වගාව, තේ වගාව, රබර් වගාව, පොල් වගාව යන වැවිලි භෝගයන්හි වැවිලි කෘෂිකර්මය පිළිබඳවත් මෙහි දී අධ්‍යයනය කෙරෙයි.

පී. පී. වී. සෝමරත්නගේ සංස්කරණයක් වන ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය (1991) ග්‍රන්ථය ද මෙම අධ්‍යයනය සඳහා භාවිත කර ඇත. මෙහි දී දහනව වන වැනි සියවස ගොවි ජනතාව සහ වාණිජ කෘෂිකර්මාන්තයත්, බ්‍රිතාන්‍ය යටත්විජිත යුගයේ ශ්‍රී ලංකාවේ මහාමාර්ග සංවර්ධනයත්, ශ්‍රී ලංකාවේ දුම්රිය පරිවහන ක්‍රමයේ පනස් වසක ප්‍රගතියත්, බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයත්, බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජීය හා ආර්ථික වර්ධනයේ පදනමත්, ආගමික ඉතිහාසය හා ශ්‍රී ලංකාවේ වතු වගා ආර්ථික වර්ධනයත් සම්බන්ධිත ලිපි මෙම අධ්‍යයනය සඳහා දායක කරගෙන ඇත.

මෙම පර්යේෂණය සිංහල නවකතා ඇසුරෙන් සිදු කරන පර්යේෂණයකි. එනිසා නවකතාවේ විකාශනය පිළිබඳ න්‍යායාත්මක දැනුම මේ සඳහා වැදගත් වේ. එහි දී මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රගේ සිංහල නවකතා ඉතිහාසය හා විචාරය කෘතිය දායක කරගෙන ඇත.

## පර්යේෂණ ගැටලුව

ක්‍රි.ව. 19 වන සියවසෙහි මැද භාගයෙහි සිට 20 වන සියවසෙහි මුල් භාගය දක්වා ලාංකේය සමාජය දැවැන්ත විපර්යාසයකට ලක් විය. මෙකී කාල වකවානුවෙහි විපර්යාසයට ලක් වූ තත් සමාජ, සංස්කෘතික, අධ්‍යාපනික, ආගමික හා ආර්ථික යන අංශයන්හි සිදු වූ විපර්යාසයන් පිළිබඳ ව සිංහල නවකතාකරුවා විසින් සිදු කළ අධ්‍යයනය, සිංහල නවකතාවන්හි කෙතරම් දුරට විද්‍යමාන වනවා ද යන්න මෙතෙක් ප්‍රමාණාත්මක ව විමර්ශනය කර නොමැත. තත් විපර්යාසයන් සිංහල නවකතාවන්හි කෙතරම් දුරට විද්‍යමාන වනවා ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි.

## පර්යේෂණ ප්‍රශ්න

යටත්විජිත බලපෑමෙන් මෙරට සමාජ දේශපාලන, සංස්කෘතික, හා ආර්ථික විපර්යාසයන් සිංහල නවකතාකරුවා විසින් සිය නවකතාවලින් නිරූපණය කර ඇත්තේ කෙසේ ද ?

- යටත්විජිත බලපෑමෙන් මෙරට සිදු වූ සමාජ, දේශපාලන, සංස්කෘතික, හා ආර්ථික විපර්යාසයන් කවරේ ද ?

- එකී අංශ ඔස්සේ සිදු වූ සමාජ විපර්යාසය මෙරට ජන ජීවිතය හා සමස්ත ලංකාව කෙරෙහි යහපත් හා අයහපත් අයුරින් බලපා ඇති අයුරු නවකතාවලින් නිරූපණය කර ඇත්තේ කෙසේ ද ?

## පර්යේෂණ අරමුණු

### ප්‍රධාන අරමුණ

- යටත්විජිත බලපෑමෙන් මෙරට සමාජ දේශපාලන, සංස්කෘතික, හා ආර්ථික විපර්යාසයන් සිංහල නවකතාකරුවා විසින් සිය නවකතාවලින් නිරූපණය කර ඇති ආකාරය අධ්‍යයනය කිරීම.

### අනු අරමුණු

- යටත්විජිත බලපෑමෙන් මෙරට සිදු වූ සමාජ, දේශපාලන, සංස්කෘතික, හා ආර්ථික විපර්යාසයන් කවරේ ද යන්න අධ්‍යයනය කිරීම.

- එකී අංශ ඔස්සේ සිදු වූ සමාජ විපර්යාසය මෙරට ජන ජීවිතය හා සමස්ත ලංකාව කෙරෙහි යහපත් හා අයහපත් අයුරින් බලපා ඇති අයුරු නවකතාවලින් නිරූපණය කර ඇති ආකාරය තෝරා ගත් නවකතා ඇසුරින් විමර්ශනය කිරීම.

## පර්යේෂණයේ වැදගත්කම

- යටත්විජිත යුගයෙහි සිදු වූ විපර්යාසයන් මෙරට සමාජ, සංස්කෘතික, ආර්ථික, අධ්‍යාපන, ආගමික යනාදී ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි බලපා ඇති අකාරය සිංහල නවකතාවන්හි කෙතරම් දුරට විද්‍යමාන වනවා ද යන්න මෙතෙක් ප්‍රමාණාත්මක ව විමර්ශනය කර නොමැත. තත් විපර්යාසයන් සිංහල නවකතාවන්හි කෙතරම් දුරට විද්‍යමාන වනවා ද යන්න සිංහල නවකතා ඇසුරෙන් අධ්‍යයනය කළ හැකි වීම.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පර්යේෂණ ක්‍රමවේදය

### පර්යේෂණ දර්ශනය

මෙම පර්යේෂණය අභිමතානුරූපී පර්යේෂණ දර්ශනය යටතේ ඇති ස්වභාවිකවාදී පර්යේෂණ දර්ශනයට අනුව සිදු කළ පර්යේෂණයකි. එම නිසා මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ සිදු කරන පර්යේෂණයක් ලෙස ද හැඳින්විය හැකි ය. මෙම අධ්‍යයනයට අදාළ පර්යේෂණ ප්‍රශ්න නිර්මාණය කරගෙන ඇත්තේ, අභිමතානුරූපී පර්යේෂණ දර්ශනයට අනුව ය. මෙම පර්යේෂණය නිගාමී පර්යේෂණයක් වන අතර එයට හේතුව වන්නේ, මෙම පර්යේෂණය මඟින් නව න්‍යායක් ඉදිරිපත් නොකරන අතර පවතින සංකල්පයක් ආශ්‍රයෙන් සිදු කර එය සංවර්ධනය කිරීමක් පමණක් සිදුකිරී ම ය.

### ක්‍රමවේදය

මෙම අධ්‍යයනය සඳහා මූලික වශයෙන් තෝරා ගත් නවකතා සියල්ල ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් ගෙන අන්තර්ගත විශ්ලේෂණය (Content Analysiss) මඟින් දත්ත විශ්ලේෂණ කෙරෙයි. ද්විතීයික මූලාශ්‍රය ලෙස ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදී යුගයෙහි පැවති සමාජ විපර්යාස පිළිබඳ ඇති න්‍යායාත්මක කෘති, සඟරා, විචාර ලිපි සහ අන්තර්ජාලය භාවිත කෙරෙයි. ගුණාත්මක දත්ත විශ්ලේෂණයක් සිදු කිරීමට අපේක්ෂිත බැවින් මෙම පර්යේෂණයේ දී දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි, සිද්ධි අධ්‍යයන හා සම්මුඛ සාකච්ඡා ආදී විධික්‍රම යොදාගන්නේ නැත. ශ්‍රී ලංකාවේ යටත්විජිත යුගයෙහි සිදු වූ සමාජ විපර්යාස සිංහල නවකතාවෙන් නිරූපණය වන ආකාරය විමර්ශනය සඳහා මූලික වශයෙන් ම විග්‍රහ ඒකකය වශයෙන් ගත් තෝරාගත් නවකතා භාවිත කර ඇත. ද්විතීයික මූලාශ්‍රය මඟින් මෙම අධ්‍යයනයට අවශ්‍ය න්‍යායාත්මක කරුණු ගොනු කර ගැනීමට අපේක්ෂා කෙරෙයි. ප්‍රාථමික මූලාශ්‍රය වන තෝරාගත් නවකතාවලින් නිරූපිත ශ්‍රී ලංකාවේ යටත්විජිත යුගයෙහි පැවති සමාජ විපර්යාසයන්හි යථාර්ථය නිරූපණය වන්නේ කෙසේ ද යන්න මූලික කොටගෙන මෙහි දී විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂිත ය.

### සාකච්ඡාව

"යටත්විජිත යුගය" යන ප්‍රකාශය නම් කරන ලද ඓතිහාසික කාලානුරූපීතාවකි. දේශීය හෝ විදේශීය පදිංචිකරුවන් කණ්ඩායමක් විසින් යම් ප්‍රදේශයක රැකියාව, පදිංචි කිරීම, පිහිටුවීම, පාලනය කිරීම සහ පාලනය කිරීමේ අදියර යනාදිය ඓතිහාසික යටත්විජිතකරණ ක්‍රියාවලියට සෘජුව ම සම්බන්ධ වේ. මෙම ප්‍රකාශනය සෑදී ඇත්තේ යුගය(කාලය) සහ යටත්විජිතවාදය (ජනපදයට සාපේක්ෂ ව) යන වචනවලින් ය. අනෙක් අතට "යටත්විජිතය" යන වචනයේ තේරුම "විදේශීය පුද්ගලයන් විසින් පාලනය කරන ලද හෝ පිහිටුවන ලද භූමිය" යන්නයි. මෙම පුද්ගලයන් හැඳින්වෙන්නේ "ජනපදිකයන්" යනුවෙනි https://si.sp-ie.org/epoca-coloial-4199.

ලාංකේය යටත්විජිත යුගය පිළිබඳ විමසීමේ දී, ශ්‍රී ලංකාව ක්‍රි.ව. 1505 සිට 1948 දක්වා බටහිර විජිතවාදී ග්‍රහණයට හසු විය. පළමුව පෘතුගීසීනුත්, දෙවනුව ලන්දේසීනුත්, තුන්වනුව ඉංග්‍රීසීහුත් ලංකාව ග්‍රහණයට ගත්හ. මේ ජාතීන් අතරින් ලංකාව කෙරෙහි වැඩි ම බලපෑමක් ඇති කරන ලද්දේ බ්‍රිතාන්‍යයන් විසිනි. ඔවුහු 1796 සිට 1815 තෙක් ලංකාවේ මුහුදුබඩ පළාත් පාලනය කළ අතර 1815 සිට සමස්ත ශ්‍රී ලංකාව ම සිය ග්‍රහණයට නතු කරගත්හ. එතැන් පටන් බ්‍රිතාන්‍ය නමැති යටත්විජිතකාරකයන් විසින් හඳුන්වා දෙන ලද ප්‍රතිපත්ති ලංකාව නමැති විජිතකරණය වූ සමාජය කෙරෙහි දිගු කාලීන බලපෑමක් සිදු කර තිබේ.

විජිතකාරක රාජ්‍ය යටත්විජිතවල විජිත රාජ්‍යයක් ගොඩ නගමින් යම් යම් සමාජ ආර්ථික, දේශපාලන හා පරිපාලන ප්‍රතිසංස්කරණ හඳුන්වා දුන්නේ,

- තම විජිතය පවත්වාගෙන යාමේ ආරක්ෂක හා පරිපාලන වියදම් අධික වීම සහ සෘජු ව විජිතය පාලනය කිරීම අපහසු වීම.
- තමන්ට අභිමුව ඇති නව සමාජයේ ඇති ජීවන රටා හා අභිලාෂ විජිතකාරකයාගේ සංස්කෘතිය සමඟ නොපෑහීම හා ඒවා වෙනස් කර ගැනීම.
- තමන්ට යටත්වැසි සමාජ තම මවු රාජ්‍යයේ උපරිම යහපත සඳහා භාවිතයට ගැනීම යන මූලික අරමුණු ඉටු කර ගැනීමට ය

https://si.m.wikipedia.org/wiki/%EO .

බ්‍රිතාන්‍යයන් ඉන්දියාවට පැමිණ ශතවර්ෂ කිහිපයක් ගතවන තුරු ලංකාව කෙරෙහි උනන්දුවක් නොදැක්වූ යුරෝපීයයන් කොට්ඨාසයක් විය. නමුත්, ලංකාව කෙරෙහි මොවුන් උනන්දුවක් දැක්වීම ඇරඹුණේ 18 වන සියවසෙහි අග භාගය පමණ වන විට ය. මෙලෙස ඉංග්‍රීසීන් ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු කිහිපයකි. එනම්,

- ශ්‍රී ලංකාවෙහි පිහිටීමේ වැදගත්කම.
- වෙළඳ කටයුතුවල දී ගනුදෙනු කිරීමේ පහසුව හේතුවෙන් ලංකාවේ පැවති වැදගත්කම.
- ත්‍රිකුණාමල වරායෙහි වැදගත්කම යන කරුණු ය.

බ්‍රිතාන්‍යයන් විසින් ශ්‍රී ලංකාව යටත්විජිතයක් බවට පත් කරගන්නා විට දීර්ඝ කාලයක සිට විකාශනය වෙමින් ආ පාලන ක්‍රමයක්, සමාජ ආර්ථික ක්‍රමයක් හා සංස්කෘතියක් ද මෙරට පැවතිණි. නමුත් ලාංකේය යටත්විජිත කාල වකවානුවෙහි රටෙහි විශාල පරිවර්තනයක් ඇති විය. 1815 වර්ෂයේ දී මෙරට පැවති සාම්ප්‍රදායික රාජාණ්ඩු ක්‍රමය බ්‍රිතාන්‍ය පාලන කාලයේ දී පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් දක්වා විකාශනය වූ අතර සමාජ, ආර්ථික හා සංස්කෘතික යනාදී සෑම අංශයක් ම මෙකී යටත්විජිත යුගයෙහි විපර්යාසයට ලක් විය. මෙකී යටත්විජිත කාල පරාසයෙහි සිදු වූ සමාජ ප්‍රවණතාවන් සිංහල නවකතාවෙන් මූර්තිමත් වන්නේ කෙසේ ද යන්න මෙහි දී අධ්‍යයනය කෙරෙයි.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

සංස්කෘතිය යනු කුමක්ද යන්න පිළිබඳ සොයා බැලීමේ දී එය මීට සියවස් එක හමාරක කාලයක් පුරා යුරෝපයෙන් ප්‍රචලිත “Culture” යන වචනය ඔස්සේ ප්‍රචලිත වූවකි. මෙම සංස්කෘතිය යන වචනය ඉන්දියාව ඔස්සේ ලංකාවට පැමිණ අඩසියවසක් පමණ කාලයක් වේ. සමාජ හා මානව විද්‍යාඥයන් පෙන්වා දෙන ආකාරයට, කිසියම් සමාජයක දැකිය හැකි මිනිසුන්ගේ හැසිරීම් රටා හා ඔවුන්ගේ ජීවන රටාව සංස්කෘතිය ලෙස හැඳින්වේ. සංස්කෘතිය පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී මෙය පරම්පරාවෙන් පැවත එන පිහියකට වරෙක සමාන කර ඇත. සංස්කෘතිය යනුවෙන් හඳුන්වනු ලබන්නේ ගතික ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. එනම් සංස්කෘතිය යනු, නොකඩවා ම වෙනස් වෙමින් පවතින්නාවූ දෙයකි. මෙම සංස්කෘතිය පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී ඒ පිළිබඳ ව ඉදිරිපත් වී ඇති නිර්වචන මගින් සංස්කෘතිය යනු කුමක්ද යන්න පිළිබඳ ව අවබෝධයක් ලබාගත හැකි ය.

“මිනිසා සමාජයේ සාමාජිකයෙකු ලෙස අත්පත් කරගනු ලබන දැනුම, විශ්වාස, කලාව, නීතිය, සිරිත් විරිත් හා සමාජයේ සාමාජිකයෙකු ලෙස සාක්ෂාත් කරගත් හුරුපුරුදු හා හැකියාවන් ඇතුළත් සමස්තය ‘සංස්කෘතිය’ වේ” -එඩ්වඩ් ටයිලර්- http://mediavalueinfo.blogspot.com/2020/03/blog-post_97.html?m=1.

සමාජය යන්නෙන් අදහස් කරන්නේ පුද්ගල අන්තර් ක්‍රියාවන්ගෙන් බැඳුණු සමාජ එකතුවයි. සංස්කෘතිය යනු එම සමාජයේ ජීවත්වන පුද්ගලයන්ගේ ජීවන රටාවයි. එමගින් පැහැදිලි වන්නේ, සමාජය හා සංස්කෘතිය එකිනෙකට බද්ධ වී ඇති බවයි. සමාජයක් පවතින්නේ නම් එයට අයත් සංස්කෘතියක් පැවතිය යුතු අතර සංස්කෘතියක් පැවතීමට නම් සමාජය තිබිය යුතු ය.

ලාංකේය සමාජ හා සංස්කෘතික පරිසරය පිළිබඳ ව විමසීමේ දී 1505න් පසු මෙහි ගොඩබට පෘතුගීසීන්, ලන්දේසීන් මෙන් ම 1796 දී ඉංග්‍රීසීන් පැමිණීමෙන් මෙහි සංස්කෘතික ලක්‍ෂණ ඕනෑවටත් වඩා වෙනස් වී ආර්ය සභ්‍යත්වය ගිලිහෙමින් බටහිර සංස්කෘතියෙහි බලපෑම ලැබුණු බව පෙනේ. අද පවා පිළිපදින රෝම ලන්දේසි නීතිය මෙරටට හඳුන්වා දුන්නේ පෘතුගීසීන්ට පසු ව මෙහි පැමිණි ලන්දේසීන් විසිනි. ඔවුන් නිර්මාණය කළ දෙව්මැඳුරු මෙන් ම උසාවි අදටත් දක්නට ලැබේ. ඊට අමතර ව ගමනාගමන කටයුතු පහසු කරලීම පිණිස තැනූ දුම්රිය මාර්ග වර්තමානයේ වුව භාවිත කෙරෙයි. සංකර ජීවිතයක් සඳහා සිංහල බෞද්ධයන් නැඹුරු වූයේ පෘතුගීසින්ගේ හා ලන්දේසීන්ගේ පැමිණීමත් සමඟ ය. ඒවාට ලොල් වූ මධ්‍ය පාන්තික පිරිසක් ද බිහි වූයේ සංස්කෘතික විසරණය නිසා ය. ඉන් පසු මෙහි පාලනය කළේ ඉංග්‍රීසීන් ය. ඉංග්‍රීසීහු මෙහි තේ, කෝපි වැනි භෝග වගාවන් ඇති කර ආර්ථිකය සවිමත් කළහ. දුම්රිය මාවත් නිර්මාණය කළහ. මේ සමඟ ම සිංහල බෞද්ධයන් ද සිංහල සිරිත් පසෙක තබා බටහිරකරණයට ලක්විය. සිංහලයට බටහිර ආභාසය ලැබීම බොහෝ වටිනා සිරිත් විරිත් විනාශයට හේතුවක් විය. බුදුදහමට වුව වගකිවයුත්තන්ගේ පවා සැලකිල්ලක් නොලැබුණි. සිංහල බෞද්ධ සාහිත්‍ය පරිහානියට පත්විය. සිංහල ආයුර්වේදය පරිහානියට ගියේ ය. බටහිර චාරිත්‍ර වාරිත්‍ර මෙහි ඉන්පසු සුලභ ව දක්නට ලැබේ. ආහාර පාන, ඇඳුම් පැළඳුම් මෙන් ම ජන ජීවිතයේ දී අවැසි සියලු ම අංගයන් සඳහා බටහිරකරණය මුල්විය. වර්තමානයේ දී වුව අපගේ නේත්‍රාදර්ශනයට ලක්වන්නේ විජයගෙන් ඇරඹි සංස්කෘතික රටාවන් නොව පසුකාලීන ව මෙහි සම්මිශ්‍රණය වූ බටහිර සංස්කෘතික විධීන් ය. http://vidyananda1983.blogspot.com/2016_11_19_archive.html?m=1.

මෙරට සංස්කෘතියෙහි විපර්යාස විදහා දැක්වෙන තවත් අංගයක් වනුයේ, විවාහයයි. විවාහයේ දී ද මෙරට ජීවත් වූවෝ මෙරට යටත්විජිතයක් කරගෙන සිටි පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසින්ගේ ද සංස්කෘතික ලක්ෂණ උකහා ගනිමින් විවාහය යන අංගයෙහි ද විවිධ විපර්යාසයන් සිදු කළහ. මෙරටට පැමිණි පෘතුගීසින්, ලන්දේසින් හා විශේෂයෙන් ම මෙරටෙහි දැවැන්ත විපර්යාසයකට මුල පිරූ ඉංග්‍රීසින්ගේ පැමිණීමත් සමඟ ම එතෙක් පැවති ආර්ය ගුණාංග කෙමෙන් කෙමෙන් වියැකී ගොස් බටහිරකරණයේ ලක්ෂණ සමාජයේ සෑම තැනක් පාසා ම ව්‍යාප්ත වනු දක්නට ලැබුණි. වර්තමාන පිරිස් අනුගමනයට පෙළඹුණේ විජයගෙන් ඇරඹුණු සංස්කෘතික රටාවන් හෝ මිහිඳු හිමි මෙරටට වැඩම කිරීමෙන් ඇති වූ බෞද්ධ සංස්කෘතික ලක්ෂණයන් හෝ නොව යටත්විජිතවාදීන්ගේ එනම් යුරෝපීයයන්ගෙන් මෙරටට උරුම වූ බටහිර සංස්කෘතික ලක්ෂණයන් ය. එකී කාරණාව හේතුවෙන් ලාංකේය සමාජයෙහි බොහෝ සමාජ හා සංස්කෘතික විපර්යාස ඇති වුණි. මෙකී සමාජ සංස්කෘතික විපර්යාසයන් එක් එක් සිංහල නවකතාකරුවන් විසින් සිය නවකතාවන්හි නිරූපණය කර ඇත්තේ, පහත පරිදි ය.

ශ්‍රී ලංකාව යනු, ස්වයංපෝෂිත ආර්ථික රටාවකට හිමිකම් කියූ , විවිධ ජාතීන්ගෙන් යුත් පුද්ගලයන් වාසය කරනා රටකි. එකී ජාතීන් අතරිනුත් සිංහල යනු, මෙරට ප්‍රධාන ජාතියයි. නමුත් යටත්විජිතවාදීන්ගේ පැමිණීමත් සමඟ මෙරට දැවැන්ත විපර්යාසයකට බඳුන් වූ අතර සිංහල ජාතිය බටහිරකරණයට ලක් විය. ලාංගනී ප්‍රනාන්දු අබේදීර විසින් රචිත කුණ්ඩාවාඩය(1998) නවකතාවෙහි කතුවරිය විසින් මනුෂ්‍ය ගති ස්වාභාවයන්හි සියුම් හා සංකීර්ණ ගති ස්වභාවයන් ඉස්මතු කරමින් එකී චරිතයන් බටහිරකරණයට ගැති වීමත් සමඟ මිනිසුන්ගේ චින්තනයේ පටන් සිරිත් විරිත් ද බටහිරකරණයට ලක් වන අයුරු විවරණය කෙරෙයි. යොහැන්නස් පීරිස් නම් චරිතය තමාගේ නොතාරිස් පදවියෙහි මාන්නක්කරකිමින් හිස උදුම්මවාගෙන සිටින අතර සිය දියණිවරුන් උසස් වැදගත් පවුල් වෙත විවාහ කර දීමට සිතයි.

> “අක්කා නඟාලා කබාකරුත්තු කම්බා උනා තබා කපු රෙද්දෙන් මැසූ ලිහිල් දිග ගවුම් ඇඳගෙන ළිඳට ගොඩ වී මුහුණ අත් පා සෝදා ගත්තේ කුප්පි ලාම්පු එළියෙනි. ඩැනිස්ටර් දෙහිවලින් එවූ ලංසි නෝනා හන්දා ගෑනු කෙල්ලන්ගේ ජීවිතවල වෙච්චි වෙනස...ලිපේ දර අඟුරු හපාලා මෙච්චර


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කල් අපූරුවට දත් මැද්දාට දැන් කොළඹින් ගේන දත් බුරුසුවයි රට බේත් කොපුවයි නැතුව ම බැරි හැටි...

අක්කයි නංගිලයි ඔය කම්බා කබාකුරුත්තු අත අරින්ඩ ඕන. ඉංග්‍රීසි ටිකක් ඉගෙන නොගෙන බෑ අම්මෙ, මහත්තුරුන්ට කතා කරන්න..." (අබේදීර,1998:23).

යොහැන්නස් පීරිස්ට හා ලුවිසියානාට දරුවන් සය දෙනෙකි. ඉන් තිදෙනෙක් ම දියණියෝ ය. දැඩි මතධාරී චරිතයක් වූ යොහැන්නස් පීරිස්ගේ මාන්නය හා වෙනත් හේතු නිසා විවාහය පමා වූ වැඩිමල් දියණිය වන ජුලියානාගේ වයස තිහකි. තම පුතුන්ට සිදු වන මඟුල් තුලාවල දී මදි පුංචිකමක් නොවන්නට යොහැන්නස් පීරිස් විසින් ලංසි ගැහැනියක් ගෙන්වා ගෙන දියණිවරුන් ව බටහිර පන්නයට ගැළපෙන පරිදි හැඩගැස්වීමට කටයුතු කළේ ය. මෙහි දී මොවුන්ගේ ඇඳුම් පැළඳුම්වල පටන් සෑම දෙයක් ම විපර්යාසයට ලක් විය. අක්කලා නඟාලා කබා අත් හැර කපු රෙද්දෙන් මැසූ ගවුම් හැඳීමට පුරුදු වූ අතර මෙපමණ කල් ලිපේ අඟුරුහපා දත් මැදගත් ඔවුන්ට කොළඹින් ගෙනෙනා දත් බුරුසු නැතිව ම බැරි විය.

මෙකල ලාංකේය සමාජයෙහි සිදු වූ තවත් ප්‍රධාන විපර්යාසයක් ලෙස භාෂාවෙහි සිදු වූ විපර්යාසය පෙන්වා දිය හැකි ය. භාෂාව බිහිවීම මානව ශිෂ්ටාචාරයේ වැදගත් සිද්ධියකි. මුල් යුගයේ දී එනම් භාෂාව බිහිවීමට පෙර සංකේත, සංඥා හා ශබ්ද මගින් අදහස් හුවමාරු කර ගැනීමට මානවයා සමත් විය. භාෂාව බිහිවීම නිශ්චිත කාල වකවානුවක් තුළ සිදු නොවී ය. මේ සඳහා ඉතා දීර්ඝ කාලයක් ගත විය. එක් එක් ජන කණ්ඩායම් විසින් ඔවුන්ට ආවේණික වන පරිදි භාෂාව නිපදවා ගනු ලැබී ය. භාෂාව (Language) පිළිබඳ ව විවිධ නිර්වචන නූතන වාග්විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කොට ඇතත් පොදු පාඨකයාට පහසුවෙන් වටහා ගත හැකි නිර්වචනයක් සේ අදත් පිළිගත හැක්කේ බර්නාඩ් බ්ලොක් (Bernard Bloch) සහ ජෝර්ජ් එල් ට්‍රේගර් (George L.Trager) විසින් 1942 දී මුලින් ම පළ කළ Outline of Linguistic Analysis නමැති පොතේ පස්වන පිටුවෙහි එන පහත දැක්වෙන නිර්වචනයයි.

"A Language is a system of arbitrary vocal symbols by means of which a social group coopertates"

මේ නිර්වචනය අනුව භාෂාව විධිමත් සැලැස්මකින් (system) යුක්ත ය. එහි ඇත්තේ සංකේත (symbols) යි. මේ සංකේත සැදුණේ ශබ්දවලින් (vocal) ය. මේ සංකේත බිහි වුණේ හුදු සම්මුතියෙන් (arbitary) ය. භාෂාවේ අරමුණ සමාජය යහතින් පවත්වා ගෙන යෑමයි (දිසානායක, 2016:01).

සිංහලය කෙරේ වඩාත් බල පෑ යුරෝපීය භාෂාව ඉංග්‍රීසියයි. ජන වහරේ ඇසෙන හැටියට 'ඉංගිරිසිය' යි. 1802 දී මේ රට ඉංග්‍රිසිකාරයන්ගේ කොලනියක් බවට පත් විණ. 1815 දී අත්සන් කළ උඩරට ගිවිසුමෙන් පසුව ඉංග්‍රීසිකාරයෝ මෙරට පාලකයන් බවට පත් වූහ. පෘතුගීසිකාරයාත් ඕලන්දකාරයාත් පාලනය කළේ බටහිර මුදු තීරය පමණක් වුවත් ඉංග්‍රිසිකාරයා මුළු දිවයින ම තමන් යටතට ගත්තේ ය. එතැන් සිට සිංහල භාෂාව කෙරේ බල පාන්නට වූයේ ඉංග්‍රිසියයි. 1948 දී ලංකාවට නිදහස දී ඉංග්‍රිසි පාලකයන් රට හැර ගියත් ඔවුන්ගේ භාෂාවේ බලපෑම නොනැවතිණි. අද එදාටත් වැඩියෙන් ඉංග්‍රීසිය සිංහලය කෙරේ බල පාමින් පවතියි. විවිධ හේතු සාධක නිසා ඉංග්‍රීසිය ලෝක භාෂාවක් බවට පත් වෙමින් පැවතීම මේ බලපෑම තවත් වැඩි කරයි (දිසානායක, 2016:304).

යටත්විජිත යුගයෙහි බලපෑමෙන් ලාංකේය සමාජයෙහි සිදු වූ තවත් ප්‍රධාන විපර්යාසයක් වන්නේ සිංහලයා විසින් සිය මව් භාෂාව වන සිංහල අමතක කර දමා ඉංග්‍රීසි භාෂාව වැළඳ ගැනීම ය. කුණ්ඩාවාඩය නවකතාවෙහි ද කතුවරිය නිරූපණය කරනුයේ, යොහැන්නස් පීරිස් නම් චරිතය විසින් සිය දරුවන් සිංහල භාෂාවෙන් ඈත් කරමින් කෙමෙන් කෙමෙන් ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම කෙරෙහි නැඹුරු කරන අයුරුත්, එලෙස ඉංග්‍රීසි ඉගෙනීම මගින් සමාජයේ උසස් තත්ත්වයකට පත් විය හැකි බවත් ඒත්තු ගන්වන අයුරු ය. යොහැන්නස් පීරිස් සිංහල භාෂාව පවා දෙවෙනි තැනට දමමින් සිය දරුවන්ට නම් තැබුවේ ද ඉංග්‍රීසියෙනි.

"ජුලියානා කැරෝලිනා

විලියම් ඩැනිස්ටර්

සිල්වෙස්ටර් තෝමස්

සිසිලියානා සොපායා

ලෝරා ඇන්ජලීනා

"යොහැන්නස් පීරිස් කාලෙට ගැළපෙන්ට හිතේ හැටියට තෝරා ගත්තේ අමු ඉංග්‍රීසි නම්. අප්පා නොකියවා පප්පා කියවා ගත්තේත් හිතේ ආසාවට. නම් දැම්ල්ලට නායක හාමුදුරුවො හරස් උනේ එක වතාවයි.

...කැලේ කොළේ උන්ටත් ඉංගිරිස් රජ පැලැන්තියේ නංගං නැතුව බැරුවා තමා. රාළහාමිගේ මනාපෙට සාරා කැරලයින් කියාලා දැම්මොත් උප්පැත්ති ආනුභාවෙ අහෝසි වෙයි. ගණ සෑස්තරේට අනුව අපි දුන්නේ අපූරු නම තමා ඔය..."(අබේදීර,1998:19-20).

යොහැන්නස් පීරිස්හට අවශ්‍ය වූයේ, තම පන්තියේ උසස් බව නිරූපණය කිරීමට ය. ඉංග්‍රීසීන්ගේ දෑ අනුකරණය කිරීමෙන් ධනපති පන්තියේ පැතිකඩක් නිරූපණයට කතුවරිය උත්සහ කරයි. අනෙක් පන්තීන්හි මිනිසුන් පහත් කරමින් ඇඳුම් පැළඳුම්, නම් ගම් ආදිය බටහිර පන්නයට අනුව වෙනස් කරගනිමින් සිරිත් විරිත් ද අභිබවා යමින් ධනපති පන්තියේ ස්වරූපයක් නවකතාව මගින් නිරූපණය කෙරෙයි.


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

කුලය (Caste) වනාහි මෙරට 19 වන සියවසෙහි ආර්ථික හා සමාජ සිරිත් විරිත් සැකසීමේ දී අනිවාර්ය වූ සහ වඩාත් බලපෑම් සහගත ආකාරයකින්, පැවති දෙයකි. මුළු සමාජ ක්‍රමයෙහි ම මෙම කුල බලපෑම දක්නට ලැබිණි.

පූර්ව ධනේශ්වර සමාජයෙහි වැදගත් ඉඩම් හිමියන් 'උසස් කුලයෙන්' වැළැක්විය නොහැකි වූ අතර පහත් කුලයේ අය සාපේක්ෂ ව දුප්පත් වූහ. යටත්විජිත පාලකයන් පවා උසස් කුලවල අයට තනතුරු හා පත්වීම් ලබා දීම දිගට ම කරගෙන ගියෝ ය. මේ අනුව බලය , ඉඩම් , සමාජ තත්ත්වය කුලය මත පදනම් විය. නමුත් ඉහත සාකච්ඡා කළ පරිදි දහනව වන සියවසේ සමාජ හා ආර්ථික වෙනස්කම් සමඟ ප්‍රාග්ධනය සහ රැකියා සඳහා ප්‍රවේශය සියලු කුලවලට ඇති අතර සමාජයේ වෙනස්කම් සඳහා තීරණාත්මක විය. එහි ප්‍රතිඵලයක් ලෙස 19 වැනි සියවසේ දෙවැනි අර්ධයේ නූතන ලංකාවක් බිහිවීමේ වැදගත් සහයෝගීතාව වූයේ පවතින වාර්ගික, ආගම්, කුල සීමාවන් කපා හරිමින් ලාංකේය මධ්‍යම පන්තිය ඉංග්‍රීසි උගත් බටහිර නැඹුරු පන්තියක් නිර්මාණය වීමයි. මෙම පන්තියේ සාමාජිකයෝ ඉංග්‍රීසි භාෂාව සහ ඉංග්‍රීසි අධ්‍යාපනය, බටහිර සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම්, ආහාර පාන, ආචාර විධි සහ මානවවාදී වටිනාකම් යන විෂයයන්හි ඔවුන්ගේ ආස්ථානය සොයා ගත්හ. මෙම මධ්‍යම පංතිය යනු එක් අතකින් ස්වදේශික පෙරදිග සංස්කෘතිය සහ අනෙක් පැත්තෙන් 'ආගන්තුක' අභඹු ලෙස සංස්කෘතීන් දෙකක ගැටීමේ සහ මිශ්‍රණයේ නිර්මාණයකි. අතීතයේ කුලය මත පදනම් වූ දෘඪ සමාජ ස්තරීකරණයේ පෙර ක්‍රමය ක්‍රමයෙන් වෙනස් විය. කුලය සම්බන්ධයෙන් වෙනස් කොට සැලකීම් නොකිරීමේ බ්‍රිතාන්‍ය ප්‍රතිපත්තිය මෙයට හේතු වන්නට ඇත. මෙම ප්‍රතිපත්තියේ මූලික අඩිතාලම දැමුවේ 1832 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගිනි. 20 වන ශතවර්ෂයේ ආරම්භය වන විට, "ජනගහනය, බලය සහ ධනය මුහුදු තීරයට මාරු කර ඇත, නව පරමාදර්ශය සහ බලවේග මතු වී ඇත, වෙරළේ නිර්භීත නාවිකයින්(එනම්, කරාව) සහ අනෙකුත් කුලවල සම්බන්ධතා මගින් ජවසම්පන්න ජීවිතයට ඉක්මන් විය (Ariyarathne, 2020:29).

මඩරත් නවකතාවෙහි 'පන්න' නම් කුලයට අයත් පිරිසක් පිළිබඳ ව කියැවේ. ශ්‍රී ලාංකේය රාජ්‍යත්වයත් සමඟ බැඳී පවතින ප්‍රමුඛ කාරණයක් වන රාජකාරි ක්‍රමය රාජ්‍ය ඉදිරියට පවත්වාගෙන යාමට අවශ්‍ය කරන්නා වූ ධනයත්, ශ්‍රමය සම්පාදනයේත් ප්‍රධානතම මඟ බවට හඳුනාගත හැකි ය. ගම පවුල කුල ක්‍රමය යන සාධක ගසට පොත්ත සේ රාජකාරි ක්‍රමය සමඟ බැඳී පවතින අයුරුත් කුල භේදය හේතුවෙන් මෙකී රාජකාරි ක්‍රමයෙන් ජනයා පීඩාවට පත් වන අයුරුත් මෙකී නවකතාව ඔස්සේ විවරණය වනු දැකිය හැකි ය.

මෙරට රාජකාරි ක්‍රමය කුලය අනුව ක්‍රියාත්මක ව පැවතිණි. ඒ අනුව සමාජය බෙදා තිබුණ කුල භේදය එක් එක් කුලයකට විශේෂ රාජකාරි සේවාවන් ඉටු කළ යුතු ව තිබුණි. මේ තත්ත්වය යටතේ රජුට ඉටු කළ යුතු වූ කාර්යයන් පරිපාලන සේවාවේ සිට කුඩා සේවා දක්වා ව්‍යාප්ත විය. පැරණි ශ්‍රී ලාංකේය සමාජයේ සමස්ත දේශපාලනික, සමාජ, ආර්ථික ක්ෂේත්‍රවල කැපී පෙනුන ප්‍රධානතම ලක්ෂණය වූයේ කුල ක්‍රමයයි. මෙම ක්‍රමය පසුකාලීන ව කුල භේදයක් බවට පත්වූ නමුත් පැරණි දේශීය ක්‍රමය යටතේ එය කුල භේදයක් නොව එක්තරා ශ්‍රේණි ක්‍රමයක් වූයේ ය. සමාජයේ සෑම කුලයකට ම නියමිත ව කාර්යභාරයක් පැවරී තිබුණ අතර, ස්වයංපෝෂිත සහ ජීවන සමාජ ක්‍රමය පවත්වාගෙන යාම සඳහා ඒ ඒ කුලවලට පැවරී ඇති කාර්යය අනිවාර්යයෙන් ම කළ යුතුවිය http://repo.lib.sab.ac.lk:8080/xmlui/bitstream/handle/123456789/1122/Akyana.

> "රාජකාරි ක්‍රමය පැවතියේ කුල ක්‍රමය අනුව ය. රාජකාරිකාරයන් ඉටු කළ යුතු වූ නිශ්චිත රාජකාරියක් වීය. ඒ අනුව විවිධ පංගු වෙන් වී තිබුණි. රාජකාරිය ඉටුකරන ලද්දේ රජු, රදළ ප්‍රධානීන්, මාලිගාව හා විහාර දේවාලවලට ය. දැන් එබඳු රාජකාරි ඉටු නොකළ කුලවතුන්ට ද පාරවල්වල වැඩට යාමට සිදුවීම ගැමි සමාජය තුළ ඇති කළේ අප්‍රසාදයකි" (තෝරදෙනිය, 2020:128).

1833 දී කෝල්බෲක් ප්‍රතිසංස්කරණ මගින් අනිවාර්ය රාජකාරි ක්‍රමය අහෝසි කිරීමට ප්‍රථම ඉංග්‍රීසීන් විසින් අවස්ථා කීපයක දී ම තම පාලන ප්‍රදේශවල ඉතා පීඩාකාරී ලෙස එම ක්‍රමය ක්‍රියාත්මක කළ අතර රාජකාරි ක්‍රමය අහෝසි කරනවා යැයි පැවසුව ද මහාමාර්ග තැනීම සඳහා රාජකාරි ක්‍රමයට මිනිස් ශ්‍රමිකයෝ යොදා ගන්නා ලදහ. මෙය රාජකාරි ක්‍රමය අවභාවිත කිරීමක් වූ අතර නිශ්චිත රාජකාරි එක් එක් කුල අනුව පංගු වෙන් ව තිබුණත් මෙහි දී පහත් කුලවල අයවලුන්ට පමණක් නොව මින් පෙර රාජකාරි ඉටු නොකළ කුලවතුන්ට පවා පාරවල්වල රාජකාරි සඳහා යාමට වීම නිසා මෙය සමාජය තුළ ඇති කළේ අප්‍රසාදයකි.

19 වන සියවස ශ්‍රී ලාංකේය ආර්ථිකයෙහි හැරවුම් ලක්ෂ්‍යය සනිටුහන් වූ කාල පරිච්ඡේදයකි. 19 වන සියවසෙහි මුල් භාගයෙහි ශ්‍රී ලාංකේය ආර්ථිකයෙහි ප්‍රධානත ම ජීවනෝපාය මාර්ගය වූයේ, කෘෂිකර්මයයි. අනුරාධපුර රාජ්‍ය සමයෙහි එනම්, දේවානම්පියතිස්ස රාජ්‍ය සමයෙහි ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සමාජ, ආර්ථික ක්‍රමයට හා සංස්කෘතියට පදනම වැටුණු 16 වන සියවසෙහි පෘතුගීසීන්ගේ පැමිණීමෙන් පසු ව බුදු දහමෙහි ආභාසය මත ගොඩනැගුණු එකී සමාජ ආර්ථික රටාවෙහි වෙනස්කම් ඇති වීම ආරම්භ වුණි. පෘතුගීසිහු මුහුදුබඩ ප්‍රදේශවල බලය අල්ලාගෙන සිටි කාලයේ වෙළඳාම කෙරෙහි අවධානය යොමු කළ අතර ලන්දේසීන්ගේ බලය පැවති සමයේ ඔවුහු කුරුඳු, ගම්මිරිස් ආදිය වගා කිරීමේ ක්‍රමයක් අනුගමනය කිරීමෙන් අපනයනය ඉලක්කකොට ගත්හ. නමුත්, පෘතුගීසින් හා ලන්දේසීන් යන දෙකොට්ඨාසයේ ම එකී මුහුදුබඩ ප්‍රදේශ ආශ්‍රය කොටගෙන බලය ගොඩනගාගෙන සිටි කාල වකවානුවෙහි දිවයිනේ විශාල ප්‍රදේශයක උඩරට රාජ්‍යයෙහි බලය ව්‍යාප්ත ව පැවතීම හේතුවෙන් මෙරට සංප්‍රදායික ආර්ථික රටාවේ දැවැන්ත විපර්යාසයන් සිදු කිරීමට ඔවුන්හට හැකියාව නොලැබුණි. මෙහි දී ලාංකේය ආර්ථිකයෙහි පුළුල් වෙනස්කම් සිදු කිරීමට සමත්වූ යුරෝපීය ජාතිය වූයේ ඉංග්‍රීසීන් ය


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

https://github.com/devzer01/history/blob/master/%E0%B6%B6%E0%B7%8A%E2%.

බ්‍රිතාන්‍ය යුගයේ දී වතු කෘෂිකර්මය හා වැවිලි ආර්ථිකයක් රටෙහි හඳුන්වා දීම හරහා සාම්ප්‍රදායික ආර්ථික ක්‍රමයේ දැවැන්ත විපර්යාස සිදු වූ අතර කෝපි, තේ සහ රබර් වැනි අපනයන භෝග මත පදනම් වූ වැවිලි ආර්ථිකයක් බිහි විය. වැවිලි ආර්ථිකය පදනම් වූ කෝපි, තේ සහ රබර් වැනි අපනයන භෝග සඳහා වාණිජ, ප්‍රවාහන හා සන්නිවේදන ජාල සඳහා නාගරික මධ්‍යස්ථාන අවශ්‍ය විය. මෙම සාධක දිවයින එක්සත් කළ බල කේන්ද්‍රය වූ අතර සමාජය ගමෙන් දුරස් කෙරී ය (Ariyarathne, 2020:21). බ්‍රිතාන්‍යයන් යටතේ වතුවගාවේ ප්‍රතිඵල වශයෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික රටාවේ සම්පූර්ණ විපර්යාස සිදු විය. දේශීය කෘෂිකර්මය නොසලකා හැරීමත්, වතුවගාව හා ඒ හා සම්බන්ධ විදේශීය වෙළඳාමක් කෙරෙහි මූලික අවධානය යොමු කිරීම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකය ලෝක වෙළඳපොළ මත රඳා පවතින තත්ත්වයක් උද්ගත විය (සෝමරත්න, 1991:275).

පළමු වරට ශ්‍රී ලංකාවේ කෝපි වැවීම ආරම්භ කරන ලද්දේ 1824 දී බාර්න්ස් ආණ්ඩුකාරවරයා සහ ජෝර්ජ් බර්ඩ් නැමැත්තා විසිනි. 1837 දී ජැමෙයිකාවේ කෝපි වැවීම පිළිබඳ ව විශේෂ දැනුමක් ලබා සිටි ආර්. බී. ටයිලර් නැමැත්තාගේ පැමිණීමෙන් පසු ව විද්‍යානුකූල ව කෝපි වැවීම ආරම්භ විය (සෝමරත්න, 1991:38). කෝපි වැවීම පළමුවෙන් ම ලන්දේසීන්ගේ පාලන සමයේ දී මුහුදුබඩ ප්‍රදේශ කිහිපයක සුළු වශයෙන් ආරම්භ වුවත්, ලන්දේසි පාලන සමයේ දී කුරුඳු වගාවට ප්‍රමුඛත්වය ලැබුණු නිසා කෝපි වගාව දියුණු නොවී ය. ඉංග්‍රීසීන් උඩරටට පැමිණෙන විට ස්ථාන කිහිපයක ගෙවතු වගාවක් ලෙස කෝපි වවා තිබුණ ද, කෝපි වගාව වතු වගාවක් ලෙස දියුණු වූයේ, බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ය.

එම නිසා 1880 දශකයේ දී සින්කෝනා, කොකෝ, තේ ආදිය කෝපි වැවුණු ප්‍රදේශවල නව භෝග ලෙස වගා කරන ලදී. මෙයින් වැඩි ම සාර්ථකත්වයක් ලැබුණේ තේ වගාවෙනි (සෝමරත්න, 1991:39).

මඩරත් නවකතාවෙහි වතු කර්මාන්තය හේතුවෙන් ගැමි ජනයාට මුහුණ දීමට සිදු වූ දුෂ්කරතා හා අභියෝගයන් සුළුපටු නොවන බැව් දක්වා ඇති අතර කෝපි වගාවේ ව්‍යාප්තිය උඩරට ගැමි ආර්ථිකයෙහි වැදගත් ස්ථානයක් හිමි කොටගෙන ඇති ආකාරය පිළිබඳ ව ද මෙහි සඳහන් වේ.

1835 න් පසු ව කෝපි වගාව කොතරම් දුරට ව්‍යාප්ත වූවා ද යත් ඒ අවධියේ ව්‍යාපාරිකයන් කෝපි වගාව කෙරෙහි දැක්වූ උනන්දුව "කෝපි පිස්සුව" වශයෙන් හඳුන්වන ලදී. එකල ආරම්භ කළ කෝපි වතු සියල්ල ම පාහේ යුරෝපීයයන්ට අයිති වූ ඒවා විය (සෝමරත්න, 1991:256).

> "'දැන් කෝපි තමයි රජ වැවිල්ල' යි යළිත් දවසක දී අම්බලමේ කතා ඇරඹියේ සඟරම්දෙණියේ දුග්ගන්නාරාළ ය. කුරුඳු, පුවක්, අලි ඇත්තු, මුතුමැණික්වලට වැඩිය කාසි හම්බු වෙන්නෙ කෝපිවලින්, කෝපි හදන්ට කුරුඳු වතු විකුණනවා කියනවා" (තෝරදෙනිය, 2020:95).

සඟරම්දෙණියේ දුග්ගන්නාරාළ විසින් අම්බලමේ කතා කීම ඇරඹියේ කෝපි වැවිල්ල පාදක කරගනිමින් ය. එහි දී ඔහු සඳහන් කරනුයේ, මෙරට තිබෙනා වටිනා සම්පත් වන කුරුඳු, පුවක්, අලි ඇතුන් හා මුතු මැණික්වලටත් වඩා ඉතා වටිනා සම්පතක් ඇති බවත් එය කෝපි නම් ආර්ථික භෝගයක් වන බවත් , කෝපි වැවීමෙන් අතමිට සරු කරගත හැකි බවත් ය. මෙහි දී සඳහන් වන තවත් වැදගත් කාරණයක් වන්නේ, කෝපි වැවීම සඳහා මිනිසුන් විසින් සිය කුරුඳු වතු පවා විකිණීමට පෙළඹීම ය.

කෝපි වගාවෙහි පරිහානියත් සමඟ ඊට විකල්ප භෝගයක් ලෙස සින්කෝනා හා කොකෝවා යන භෝග හඳුන්වා දුණි. නමුත් එකී වගාවන් ද එතරම් සාර්ථක නොවීම නිසා ලාංකේය පරිසරයට ගැළපෙන භෝගයක් හඳුන්වා දීමට බ්‍රිතාන්‍යයන් උත්සුක වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කඳුරට දේශගුණයට වඩාත් උචිත භෝගයක් මෙන් ම ආර්ථික භෝගයක් ද වන 'තේ' හඳුන්වා දෙන ලදී. 1873 වර්ෂයේ දී පමණ තේ වගාව පිළිබඳ ව මූලික අධ්‍යයනයනක් සිදු කරන ලද්දේ ජේම්ස් ටේලර් නමැත්තා ය.

මෙරට වැවිලි භෝගයක් ලෙස තේ වගාව වගා කිරීමට ආරම්භ කිරීමෙන් මෙරට සිදු වූ සමාජ විපර්යාසයන් බොහෝ ය. තේ වගාව සඳහා එහි සේවයට ශ්‍රමිකයන් ප්‍රමාණවත් නොවී ය.

එහෙයින් වැවිලි කර්මාන්තයට අවශ්‍ය ශ්‍රමය සපයා ගැනීමේ දී සිංහලයන් බඳවා ගැනීමට ඔවුහු එතරම් කැමැත්තක් නොදැක්වූහ. මේ නිසා ශ්‍රමය සපයා ගන්නා ලද්දේ දකුණු ඉන්දීය කුලීකරුවන් ගෙන්වා ගැනීමෙනි (ඊරියගම, 2011:86-87). ගමරාල හා පිච්චි අතර වූ කතාබහේ දී ඉංග්‍රීසීන් විසින් තේ වගාව සඳහා දෙමළ වතුකම්කරුවන් ගෙන ඒම පිළිබඳ ව සඳහන් කෙරෙයි.

> "ඒ පාරවල් සේරම කඩලා පාලං තනනවා මේ සුදු මහත්තුරුන්ගේ ආණ්ඩුවෙන්. මේ මාදම්පෙ වත්තෙ තේ හිටෝන සුදු මහත්තුරු... මුං මුහුදෙන් එපිට ඉන්දියා රටෙං වතු වැඩට ගේන දෙමෙල්ලු" (මස්ඉඹුල, 2015:91).

තේ වගාවත් සමඟ පැමිණි දෙමළ වතු කම්කරුවන්ගේ ආගමනයත් සමඟ මෙරට 'ලැයිම් කාමර' සංස්කෘතියක් බිහි වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස උප සංස්කෘතික ලක්ෂණ සිංහල ගම්මානවල ස්ථාපිත විය.

ඉංග්‍රීසි අධිරාජ්‍යවාදී සමයේ තැබෑරුම් පවත්වාගෙන යාම සඳහා සහ එහි බදු මුදල් එකතු කිරීම සඳහා රජය මගින් අරක්කු රේන්දය පවත්වාගෙන ගිය අතර අරක්කු රේන්දයෙහි කුලී බලපත්‍රය ලබාගන්නා පුද්ගලයා ඇරක් රෙන්ටර් (Arrack Renter) ලෙස හැඳින්විය. නන්නාඳුනන විදේශිකයින් පිරිසක් පැමිණ තිරිවානා ගල් සපමින්, රතු ලේ බොනවා දැක


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

විස්මයටත්, ත්‍රාසයටත් පත් වූ සිංහලයා පසු ව පෘතුගීසි සමයේ සිට ක්‍රම ක්‍රමයෙන් මත්පැන් භාවිතයට පුරුදු වූ අතර මේ වනවිට ලංකාව සුරාගුදමක තත්ත්වයට පත් වී හමාර ය. වත්මනේ දී ශ්‍රී ලංකාවේ දක්නට ඇති මත්පැන් නිෂ්පාදනය හා වෙළඳාම වඩාත් සංවිධානාත්මක ව සමාජයේ මුල්බැස ගත්තේ යුරෝපීය ආක්‍රමණවලින් පසු ව වූ අතර 1796 දී ඉංග්‍රීසීන් විසින් මුහුදුබඩ පළාත් අල්ලා ගැනීමෙන් අනතුරු ව අරක්කු පෙරීම මෙරට දේශීය ජනතාව වෙත බාර කෙරිණි. ඉන් පසු ව ක්‍රම ක්‍රමයෙන් ආදායම් ලබන ප්‍රධාන ආදායම් මාර්ගයක් බවට මෙය පත් වූ අතර එය වේගයෙන් ව්‍යාප්ත විය.

ලන්දේසි සහ බ්‍රිතාන්‍ය යුගයන්හි මුල් භාගයේ බොහෝ කුඩා ව්‍යාපාර අතරින් එකක් වූ අරක්කු සිල්ලර වෙළඳාම බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මහා ව්‍යාපාරයක් බවට පත් වූ අතර ප්‍රාග්ධන ගොඩනැගීමේ මූලාශ්‍රයයක් බවට පත් වූවේ ය. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙම කර්මාන්තය කැපී පෙනෙන ව්‍යාප්තියකට ලක් විය. එදා ආර්ථිකයේ සිදු වූ වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස අරක්කු ඉල්ලුමේ සැලකිය යුතු වර්ධනයක් ඇති විය. අරක්කු මිලදී ගැනීම එක් පළාතකට පමණක් සීමා නොවී ය. එය මධ්‍යම පළාත, බස්නාහිර පළාත, උතුරු පළාත, දකුණු පළාත සහ නැගෙනහිර පළාත දක්වා පැතිර ගියේ ය. වතු ආර්ථිකය සමඟ මෙම මත්පැන් වෙළඳාම නව ධනපති පන්තියක් බිහිවීමට ඉමහත් දායකත්වයක් ලබා දුන්නේ ය.

මාණික්කාවත යනු, මහපොළව මත සිදු වූ හා සිදුවෙමින් පවතින යථාර්ථය විදහා දක්වන්නා වූ නවකතාවකි. වතු වගාව හේතුවෙන් මෙකල සමාජයෙහි දැවැන්ත විපර්යාසයන් රාශියක් සිදු වූ අතර ඒ අතරින් එකක් වන්නේ, අරක්කු තැබෑරුම් බිහි වීමයි.

> "නන්දෝරිස් ගොඩකවෙලින් පොල්ගහ ලකුණ ඇති අරක්කු බෝතල් තුනක් ගෙනැවිත් තිබුණේ ය. අරක්කු නොබොන උන් පවා එදා රාත්‍රියේ අරක්කු ඩිංගක් බිවූ හ..." (මස්ඉඹුල, 2015:145).

පොල් ගසේ සෑදෙන්නා වූ පොල් මලෙහි සාරයෙන් නිෂ්පාදිත අරක්කු නිසා ම මෙරට ධනපති පන්තියක් බිහි විය. නන්දෝරිස් විසින් ගොඩකවෙලින් අරක්කු බෝතල් තුනක් රැගෙන ඒමෙන් සංකේතවත් කරනුයේ, ගැමියා මත්පැන් සඳහා දක්වන ලොල්බව හා ඊට හුරු වී ඇති අන්දම ය. කිසිදිනෙක අරක්කු තොල ගා හෝ නොමැති මිනිසුන් පවා අරක්කු පානයට නම්මවා ගැනීමට තරම් විශාල බලයක් ඉංග්‍රීසින්ගේ මෙම අරක්කු සතු ව පැවති බව කතුවරයා දක්වා ඇත්තේ කිසිදින නොබිව් මිනිසුන් පවා අරක්කු ඩිංගක් බිවූ ආකාරය විස්තර කරමින් ය.

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන පද්ධතියේ ඉතිහාසය පිළිබඳ ව පුරාවිද්‍යාත්මක හා සාහිත්‍යමය මූලාශ්‍රය ඔස්සේ විමසීමේ දී තහවුරු වන්නේ, එහි ඉතිහාසය අනුරාධපුර යුගය තරම් අතීතයට විහිද යන බවයි. එනමුත්, වත්මනේ දී භාවිතයට ගන්නා මාර්ගවලින් බොහොමයක ම මූලාරම්භය සිදු ව ඇත්තේ බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ය. බ්‍රිතාන්‍යයන් ඉතිරි කර ගිය සියලු යටිතල පහසුකම් අතුරින් වඩාත් වැදගත් වන්නේ, මුළු රට ම සම්බන්ධ වන සේ ඉදි කරන ලද දුම්රිය මාර්ගයයි. රටෙහි පළමුවෙන් ම දුම්රිය පීලි සවි කිරීම බ්‍රිතාන්‍ය පාලන සමයේ දී සිදු වූ අතර, සියලු ප්‍රදේශ යා වන සේ දුම්රිය පද්ධතියක් සැකසීමට ඔවුහු ක්‍රියා කළහ. මේ අතරින් දෙමෝදර, ඔහිය, පට්ටිපොළ වැනි උස් ස්ථානවල දුම්රිය මාර්ග විස්මිත නිර්මාණ ලෙස අදටත් ලොව පුරා ප්‍රසිද්ධ වී තිබේ.
මහාමාර්ග හා දුම්රිය පිළිබඳ ව සඳහන් වන තවත් නවකතාවක් ලෙස මඩරන් නවකතාව පෙන්වා දිය හැකි ය. ඉංග්‍රීසි යටත්විජිත පාලන සමයෙහි වතු වගාව ඇරඹීමත් සමඟ ප්‍රවාහන පද්ධතිය ද ගොඩනැඟුණු අයුරු මෙහි විස්තර වෙයි.

1837 දී වැවිලි භෝගයක් ලෙස කෝපි වැවීමට පටන් ගැනීමත් සමඟ ඒවා ප්‍රවාහනය සඳහා පහසුකම් නොතිබුණු බැවින් එහි යටිතල පහසුකම් ලෙස මාර්ග පද්ධතිය වැඩිදියුණු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ - මහනුවර මහාමාර්ගයට අමතර ව තවත් මාර්ග කිහිපයක් තනන්නට විය.

> "පාරවල් කපන්ට තවත් හේතුවක් තියෙනවා. කෝපි රට පටවන්ට. කෝපි වතුකාරයෝ තමයි පාරවල් ඉල්ලනව කියන්නේ. වැඩි කල් නොගිහින් මේ හැම කෝපි වත්තකට ම පාරවල් කැපෙනවා" (තෝරදෙනිය,2020:95).

දිනක් සඟරම්දෙණියේ දුග්ගන්නාරාළ පැවසුයේ, මහාමාර්ග තැනීම සඳහා පාරවල් කැපීමට එක් ප්‍රධාන හේතුවක් වූයේ, කෝපි අපනයනයෙහි පහසුව තකා බව ය. කෝපි නෙළා ගත් පසු ඒවා අපනයනය සඳහා ගෙනයාමේ දී මාර්ගයන්හි පැවති දුෂ්කරතාවන් හේතුවෙන් ඊට පිළියමක් ලෙස ඉංග්‍රීසීන් විසින් මහාමාර්ග තැනී ය.

මෙකල දී ලාංකේය අධ්‍යාපනයෙහි ද විපර්යාසයන් සිදුවිය. ලංකාවෙහි මිෂනාරි අධ්‍යාපනය ව්‍යාප්ත කිරීමෙහි ලා පුරෝගාමී ලෙස කටයුතු කළේ මිෂනාරි සංගමය ය. එමෙන් ම බ්‍රිතාන්‍ය පාලන සමයේ දී මෙරටට පැමිණි විදේශීය සංවිධාන කිහිපයක් ක්‍රිස්තියානි ධර්මය මෙරට පුරා ව්‍යාප්ත කිරීමට කටයුතු කළහ. එනම්, ලන්ඩන් මිෂනාරි සමාගම (1804), බැප්ටිස්ට් මිෂනාරි සමාගම (1812), වෙස්ලියන් මිෂනාරි සමාගම (1814-1815), ඇමරිකන් මිෂනාරි සමාගම (1816), චර්ච් මිෂනාරි සමාගම (1818) යන සංගම් ය. මෙම සංවිධාන මිෂනාරි සංවිධාන ලෙස හැඳින්වේ. මොවුන් මෙරටට පැමිණියේ, ක්‍රි.ව. 1804-1818 කාලයෙහි ය. මෙම මිෂනාරීන් විසින් ඔවුන්ගේ ආගම ප්‍රචාරය කිරීම සඳහා යොදාගත් ක්‍රම කිහිපයක් විය. එනම්, අධ්‍යාපනය, ලේඛනය, දේශන හා සමාජ සේවා කටයුතු ය. ක්‍රි.ව. 1833 පමණ සිට කෝල්බෲක් කොමිසමේ නිර්දේශයන්ට අනුකූල ව මෙරටෙහි ඉංග්‍රීසි පාලනයට ස්වදේශකයන් පුහුණු කරන්නට විය. ඒ සඳහා ඉංග්‍රීසි භාෂාව අධ්‍යාපන මාධ්‍ය බවට පත් කිරීමත් සමඟ මිෂනාරි අධ්‍යාපනය රට පුරා ව්‍යාප්ත කිරීමේ අරමුණ ඇති ව උසස් තත්ත්වයේ ඉංග්‍රීසි පාසල් රැසක් දිවයිනෙහි නගර අරභයා විවෘත කෙරිණි. ඉංග්‍රීසීන් පැමිණීමට පෙර ලන්දේසීන් විසින් ගොඩනැගූ පාසල් පද්ධතියක් පැවති නමුත් 1796 සිට


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

මෙරට පාලනය ගෙන ගිය මදුරාසි බලධාරීන්ගේ පාලනය නිසා ලන්දේසීන් විසින් ගොඩනඟා තිබුණු සමස්ත පාසල් පද්ධතිය ම බිඳ වැටිණි. මිෂනාරි සංවිධානය විසින් ලංකාවේ විවිධ ප්‍රදේශවලට ගොස්, මිෂනාරි අධ්‍යාපනයෙහි මාර්ගයෙන් අධ්‍යාපන කටයුතු ද, ආගමික කටයුතුවල මුවාවෙන් මිෂනාරි අධ්‍යාපනය ද මෙහෙය වන ලදී . මෙලෙස උපායන් අනුගමනය කරමින් ක්‍රිස්තියානි ආගම පැතිරවීමට මොවුහු වගබලා ගත්හ.

බ්‍රිතාන්‍යයන් විසින් මෙරට මිනිසුන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීමට කෙතරම් නම් කැපවී ද යත්, පල්ලියේ පියතුමන්ලා පවා ගැමියන්ගේ නිවෙස් වෙත ගොස් ගැමියන්ගේ දරුවන් පල්ලියේ පාසලට එවන ලෙස ඉල්ලා සිටියහ. පුංචිනාගේ හා ගුණමලාගේ පුතු වූ ඩිංගිරි ව පල්ලියේ පාසල වෙත යැවීමට පුංචිනා එක පයින් ම කැමැත්තෙන් සිටියේ පල්ලියේ පියතුමන් නිවසට ම පැමිණ ගිය දින පටන් ය.

> "කොල්ලට අකුරු සැස්තරේ උගන්නංට ඕන්නං පංසලට යවන්ට පුළුහං නෙව. සිත්තරකාරයෙක් වෙන්ටත් සාරිපුත්තරේ හෙම කියෝල තේරුං ගන්ට ඕනැනෙ.
>
> පල්ලියෙ ඉස්කෝලෙ උගන්නංනෙ ඔච්ච නෙවෙයි ඉංගිරිස්ලුනෙ. තව ඔය නානාපරකාර බාසාවල් හෙම, ඒරොප්පෙ සැස්තර හෙමත් උගන්නනවෑ කියන්නෙ. ඔහේට මතක නැද්ද අපේ මේ ඉඩං මනින්ට ආපු මහත්තැං ගොල්ලො කටේ තොලේ නොගෑවී ඉංගිරිස් කතා කොරපු උජාරුව. ආරච්චි උන්නැහේගෙ දරුවොත් ඉංගිරිස් කතා කොරපු උජාරුව. ආරච්චි උන්නැහේගෙ දරුවොත් ඉංගිරිස් උගන්නංට යවන්නෙ ඒකෙ මොකක් හරි ගත යුත්තක් තියෙන හින්ද නෙව" (සෙනෙවිරත්න, 2018:25).

ගුණමලා පවසන්නේ, ඩිංගිරිට අකුරු සාස්තරය ඉගැන්වීමට අවශ්‍ය ම නම් පන්සල වෙත යවන ලෙස ය. නමුත්, පුංචිනාගේ අදහස ඊට හාත්පසින් ම වෙනස් වූ අතර ඇගේ අදහස වූයේ, සිය දරුවාට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීමට ය. මන්දයත් එහි ගතයුත්තක් ඇති බැව් ඇයට ඒත්තුගැන්වී තිබුණු බැවිනි. ග්‍රාමීය පාසල්වල ඉගැන්වීමේ කටයුතු සිදු කිරීම සඳහා සිංහල හා දෙමළ වැනි ස්වදේශීය භාෂා උගත් මිෂනාරිවරු දේශීය භාෂාවෙන් අධ්‍යාපන කටයුතු මෙහෙය වූ අතර නාගරික පාසල්වල ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපන කටයුතු මෙහෙයවී ය. මෙමගින් මෙතෙක් කලක් සිංහල, පාලි හා සංස්කෘත පමණක් දැන සිටි මිනිස්සු ඉංග්‍රීසි භාෂාව ද ඉගෙන ගත්තෝ ය. බෞද්ධ වෙහෙර විහාරස්ථාන ආශ්‍රිත ව හා පිරිවෙන් ආශ්‍රිත ව පැවති බෞද්ධ අධ්‍යාපන ක්‍රමය මෙම මිෂනාරි අධ්‍යාපන ක්‍රමය හමුවේ පසුබෑමකට ලක් වූ අතර මිෂනාරි අධ්‍යාපනය හා සමගාමී ව ඉදිරියට යෑමේ හැකියාවක් බෞද්ධ අධ්‍යාපන ක්‍රමයට නොවී ය.

## නිගමනය

ක්‍රි.ව. 1796-1948 යන යටත්විජිත කාල පරිච්ඡේදයෙහි දී මෙරට ක්ෂේත්‍ර ගණනාවක් විපර්යාසයට ලක් වූ අයුරු පැහැදිලි ය. විශේෂයෙන් ම මෙරට සමාජ, සංස්කෘතික, ආගමික, අධ්‍යාපනික, ආර්ථික හා දේශපාලනික යනා දී විවිධ ක්ෂේත්‍ර ගණනාවක් මෙම යටත්විජිත යුගයෙහි විපර්යාසයන්ට භාජනය විය. ලංකාවෙහි බ්‍රිතාන්‍ය යටත්විජිත යුගය යනු, නවකතාකරුවාට වස්තුබීජ සපයන්නා වූ නොසිඳෙන උල්පතක් බඳු යුගයකි. එබැවින් මෙකී යටත්විජිත යුගය අළලා සිංහල නවකතා බොහොමයක් ලියැවී ඇත. මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන ගැටලුව බවට පත් වූයේ, මෙම යටත්විජිත යුගයෙහි සිදු වූ ලාංකේය සමාජ විපර්යාසයන් සිංහල නවකතාවෙහි නිරූපණය වන්නේ කෙසේ ද යන්න විමර්ශනය කිරීම ය. මෙහි දී මෙරට ලාංකිකයන් බටහිර ඇඳුම් පැළඳුම්, සමාජ සිරිත් විරිත් ඉතා කැමැත්තෙන් වැළඳ ගැනීමට පෙළඹුණු අතර කුලවත් ප්‍රභූ පැළැන්තිය බිඳ වැටී බටහිර සංස්කෘතිය අනුගමනය කරන නාගරික මධ්‍යම පන්තියක් බිහි වීම මෙහි දී දැකගත හැකි ය. සිංහලයන් ඉංග්‍රීසි පන්නයට හැඩගැසීමට දරන උත්සාහය ඇතැම් විටෙක හාස්‍යජනක වූ අතර නවකතාකරුවන් විසින් එකී අවස්ථාවන් උපහාසයෙන් යුතු ව දක්වා ඇති අයුරු දක්නට තිබුණි. සමාජ, ආර්ථික හා සංස්කෘතික වෙනස්කම් සමග කුලය පදනම් කරගත් සාම්ප්‍රදායික අනන්‍යතාව ද සංකීර්ණ මට්ටමක පැවති බව ද මෙහි දක්නට ලැබුණි. එතෙක් මෙරට පැවති ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටී වැවිලි ආර්ථිකයක් හෙවත් වාණිජ ආර්ථිකයක් බිහි වී සමාජයේ වැටුපට වැඩ කිරීමේ ක්‍රමයක් බිහි වූ ආකාරය දැකගත හැකි ය. ආර්ථික ප්‍රතිසංස්කරණයන්හි ප්‍රතිඵලයක් ලෙස බිහි වූ වැවිලි ආර්ථිකය මගින් මෙරට තොග හා සිල්ලර වෙළඳාම, අරක්කු රේන්ද ව්‍යාපාරය, මිනිරන් කර්මාන්තය ප්‍රවාහන, කටයුතු, පොල් වගාව, ස්වදේශිකයන්ට ආයෝජනය කළ හැකි ව්‍යාපාර ආදිය බිහි වීම මෙහි දක්නට ලැබුණු සුවිශේෂ කරුණු ය. මිෂනාරි අධ්‍යාපන ක්‍රමය මෙරට ආගම ප්‍රචාරය කිරීමටත්, බටහිර සංස්කෘතිය සමාජගත කිරීමටත් යොදා ගැනුණු ආකාරය මෙහි දී නිරීක්ෂණය වූ අතර මෙම බටහිර අධ්‍යාපනය ලාංකේය කාන්තාවට ද බලපෑ අතර එහි දී ඉංග්‍රීසි උගත් බෞද්ධ කාන්තාවන් බිහි වී එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් පසු ව ලාංකේය සංස්කෘතියෙන් පරිබාහිර වූ ජීවන රටාවන්ට හුරු වූ ආකාරය දැකගත හැකි විය. මෙකී යටත්විජිත යුගයෙහි සිදු වූ , සමාජ විපර්යාසයන් මෙරටට යහපත් මෙන් ම අයහපත් ප්‍රතිවිපාකයන් ද උරුම කර දුන් බැව් මෙහි දී දැකගත හැකි විය. එහි වාසි සහගත තත්ත්වයන් ලෙස, ජාත්‍යන්තර භාෂාවක් වන ඉංග්‍රීසි භාෂා දැනුම රටෙහි ව්‍යාප්ත වීම, අපනයන වැවිලි භෝග හඳුන්වා දීම, ගමනාගමනය හා සන්නිවේදන කටයුතු දියුණු වීම යනාදිය ද, අවාසි සහගත තත්ත්වයන් ලෙස, බටහිර සංස්කෘතික අංග රටෙහි ව්‍යාප්ත වීම හා සම්ප්‍රදාය අභිබවා යමින් සංස්කෘතික හර පද්ධතිය දෙදරා යාම, මත්පැන් තැබෑරුම් රටෙහි ව්‍යාප්ත වීමෙන් සමාජය පිරිහීමට ලක් වීම, ඉඩම් අහිමි වූ ජනතාවක් බිහි වීම, සාම්ප්‍රදායික ග්‍රාමීය ස්වයංපෝෂිත ආර්ථික ක්‍රමය බිඳ වැටීම හමුවේ දේශීය දැනුම අභාවයට යාම යනාදී අහිතකර තත්ත්වයන් ඇති වූ ආකාරය නිරීක්ෂණය කළ හැකි විය.

මෙහි බොහෝ නවකතාකරුවන් මෙකී විපර්යාසයන් හේතුවෙන් මෙරට ජනයා පීඩාවට පත් වූ අයුරු


© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

නිරූපණයට වැඩි බරක් තබා ඇති ආකාරය නිරීක්ෂණය වූ අතර ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික සමාජ සංවිධානයේ එක ම පදනම වන්නේ, වෙනස්වන සමාජ තත්ත්වයන් සමඟ යමින් ශීඝ්‍රයෙන් වෙනස් වීම බැව් මෙහි දී සඳහන් කළ හැකි ය. 19 වන සියවසෙහි මැද භාගයෙහි සිට 20 වන සියවස මුල් භාගය දක්වා කාල වකවානුවෙහි සිදු වූ සමාජ විපර්යාසයන්, අමුද්‍රව්‍ය ලෙස සිංහල නවකතාකරුවා විසින් තම සිංහල නවකතාවන්ට වස්තු විෂය කොට ගෙන තිබෙනා බව මෙහි දී නිගමනය කළ හැකි ය. අනාගත පර්යේෂකයෙකුට මෙම අධ්‍යයනයට පාදක නොවූ නවකතා අළලා පර්යේෂණයක් සිදු කිරීමට මෙමගින් මාර්ගය පාදා ගත හැකි ය.

## පරිශීලිත මූලාශ්‍රය


අත්තනායක, අනුලා (2021). දහනව වැනි සියවසෙහි බ්‍රිතාන්‍යයන් දුටු ලංකාව. පන්නිපිටිය : සී. කේ. ලිමිටඩ් ලංකා පුද්ගලික සමාගම.

අබේදීර, ලාංගනී ප්‍රනාන්දු (1998). කුණ්ඩාවාඩය. කොළඹ 10 : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඊරියගම, තිස්ස (2011). ශ්‍රී ලංකාවේ වතු විප්ලවය. කොළඹ 08 : සමුද්‍ර පොත් ප්‍රකාශකයෝ.

තෝරදෙනිය, සේන (2020). මඩරන්. කොළඹ : ෆාස්ට් පබ්ලිෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, (2018). ඉතිහාසය (11 ශ්‍රේණිය). හොරණ : සී/ස කරුණාරත්න සහ පුත්‍රයෝ (පුද්ගලික සමාගම).

බණ්ඩාරගේ, අසෝකා (2005). ශ්‍රී ලංකාවේ යටත්විජිතවාදය. පන්නිපිටිය : සීමාසහිත ස්ටැම්ෆර්ඩ් ලේක් (පෞද්ගලික සමාගම).

මස්ඉඹුල, මහින්ද ප්‍රසාද් (2015). මාණික්කාවත. යක්කල : සන්ථව ප්‍රකාශන.

වෙලගෙදර, චම්මින්ද (2019). සක්කාරං. කොළඹ 10 : ෆාස්ට් ප්‍රින්ටරි (ප්‍රයිවට්) ලිමිටඩ්.

සරච්චන්ද්‍ර, එදිරිවීර (2005). සිංහල නවකතා ඉතිහාසය හා විචාරය. නුගේගොඩ : සරසවි ප්‍රකාශකයෝ.

සෙනෙවිරත්න, සුමුදු නිරාගී (2018). දූල්වල අලංකාරේ . කොළඹ 10 : ගොඩගේ සහ සහෝදරයෝ.

සෝමරත්න, පී. පී. වී. (1991). ලංකා ඉතිහාසයෙහි බ්‍රිතාන්‍ය යුගය. කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය හා දේශපාලන විද්‍යා අංශයේ ප්‍රකාශනයකි.

Ariyarathne, M. (2020). Sociocultural Milieu, cultural Dilemma and Early Sinhala Fiction (1866-1906). colombo 10: S. Godage & Brothers.


### වෙබ් අඩවි සහ බ්ලොග් අඩවි


*Vidyananda Pirivena, Bibile*.(2016, November 19).Retrieved from vidyananda1983.blogspot.com: http://vidyananda1983.blogspot.com/2016_11_19_archive.html?m=1

*බ්‍රිතාන්‍යයන් යටතේ ශ්‍රී ලංකාවේ සමාජ පරිවර්තනය*. (2022). Retrieved from github.com: https://github.com/devzer01/history/blob/master/%E0%B6%B6%E0%B7%8A

Lanka,S.U.(2020).*wdLHdk*.Retrieved from 2020-2-Akhyana.pdf: https://www.sab.ac.lk/cikcs/sites/default/files/gallery/ejournal/2020-2-Akyana.pdf

Rathnasiri, S. (2018, June 10). *සංස්කෘතිය හා ජනප්‍රිය සංස්කෘතිය* . Retrieved from sumedarathnasiri.blogspot.com: http://sumedarathnasiri.blogspot.com/2018/06/blog-post_10.html?m=1

*si.nsp-ie.org*.(n.d.).Retrieved from *යටත්විජිත යුගයේ තේරුම:* http://mediavalueinfo.blogspot.com/2020/03/blog-post_97.html?m=1

*ධනවර්ධන, එ. ඒ.* (2021, February 12). *බ්‍රිතාන්‍යය ලංකාවේ ඉඩම් කොල්ල කෑවේ මෙහෙමයි*. Retrieved from m.facebook.com: https://m.facebook.com/345505036642792/photos/a.345558123304150/35308

*ශ්‍රී ලංකාවේ යටත්විජිත යුගයේ ආර්ථික හා සමාජ ප්‍රතිඵල*. (n.d.). Retrieved from si.m.wikipedia.org: https://si.m.wikipedia.org/wiki/%E0%B7%81%E0%B7%8A%E2%80%8D%

සිල්වා, ච. එ. (2022, April 17). *සිංහල නවකතාකරුවාට වස්තු විෂය වූ කුල සංකල්පය*. Retrieved from divaina.lk: https://divaina.lk/%E0%B7%83%E0%B7%92%E0%B6%82%E0%B7%84%E0%B



© 2022 ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

# සබරගමුව විශ්වවිද්‍යාලයීය ශාස්ත්‍රීය සංග්‍රහය
# දහහතරවන කලාපය - 2022 දෙසැම්බර්


'පන්නම් කතුර' පැදි පෙළින් හෙළි වන සාම්ප්‍රදායික පන් කර්මාන්තය 1-09
**යූ. ඩී. ආර්. ෂෙහාන් තිලකරත්න**

21 වන සියවසේ ලෝක හදබිම: චීනයේ පිබිදීම ඇසුරෙන් 10-23
**හෂාන් විජේසිංහ සහ කළිඳු රත්නායක**

තත්කාලීන සමාජ පරිස්ථිතිය නිරූපණය කිරීම උදෙසා මායා යථාර්ථවාදී ලක්ෂණ භාවිතය: පියල් කාරියවසම්ගේ වීදුරු කුඩු කැවුණු කලෙක නවකතාව ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයකි 24-32
**රෂ්මි හෙට්ටිආරච්චි සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චම්පා එස්. ද සිල්වා**

'ටවරවියේ පසුවන පාසල් සිසුන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීමට බලපාන මනෝ සමාජීය සාධක පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්' 33-41
**කළුබෝවිටියන සෝරත හිමි**

සමාජ විරෝධී චර්යාවන් පාලනයට පාසල් ලිංගික අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් (හම්බන්තොට දිස්ත්‍රික්කයේ වලස්මුල්ල ප්‍රදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්) 42-70
**ඩබ්ලිව්. ටී. ඩී. විජේතුංග, එස්. ඩී. වයි. ජයරත්න සහ රිශිනි ෆර්නැන්ඩෝ**

සිංහල නවකතාවෙන් නිරූපිත යටත්විජිත යුගයෙහි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදු වූ සමාජ විපර්යාස : තෝරාගත් සිංහල නවකතා කිහිපයක් ඇසුරින් කෙරෙන විමර්ශනාත්මක අධ්‍යයනයක් 71-82
**ඩබ්. ඩී. එන්. ඩබ්. කුමාරි, සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චම්පා එස්. ද සිල්වා සහ මහාචාර්ය ඩබ්. එම්. ආරියරත්න**



ISSN 1800-1459
eISSN 2673-1177